330 වන කාණ්ඩය - 07 වන කලාපය
தொகுதி 330 - இல. 07
Volume 330 - No. 07

2026 ඔක්තෝබර් 22 වන බ්‍රහස්පතින්දා
2026 ஒக்ரோபர் 22, வியாழக்கிழமை
Thursday, 22nd October, 2026



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තිරුව 1197]

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා [තිරුව 1198]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තිරු 1200-1224]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

2026 අය වැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය [තිරුව 1227]

මැදපෙරදිග ගැටුම හේතුවෙන් ශ්‍රී ලංකාවට ඇති වන මූල්‍යමය බලපෑම [තිරුව 1237]

විදේශ සංචිතවල තිරසරභාවය:

මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තිරුව 1239]

එල් නිනෝ දේශගුණික සංසිද්ධියේ වත්මන් සහ අපේක්ෂිත බලපෑම්:

ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තිරුව 1246]

"දිවිවා" සුළි කුණාටුවෙන් පසු රට යළි ගොඩනැඟීමේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය:

ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තිරුව 1255]

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත:

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි [තිරු 1263-1363]

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත:

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි [තිරුව 1364]

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය:

වාර්ෂික වාර්තාව (2022) [තිරුව 1366]

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය:

වාර්ෂික වාර්තාව (2022) [තිරුව 1366]

ජනතා වතු සංවර්ධන මණ්ඩලය:

වාර්ෂික වාර්තාව (2015) [තිරුව 1367]

ජනතා වතු සංවර්ධන මණ්ඩලය:

වාර්ෂික වාර්තාව (2016) [තිරුව 1367]

ජනතා වතු සංවර්ධන මණ්ඩලය:

වාර්ෂික වාර්තාව (2017) [තිරුව 1368]

ජනතා වතු සංවර්ධන මණ්ඩලය:

වාර්ෂික වාර්තාව (2018) [තිරුව 1368]

රණවිරු සේවා අධිකාරිය:

වාර්ෂික වාර්තාව (2023) [තිරුව 1369]

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය:

වාර්ෂික වාර්තාව (2022) [තිරුව 1369]

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය:

වාර්ෂික වාර්තාව (2023) [තිරුව 1370]

කල්කැඩීමේ යෝජනාව:

තායිලන්ත නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරියගේ සංචාරයේදී නිසි රාජ්‍ය තාන්ත්‍රික පිළිගැනීම ලබා නොදීම [තිරු 1371-1382]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තිරු 1383-1398]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

பயங்கரவாதத்திலிருந்து அரசைப் பாதுகாப்பதற்கான சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 1197]

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள் [ப: 1198]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1200-1224]

தனி அறிவித்தல் மூல வினா:

2026 வரவு செலவுத்திட்ட முன்மொழிவுகளை நடைமுறைப்படுத்துவதிலுள்ள முன்னேற்றம் [ப: 1227]

மத்திய கிழக்கு மோதல் காரணமாக இலங்கைக்கு ஏற்படும் நிதி ரீதியான தாக்கம் [ப: 1237]

அந்நியச் செலாவணிக் கையிருப்பின் நிலைத்தன்மை:

நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 1239]

எல் நினோ காலநிலை மாற்றத்தின் தற்போதைய மற்றும் எதிர்பார்க்கப்படும் தாக்கம்:

பாதுகாப்புப் பிரதி அமைச்சரினது கூற்று [ப: 1246]

தித்வா சூறாவளியின் பிறகு நாட்டை மீட்டெடுப்பதற்கான நிதி மற்றும் பௌதிக முன்னேற்றம்:

பாதுகாப்புப் பிரதி அமைச்சரினது கூற்று [ப: 1255]

நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம்:

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 1263- 1363]

நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம்:

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 1364]

தேசிய தொழில் கற்கைகள் நிறுவகம்:

வருடாந்த அறிக்கை (2022) [ப: 1366]

தேசிய தொழில்சார் பாதுகாப்பு மற்றும் சுகாதார நிறுவகம்:

வருடாந்த அறிக்கை (2022) [ப: 1366]

மக்கள் தோட்ட அபிவிருத்திச் சபை:

வருடாந்த அறிக்கை (2015) [ப: 1367]

மக்கள் தோட்ட அபிவிருத்திச் சபை:

வருடாந்த அறிக்கை (2016) [ப: 1367]

மக்கள் தோட்ட அபிவிருத்திச் சபை:

வருடாந்த அறிக்கை (2017) [ப: 1368]

மக்கள் தோட்ட அபிவிருத்திச் சபை:

வருடாந்த அறிக்கை (2018) [ப: 1368]

ரணவிரு சேவா அதிகாரசபை:

வருடாந்த அறிக்கை (2023) [ப: 1369]

ஜெனரல் சேர் ஜோன் கொத்தலாவல பாதுகாப்புப் பல்கலைக்கழகம்:

வருடாந்த அறிக்கை (2022) [ப: 1369]

ஜெனரல் சேர் ஜோன் கொத்தலாவல பாதுகாப்புப் பல்கலைக்கழகம்:

வருடாந்த அறிக்கை (2023) [ப: 1370]

ஒத்திவைப்புப் பிரேரணை:

தாய்லாந்து பிரதிப் பிரதமரின் விஜயத்தின்போது முறையான இராஜதந்திர வரவேற்பு வழங்கப்படாமை [ப: 1371-1382]

வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப: 1383-1398]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Protection of the State from Terrorism Bill: Petitions to the Supreme Court [Col. 1197]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 1198]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1200-1224]

QUESTION BY PRIVATE NOTICE:
Progress of Implementing Budget Proposals, 2026 [Col. 1227]
Financial Impact of Middle East Conflict on Sri Lanka [Col. 1237]

SUSTAINABILITY OF FOREIGN RESERVES:
Statement by Deputy Minister of Finance and Planning [Col. 1239]

CURRENT AND PROJECTED IMPACT OF EL NIÑO CLIMATE PHENOMENON:
Statement by Deputy Minister of Defence [Col. 1246]

FINANCIAL AND PHYSICAL PROGRESS OF RESTORING THE COUNTRY AFTER CYCLONE "DITWAH":
Statement by Deputy Minister of Defence [Col. 1255]

POISONS, OPIUM AND DANGEROUS DRUGS (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended [Cols. 1263-1363]

POISONS, OPIUM AND DANGEROUS DRUGS (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended [Col. 1364]

NATIONAL INSTITUTE OF LABOUR STUDIES:
Annual Report (2022) [Col. 1366]

NATIONAL INSTITUTE OF OCCUPATIONAL SAFETY AND HEALTH:
Annual Report (2022) [Col. 1366]

JANATHA ESTATES DEVELOPMENT BOARD:
Annual Report (2015) [Col. 1367]

JANATHA ESTATES DEVELOPMENT BOARD:
Annual Report (2016) [Col. 1367]

JANATHA ESTATES DEVELOPMENT BOARD:
Annual Report (2017) [Col. 1368]

JANATHA ESTATES DEVELOPMENT BOARD:
Annual Report (2018) [Col. 1368]

RANAVIRU SEVA AUTHORITY:
Annual Report (2023) [Col. 1369]

GENERAL SIR JOHN KOTELAWALA DEFENCE UNIVERSITY:
Annual Report (2022) [Col. 1369]

GENERAL SIR JOHN KOTELAWALA DEFENCE UNIVERSITY:
Annual Report (2023) [Col. 1370]

ADJOURNMENT MOTION:
Failure to Accord Due Protocol during the Visit of Deputy Prime Minister of Thailand [Cols. 1371-1382]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 1383-1398]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2026 ඔක්තෝබර් 22 වන බ්‍රහස්පතින්දා
2026 ஒக்ரோபர் 22, வியாழக்கிழமை
Thursday, 22nd October, 2026

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
பயங்கரவாதத்திலிருந்து அரசைப் பாதுகாப்பதற்கான சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
PROTECTION OF THE STATE FROM TERRORISM BILL: PETITIONS TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 ඔක්තෝබර් 07, 08, 20 සහ 21 දිනැති නිවේදනවල සඳහන් පෙත්සම් තිස්හයට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් හතරක පිටපත්, මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

II

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026.10.08 දින පැවති අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීමේ දී ගරු අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය විසින් ලබා දුන් උපදෙස් පරිදි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම සඳහා වන අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ විශේෂ රැස්වීමක් 2026 ඔක්තෝබර් 22වන බ්‍රහස්පතින්දා, එනම් අද දින පස්වරු 2.00ට පාර්ලිමේන්තුවේ කාරක සභා කාමර අංක 1හිදී පැවැත්වීමට නියමිත බැවින් ඒ සඳහා සහභාගී වන ලෙස සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කාරුණිකව ආරාධනය කරනු කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the -

(i) Annual Report and Accounts of the Institute of Human Resource Advancement of the University of Colombo for the year 2024; and

(ii) Annual Report of the Ceylon German Technical Training Institute for the year 2024.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

2024 වර්ෂය සඳහා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද ජලනීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, කාශ්‍යපපුර, මහඋල්පත, අංක 161 යන ලිපිනයෙහි පදිංචි කේ.ඒ. සරත් කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Dinindu Saman Hennayake - Deputy Minister of Youth Affairs)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) බදුලු ඔය, කරමැටිය, අංක 41 යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්. ධර්මදාස මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) බදුල්ල, බදුලුපිටිය, අංක සී/224 යන ලිපිනයෙහි පදිංචි ජී.පී.එච්. සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) බදුල්ල, වෙලගෙදර, ඉහළ අලුත්ඇළ පාර, "තාරක" අංක 76/1 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.යූ. ශ්‍රියාකාන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු උපුල් කිත්සිරි මහතා
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු කථානායකතුමනි, ඇඹිලිපිටිය, මොරකැටිය, 7-ඇළ, අංක 254/6 යන ලිපිනයෙහි පදිංචි ඒ.එල්.ඩී. පියතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු චමින්ද ලලිත් කුමාර මහතා
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)

ගරු කථානායකතුමනි, ගම්පහ, දොඹවල, සද්ධර්මගුප්ත පිරිවෙනෙහි වැඩවසන පූජ්‍ය උඩුගම්පොළ චන්දරතන හිමිගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නිශාන්ත පෙරේරා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගොවි පවුල් සඳහා පොහොර සහනාධාරය ලබා දීම: කුරුණෑගල දිස්ත්‍රික්කය
உர மானியம் வழங்கப்பட்ட விவசாயக் குடும்பங்கள்: குருநாகல் மாவட்டம்
FARMER HOUSEHOLDS GRANTED WITH FERTILIZER SUBSIDY: KURUNEGALA DISTRICT

200/2024

1. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ මෙම කන්නයේ පොහොර සහනාධාර ලැබූ ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ගොවි ජන කොට්ඨාස අනුව එම සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සහනාධාරය සඳහා රජය විසින් වැය කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) සහනාධාරය නිවැරැදිව සහ විධිමත්ව ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කමත්තොழில், කාල්නඩෙ වළංකල්, කාණි මත්‍රුම් නීර්ප්පාසන අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) குருநாகல் மாவட்டத்தில் இந்தப் போகத்தில் உர மானியத்தைப் பெற்றுக்கொண்ட குடும்பங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) ஒவ்வொரு கமநல சேவைப் பிரிவுகளின்படி மேற்படி எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி உர மானியத்துக்காக அரசாங்கத்தால் செலவிடப்பட்ட தொகை எவ்வளவு என்பதையும்;

(iv) மானியத்தை சரியாகவும் முறையாகவும் வழங்குவதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the number of farmer households in the Kurunegala District which had received the fertilizer subsidy during the current season;

(ii) separately, the number of such farmer hous.eholds in each Agrarian Service Division;

(iii) the total expenditure incurred by the Government in providing the said subsidy; and

(iv) the measures that will be taken to ensure the proper and systematic provision of the fertilizer subsidy in the future?

(b) If not, why?

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)

(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

- වී සඳහා පොහොර සහනාධාර ලැබූ ගොවීන් සංඛ්‍යාව - 129,167

වෙනත් බෝග සඳහා පොහොර සහනාධාර ලැබූ ගොවීන් සංඛ්‍යාව - 1020

(ii) ඇමුණුම් 01 හා 02 මඟින් ඉදිරිපත් කර ඇත.

Annexure 1

ASC Generated Cash Grant Report - Paddy - 2026 Yala

District	ASC Name	ASC Code	Total Generated Amount (Rs)	Total Farmers
Kurunegala	Alawwa	18/041	21,973,269.00	2,824
Kurunegala	Ambanpola	18/012	42,607,293.00	2,973
Kurunegala	Awulegama	18/024	35,515,707.00	2,732
Kurunegala	Bingiriya	18/029	40,790,460.00	2,225
Kurunegala	Boraluwewa	18/056	10,647,555.00	800
Kurunegala	Boyagane	18/049	18,034,170.00	1,690
Kurunegala	Dambadeniya	18/043	17,141,100.00	1,819
Kurunegala	Deegalla	18/038	15,868,446.00	1,251
Kurunegala	Divullegoda	18/006	13,652,451.00	972
Kurunegala	Dodangaslanda	18/053	10,472,004.00	1,075
Kurunegala	Dummalasuriya	18/030	11,991,780.00	735
Kurunegala	Ehetuwewa	18/009	67,873,242.00	3,199
Kurunegala	Galgamuwa	18/008	94,002,114.00	4,846
Kurunegala	Ganewatta	18/019	41,379,987.00	3,049
Kurunegala	Hamangalla	18/033	20,645,097.00	2,003
Kurunegala	Horombawa	18/036	37,594,014.00	3,340
Kurunegala	Ibbagamuwa	18/020	43,009,167.00	3,937
Kurunegala	Kanogama	18/026	34,757,070.00	2,841
Kurunegala	Karadagolla	18/055	24,928,929.00	2,100
Kurunegala	Kithalawa	18/037	20,554,845.00	2,034
Kurunegala	Kobeigane	18/005	33,201,078.00	2,490
Kurunegala	Kotawehera	18/001	18,952,323.00	959
Kurunegala	Kudagalgamuwa	18/048	22,513,170.00	1,831
Kurunegala	Kuliyapitiya	18/035	18,007,176.00	1,479
Kurunegala	Kumbukgate	18/018	13,985,145.00	1,165
Kurunegala	Kurunegala	18/047	9,005,313.00	921
Kurunegala	Madahapola	18/017	2,712,381.00	267
Kurunegala	Mahagirilla	18/002	24,638,796.00	1,462
Kurunegala	Mahananneriya	18/007	16,586,493.00	1,084
Kurunegala	Maharachchimulla	18/042	20,889,168.00	2,359
Kurunegala	Mahawa	18/014	27,092,661.00	2,402
Kurunegala	Mawathagama	18/051	29,174,595.00	3,238
Kurunegala	Melsiripura	18/021	30,308,427.00	2,659
Kurunegala	Moonamaldeniya	18/027	32,653,050.00	2,139
Kurunegala	Moragollagama	18/016	34,991,724.00	2,346
Kurunegala	Nagollagama	18/013	49,230,807.00	3,299
Kurunegala	Narammala	18/040	33,675,375.00	2,846
Kurunegala	Nathagane	18/022	51,071,871.00	4,073
Kurunegala	Nikaweratiya	18/004	44,304,732.00	2,638
Kurunegala	Panduwasnuwara	18/025	62,540,940.00	4,263
Kurunegala	Polgahawela	18/044	22,358,085.00	2,284
Kurunegala	Pothuhera	18/045	28,081,011.00	2,861
Kurunegala	RajanganayaWamlura	18/010	64,539,864.00	2,796
Kurunegala	Rambadagalla	18/054	14,443,809.00	1,514
Kurunegala	Rambe	18/015	95,954,871.00	6,912
Kurunegala	Rasnayakapura	18/003	31,413,981.00	1,753
Kurunegala	Thambutta	18/011	19,483,980.00	1,173
Kurunegala	Tharana	18/028	12,354,573.00	1,163
Kurunegala	Ududaddawa	18/031	12,724,512.00	927
Kurunegala	Wariyapola	18/023	42,839,229.00	3,323
Kurunegala	Weerambugedara	18/046	41,604,579.00	3,545
Kurunegala	Wellawa	18/050	18,349,113.00	1,483
Kurunegala	Welpalla	18/034	34,359,171.00	1,911
Kurunegala	Werawella	18/052	28,662,486.00	2,961
Kurunegala	Wewagama	18/039	24,529,014.00	2,178
Kurunegala	Yakwila	18/032	26,868,639.00	2,018
TOTAL			1,717,540,842.00	129167

[ගරු නාමල් කරුණාරත්න මහතා]

Annexure 2

ASC Paid Cash Grant Report - Other Crops - 2026 Yala

#	District Name	ASC Code	ASC Name	Total Amount	Total Farmers
1	Kurunegala	18/009	Ehetuwewa	37,157.40	6
2	Kurunegala	18/008	Galgamuwa	2,434,912.20	333
3	Kurunegala	18/020	Ibbagamuwa	115,286.40	45
4	Kurunegala	18/055	Karadagolla	6,964.20	2
5	Kurunegala	18/018	Kumbukgate	2,986.20	1
6	Kurunegala	18/017	Madahapola	236,412.00	46
7	Kurunegala	18/021	Melsiripura	61,943.40	16
8	Kurunegala	18/016	Moragollagama	664,183.80	89
9	Kurunegala	18/004	Nikaweratiya	3,770,226.00	481
10	Kurunegala	18/003	Rasnayakapura	5,769.00	1
TOTAL				7,335,840.60	1020

(iii)

- වී ගොවීන් සඳහා පොහොර සහනාධාරය වෙනුවෙන් රජය විසින් වැය කරන ලද මුදල් ප්‍රමාණය රුපියල් 1,717,540,842.00කි.
- වෙනත් භෝග සඳහා පොහොර සහනාධාරය වෙනුවෙන් රජය විසින් වැය කරන ලද මුදල් ප්‍රමාණය රුපියල් 7,335,840.60කි.

(iv) වී වගාව සඳහා මූල්‍ය සහනාධාරය ලබා දීමේ වැඩසටහනට අදාළව කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් ඒ, ඒ කන්නයේදී ගොවීන් වෙත පොහොර සහනාධාරය ලබා දීමට අදාළ චක්‍රලේඛය නිකුත් කරනු ලබන අතර, එමඟින් ලබා දී ඇති උපදෙස් අනුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මට්ටමින් ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව සියලු දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාරවරුන් ඇතුළු ඒ හා සම්බන්ධ සියලු නිලධාරීන් දැනුවත් කරනු ලැබේ. ඒ අනුව, ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් සහනාධාර ලැබිය යුතු ගොවීන්ගේ තොරතුරු කෘ.ප.නි.ස. නිලධාරීන් සම මට්ටමින් ලබාගෙන ගොවිජන සේවා මධ්‍යස්ථානවල ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන් හරහා තොරතුරු පද්ධතියට ඇතුළත් කරනු ලබන අතර, එම තොරතුරුවලට අනුව පොහොර සහනාධාරය ගොවීන්ගේ බැංකු ගිණුම වෙත බැර කිරීම සිදු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(*மாண்புமிகு நலின் பண்டார ஜயமஹ*)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි දන්නවා, පසුගිය කාලයේ එල් නිනෝ අවදානමක් පිළිබඳව අපේ අවධානය, රජයේ අවධානය සහ ලෝකයේ අවධානය යොමු වුණු බව. මේ එල් නිනෝ අවදානමත් එක්ක ගොවීන් මොකක්ද කරන්න ඕනෑ කියන එක පිළිබඳව විවිධ මත තිබුණා. නමුත්, මේ වෙලාවේදී වැස්ස බව අපි දන්නවා. කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරී මහත්වරු මේ පිළිබඳව නිවැරදි උපදෙස් සමහර අයට ලබා දීලා තිබුණත් සමහර අයට නිවැරදි උපදෙස් ලබා දීලා තිබුණේ නැහැ. සමහරුන්ට දීලා තිබුණු උපදෙස් අනුව ඔවුන් කුඹුරු වගා කළා. හැබැයි, ඒ එක්කම වර්ෂාපතනය ලැබුණු නිසා සමහර තැන්වල වගා කරපු කුඹුරු යට වෙලා, ඒවාට හානි සිදු වෙලා තිබෙනවා. කුඹුරු වගා කරපු අයට ඒ වාගේ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. එම නිසා අනවබෝධය සහ වැරදි උපදෙස් හේතුවෙන් ගොවීන්ට ඇති වූ හානි වෙනුවෙන් යම් වන්දි ගෙවීමක් කරන්න ඔබතුමන්ලා රජය විධියට සහ අමාත්‍යාංශය විධියට කටයුතු කරනවාද?

ගරු නාමල් කරුණාරත්න මහතා
(*மாண்புமிகு நாமல் கருணாரத்ன*)
(The Hon. Namal Karunaratne)

ඔව්. ගරු මන්ත්‍රීතුමනි, එල් නිනෝ තත්ත්වය පිළිබඳව ඇත්තටම දන්න ඉදිරිපත් කළේ ජාත්‍යන්තර මට්ටමින්. ඒ අනුව අපේ රටේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරපු දත්තත් එක්ක තමයි කෘෂිකර්ම අමාත්‍යාංශය කටයුතු කරන්නේ. ඒ අනුව තමයි මේ කන්න අපි සැලසුම් කළේ. විශේෂයෙන්ම සති දෙකක් කලින් වගාව ආරම්භ කළා. අපිට ඉදිරිපත් කර තිබෙන දත්ත අනුව ලබන වසරේ ජනවාරි සහ පෙබරවාරි කියන මාසවල දැඩි නියං තත්ත්වයක් එනවා. ඒ වාගේම තමයි, පාරිසරික වශයෙන් ගත්තොත් ජල වාෂ්පීකරණය සියයට 20කින් විතර වැඩි වෙලා තිබෙනවා. ඒක ප්‍රායෝගිකවත් අපි අත්දුටුවා. ඒ තත්ත්වය තුළ වාෂ්පීකරණය වැඩි වීම නිසා ජලාශවල, ළිංවල වතුර වේගයෙන් වාෂ්ප වන ප්‍රවණතාවක් අපි පසුගිය දවස්වලත් දැක්කා. මාධ්‍යවලත් ඒක පෙන්වුවා. ඒ තත්ත්වය තුළ ජනවාරි සහ විශේෂයෙන්ම පෙබරවාරි මාසයේ වැව්වල වතුර කුඹුරු සඳහා නිදහස් කර ගැනීම වළක්වා ගැනීමට තමයි ඒකෙන් අපි බලාපොරොත්තු වුණේ. එහෙම වුණොත් යල කන්නයේ අපට යම් වතුර ප්‍රමාණයක් ආරක්ෂා කරගෙන අතිරේක භෝගවලට හරි යන්න පුළුවන් කියන ස්ථාවරයේ ඉඳගෙන තමයි අපි මේ කන්න සැලසුම් කළේ. මොකද, ඇත්තටම යල කන්නයට තමයි මෙහි අවදානම බලපාන්නේ. කොහොමත් මේ කාල පරාසය තුළ වර්ෂාව එනවා කියන එක පිළිබඳවත් දැනුවත් කරලා තිබුණා. ඔන්න ඔය තත්ත්වයන් අනුව තමයි ගොවීන්ට උපදෙස් දුන්නේ බාල වී ඉහින්න, යල කන්නයේ ඉහින වී ම මාස් කන්නයේත් ඉහින්න කියලා. ජනවාරි අග විතර වෙනකොට ගොයම් කපන විධියටත්, පෙබරවාරි වෙනකොට ගොයම් අස්වනු නෙළන විධියටත් වගාව කළමනාකරණය කර ගැනීම තමයි මේකෙන් අදහස් කළේ. ඇත්තටම මේ තිබෙන දත්ත අනුව අපි ලොකුම අවදානමකට ලක් වෙන්නේ යල කන්නයේ. අන්න ඒ අනුව තමයි උපදෙස් දීලා තිබෙන්නේ.

ඔබතුමාගේ ඊළඟ ප්‍රශ්නයට පිළිතුර විධියට මම කියන්න කැමැතියි, මොනවා හරි වගා හානි වෙනවා නම් ඒ සියලු ගොවීන්ට අපි වන්දි ලබා දෙන බව. "දිවිවා" ආපදාව ආවාට පසුව ඉතිහාසයේ කිසිම ආණ්ඩුවක් නොකරපු විධියට වන්දි ලබා දීම අපි සිද්ධ කළා. එළවලු ඇතුළු අනිකුත් භෝගවලට කවදාවත් නොගෙවපු තරමේ වන්දි මුදල් අපි ගෙව්වා. අපි ආණ්ඩුව භාර ගන්න කලින් යල කන්නයේ වෙච්ච වගා හානි සඳහා ගොවියාට වන්දි වශයෙන් ශත පහක්වත් ගෙවලා තිබුණේ නැහැ. අපි අමාත්‍යාංශය භාරගෙන පළමුවෙන්ම කළේ ඒ වන්දි මුදල් ගෙවන එක. ඒ වාගේම පසුගිය කාලවලදීත් ඒ අදාළ වන්දි, අදාළ විධියට අපි ගොවි ජනතාවට ගෙවා තිබෙනවා. ඔබතුමා අහන ප්‍රශ්නයට පිළිතුරක් විධියට, මෙවරත් වගා හානි වන සියලු ගොවීන්ට අදාළ වන්දි මුදල් ලබා දීමට රජය විධියට අපි සූදානම් කියලා මම ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ඔබතුමා තමයි මේ ආණ්ඩුව බලයට පත්වන්න කලින් ගොවි ජනතාව නියෝජනය කරපු ගොවි නායකයා. මට මතක විධියට, ඔබතුමන්ලා වී කිලෝවක සහතික මිල රුපියල් 120ක් වශයෙන් නම් කරලා තිබුණා. යල කන්නය ඉවර වෙලා දැන් මහ කන්නයත් ආරම්භ කරන්න සූදානම්. සමහර තැන්වල ඒ කටයුතු ආරම්භ වෙලාත් තිබෙනවා. හැබැයි, වී කිලෝවක මිල පැවතුණේ රුපියල් 90, 95, 96, 98 වාගේ ගණනක. ඔබතුමන්ලා අතීතයේ දුන් පොරොන්දුත් එක්ක රටේ ගොවීන් බලාපොරොත්තු වුණා, වී අලෙවි මණ්ඩලය ශක්තිමත් කරලා රජය සාධාරණ මිලකට වී මිලදී ගනීවි කියලා. ඔබතුමා ඒ කාලයේ කිව්වා, වී කිලෝවකට රුපියල් 150ක්වත් ගොවියාට ඕනෑ කියලා. ඒවා අපි අමතක කරමුකෝ. අඩුම ගණනේ ඔබතුමන්ලා දුන් සහතික මිල - කිලෝ එකකට රුපියල් 120ක් - පවත්වා ගෙන යෑමට අවශ්‍ය රාජ්‍ය මැදිහත්වීමවත් ඔබතුමන්ලාට කරන්න බැරිව ගියා. ඉතින් මම අහන්නේ, ඔබතුමන්ලා ගොවීන්ට දුන් බලාපොරොත්තුත් එක්ක ඒ රාජ්‍ය මැදිහත්වීම කරන්න බැරිව ගියේ ඇයි කියන එකයි.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, නැවත වතාවක් මම පැහැදිලි කරන්න ඕනෑ, මේ රුපියල් 150 කථාව ගැන. මේක මෙතැනදීම මම සෑහෙනදුරට පැහැදිලි කරලා තිබෙනවා. අපි කොතැනකදීවත් වී කිලෝ එකකට රුපියල් 150ක් ඉල්ලුවේ නැහැ, මන්ත්‍රීතුමා. පුළුවන් නම් එහෙම ඉල්ලපු තැනක් කියන්නකෝ. එහෙම කියන්න ඔබතුමන්ලාට හැකියාවක් නැහැ. අපි කිව්වා, වී කිලෝ එකක නිෂ්පාදන වියදම රුපියල් 150ට වැඩියි කියලා. අපි එහෙම කිව්වේ රසායනික පොහොර තහනම් කළ වෙලාවේ නේ. රසායනික පොහොර තහනම් කළ ඒ වකවානුව තුළ අපේ විපක්ෂ නායකතුමා මෙතැන ඉඳන් ප්‍රකාශ කළා, එවකට ගොවියාගේ වී නිෂ්පාදනය සියයට 35කින් අඩු වුණා කියලා. ඒකට මම තමයි උත්තර දුන්නේ. එතුමා කියපු කාරණය හරි. වී කිලෝ 1,000ක් ගත්ත ගොවියාට ඒ අවස්ථාවේ ගන්න පුළුවන් වුණේ වී කිලෝ 650යි නේ. අස්වැන්න අඩු වුණා. මොකද, ඒ කාලයේ රසායනික පොහොර සොයා ගන්න නැතිව ගියා. පොහොර මිටිය රුපියල් 40,000ට, 50,000ට ගියා. ඔන්න ඔය තත්ත්වය ඇතුළේ වී කිලෝවක නිෂ්පාදන පිරිවැය ගණන් බලනකොට රුපියල් 150ටත් වැඩි වුණා. ඒ වෙලාවේ ගොවිජන සම්මේලනය විධියට - අපේ ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා - අපේ සටන් පාඨය වුණේ, "වීවල නිෂ්පාදන වියදම අඩු කරන්න, පොහොර තහනම ඉවත් කරන්න, ගොවියාට මේ කරපු හානියට වන්දි ගෙවන්න" කියන එකයි. ඔන්න ඔය සටන් පාඨයේ තමයි අපි හිටියේ. එහෙම නැතිව අපි කොතැනකවත් වී කිලෝවකට රුපියල් 150ක් ඉල්ලුවේ නැහැ. "පොහොර තහනම ඉවත් කරන්න, නිෂ්පාදන වියදම අඩු කරන්න, ගොවියාට කරපු හානියට වන්දි ගෙවන්න" කියන එක තමයි දිගටම අපේ ඉල්ලීම වුණේ.

ගරු කථානායකතුමනි, අපි ආණ්ඩුව ගන්නකොට වී ගබඩා ඔක්කෝම වහලා තිබුණේ. නමුත් අපි වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කළා. ඒ විතරක් නොවෙයි. ඉතිහාසයේ පළමුවැනි වතාවට මේ පාර්ලිමේන්තුවේදී රුපියල් මිලියන 7,500ක් අනුමත කරලා මෝල් හිමියන්ට, සමුපකාරවලට වෙනම මුදල් ලබා දීලා වී මිලදී ගැනීම සඳහා අපි ඔවුන්ට අවස්ථාව ලබා දුන්නා. ඒ හින්දා ගොවි ජනතාවට රජයේ ගබඩාවලට පමණක් නොවෙයි, පෞද්ගලික අංශයේ මෝල් හිමියන්ටත් රජයේ මිලටම වී ටික විකිණීමට අවශ්‍ය පරිසරය අපි හදලා දුන්නා. තිබුණු තත්ත්වයත් එක්ක අපි යම් දුරක් ආවාට, ගොවියාට සියයට සියයක් සතුටුදායක තත්ත්වයක් උදා වුණේ නැහැ කියලා අපි පිළිගන්නවා.

හැබැයි, තිබුණු තත්ත්වයත් එක්කයි අපි මේක සාපේක්ෂව බලන්න ඕනෑකම තිබෙන්නේ. ඒ ක්‍රියාවලි අපි ක්‍රමානුකූලව මේ වනකොට සකස් කරමින්, ගොවි ජනතාවත් එක්ක සාකච්ඡා කරමින් ඉදිරියට යනවා. අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, ඉන්ධන මිල වැඩිවීමත් එක්ක මේ වනකොට ගොවියාගේ නිෂ්පාදන වියදමෙහි යම් කිසි වැඩිවීමක් ඇත්තටම වුණු බව. හැබැයි, අනෙක් පැත්තෙන් ගොවියාගේ අස්වැන්නත් වැඩි වෙලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පැත්තෙන්ම ඉදිරිපත් කරපු ප්‍රශ්නයකට මම පෙරේදා මෙතැනදීම උත්තරයක් දුන්නා. ඒ ප්‍රශ්නය ඇහුවේ ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මන්ත්‍රීතුමා. පසුගිය මහ කන්නයට සාපේක්ෂව මෙවර මහ කන්නයේ මොනරාගල දිස්ත්‍රික්කයේ විතරක් අස්වැන්න වැඩි වෙලා තිබෙනවා, වී කිලෝ හැත්තෑහත් ලක්ෂයකට වැඩි ප්‍රමාණයක්. අන්න ඒ තත්ත්වය ඇතුළේ අපි ගොවියාගේ අස්වනු වැඩි කර ගැනීමට අදාළ වැඩ පිළිවෙළ මේ වනකොට දියත් කර තිබෙනවා. ඒ තුළින් ගොවියාගේ නිෂ්පාදන වියදම අඩු කර ගන්නත් පුළුවන්කම තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -372/2025- (1), ගරු අජිත් පී. පෙරේරා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -476/2025- (1), ගරු රවී කරුණානායක මහතා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -685/2025- (2), ගරු රෝහණ බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -771/2025- (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -905/2025- (1), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7 -988/2025- (1), ගරු කිංස් නෙල්සන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8 -1496/2025- (1), ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9 -1669/2025- (1), ගරු චාමර සම්පත් දසනායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රජා ශක්ති සංවර්ධන වැඩසටහන: ආරම්භ කර ඇති ව්‍යාපෘති
பிரஜா சக்தி அபிவிருத்தி நிகழ்ச்சித்திட்டம்: ஆரம்பிக்கப்பட்டுள்ள திட்டங்கள்
PRAJA SHAKTHI DEVELOPMENT PROGRAMME: PROJECTS UNDERTAKEN

2398/2026

10. ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ප්‍රජා ශක්ති සංවර්ධන වැඩසටහන මඟින්,-

(i) බහුමාන දරිද්‍රතාව තුරන් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) විශේෂ අවශ්‍යතා සහිත පාසල් දරුවන් සඳහා මූල්‍යාධාර හෝ වෙනත් සහනාධාර ලබා දෙන්නේද;

(iv) එසේ නම්, එම සහනාධාර කවරේද;

(v) ආබාධ සහිත පුද්ගලයින් සඳහා ක්‍රියාත්මක වන සුබසාධන වැඩසටහන් තිබේද;

(vi) එසේ නම්, එම වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කිරාමිය අපිවිරුත්ති, සමූකප් පාදුකාප්පු මර්‍රුම් සමූක වළුවූට්ටුකෙ අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) பிரஜா சக்தி அபிவிருத்தி நிகழ்ச்சித்திட்டத்தின்மூலம் -

(i) பல்பரிமாண வறுமை ஒழிப்புக்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், அந்நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) விசேட தேவையுடைய பாடசாலை மாணவர் களுக்கு நிதியுதவி அல்லது வேறு ஏதேனும் நிவாரணங்கள் வழங்கப்படுகின்றனவா என்ப தையும்;

(iv) ஆமெனில், அந்நிவாரணங்கள் யாவை என்பதையும்;

(v) மாற்றுத்திறனாளிகளுக்காக நடைமுறைப்படுத் தப்\படும் நலன்புரி நிகழ்ச்சித்திட்டங்கள் உள்ளனவா என்பதையும்;

(vi) ஆமெனில், அந்நிகழ்ச்சித்திட்டங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Rural Development, Social Security and Community Empowerment:

(a) Will he inform this House in relation to the Praja Shakthi Development Programme -

(i) whether measures have been taken under the programme to eradicate multidimensional poverty;

(ii) if so, such measures;

(iii) whether financial assistance or other relief is provided for schoolchildren with special needs;

(iv) if so, such relief;

(v) whether there are welfare programmes that are being conducted for persons with disabilities; and

(vi) if so, such programmes?

(b) If not, why?

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) "ප්‍රජා ශක්ති" දිළිඳු බව තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය යටතේ ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් පිහිටුවා ඇති ප්‍රජා සංවර්ධන සභා මඟින් තම දිස්ත්‍රික්කයේ/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හඳුනා ගත් බහුමාන දරිද්‍රතාව තුරන් කිරීම සඳහා සෘජුවම අදාළ වන ව්‍යාපෘති හඳුනා ගැනීමට කටයුතු කරනු ලබයි. එහිදී දිළිඳු බව තුරන් කිරීමේ වැඩසටහන්වල පැවති අඩුපාඩු මඟ හරවා ගනිමින් පහත කුලුනු 6 යටතේ ව්‍යාපෘති හඳුනා ගෙන ක්‍රියාත්මක කරනු ලබයි.

1. නිෂ්පාදන ආර්ථිකය
2. ආහාර සුරක්ෂිතතාව
3. සමාජ පරිසරය
4. මානව සම්පත් සංවර්ධනය
5. රැකවරණය
6. සැපයුම් ජාල සහ ප්‍රවේශය

මම මේ සම්බන්ධව සාරාංශයක් විධියට කියන්නම්. 2026 වර්ෂයේදී ප්‍රජා ශක්ති ජාතික ව්‍යාපාරය යටතේ බහුමාන දරිද්‍රතාව තුරන් කිරීම සඳහා සෘජුවම දායක වන ජීවනෝපාය සංවර්ධනය, අධ්‍යාපනය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපෘති 15,725ක් මේ වනකොට ආරම්භ කර තිබෙනවා. ඒ යටතේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති 15,316ක් ඇතුළත් වෙනවා. අධ්‍යාපනයට අදාළ ව්‍යාපෘති 273ක් තිබෙනවා. සෞඛ්‍යයට අදාළ ව්‍යාපෘති 136ක් තිබෙනවා.

(iii) සෘජුවම "ප්‍රජා ශක්ති" වැඩසටහන යටතේ මූල්‍යාධාර හෝ සහනාධාර ලබා දීමක් සිදු කරන්නේ නැහැ. නමුත් මෙම අමාත්‍යාංශය යටතේ ඇති සමාජ සේවා දෙපාර්තමේන්තුව සහ ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය මඟින් ආබාධ සහිත පාසල් දරුවන් සඳහා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවා. ඊට අමතරව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළුව රේඛීය අමාත්‍යාංශයත් ආබාධ සහිත සිසුන් සඳහා මූල්‍යාධාර හෝ වෙනත් සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කරනවා.

(iv) දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල හරහා අඩු ආදායම්ලාභී දෘශ්‍යාබාධිත පාසල් සිසුන් සඳහා ශිෂ්‍යාධාර වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය මඟින් සිසුන් සඳහා රුපියල් 30,000ක එක්වරක් පමණක් වෛද්‍යාධාර ලබා දීම සිදු කරනවා. ඊට අමතරව ජනාධිපති ලේකම් කාර්යාලයේ මැදිහත් වීමෙන් මේ සිසුන් සඳහා රුපියල් ලක්ෂයේ උපරිමය දක්වා එක් වරක් පමණක් වෛද්‍යාධාර ලබා දීම සිදු කරනවා. ඒ වාගේම විවිධ ආධාර උපකරණ, විශේෂයෙන් ශ්‍රවණ උපකරණ ආදිය මිලදී ගැනීම සඳහා රුපියල් 50,000ක මුදලකට යටත්ව අවශ්‍ය ආධාර මුදල් ලබා දීමක් සිදු කරනවා. ඊට අමතරව උසස් අධ්‍යාපනය හදාරන සාමාන්‍ය සිසුවෙකු ලබන ශිෂ්‍යාධාර හෝ මහපොළ ශිෂ්‍යාධාරයට අමතරව, උසස් අධ්‍යාපනය ලබන ආබාධ සහිත ශිෂ්‍යයෙක් සඳහා රුපියල් 5,000ක දීමනාවක් ලබා දෙනවා. ඊටත් අමතරව ජනාධිපති අරමුදලෙන් එක් වරක් පමණක් පිරිනමන රුපියල් ලක්ෂයක ශිෂ්‍යාධාර මුදල උසස් අධ්‍යාපනය ලබන ආබාධ සහිත විද්‍යාර්ථීන් සඳහා පිරිනමනු ලබනවා. (වැඩි විස්තර ඇමුණුමෙහි දක්වා ඇත.)

(v) ඔව්.

(vi) ජීවනාධාර දීමනා වශයෙන් මාසිකව රුපියල් 10,000ක් ලබා දෙනවා. මේ වනවිට 180,000ක පමණ පිරිසක් මෙම ආධාරය ලබනවා. ඊට අමතරව ආබාධ සහිත පුද්ගලයින් ඉන්න පවුල්වලට නිවාස ආධාර ලබා දෙනවා, රුපියල් දසලක්ෂයක් දක්වා. ආබාධ සහිත පුද්ගලයෙකු ඉන්න අඩු ආදායම්ලාභී පවුල්වලට සනීපාරක්ෂක පහසුකම් ලබා දීම සඳහා රුපියල් එක්ලක්ෂ පනස්දාහක දීමනාවක් ලබා දෙනවා. ඊට අමතරව ආධාර උපකරණ ලබා දීම සඳහා කටයුතු කරනවා.

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ, සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ආබාධ සහිත පුද්ගලයින් සඳහා විශේෂ පුහුණුව ලබා දෙන පුහුණු මධ්‍යස්ථාන 10ක් තිබෙනවා. ඒ හරහා අධ්‍යාපනික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනවා.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම ඇතුළු සවිස්තරාත්මක පිළිතුර **සභාගත*** කරමි.

ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, බහුමාන දරිද්‍රතාව තුරන් කිරීම, එහෙම නැත්නම් දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහන යටතේ ඔබතුමාගේ අමාත්‍යාංශය විසින් සැලකිය යුතු ආකාරයකින් ජනතාවට අවශ්‍ය වන වැඩ පිළිවෙළක් හදලා, ප්‍රජා ශක්ති සංවර්ධන සභා හරහා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කටයුතු සූදානම් කර තිබෙනවා. ඒකෙදි ගමට ප්‍රතිපාදන වෙන්කරලා තිබෙනවා. ඒ වාගේම ජාතික වශයෙන් තවත් වැඩසටහන් බොහොමයක් ක්‍රියාත්මක කරන්න සැලසුම් කර තිබෙනවා. පුත්තලම දිස්ත්‍රික්කය තුළ මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගෙන ඇති ව්‍යාපෘති ප්‍රමාණය කොපමණද, ඒ සඳහා වැය වෙන මූල්‍යමය වටිනාකම කොපමණද කියන කාරණාවලට මම ඔබතුමාගෙන් පිළිතුරු දැනගන්න කැමැතියි.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, දිළිඳු බව තුරන් කිරීමේ "ප්‍රජා ශක්ති" වැඩසටහන සඳහා පසුගිය අය වැයෙන් රුපියල් මිලියන 25,000ක මුදලක් වෙන් කළා. ඒ රුපියල් මිලියන 25,000න් දිස්ත්‍රික් පදනමින් හඳුනා ගනු ලබන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය යටතේ රුපියල් මිලියන 23,000කුත්, ජාතික මට්ටමින් හඳුනා ගනු ලබන බහුමාන දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වූ ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 2,000කුත් වෙන් කළා. ඒ යටතේ, පුත්තලම දිස්ත්‍රික්කය සඳහා රුපියල් මිලියන 980.98ක් වෙන්කර තිබෙනවා, ප්‍රජා සංවර්ධන සභා මඟින් ග්‍රාම නිලධාරී මට්ටමින් හඳුනා ගනු ලබන බහුමාන දරිද්‍රතාව තුරන් කිරීම සඳහා සෘජුවම දායක වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා.

ගරු කථානායකතුමනි, එතුමාගේ අතුරු ප්‍රශ්නයේ දෙවැනි කොටසට පිළිතුර මෙයයි. අපනයන අභිමුඛ කර්මාන්ත, ආනයන ආදේශන කර්මාන්ත ඇතුළු කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළව පුත්තලම දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 68ක් මේ වෙනකොට ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම අපනයන භෝග වගාව ඇතුළුව කෘෂිකර්මය ආශ්‍රිත ව්‍යාපෘති 39ක් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම කරදිය, මිරිදිය සහ විසිතුරු මත්ස්‍ය වගාව ආශ්‍රිත ව්‍යාපෘති 54ක් ක්‍රියාත්මක

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

වෙනවා. ඊට අමතරව යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 251ක්, සත්ව පාලන ව්‍යාපෘති 126ක් සහ සංචාරක ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපෘති 09ක් ක්‍රියාත්මක වෙනවා. මේ විධියට තමයි පුත්තලම දිස්ත්‍රික්කය තුළ ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙන්නේ. මේ ව්‍යාපෘති සියල්ල මේ වර්ෂයේ දෙසැම්බර් 31වන දිනට පෙර අවසන් කිරීමට සැලසුම් කර තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු අජිත් ගිහාන් මහතා
(මාණ්පුමිකු අජිත් කිහාන්)
(The Hon. Ajith Gihan)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

ගරු අමාත්‍යතුමනි, එක් එක් categories විධියට ගත්තොත්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ඒ ප්‍රතිපාදන වෙන් වන විධිය, දිළිඳුකම තුරන් කරන්න සැලසුම් කර තිබෙන ප්‍රමාණය සහ ඒ ප්‍රතිපාදන පිළිබඳව ඔබතුමාගේ පිළිතුර ඉදිරිපත් කිරීමේදී සඳහන් කළා. ගරු අමාත්‍යතුමනි, මෙහිදී සමාජීය වශයෙන් තිබෙන තවත් ගැටලුවක් අපි දකිනවා. ඒ තමයි, වීදිවල ඉන්න යාචකයන්. අපි පාරේ යද්දී හැම තැනම, traffic lights ළඟ නැවැත්වුවත් ඒ යාචකයන් එක් එක් විධියට ඇවිල්ලා සිහමනේ යෙදෙනවා. එතැන ගැටලුවක් තිබෙනවා. අපි හලාවත නගරය ගත්තත්, ඒ නගරය තුළත් අපිරිසිදු කිරීම් කරනවා. ඒ වාගේම, නගරයේ රෑ, දවල් හැම මොහොතේම යාචකයන් රැඳී සිටිනවා. මේ යාචකයන් සම්බන්ධව තිබෙන වැඩ පිළිවෙළ කුමක්ද? සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා මෙයට යම් වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(මාණ්පුමිකු (කලානිති) උපාලි පන්නිලකේ)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නය විශේෂයෙන්ම යොමු කරන්නේ යාචකයින් සම්බන්ධයෙන්. දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව මේ සම්බන්ධයෙන් විෂය පථය අදාළ වන්නේ පළාත් සභාවලට, ගරු කථානායකතුමනි. ඉතින්, පළාත් සභාවල තිබෙන සමාජ සේවා අංශ මඟින් තමයි යාචකයින් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කරනු ලැබිය යුත්තේ. කෙසේ වෙතත්, දකුණු පළාත් සභාව යටතේ රිදියගම තිබෙනවා, යාචකයින් රඳවා තබා ගැනීමේ මෙවැනි මධ්‍යස්ථානයක්. ඒ මධ්‍යස්ථානය දැනට සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබනවා. විශේෂයෙන්ම අධිකරණමය ක්‍රියාමාර්ගයක් ඔස්සේ එවැනි මහ මහ සිහමන් යදින යාචකයන් පමණක් යොමු කරනු ලබනවා නම්, ඒ මධ්‍යස්ථානයේ රඳවා තබාගෙන පුනරුත්ථාපන කටයුතු කරලා නැවත සමාජයට මුදා හරින්න පුළුවන්. මොකද, දැනට අපි එහෙම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. දැනට මේ මධ්‍යස්ථානයේ පුද්ගලයන් 600කට පමණ ධාරිතාවක් තිබෙනවා. මේ වනකොට මුළු ධාරිතාවම වාගේ සම්පූර්ණ වෙලා තිබෙනවා. නමුත්, අපි මේ වනකොට අලුතින් ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරලා ලබන වර්ෂයේදී - 2027 වර්ෂයේදී - මෙහි ධාරිතාව තවදුරටත් වැඩි කිරීම සඳහා කටයුතු කරමින් ඉන්නවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කල්)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 2 -372/2025- (1), ගරු අජිත් පී. පෙරේරා මහතා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නාමල් කරුණාරත්න මහතා
(මාණ්පුමිකු නාමල් කරුණාරත්න)
(The Hon. Namal Karunaratne)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු දිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළైයිටප්පට්ටදු.
Question ordered to stand down.

"ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ ආරම්භ කරන ලද ඉදිකිරීම්: උතුරු මැද පළාත

"அருகிலுள்ள பாடசாலை - சிறந்த பாடசாலை" கருத்திட்டத்தின்கீழ் ஆரம்பிக்கப்பட்டுள்ள நிர்மாணப் பணிகள்: வட மத்திய மாகாணம்

CONSTRUCTIONS INITIATED UNDER "THE NEAREST SCHOOL-THE BEST SCHOOL" PROJECT: NORTH CENTRAL PROVINCE

685/2025

4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහණ බණ්ඩාර මහතා වෙනුවට)
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක - මාණ්පුමිකු රෝහණ පණ්ඩාර සාර්පාග)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rohana Bandara)

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාතේ රජයේ පාසල්වල ආරම්භ කර ඇති ඉදිකිරීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘති පිළිබඳ විස්තර කවරේද;

(iii) මේ වනවිට එම ව්‍යාපෘති අතරින් අතරමග නතරවී ඇති ව්‍යාපෘති සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(iv) එම ව්‍යාපෘති සඳහා වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(v) එම ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) "அருகிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை" என்ற கருத்திட்டத்தின்கீழ் வட மத்திய மாகாணத்தின் அரசாங்கப் பாடசாலைகளில் ஆரம்பிக்கப்பட்டுள்ள நிர்மாணப் பணிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டங்கள் பற்றிய விபரங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி கருத்திட்டங்களில் தற்போது இடைநடுவே நிறுத்தப்பட்டுள்ள கருத்திட்டங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி கருத்திட்டங்களுக்காகச் செலவிடப் பட்டுள்ள நிதி எவ்வளவு என்பதையும்;

(v) மேற்படி கருத்திட்டங்களின் பணிகளை நிறைவு செய்வதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of construction projects that have been initiated in government schools in the North Central Province under "The Nearest School - The Best School" Project;

(ii) the details of the said projects;

(iii) the number and names of the projects which have been halted midway, out of the said projects at present;

(iv) the total expenditure incurred on the said projects; and

(v) the measures that will be taken to complete those unfinished projects?

(b) If not, why?

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පාසල්වල නව ඉදිකිරීම් - 208

(ii)

ඉදිකරන ලද ගොඩනැඟිලි පිළිබඳ විස්තරය	පළාත් පාසල්වල ඉදිකර ඇති සංඛ්‍යාව	ජාතික පාසල්වල ඉදිකර ඇති සංඛ්‍යාව	එකතුව
පන්ති කාමර ගොඩනැඟිලි	29	02	31
ගුරු නිවාස	27	03	30
විදුහල්පති නිවාස	24	01	25
ප්‍රාථමික ද්විතියික විද්‍යාගාර	24	-	24
ප්‍රාථමික ඉගෙනුම් මධ්‍යස්ථාන	55	-	55
තාක්ෂණ ඒකක	26	-	26
සෞන්දර්ය ඒකක	04	01	05
ආපනශාලා	06	-	06
දන්ත සෞඛ්‍ය මධ්‍යස්ථාන	03	-	03
ක්‍රීඩාගාර	02	01	03
එකතුව	200	08	208

(iii) ව්‍යාපෘති 05කි.

01. අ/තන්තිරිමලේ විමලඥාණ විද්‍යාලයේ තාක්ෂණ ගොඩනැඟිල්ල

02. අ/හබරණ මහා විද්‍යාලයේ සෞන්දර්ය ගොඩනැඟිල්ල

03. අ/ගලෙන්බිඳුණුවැව මහා විද්‍යාලයේ ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය

04. අ/විවේකානන්ද දෙමළ විද්‍යාලයේ ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය

05. අ/තිරප්පනේ මහානාම විද්‍යාලය ක්‍රීඩාපිටිය සහ ශාරීරික යෝග්‍යතා මධ්‍යස්ථානය

(iv) රුපියල් මිලියන 63.70කි.

(v) මෙම ව්‍යාපෘති 5හි ඉතිරි වැඩ නිම කිරීම සඳහා පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව ඇස්තමේන්තු සකස් කරමින් පවතින බවත් මෙම වසර තුළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන බවත් උතුරු මැද ප්‍රධාන ලේකම් විසින් වාර්තා කර ඇත.

(ආ) අදාළ නොවේ.

ජලාපවහන පද්ධති ප්‍රතිසංස්කරණය/ ස්ථාපිත කිරීම: කාත්තන්කුඩි නගර සීමාව

வடிகாலமைப்புத் தொகுதிகளை மறுசீரமைத்தல்/ புதிதாக நிறுவுதல்: காத்தான்குடி நகர எல்லைப்பகுதி

RENOVATED/ NEWLY ESTABLISHED DRAINAGE SYSTEMS: KATTANKUDY URBAN LIMITS

905/2025

6. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Dr.) M.L.A.M. Hizbullah)

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කාත්තන්කුඩි නගර සීමාවට අයත් ප්‍රදේශවල සහ ඒ ආශ්‍රිත ප්‍රදේශවල ප්‍රතිසංස්කරණය කළ යුතු සහ අලුතින් ස්ථාපිත කළ යුතු ජලාපවහන පද්ධති පවතින බව දන්නේද;

(ii) පවතින ජලාපවහන පද්ධති ප්‍රතිසංස්කරණය කිරීමට සහ නව ජලාපවහන පද්ධති ස්ථාපිත කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காத்தான்குடி நகர எல்லைக்குட்பட்ட பிரதேசங் களிலும் அதனை அண்டிய பிரதேசங்களிலும் மறுசீரமைக்கப்பட வேண்டியதும் புதிதாக நிறுவப்பட வேண்டியதுமான வடிகாலமைப்புத் தொகுதிகள் காணப்படுவதை அறிவாரா என்பதையும்;

(ii) தற்போதுள்ள வடிகாலமைப்புத் தொகுதிகளை மறுசீரமைக்கவும், புதிய வடிகாலமைப்புத் தொகுதிகளை நிறுவவும் நடவடிக்கைகள் எடுக்கப்படுமா என்பதையும்;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iii) ஆமெனில், அதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House -

(i) whether he is aware that there are drainage systems which need to be renovated and to be newly established in the areas belonging to the Kattankudy urban limits and its surrounding areas;

(ii) whether actions will be taken to renovate the existing drainage systems and to establish new drainage systems; and

(iii) if so, the steps that will be taken for that purpose?

(b) If not, why?

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ක්‍රියාත්මක හා නඩත්තු කටයුතු (O&M) සිදු කරනු ලබන අපජල කළමනාකරණ පද්ධති (Wastewater/ Sewage Management Systems) කාත්තන්කුඩි නගර සීමාව සහ ඒ ආශ්‍රිත ප්‍රදේශවල නොමැත. එම ප්‍රදේශයේ සහ ඊට යාබද ප්‍රදේශවල දැනට අපජලය කළමනාකරණය සිදු වන්නේ septic tank, soakage pit වැනි ස්ථානීය සනීපාරක්ෂක පද්ධති (Onsite Sanitation Systems) සහ විමධ්‍යගත අපජල කළමනාකරණ පද්ධති (Decentralized Wastewater Management Systems - DEWATS) මඟිනි.

ඉහත සඳහන් කරන ලද දැනට පවතින ස්ථානීය සනීපාරක්ෂණක පද්ධති සහ DEWATSවල ක්‍රියාත්මක හා නඩත්තු කටයුතු (O&M) සිදු කරගත යුත්තේ එම පද්ධති පිහිටා ඇති පරිශ්‍රවල හිමිකරුවන් විසිනි. තවද, එම අපජල කළමනාකරණය පිළිබඳ වගකීම අදාළ පළාත් පාලන ආයතන (Local authorities - PS/UC/MC) සතු වේ.

(ii) දැනට පවතින අපජල පිරිපහදු පද්ධති ප්‍රතිසංස්කරණය කිරීමට හෝ නව අපජල කළමනාකරණ පද්ධති ස්ථාපනය කිරීම සම්බන්ධව ජතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට වාර්තා වී නොමැත.

නාගරික අපජලය තිරසාරව කළමනාකරණ කිරීම සඳහා මධ්‍යගත අපජල කළමනාකරණය කිරීමේ පද්ධතියක් (Centralized/ Municipal Wastewater Management System) අවශ්‍ය වේ. නල මඟින් අපජලය එකතු කර, පිරිපහදුවකට ලක්කොට ආරක්ෂිතව බැහැර කිරීමේ ව්‍යාපෘතියක් (Wastewater Collection, Treatment and Disposal Project) කාත්තන්කුඩි ප්‍රදේශය සඳහා අලුතින් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් හඳුනාගෙන ඇත. නමුත්, වර්ෂ 2011 පමණ කාත්තන්කුඩි ප්‍රදේශය සඳහා අපජල එකතු කොට, බැහැර කිරීමේ පද්ධතියක් ඉදිකිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යෝජනා කර ඇතත්, අරමුදල් නොමැති නිසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

(iii) කාත්තන්කුඩි ප්‍රදේශයේ අපජල කළමනාකරණය තිරසාරව සිදු කිරීමට නව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකොට ව්‍යාපෘති වාර්තාවක් සකස් කළ යුතුව ඇත. ඉන්පසුව ව්‍යාපෘතියට අදාළ අනුමැතීන් ලබා ගැනීම සිදු කළ යුතුය. අරමුදල් තහවුරු වූ විට, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මැදිහත් වීමෙන් ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

(ආ) අදාළ නොවේ.

ඉන්ධන ප්‍රවාහනය සඳහා ලියාපදිංචි වී ඇති බවුසර් හිමිකරුවන්: විස්තර
எரிபொருள் ஏற்றிச்செல்வதற்காகப் பதிவு செய்யப்பட்டுள்ள பவுசர் உரிமையாளர்கள்: விபரம்
BOWSER OWNERS REGISTERED FOR FUEL TRANSPORT: DETAILS

988/2025

7. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු කිංස් නෙල්සන් මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு கிங்ஸ் நெல்சன் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Kins Nelson)

බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව මේ වනවිට ඇති ඉන්ධන ප්‍රවාහන බවුසර් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) ඉන්ධන ප්‍රවාහන කටයුතු සඳහා සංස්ථාව යටතේ ලියාපදිංචි වී ඇති බවුසර් රථ හිමිකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම බවුසර් රථ හිමියන්ගේ හෝ සමාගම්වල නම් සහ ලිපින කවරේද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉන්ධන ප්‍රවාහනය වෙනුවෙන් බවුසර් රථ හිමියන්ට ගෙවීම් සිදු කරන ක්‍රමවේදය කවරේද;

(v) එම කාලසීමාව තුළ ඉන්ධන ප්‍රවාහනය වෙනුවෙන් බවුසර් රථ හිමියන්ට ගෙවන ලද මුදල් ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ඉන්ධන ප්‍රවාහනය සඳහා දුම්රිය වැනි රාජ්‍ය අංශයේ ප්‍රවාහන සේවා වැඩි වශයෙන් භාවිතා කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனத்திடம் தற்போதுள்ள எரிபொருள் பவுசர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) எரிபொருள் ஏற்றிச்செல்வதற்காக கூட்டுத்தாபனத் தின்கீழ் பதிவு செய்யப்பட்டுள்ள பவுசர் உரிமையாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) මේற்படி பவுசர் உரிமையாளர்கள் அல்லது நிறுவனங்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை என்பதையும்;

(iv) 2015ஆம் ஆண்டு முதல் இதுவரை எரிபொருள் போக்குவரத்துக்காக பவுசர் உரிமையாளர் களுக்குக் கொடுப்பனவுகளை மேற்கொள்ளும் நடைமுறை யாது என்பதையும்;

(v) மேற்படி காலப்பகுதியினுள் எரிபொருள் போக்குவரத்துக்காக பவுசர் உரிமையாளர் களுக்குச் செலுத்தப்பட்ட பணத் தொகை ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(vi) எரிபொருள் போக்குவரத்துக்காகப் புகையிரதம் போன்ற அரச துறைப் போக்குவரத்துச் சேவைகளை அதிகளவில் பயன்படுத்துவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) the number of fuel transport bowsers currently owned by the Ceylon Petroleum Corporation;

(ii) the number of bowser owners registered under the Corporation for transportation of fuel;

(iii) the names and addresses of the said bowser owners or companies;

(iv) the method by which payments are made to bowser owners for fuel transportation from 2015 to date;

(v) separately, the amounts of annual payments made to bowser owners for fuel transportation during that period; and

(vi) the measures that will be taken to increase the use of public sector transport services such as railways for the transportation of fuel?

If not, why?

ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඉන්ධන ප්‍රවාහනය කරනු ලබනුයේ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්තය විසිනි. ඒ අනුව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සතුව පවතින ඉන්ධන ප්‍රවාහන බවුසර් රථ සංඛ්‍යාව 127කි.

(ii) ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම යටතේ ලියාපදිංචි වී ඇති බවුසර් හිමිකරුවන් සංඛ්‍යාව 377කි.

(iii) අදාළ විස්තර ඇමුණුම 01හි** දක්වා ඇත.

(iv) පුද්ගලික බවුසර් රථ මඟින් සිදුකෙරෙන ප්‍රවාහන සේවා සඳහා වන ගෙවීම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම යන ආයතන මඟින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රවාහන ගාස්තු මත පදනම්ව, ගමන් කරන දුර (කි.මී) සහ බවුසරයේ ධාරිතාව සැලකිල්ලට ගනිමින් ගෙවිය යුතු ගාස්තු ගණනය කරනු ලැබේ. ඉන්ධන මිලෙහි සිදුවන වෙනස්කම්වලට අනුකූලව මෙම ගාස්තු සංශෝධනය කෙරෙන අතර, පවතින මෙහෙයුම් පිරිවැය පිළිබිඹු වන පරිදි ඒවා වරින්වර සමාලෝචනය කරනු ලබයි.

(v) අදාළ විස්තර ඇමුණුම 02හි දැක්වේ. එය පහත පරිදි වේ.

Hired Bowser Transport Payment
Summary from 2015 to Sep. 2026

Year	Transport Payment (Rs)
2015	2,007,400,181
2016	2,192,097,266
2017	2,479,394,379
2018	2,731,168,596
2019	2,949,847,653
2020	2,646,458,991
2021	2,829,147,525
2022	3,914,870,523
2023	5,476,492,273
2024	6,282,788,958
2025	6,494,444,043
2026- September	5,414,844,516
Total	45,418,954,904

(vi) ඉන්ධන බෙදාහැරීමේ තොග ගබඩා 11න් වර්තමානයේදී තොග ගබඩා 6ක් සඳහා දුම්රිය මඟින් තෙල් ප්‍රවාහනය කරනු ලබයි. එය මුළු තෙල් ප්‍රමාණයෙන් සියයට 25-සියයට 35 වන අතර, එම ප්‍රමාණය සියයට සියය දක්වා වර්ධනය කර ගැනීමට පහත සඳහන් ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.

1. නව ඉන්ධන බෝගී එකතු කිරීම සහ ආනයනය කිරීම

   මෙම තොග ගබඩාවන්ගේ දෛනික අවශ්‍යතාව සපුරාලීම පිණිස ප්‍රමාණවත් පරිදි දුම්රිය වැගන් සමඟ එන්ජින් කට්ටල සැපයීම මඟින් ඉන්ධන ප්‍රවාහන ධාරිතාව වැඩිකිරීම.

2. දුම්රිය මාර්ග සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

   ඒ ඒ මාර්ගවල ඉන්ධන රැගත් බර දුම්රිය ආරක්ෂිතව වේගයෙන් ධාවනය කළ හැකි පරිදි මාර්ග පද්ධතිය, සංඥා පද්ධතිය, රේල් පීලි අලුත්වැඩියා කටයුතු සහ නවීකරණ කටයුතු මඟින් ප්‍රවාහන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අනුර කරුණාතිලක මහතා]

3. ලංකා බනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සහ දුම්රිය දෙපාර්තමේන්තුව අතර ඒකාබද්ධ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම

ආයතන දෙක අතර සම්බන්ධීකරණය ශක්තිමත් කරමින්, දුම්රිය ගමන් කාලසටහනට අනුව පිරවීම් කටයුතු සැලසුම් කර ඉන්ධන බෙදා හැරීම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.

4. නවීන ක්‍රම භාවිත කිරීම පිණිස ස්වයංක්‍රීය පද්ධති හඳුන්වාදීම

ලංකා බනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වෙතින් ඉන්ධන පිරවීමේ සහ ඉවත් කිරීමේ කටයුතුවලදී කාලය නාස්තිවීම වළක්වා ගැනීමේ අරමුණින් නවීන ක්‍රම භාවිත කිරීම පිණිස ස්වයංක්‍රීය පද්ධති හඳුන්වා දීමට දැනටමත් අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත.

5. විශේෂිත කාලසටහන්

මගී ප්‍රවාහන දුම්රිය ගමන්වලට බාධාවක් නොවන පරිදි රාත්‍රී කාලයේ සහ මාර්ග තදබදය අවම වේලාවන්හිදී ඉන්ධන දුම්රිය ගමන් ක්‍රියාත්මක කිරීමට වෙනම කාලසටහන් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

6. ප්‍රමුඛතා ප්‍රතිපත්තියක් සැකසීමෙන්

කිලෝමීටර 100ට වැඩි දුර දුම්රියෙන් ඉන්ධන ප්‍රවාහනය කිරීම සඳහා රජයේ ප්‍රතිපත්තියක් බවට දැඩිව ක්‍රියාත්මක කිරීම.

7. පිරිවැය වාසිදායක මිල ක්‍රමයක් හඳුන්වා දීමෙන්

දුම්රිය ප්‍රවාහන ගාස්තු, ටැංකි රථ ප්‍රවාහන පිරිවැයට වඩා ආර්ථිකමය වාසිදායක මට්ටමක පවත්වා ගනිමින් අපගේ ආයතනයට මෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුවටද ලාභදායක මූල්‍යමය ආකෘතියක් සැකසීම.

ඉහත සඳහන් කරුණු අනුව වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම මඟින් මාර්ගවල තදබදය සහ අනතුරු අඩුකර ගනිමින් ප්‍රවේශම් සහගතව අඩු වියදමකින් රට පුරා ඉන්ධන බෙදා හැරීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කළ හැකිය.

(ආ) අදාළ නැත.

විශේෂ කාර්ය බලකා කඳවුර ස්ථාපිත කර ඇති මඩකලපුව තාණ්ඩියඩිහි පිහිටි ඉඩම: විස්තර

மட்டக்களப்பு, தாண்டியடியில் விசேட அதிரடிப்படை முகாம் அமைந்துள்ள நிலம்: விபரம்

LAND OCCUPYING SPECIAL TASK FORCE CAMP IN THANDIYADI, BATTICALOA: DETAILS

1496/2025

8. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා වෙනුවට)

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் சார்பாக)

(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, වවුනතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තාණ්ඩියඩි ගම්මානයේ පිහිටි සුසාන භූමියෙහි විශේෂ කාර්ය බලකායට අයත් කඳවුරක් ස්ථාපිත කර ඇති බව පිළිගන්නේද;

(ii) එම සුසාන භූමියේ මිහිදන් කර ඇති පුද්ගලයන් වෙනුවෙන් ඥාතීන් විසින් පවත්වනු ලබන අනුස්මරණ වැඩසටහන් සඳහා අනුමැතිය ලබා දීම ප්‍රතික්ෂේප කර තිබේද;

(iii) 2025.08.13වන දින මඩකලපුවේදී පැවැති විශේෂ සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී අදාළ ස්ථානය නිරීක්ෂණය කර අනුස්මරණ කටයුතු සඳහා එම භූමියෙන් කොටසක් වෙන් කිරීම සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශයට අනුකූලව මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඉදිරියේදී අදාළ සුසාන භූමිය තුළ අනුස්මරණ වැඩසටහන් පැවැත්වීමට ඥාතීන්ට අවස්ථාව ලබා දෙන්නේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මඩකලපුව උතුර අධ්‍යාපන කලාපයට අයත් තාණ්ඩියඩි රජයේ දෙමළ මිශ්‍ර පාසලේ ක්‍රීඩාංගණය මේ වන විට විශේෂ කාර්ය බලකා කඳවුරු පරිශ්‍රයට ඇදාගෙන තිබේද;

(ii) පාසල් සිසුන්ගේ සහ පාසලේ කටයුතු වෙනුවෙන් එම ක්‍රීඩාංගණය නැවත පාසල වෙත මුදා හැරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද; යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தின் வவுணதீவு பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட தாண்டியடி கிராமத்தில் அமைந்துள்ள மயானத்தில் விசேட அதிரடிப் படையினருக்குச் சொந்தமான முகாமொன்று நிறுவப்பட்டுள்ளதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(ii) மேற்படி மயானத்தில் அடக்கம் செய்யப் பட்டுள்ளவர்களின் உறவினர்களால் நடத்தப் படும் நினைவேந்தல் நிகழ்வுகளுக்கு அனுமதி மறுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) 2025.08.13ஆந் திகதி மட்டக்களப்பில் நடைபெற்ற விசேட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில், குறித்த இடத்தைக் கண்காணித்து நினைவேந்தல் நிகழ்வுகளை நடத்துவதற்காக அம்மயான பூமியின் ஒரு பகுதியை ஒதுக்குவது தொடர்பாக வெளியிடப்பட்ட அறிவிப்புக்கு அமைவாக இதுவரை மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) இனிவரும் காலங்களில் குறித்த மயானத்தில் நினைவேந்தல் நிகழ்வுகளை நடத்துவதற்காக உறவினர்களுக்கு சந்தர்ப்பம் வழங்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மட்டக்களப்பு வடக்கு கல்வி வலயத்துக்குட்பட்ட தாண்டியடி அரசினர் தமிழ்க் கலவன் பாடசாலையின் விளையாட்டு மைதானம், தற்போது விசேட அதிரடிப் படையினரின் முகாம் வளாகத்துடன் இணைக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) பாடசாலை மாணவர்களினதும், பாடசாலை யினதும் நடவடிக்கைகளுக்காக மேற்படி விளையாட்டு மைதானத்தை மீண்டும் பாடசாலையிடம் ஒப்படைப்பதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) whether he accepts that a camp belonging to the Special Task Force has been established in the cemetery situated in the Thandiyadi village belonging to the Vavunativu Divisional Secretary's Division in the Batticaloa District;

(ii) whether permission has been denied to hold commemoration programmes conducted by relatives in memory of the persons buried in the said cemetery;

(iii) the measures taken up to now in accordance with the statement made at the Special Coordinating Committee meeting held on 13.08.2025 in Batticaloa regarding the inspection of the relevant site and the allocation of a portion of the said land for commemoration activities; and

(iv) whether relatives will be granted the opportunity to hold commemoration programmes within the relevant cemetery in the future?

(b) Will he also inform this House -

(i) whether the playground of the Thandiyadi Government Tamil Mixed School belonging to the Batticaloa North Education Zone, has currently been annexed to the Special Task Force camp premises; and

(ii) the measures taken to release the said playground back to the school for the benefit of the students and school activities?

(c) If not, why?

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත.

- මඩකලපුව දිස්ත්‍රික්කයේ වවුනතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට (මන්මුනේ බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට) අයත් තාණ්ඩියඩි මුරුගන් කෝවිලට දකුණු පසින් වවුනතිව් පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර ස්ථාපිත කර ඇති අතර, මෙම කඳවුර 2007.04.08 දින ආරම්භ කර ඇත.

- මෙම ඉඩම ප්‍රාදේශීය ලේකම්වරයා විසින් මන්මුනේ බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුලුමණ්ඩපත්තඩි 149 E ග්‍රාම නිලධාරී වසමේ පිහිටි භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 1.1850ක් වූ රජයේ ඉඩම් අංක PP/මඩ/2595 දරන පිඹුර මඟින් හා අංක DS/MW/LAN/HO/13 දරන ලිපිය මඟින් විශේෂ කාර්ය බලකාය වෙත පවරා දී ඇති අතර, මෙම කඳවුරු භූමිය තුළ සුසාන භූමියක් හෝ පුද්ගලයන් මිහිදන් කළ ස්ථානයක් පවතින බවට මෙතෙක් අනාවරණය වී නොමැත.

(ii) පැන නොනඟී.

(iii) නීත්‍යානුකූලව විශේෂ කාර්ය බලකාය වෙත කඳවුර පිහිටි භූමිය ස්ථිරව පවරා දී ඇති බැවින් ඉන් කොටසක් වෙන් කර දීමක් සිදු කර නැත.

(iv) පැන නොනඟී.

(ආ) (i) නැත.

(ii) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

දේශීය ඇන්තූරියම් වගාකරුවන්: ලබා දී ඇති පහසුකම්
உள்நாட்டு அந்தூரியம் பயிர்ச்செய்கையாளர்கள்: வழங்கப்பட்டுள்ள வசதிகள்
DOMESTIC ANTHURIUM GROWERS: FACILITIES PROVIDED

1669/2025

9. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චාමර සම්පත් දසනායක මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Chamara Sampath Dasanayake)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දේශීය ඇන්තූරියම් වගාකරුවන් ලෙස ලියාපදිංචි වී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඇන්තූරියම් වගාව සඳහා ඔවුන්ට රජය විසින් පහසුකම් සපයන්නේද;

(iii) එසේ නම්, එම පහසුකම් කවරේද;

(iv) දේශීය වගාකරුවන්ට අමතරව ඇන්තූරියම් මල් ආනයනය කිරීම සඳහා වෙනත් පාර්ශ්ව සඳහා අවසර ලබා දී තිබේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

සුබෝධාඩල් අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) උළුනාට්ටු අන්තූරියම් පයිර්ච්චෙය්කෙයාළර් කළාකප් පතිවු චෙය්යප්පට්ටුළ්ළ නපර්කළින් එණ්ණික්කෙ යාතු එන්පතෙයුම්;

(ii) අන්තූරියම් පයිර්ච්චෙය්කෙයින් පොරුට්ටු අරචාංකම් අවර්කළුක්කු වචතිකළෙ වළංකුකින්රතා එන්පතෙයුම්;

(iii) ආමෙනිල්, අන්ත වචතිකළ් යාවෙ එන්පතෙයුම්;

(iv) උළුනාට්ටුප් පයිර්ච්චෙය්කෙයාළර්කළුක්කු මේලතිකමාක වේරු තරප්පිනරුක්කු අන්තූරියම් පූක්කළෙ ඉරක්කුමති චෙය්වතර්කු අනුමති වළංකප්පට්ටුළ්ළතා එන්පතෙයුම්;

අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ආ) ඉන්රේල්, ඒන්?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the number of individuals registered as domestic anthurium growers;

(ii) whether the Government provides them with facilities for growing anthurium;

(iii) if so, such facilities; and

(iv) whether permission has been granted to other parties other than domestic growers to import anthurium flowers?

(b) If not, why?

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක "සුවහස් මල් වගා" වැඩසටහන යටතේ 2022 වර්ෂය වන විට දිවයින පුරා ලියාපදිංචි වී ඇති සමස්ත මල් වගාකරුවන් සංඛ්‍යාව 10,698කි. මෙම ලියාපදිංචි දත්ත ප්‍රධාන වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ මල් වගාකරුවන් ආවරණය කරයි. එබැවින් මෙම සංඛ්‍යාව ශ්‍රී ලංකාවේ මල් වගාවේ නිරත සියලුම වාණිජ වගාකරුවන්ගේ සමස්ත සංඛ්‍යාව ලෙස සැලකිය නොහැක.

(ii) ඔව්.

ප්‍රධාන වශයෙන් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව මඟින් 2005 වර්ෂයේදී ආරම්භ කරන ලද "සුවහස් මල් වගා" වැඩසටහන හරහා ඇන්තූරියම් ඇතුළු මල් වගාකරුවන්ගේ වගා කටයුතු, නිෂ්පාදන ගුණාත්මකභාවය සහ තාක්ෂණික දැනුම වර්ධනය කිරීම සඳහා විවිධ පහසුකම් හා සේවා සපයනු ලැබේ.

(iii) ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව මඟින් සපයනු ලබන පහසුකම්:

1. වගාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ සැපයීම.

වගාකරුවන්ගේ වගා පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ ලබා දීම සිදු කරනු ලැබේ. ඒ අතර,

- සෙවණ දැල් (Shade nets) - සියයට 70 හෝ සියයට 80 සෙවණ දැල්
- බඳුන් සහ අනෙකුත් වගා බහලුම් (ප්ලාස්ටික් පෝච්චි, පොලිතීන් බඳුන්, ජල විසිරුම් බඳුන්, මල් බාල්දි, සෙකටියර්, ප්ලාස්ටික් කූඩ ආදිය)
- සුවහස් මල් වගා සමිති මට්ටමින් ප්‍රදර්ශන හා ප්‍රවර්ධන කටයුතු සඳහා කැනොපි හට පහසුකම් (අඩි 10x10 ප්‍රමාණයේ වර්ගඵලය සහිත කුටි) ප්‍රධාන වේ.

2. න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලබා දීම.

ඇන්තූරියම් ඇතුළු මල් වගාව සම්බන්ධයෙන් වගාකරුවන්ගේ තාක්ෂණික දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා,

- න්‍යායාත්මක පුහුණු වැඩසටහන්,
- ප්‍රායෝගික පුහුණු වැඩසටහන්,
- වගා තාක්ෂණය හා නව තාක්ෂණික ක්‍රම පිළිබඳ දැනුවත් කිරීම,
- පැළ නඩත්තුව හා කළමනාකරණය,
- පළිබෝධ හා රෝග කළමනාකරණය,
- ගුණාත්මක නිෂ්පාදන ලබා ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම සිදු කරනු ලැබේ.

3. තවාන් පරීක්ෂා කිරීම හා තාක්ෂණික උපදේශන සේවා

වගාකරුවන්ගේ තවාන් සහ වගා ඒකක පරීක්ෂා කර වගා තත්ත්වය, පැළවල වර්ධනය, රෝග හා පළිබෝධ තත්ත්වයන් සහ අනෙකුත් වගා ගැටලු හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා මාර්ගෝපදේශ ලබා දීම සිදු කරනු ලැබේ.

4. ගුණාත්මක මව් ශාක සහ රෝපණ ද්‍රව්‍ය ලබා දීම.

ඇන්තූරියම් වගාවේ ගුණාත්මකභාවය සහ නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා ගුණාත්මක මව් ශාක සහ සුදුසු රෝපණ ද්‍රව්‍ය වගාකරුවන් වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ. මේ මඟින් වගාකරුවන්ට ගුණාත්මක හා වෙළෙඳ පොළ ඉල්ලුමට සරිලන ඇන්තූරියම් පැළ හා මල් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය මූලික රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීමට අවස්ථාව සැලසේ.

ඒ අනුව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ "සුවහස් මල් වගා" වැඩසටහන මඟින් ඇන්තූරියම් වගාකරුවන් සඳහා වගා ද්‍රව්‍ය සැපයීම, පුහුණුව, තාක්ෂණික උපදේශන, තවාන් පරීක්ෂාව සහ ගුණාත්මක මව් ශාක හා රෝපණ ද්‍රව්‍ය සැපයීම ඇතුළු සේවාවන් ලබා දෙමින් වාණිජ ඇන්තූරියම් වගාව ප්‍රවර්ධනය කිරීමට දායක වේ.

(iv) දේශීය ඇන්තූරියම් වගාකරුවන්ගේ නිෂ්පාදනය මඟින් දේශීය අවශ්‍යතාව සැපිරිය හැකි බැවින්, කැපුම් මල් (Cut Flowers) ලෙස ඇන්තූරියම් මල් ආනයනය කිරීම සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය ලබා දීම සාමාන්‍යයෙන් සිදු කරනු නොලැබේ.

ඔව්.

(ආ) අදාළ නොවේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමාව තවම ගෙනැල්ලා නැහැ. ඒ නිසා එතුමාට දැන් අහන්න විධියක් නැහැ නේ, එතුමාගේ ප්‍රශ්නය. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, එතුමාව උදේ ගේන්න නිබුණා. නමුත් තවම ගෙනැල්ලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ, එතුමා අද උදේ- *[බාධා කිරීම්]*

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා හරියට කරුණු දැනගෙන කථා කරන්න. *[බාධා කිරීම්]* එතුමා ඉන්නවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කොහේද ඉන්නේ? *[බාධා කිරීම්]* හිරේ, හිරේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා. *[බාධා කිරීම්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92(2) "රීති ප්‍රශ්න" (ආ) අනුව මට ප්‍රශ්න කරන්න ඕනෑ, ස්ථාවර නියෝග 31හි සඳහන්, "ප්‍රශ්න" පිළිබඳව. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සාමාන්‍ය සම්ප්‍රදාය තමයි, මන්ත්‍රීවරු මේ ප්‍රශ්න Table Office එකට ගිහින් බාරදෙන එක. මන්ත්‍රීවරු ප්‍රශ්න 10ක්, 15ක් විතර ගිහින් දෙනවා. එතකොට අපට කාලීන ප්‍රශ්න අහන්න බැරි වෙනවා. මොකද, ප්‍රශ්න බාර දුන්නාට පසුව Table Office එකෙන් ඒ ප්‍රශ්නවලට අදාළව 1, 2, 3 ආදි වශයෙන් යොදනවා. හැබැයි මම ඊයේ දිනයේදී දැක්කා, ආණ්ඩු පක්ෂයෙන් විතරක් කාලීන ප්‍රශ්න ඇහෙන බවක්. ඒ ගැන මම සොයා බැලුවා, අද උදේ කථා කරන කොට. ඒ මන්ත්‍රීතුමන්ලා මේ සතියේ ප්‍රශ්න බාර දීලා නැහැ. ඒ කියන්නේ, එතුමන්ලා මේ සතියේ Table Office එකට ප්‍රශ්න බාර දීලා නැහැ. අද පාර්ලිමේන්තු කටයුතු අවසන් වුණාම ගිහිල්ලා ලබන රැස්වීම් සතියට අවශ්‍ය ප්‍රශ්න බාර දෙනවා. එතකොට ඒක වෙනම වරප්‍රසාදයක්. ඒ නිසා ඒ වරප්‍රසාදය විපක්ෂයේ අපටත් ලබා දෙන්න. අපි ප්‍රශ්න බාර දීලා තිබුණා. මම මේ කියන දේ අහලා හොඳට තේරුම් අරගෙන උත්තරයක් දෙන්න.

ප්‍රශ්න බාර දුන්නාට පසුව ඒ ප්‍රශ්නවලින් එක එක න්‍යාය පත්‍රයට ඇතුළත් කරනවා. සාමාන්‍යයෙන් කරන්නේ ඒකයි. හැබැයි අප දාලා තිබෙන ප්‍රශ්න සමහර විට කාලීන ප්‍රශ්න වෙන්නේ නැහැ, අපි ඒවා කලින් බාර දීලා තිබෙන නිසා. නමුත්, ගිය සතියේ සමාජයේ වෙච්ච ප්‍රශ්නයක් ගැන මන්ත්‍රීවරයෙක් මේ සතියේ අහනවා ඊයේ මම දැක්කා. ඒක හොඳයි. ඒක තමයි වෙන්න ඕනෑ. ඒක හරිම සාධාරණයි. ඒ නිසා ආණ්ඩු පක්ෂයට තිබෙන ඒ වරප්‍රසාදය විපක්ෂයටත් දෙන්න කියලා මම ඔබතුමාට යෝජනා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන ඔය කාරණය සම්බන්ධයෙන් මම සොයා බලන්නම්. ලේකම් මණ්ඩලයට යොමු කරලා, ඒ සම්බන්ධයෙන් මම සොයා බලන්නම්, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපි ඒ චෝදනාව සහමුලින්ම ප්‍රතික්ෂේප කරනවා. පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයට කිසිදු ආකාරයේ වරප්‍රසාදයක් ලබා දීලා නැහැ. ඒ නිසා එතුමා කරුණු තෝරාගෙන කථා කරන්න ඕනෑ. මම හිතනවා, ඒ ගැන පැහැදිලි කරන්න ලේකම් මණ්ඩලයට පුළුවන් කියලා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මෙතුමා විතරයි කරුණු දන්නේ. *[බාධා කිරීම්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි කිසිසේත් එවැනි වරප්‍රසාදයක් අරගෙන නැහැ. [බාධා කිරීමක්] ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා,- [බාධා කිරීමක්]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක කථානායකතුමාගේ කාර්යයක්. *[බාධා කිරීම්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඉතින් මම උත්තර දෙන්න ඕනෑ, ආණ්ඩු පක්ෂය පැත්තෙන්. *[බාධා කිරීමක්]* ඒක එතුමාගේ වැඩේ. ගරු කථානායකතුමනි, ඒ නිසා ආණ්ඩු පක්ෂය විධියට අපි වගකීමෙන් කියනවා, අපට එහෙම වරප්‍රසාදයක් පාර්ලිමේන්තුව දීලා නැති බව. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම් මණ්ඩලය මාව දැනුවත් කරනවා, Table Office එක - [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා, ඇහුම්කන් දෙන්න. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ඒ චෝදනාව Table Office එක සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන බව ලේකම් මණ්ඩලය මට දැනුම් දුන්නා. [බාධා කිරීමක්]

මීළඟට, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා. *[බාධා කිරීමක්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එතුමා එක්ක කථා කරපු recording එක දමන්නද? ඒක record වෙලා තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
කාලය කන්න දෙන්න එපා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීමක්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට දැන් උත්තරය දීලා ඉවරයි. නැවත නැවත ඒක ඇදගන්න බැහැ. මේක විවාදයක් නොවෙයි. *[බාධා කිරීමක්]* ගරු විපක්ෂ නායකතුමා ඔබතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කරන්න පුළුවන්. *[බාධා කිරීමක්]* ප්‍රශ්නය ඉදිරිපත් කරන්න, ගරු විපක්ෂ නායකතුමා. *[බාධා කිරීමක්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මම දැන් කථා කළා, Table Office එකට. ඒ recording එක මා ළඟ තිබෙනවා. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය ඉදිරිපත් කරන්න, ගරු විපක්ෂ නායකතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

2026 අය වැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය
2026 வரவு செலவுத்திட்ட முன்மொழிவுகளை நடைமுறைப்படுத்துவதிலுள்ள முன்னேற்றம்
PROGRESS OF IMPLEMENTING BUDGET PROPOSALS, 2026

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

මම මේ ප්‍රශ්නයෙන් අහන්නේ 2026 වර්ෂයේ අයවැය කථාවෙන් ඉදිරිපත් වුණු යෝජනාවල ප්‍රගතියයි. මම ආරම්භයේදීම කියන්න කැමැතියි, මේකට නම් පිළිතුර දීමට කල් ගන්න බැරි බව. මොකද, තව සති තුනකින් 2027 වර්ෂයේ අයවැය ඉදිරිපත් කරනවා.

අය වැය යෝජනා සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පමණක් අපේක්ෂිත සංවර්ධන හා ආර්ථික අරමුණු සාක්ෂාත් කර ගත නොහැකි අතර, එම යෝජනා ඵලදායී ලෙස ක්‍රියාත්මක කරමින් මහජන මුදල්වලට සරිලන ප්‍රතිඵල අත් කර ගැනීම රජයේ වගකීමක් වනවා. ඒ අනුව, පසුගිය වසර අවසානයේදී 2026 වසර සඳහා ආණ්ඩුව ඉදිරිපත් කළ අය වැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, ප්‍රතිපාදන භාවිතය - ඒ කියන්නේ මූල්‍ය ප්‍රගතිය සහ භෞතික ප්‍රගතිය - සහ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමේ තත්ත්වය පිළිබඳව කරුණු විමසීම සඳහා තමයි මම මේ ප්‍රශ්නය අහන්නේ.

2027 වර්ෂයට අදාළ අයවැය ගරු ජනාධිපතිතුමා නොවැම්බර් 12වන දා ඉදිරිපත් කරනවා. ඒ නිසා මේ මොහොත වන විට 2026 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය ගැන රජය පිළිතුරු ලබා දීම අද දවසේ අනිවාර්යයෙන්ම සිද්ධ වෙන්න ඕනෑ.

1. 2026 සැප්තැම්බර් 30වන දින වන විට එක් එක් අමාත්‍යාංශ යටතේ ප්‍රතිපාදනවලින් වැය කර ඇති මුදල සහ ඉතිරිව ඇති මුදල අමාත්‍යාංශ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද? එම කාල සීමාව තුළ අදාළ ව්‍යයම්වලට සාපේක්ෂව අත් කර ගෙන ඇති මූල්‍ය හා භෞතික ප්‍රගතිය කවරේද?
2. 2025 නොවැම්බර් 07වන දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ප්‍රධාන රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති සාරාංශයේ සඳහන් ක්ෂේත්‍ර 28කට අදාළ විශේෂ ව්‍යාපෘති සඳහා දේශීය හා විදේශීය මූලාශ්‍රවලින් ප්‍රතිපාදන වෙන් කර ඇති ආකාරය කවරේද?

   මම මේ ඔක්කෝම අහන්නේ, මේ අවුරුද්දේ වැඩසටහන ගැනයි.

   එම එක් එක් ව්‍යාපෘතියේ 2026 සැප්තැම්බර් 30වන දිනට අත්පත් කරගෙන ඇති මූල්‍ය හා භෞතික ප්‍රගතිය සහ 2026 වර්ෂයේ අවසන් කාර්තුව සඳහා අපේක්ෂිත මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය කවරේද?
3. 2026 වර්ෂයේ ඉතිරි කාලය තුළ ක්‍රියාත්මක කිරීමට හෝ සම්පූර්ණ කිරීමට නියමිත අය වැය යෝජනා කවරේද? ඒ සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන ප්‍රමාණය, අපේක්ෂිත ව්‍යයම, සම්පූර්ණ කිරීමට නියමිත කාල සීමාව සහ වගකිව යුතු රාජ්‍ය ආයතන ඇතුළත් යාවත්කාලීන ක්‍රියාකාරී සැලැස්මක් සභාගත කරන්නේද? වර්ෂය අවසානයේදී භාවිත නොකර ඉතිරි විය හැකි ප්‍රතිපාදන සම්බන්ධයෙන් රජය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

   ගරු කථානායකතුමනි, මම මේක පැහැදිලි කරන්න ඕනෑ. Zero-based budgeting කියලා ක්‍රමවේදයක් තිබෙනවා. ඒ කියන්නේ දෙසැම්බර් 31වන දා වනකොට මූල්‍ය ප්‍රගතිය, භෞතික ප්‍රගතිය අවසන් වෙන්නට ඕනෑ. එතකොට ඒවා අවිච්ඡේද හැටියට ඊළඟ වසරට ගෙන යන්න බැහැ. දෙසැම්බර් 31වන දා වනකොට zero-based budgeting ක්‍රමවේදය ක්‍රියාත්මක කරලා 2026 අවුරුද්දට වෙන් කරපු සම්පූර්ණ මුදල ව්‍යයකරලා අවසන් කළ යුතුද, එහෙම නැත්නම් ලබන වසරට අවිච්ඡේද වැඩසටහන් හැටියට ක්‍රියාත්මක කිරීම රජයේ ප්‍රතිපත්තියද කියලාත් මම අහන්න කැමැතියි.
4. 2026 වර්ෂය සඳහා රජය විසින් ඉදිරිපත් කරන ලද අය වැය යෝජනා සංඛ්‍යාව කොපමණද?

   බොහොම සරල ප්‍රශ්නයක් මේ අහන්නේ.

   එම එක් එක් යෝජනාව සඳහා අනුමත කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය, 2026 සැප්තැම්බර් 30වන දින වන විට වැය කර ඇති මුදල සහ අත්පත් කරගෙන ඇති භෞතික ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කොපමණද?

බොහොම සරල දෙයක් අහන්නේ. මේ අවුරුද්දේ මූල්‍ය ප්‍රගතිය කොච්චරද, භෞතික ප්‍රගතිය කොච්චරද? "DailyFT" එකේ පැහැදිලිවම සඳහන්ව තිබෙනවා, 2026 වර්ෂයේ පළමු මාස 8 තුළ රාජ්‍ය ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 75.5ක් දක්වා ඉහළ ගිහින් තිබෙනවා කියලා. ඒ, ආදායම. අපි අහන්න කැමැතියි, ප්‍රාග්ධන වියදම්, ශුද්ධ ණය දීම සඳහා වැය කළ මුදල. අපට වාර්තා වෙනවා, එහි ප්‍රගතිය තිබෙන්නේ සියයට 25.4යි කියලා. මෙන්න මේ කාරණාව නිසා තමයි ජනාධිපතිතුමා 2025 අග භාගයේදී, 2026 වර්ෂය තුළ රටේ සංවර්ධනය උදෙසා ඉදිරිපත් කරපු අය වැයේ වර්තමාන ප්‍රගතිය පිළිබඳව අපි ප්‍රශ්න කරන්නේ.

5. 2026 වර්ෂය තුළ එක් එක් අමාත්‍යාංශය සඳහා මුලින් වෙන් කරන ලද ප්‍රතිපාදන සංශෝධනය කිරීමක් හෝ වෙනත් කාර්යයන් සඳහා මාරු කිරීමක් සිදු කර තිබේද? එසේ නම්, එම එක් එක් අවස්ථාවට අදාළ මුදල් ප්‍රතිපාදන ප්‍රමාණය, සංශෝධිත ප්‍රතිපාදන ප්‍රමාණය, මාරු කරන ලද මුදල, එම සංශෝධන හා මාරු කිරීම් සඳහා හේතු සහ ඒ සඳහා අනුමැතිය ලබාදීමේ ක්‍රමවේදය - මොන මොන චක්‍රලේඛවලට අනුකූලවද ඒක ක්‍රියාත්මක කළේ - සහ ඒ මාරු කිරීම් සඳහා වගකිව යුතු නිලධාරීන් කවරේද?

6. 2026 වර්ෂය තුළ විදේශ ආධාර හෝ විදේශ ණය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද?

මේ, බොහොම සරල ප්‍රශ්නයක්.

එම එක් එක් ව්‍යාපෘතිය සඳහා අනුමත කර ඇති මුළු ව්‍යාපෘති පිරිවැය, 2026 වර්ෂයට වෙන් කර ඇති ප්‍රතිපාදන, 2026 සැප්තැම්බර් 30 දින වන විට වැය කර ඇති මුදල, අත්කරගෙන ඇති මූල්‍ය හා භෞතික ප්‍රගතිය සහ ව්‍යාපෘතිය සඳහා අවසන් කිරීමට නියමිත කාල සීමාව කවරේද?

7. 2026 වර්ෂය තුළ සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් සහ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කවරේද?

ඒ කියන්නේ foreign direct investments ආකර්ෂණය කරන්නට රජය ක්‍රියාත්මක කරපු වැඩ පිළිවෙළ මොකක්ද කියන එකයි.

2026 වර්ෂය සඳහා රජය විසින් නියම කර ඇති සෘජු විදේශ ආයෝජන ඉලක්කය කොපමණද? ඒ කියන්නේ, මේ වසර තුළ කොච්චර සෘජු විදේශ ආයෝජන ඉලක්කයක් තිබුණාද? ඒක සම්පූර්ණ කර ගත්තු ප්‍රමාණය කීයද? 2026 සැප්තැම්බර් 30 දින වනවිට සැබෑ වශයෙන් ලැබී ඇති සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය කොපමණද? එම ආයෝජනවල ප්‍රධාන ආර්ථික අංශ සහ මූලාශ්‍ර රටවල් කවරේද?

8. රජය සතු ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව කොපමණද? 2026 වර්ෂයේ පළමු කාර්තු තුන තුළ එම එක් එක් ආයතනය අත්පත් කරගෙන ඇති ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද? අලාභ ලබන ආයතන සඳහා එම අලාභ පියවා ගැනීමට හෝ මූල්‍ය කාර්ය සාධනය වැඩිදියුණු කිරීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද? එම ආයතන සඳහා 2027 වර්ෂයේදී රජයේ අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමට අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපාදනවල ඇස්තමේන්තුගත ප්‍රමාණයන් සහ ඒවායේ අරමුණු කවරේද?

ගරු කථානායකතුමනි, මේක බොහොම පැහැදිලි ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට කල් ගන්න බැහැ. මොකද, නොවැම්බර් 12වෙනි දා ගරු ජනාධිපතිතුමා 2027 අය වැය කථාව ඉදිරිපත් කරනවා. මේ වනතෙක් ප්‍රගතිය මොකක්ද කියන එක මම එතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ප්‍රශ්නය අහනකොටම දන්නවා, මේකට පිළිතුරු සකස් කර ගන්න මාස ගණනාවක් යනවා කියලා. ඒ නිසාම වෙන්න ඇති එතුමා කියන්නේ මේකට අදම උත්තරය ඕනෑය කියලා. ඒක වැරදියි. මොකද, වර්ෂයක විශේෂයෙන්ම කාර්ය සාධනය පිළිබඳව අපිට assessment එකකට යන්න වෙන්නේ වර්ෂය අවසානයේදී. ගරු කථානායකතුමනි, ඒත් එක්කම එතුමා මතු කරපු සමහර ක්ෂේත්‍ර පිළිබඳව කාලීන වාර්තා මගින් online හරහාත් ඒ ඒ අමාත්‍යාංශවලට ඉදිරිපත් කරනවා. වාර්තාත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ඒ කෙසේ වෙතත්, මේ තොරතුරු ලබා දෙන්න අපට කාලයක් අවශ්‍ය වනවා. අනෙක, මේවා හදිසි අවශ්‍යතාව මත ලබාගත හැකි තොරතුරු නොවෙයි. ඒ නිසා අවශ්‍ය තොරතුරු ලබා දෙන්න පුළුවන්; හැබැයි, සැලකිය යුතු කාලයක් අවශ්‍ය වෙනවා.

උදාහරණයක් ලෙස එක ප්‍රශ්නයක් මා පෙන්වන්නම්, ගරු කථානායකතුමනි. ප්‍රශ්න අංක 8හි රාජ්‍ය ව්‍යවසායකයන් පිළිබඳ තොරතුරු අහනවා. ලාභය, පාඩුව, ඒවායෙහි ක්‍රියාකාරිත්වය අහනවා. රාජ්‍ය ව්‍යවසායයන් 520 ගණනක් තිබෙනවා. ඒ ප්‍රශ්නය බැලුවොත් මම හිතන විධියට උත්තරය දෙන්න පැය ගණනක් යයි. කෙසේ වෙතත්, ගරු විපක්ෂ නායකතුමනි, මේ ප්‍රශ්නවලට පිළිතුරු සකස් කර ගැනීමට සෑහෙන කාලයක් යනවා. පිළිතුර සකස් කරගෙන මම පිළිතුර ඉදිරිපත් කරන්නම්. අද පිළිතුර ලබා දෙන්න විධියක් නැහැ.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ point of Order එක මෙයයි. ඇත්තවශයෙන්ම මේ අහලා තිබෙන ප්‍රශ්නවල පිළිතුරු කේන්ද්‍රගත කරගෙන තමයි, 2027 අය වැය වෙනුවෙන් වියදම, ආදායම, ප්‍රගතිය, ඒ සියල්ලක්ම ලබා දීම තවත් සති තුනකින් ජනාධිපතිවරයා මේ පාර්ලිමේන්තුවේ සිදුකරන්න ඕනෑ. එහෙම නම්, මේ තොරතුරු ටික අද අමාත්‍යාංශය සතුව තිබෙන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඒක point එකක් නොවෙයි. *[බාධා කිරීමක්]* ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ඉදිරි කාලයේදී ලබා දෙනවා කියලා ගරු ඇමතිතුමා දැනුම් දුන්නා. නමුත්, මම ඉතා පැහැදිලිව ඔබතුමාට කියන්න කැමැතියි සභානායකවරයා වශයෙන් මට සෘජුවම අදාළ වෙන කරුණක්. ඔබතුමා දන්නවා, ස්ථාවර නියෝග 27(2) යටතේ තිබෙන අයිතිය ගැන.

ස්ථාවර නියෝග 27(2)හි Second Paragraph එකේ සඳහන් වන්නේ මෙසේයි:

> "Provided that, any question relating to a matter of urgent public importance may be asked by the Leader of the Opposition or a leader of a recognized political party at the conclusion of questions after due notice has been given to the Minister concerned."

මේ අයිතිය තමයි තිබෙන්නේ. හැබැයි, මේ යටතේ විපක්ෂ නායකතුමා ඇසූ ප්‍රශ්නය ගැන ඇමතිතුමා පැහැදිලි කළා. මේ පිළිබඳව දිගින් දිගටම ගැටලු මතු වීම නිසා පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය 2026 ඔක්තෝබර් මස 19වැනි දා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ලේකම්වරයාට ලිපියක් යවා තිබෙනවා. මොකද, මේ ගැටලුව දිගටම මතු වෙමින් ආවා. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා දන්නවා, Parliamentary Business Committee එකේදී අපි සියලුදෙනාම එකඟතාවකට ආවා, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න කොහොමද යොමු කළ යුත්තේ කියලා. ප්‍රශ්නය එක අමාත්‍යාංශයක විෂය පථයට අදාළව විය යුතුයි, urgent public matter එකක් විය යුතුයි. අපට අවශ්‍ය නැහැ ඔබතුමන්ලාගේ ප්‍රශ්න frame කරන්න. හැබැයි, අපි පාර්ලිමේන්තුව විනයානුකූලව සහ time management එකක් අනුව ගෙන යන්න ඕනෑ. එම නිසා අපි ඔක්කෝම එකඟ වෙලා guideline එකක් පිළිගත්තා. දැන් ඒ guideline එක අනුව කටයුතු නොකිරීම නිසා ඇති වෙලා තිබෙන ගැටලු ගැන ඔබතුමාගේ ලේකම්ට දැනුම් දීලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය විසින් යවපු එම ලිපියේ ඇති කරුණු කිහිපයක් විතරක් මම කියන්නම්. ගරු කථානායකතුමනි, ඒ සඳහා මට විනාඩියක් දෙන්න. මොකද, එය වැදගත්.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමන්ලාට තිබෙන අයිතිය නැති කරන්න අපට අවශ්‍ය නැහැ. නමුත්, අපි සාධාරණව එම අවශ්‍යතාව ඉටු කරන්න නම් අපට ඒ format එකේ ලැබෙන්න ඕනෑ. අද ඔබතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නයේ අතුරු ප්‍රශ්න 19ක් තිබෙනවා. ඊළඟ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ප්‍රශ්නයේ ඊට වැඩිය තිබෙනවා. මේවා public importance එකක් තිබෙන ප්‍රශ්න තමයි. හැබැයි, එකක්වත් urgent නොවෙයි. මේවා ඉදිරිපත් කරන්න වෙන forums තිබෙනවා.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය විසින් විපක්ෂ නායක ලේකම්ට යවපු ලිපිය මම ඉක්මනින් කියවන්නම්. එහි මෙසේ සඳහන් වනවා:

> "..... දිනැති ලිපි ද සම්බන්ධයෙන් ඔබගේ කාරුණික අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.
>
> 02. ඒ අනුව ස්ථාවර නියෝග 27(2) ප්‍රකාරව මතු කරනු ලබන ප්‍රශ්න ඒ සම්බන්ධව පිළියෙළ කරන ලද මාර්ගෝපදේශ මාලාවට අනුකූලව ඉදිරිපත් කළ යුතු බව 2025 නොවැම්බර් 18 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී තීරණය කරනු ලැබුවද, ..."

ඒ, මීට අවුරුද්දකට කලින්.

> ".....දිගින් දිගටම එම මාර්ගෝපදේශවලට අනුකූල නොවන ආකාරයෙන් පහතින් දක්වා ඇති දෝෂ සහිතව ස්.නි. 27(2) යටතේ ප්‍රශ්න ඉදිරිපත් කරන බව නිරීක්ෂණය කර ඇත.
>
> - ප්‍රශ්නය හදිසි පොදු වැදගත්කමකින් තොරවීම හා එක් නිශ්චිත කාරණයකට සීමා නොවීම
> - ප්‍රශ්නය එක් අමාත්‍යාංශයක විෂය පථයට සීමා නොවී අමාත්‍යාංශ කිහිපයක විෂය පථයන්ට අයත් කාරණයක් වීම
> - එක් ප්‍රශ්නයක් තුළ තවත් ප්‍රශ්න රාශියක් ඇතුළත් වීම
> - කෙටි විස්තරය සහ ප්‍රශ්නය යන දෙකෙහිම අඩංගු වචන සංඛ්‍යාව ප්‍රශ්නය ඉදිරිපත් කරනු ලබන භාෂාවෙන් වචන 350 ඉක්මවීම -

ළඟදි ප්‍රශ්නයක් අහලා තිබුණා, ඒකේ වචන 350 වෙනුවට එක්දහස් හත්සිය ගණනක් තිබුණා.

> - ප්‍රශ්නය අසනු ලබන දිනට පෙර දින මධ්‍යාහ්න 12.00ට ඉතා ආසන්නව මහ ලේකම් කාර්යාලය වෙත ලැබීම

ඊළඟ එක හරි වැදගත්.

> - අමාත්‍යාංශ නිවේදනයක් මඟින් කල්තැබීමේ විවාදයකදී හෝ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයක් හරහා පිළිතුරු ලබාදී විස්තරාත්මකව පැහැදිලි කර ඇති කාරණයක් සම්බන්ධ ප්‍රශ්නයක් නැවත ඉදිරිපත් කිරීම."

වෙන formats තිබෙනවා. එසේ තිබියදී මේක යොදා ගන්නවා. ඒ නිසා මම මේ ලිපිය ඔබතුමාගේ අවසරය මත සභාගත කරන්නම්. මම ගරු ඇමතිතුමන්ලාගෙනුත් කරුණාවෙන් ඉල්ලීමක් කරනවා. ස්ථාවර නියෝග 27(2) අපිත් පිළිපදින්න ඕනෑ. මම සභානායක ලේකම්වරයාට උපදෙස් දීලා තිබෙනවා, ස්ථාවර නියෝග 27 (2) යටතේ එකඟ වෙච්ච guidelinesවලට පිටින් නම් කිසිවක් අනුමත කරන්න එපා කියලා. ඒ වාගේම ගරු ඇමතිතුමන්ලාගෙනුත් මා ඉල්ලා සිටිනවා, guidelinesවලට පිටින් උත්තර දෙන්න එපා කියලා. ඒ වාගේම ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නයකට උත්තර දීමේදීත් අපිට විනාඩි 15ක් වාගේ තමයි තිබෙන්නේ. එතකොට අදාළ මන්ත්‍රීතුමා විනාඩි 5ක්, 10ක් ගන්න පුළුවන්, එතුමාගේ ප්‍රශ්නය නිසා. පිළිතුරත් විනාඩි 5කට සීමා කරගෙන කටයුතු කරමු කියලා, ගරු ඇමතිවරුන්ගෙනුත් ඉල්ලා සිටිනවා. Guidelines නැතුව අපිට වැඩ කරන්න බැහැ. මම මේ ලිපිය **සභාගත*** කරනවා.

මම ගරු කථානායකතුමාගෙන් සහ ලේකම් මණ්ඩලයෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා මේ guidelines කඩ කරපුවා සභානායක කාර්යාලයට එවන්න එපා කියලා. Guidelines බලන්න තිබෙන්නේ ඔබතුමියලාට. Guidelines බලලා එවන්න. Please, එහෙම නැතිව අපිට එවන්න එපා. *[බාධා කිරීමක්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூணிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, හදිසි, කාලීන ඒ වාගේම වැදගත්කමකින් යුත් ප්‍රශ්නය ඇසීමේදී අනුගමනය කළ යුතු කාරණා සභානායකතුමා ඉදිරිපත් කළා. මම ඇහුවේ මම ගිය අවුරුද්දේත් අහපු ප්‍රශ්නයමයි. ගිය අවුරුද්දේ ඒකට උත්තර ලැබුණා. ඊට ඉස්සෙල්ලාත් හම්බ වුණා. මම අහන්නේ මොකක්ද? 2025 ජනාධිපතිතුමාගේ අය වැය කථාව තුළින් වෙන් කරපු මුදල්වලට මේ අවුරුද්දේ සැප්තැම්බර් 30 වෙනකම් ලැබුණු භෞතික ප්‍රගතියයි, මූල්‍ය ප්‍රගතියයි, සෘජු විදේශ ආයෝජන පිළිබඳවයි. එතකොට මෙතුමා කියනවා, නිශ්චිත කාරණාවක් තිබිය යුතුය කියා. නිශ්චිත කාරණාව තමයි අය වැය. ඒ වාගේම නිශ්චිත අමාත්‍යාංශය තමයි මුදල් අමාත්‍යාංශය. මෙහෙම කරන්න දෙන්න බැහැ නේ ගරු කථානායකතුමා. විපක්ෂයෙන් අහන ප්‍රශ්න ටික ආණ්ඩු පක්ෂයෙන් ලියවා ගන්න බැහැ නේ. විපක්ෂයෙන් අහන ප්‍රශ්නය ඇසීමේ නිදහස අපිට තිබෙන්න ඕනෑ.

දැන් ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත හා Prevention of Organised Crimes Bill එක හරහා මේ රටේ දේශපාලන නිදහස, ප්‍රජාතන්ත්‍රවාදී නිදහස ඔක්කෝම කාබාසිනියා කරනවා නේ. දැන් මේකෙනුත් එහෙමද? කොහොමද කියන්නේ, මම ප්‍රශ්නය ලියන්න ඕනෑ සභානායකතුමා හෝ ආණ්ඩුවට කැමති විධියට කියලා? එහෙම මට ප්‍රශ්න අහන්න බැහැ. මේකෙදි නිශ්චිත කාරණාව මොකක්ද? 2026 අය වැය ප්‍රගතිය. ඒක නිශ්චිත නැද්ද? එතකොට නිශ්චිත අමාත්‍යාංශය මොකක්ද? ජනාධිපතිතුමාගේ මුදල් අමාත්‍යාංශය. එතකොට මේකේ නිශ්චිතභාවයත් තිබෙනවා; අරමුණත් තිබෙනවා; අමාත්‍යාංශයත් තිබෙනවා. මම අහන්නේ එක සරල දෙයයි. මේවාට උත්තර නැතුව කොහොමද නොවැම්බර් 12වෙනි දා ජනාධිපතිවරයා 2027 අය වැය කථාව කරන්නේ? කොහොමද කරන්නේ? *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, පුංචි පැහැදිලි කිරීමක් කරන්නට ඕනෑ, මේ තොරතුරු පිළිබඳව. නිශ්චිත කාරණය අය වැය කියලා කිව්වා. මම හිතන්නේ බොහෝදුරට අතීතමය භාවිතය ගත්තොත්, අය වැය ඒගොල්ලන් හැදුවේ කලින් අවුරුද්දේ මුදල් වියදම් කරපු ප්‍රමාණය බලලා ඒ අනුව යම් යම් ප්‍රතිශත එකතු කරලාද දන්නේ නැහැ. මොකද, අය වැයක් සකස් කිරීමේදී ඒ මුදල් වියදම් වීමේ ප්‍රගතිය අපි අඛණ්ඩව බලන ගමන්ම තව කරුණු කාරණා බලන්න ඕනෑ. එනම්, වර්තමාන තත්ත්වය, ඒ වාගේම අනාගතයේදී වෙන්න පුළුවන් දේවල්, ලෝක ප්‍රවණතා. මේ විධියට අපේ උපාය මාර්ග අනුව තමයි මේ අය වැය සකස් වන්නේ, ගරු කථානායකතුමනි.

ඒත් එක්කම zero-based budgeting සම්බන්ධයෙනුත් වැරදි අදහසක් මතු කළා. මීට කලින් මෙගොල්ලන් මේ zero-based budgeting කියන එක කොටස් වශයෙන් ඉදිරිපත් කර ගත්තාට, ඒකේ ස්තර තුනම ඉදිරිපත් කර ගන්නේ නැතුව ඒකත් අත්හැර දාලා තිබෙන්නේ. අපි zero-based budgeting නොවෙයි යන්නේ. Performance-based, output-oriented budgeting framework එකක් ඇතුළේ තමයි අපි මේ වැඩකටයුතු සිද්ධ කරන්නේ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. *[බාධා කිරීම්]* නැහැ, මෙය විවාදයකට යා හැකි කාරණාවක් නොවෙයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු විපක්ෂ නායකතුමා හිටගෙන ඉන්නවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම මේ සභානායකතුමාගේ duty එක ගැන, - *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි. *[බාධා කිරීම්]* තවත් කෙනෙක්ගේ duty එකක් ගැන කථා කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපටත් කථා කරන්න දෙන්න. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ස්ථාවර නියෝග 28(ඊ) යටතේ අපේ වරප්‍රසාද යෝජනාව තමයි, - *[බාධා කිරීම්]* දැන් සභානායකතුමා කියනවා, ඔබතුමාට ලියුම් දෙන්නත් එපා කියලා. සභානායකතුමාට ආවාම,- *[බාධා කිරීම්]* අපට තිබෙන්නේ ඔබතුමාට ලියුම් ඉදිරිපත් කරලා සභා ලේකම් කාර්යාලයට, - *[බාධා කිරීම්]* දැන් අපි සභානායකටද ලියුම් ටික එවන්න ඕනෑ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. *[බාධා කිරීම්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමා මට කියන්න, ජනාධිපතිතුමා නොවැම්බර් 12වෙනි දා අය වැය කථාව ඉදිරිපත් කරන්න පෙර මට අයිතියක් නැද්ද, 2026 අය වැයේ ප්‍රගතිය අහන්න?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂ නායකතුමා ඒක point of Order එකක් නොවෙයි. ඒ කාරණාවට නැවත අවස්ථාවක් දෙන්න බැහැ.

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය අහන්න. නැත්නම් මට ඉදිරියට යන්න සිද්ධ වනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, අපි අහන්න යන ප්‍රශ්නය මොන භාෂාවෙන්ද අහන්නේ, මොන විධියටද අහන්නේ කියන එකත් ඉදිරියේදී කියන්න වෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීමක්]*

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තව ප්‍රශ්න විසිඑකකට උත්තර දෙන්නත් තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ප්‍රශ්නයක් ඉදිරිපත් කරනකොට guidelines අනුව ඒ කටයුත්ත කරන්න.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, ඉතින්, guidelines අනුව තමයි අපි මේවා දෙන්නේ. අපි මේක අනුගමනය කරන්නේ මීට පෙර, - *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, මෙතැන වාද විවාදයක් නැහැ. කරුණාකර ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. ඔබතුමා වෙන කොහේවත් යන්න එපා. ඔබතුමාටත් දැන් රාජකාරියක් පැවරිලා තිබෙනවා, ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනුශාසනාව ඉවරද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනුශාසනාව ඉවරද, ගරු කථානායකතුමනි?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අනුශාසනාව නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. මෙතැන විවාදයකට යන්න බැහැ. කාලය නාස්ති වනවා.

II

මැදපෙරදිග ගැටුම හේතුවෙන් ශ්‍රී ලංකාවට ඇති වන මූල්‍යමය බලපෑම

மத்திய கிழக்கு மோதல் காரணமாக இலங்கைக்கு ஏற்படும் நிதி ரீதியான தாக்கம்

FINANCIAL IMPACT OF MIDDLE EAST CONFLICT ON SRI LANKA

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, I would like to ask the following Question from the Minister of Finance, Planning and Economic Development.

The conflict involving the United States, Israel and Iran, which began on 28th February, 2026, threatens Sri Lanka's recovery with energy, trade and financing shocks. Parliament requires a quantified response to the following questions:-

1. What are the monthly and cumulative additional costs on petroleum, gas, coal, fertilizer, freight, insurance and aviation against the pre-war baseline? Separate price, volume and exchange rate effects, public and private costs, avoiding double counting.

2. What losses have occurred in tourism, exports, remittances, overseas employment and investment? What are their effects on growth, inflation, household incomes, poverty and Government revenue?

දැන් මේ ඔක්කෝටම හැම දවසකම, එහෙම නැත්නම් හැම සුමානයකම මහ බැංකුව උත්තර දෙමින් ඉන්නවා. මුදල් නියෝජ්‍ය අමාත්‍ය ගරු අනිල් ජයන්ත මහතාත් මේවාට උත්තර දෙමින් ඉන්නවා.

3. How are these costs financed through revenue, expenditure reductions, borrowing, supplier credit, assistance or reserves? Who ultimately pays? What funds the diesel subsidy ceilings of Rs. 15 billion in October, 2026, Rs.13.5 billion in November, 2026 and Rs. 12.15 billion in December, 2026? What replaces this relief thereafter?

Sir, we have been mentioning in this House that if you all want to give a subsidy, ensure that you give it to the CPC and not to the foreign companies. Now, I am happy to see the Hon. Minister Anura Karunathilaka also saying the same thing. So, ensure that these are put to use; you can use that Rs. 40 billion for the people of this country.

4. With September, 2026 gross reserves reported at US Dollars 6.851 billion, what are the usable reserves, restricted swaps, reserve liabilities, IMF net international reserves, import cover and external payments due within twelve months? Distinguish conflict pressures from scheduled repayments and valuation changes.

5. What measureable gains have arisen from diverted shipping, bunkering, aviation, tourism or relocated investment? What is their net foreign exchange contribution after costs?

6. What assumptions underpin the Government's assessment of the conflict's remaining duration? Will you table three, six and twelve-month scenarios, covering oil prices, financing gaps, reserves, debt service and contingency triggers?

7. What strategy with responsible agencies and deadlines will diversify energy supplies, accelerate renewables, protect migrant workers, secure export markets, attract displaced business and preserve balanced diplomatic relations?

8. Beyond completing the existing IMF programme, has a successor arrangement been requested or discussed? What financing, conditionality, social protection and debt sustainability terms are being considered?

We have been mentioning that going to the IMF is unpalatable. But, once you declare yourself bankrupt, like what happened on the 12th of April, 2022, to come out of it, you need to hold the hand of the IMF. That four-year Programme will come to an end in March, 2027. So, there must be a successor programme and we want to know what it is. That is necessary to take the country to a stable tomorrow. So, it is in order to ensure that it happens and for the benefit of the country that we are asking the IMF programme to be continued.

9. Given these risks, would securing a successor IMF programme better insulate Sri Lanka against prolonged external shocks? If not, what demonstrably more beneficial alternatives can provide comparable financing, credibility and protection? Will the Government table its comparative assessment, identify its preferred option and implementation timetable and report quarterly to Parliament on financing, delivery, outcomes and risks?

Thank you, Sir.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

Hon. Speaker, there are nine questions, and information has to be collected from different departments and units, though it had been referred to the Ministry of Finance, Planning and Economic Development. Therefore, I kindly request for time to answer the Question.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
The very purpose of asking Questions under Standing Order No. 27(2) is not to seek historical information, but to proactively raise matters concerning the economy of the country or a specific issue that is going to impact on the country.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Now, he has given a reply regarding your Question, Hon. Member.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
He says that there are nine questions. We cannot ask one question with 350 words. So, please ensure -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ප්‍රතිචාරයක් ලබා දුන්නා නේ, එතුමා කාලය ගන්නවා කියලා. නැවත වතාවක් ඔය සම්බන්ධයෙන් debate එකකට යන්න අවශ්‍යතාවක් නැහැ.

අමාත්‍යාංශ නිවේදන, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා. 2026.08.18වැනි දින ගරු රවී කරුණානායක මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම.

විදේශ සංචිතවල තිරසරභාවය: මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

அந்நியச் செலாவணிக் கையிருப்பின் நிலைத்தன்மை: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று

SUSTAINABILITY OF FOREIGN RESERVES: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

1. Hon. Speaker, the Gross Official Reserve statistics during the period from June, 2022 to August, 2026 are given in the table in US Dollars billions. Sometimes, it had gone up and on other times, it had gone down.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Minister, you have to read the whole Answer.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Okay, if time permits, I will read it out.

USD bn

End Period	Gross Official Reserves (GOR) as at end month	Change in GOR	Net Purchases during 6 month period under consideration*
Jun-22	1.85	-1.29	-0.64
Dec-22	1.90	0.04	0.05
Jun-23	3.72	1.83	1.63
Dec-23	4.39	0.67	0.05
Jun-24	5.65	1.26	1.76
Dec-24	6.12	0.47	1.08
Jun-25	6.08	-0.04	1.01
Dec-25	6.84	0.76	0.98
Jun-26	6.46	-0.38	0.56
Jul-26	6.6	0.14	
Aug-26	6.9	0.3	

*Based on value date

And details for the rest of the period starting from 2015 is given below.

Gross Official Reserves During 2015-2021

USD bn

End Period	Gross Official Reserves (GOR) as at end month	Change in GOR	Net Purchases during 6-month period under consideration*
Jun-15	7.53	-0.68	-1.07
Dec-15	7.30	-0.22	-2.18
Jun-16	5.29	-2.01	-1.09
Dec-16	6.02	0.73	0.32
Jun-17	6.96	0.94	0.43
Dec-17	7.96	1.00	1.23
Jun-18	9.27	1.31	0.14
Dec-18	6.92	-2.35	-1.26
Jun-19	8.86	1.95	0.23
Dec-19	7.64	-1.22	0.16
Jun-20	6.69	-0.95	-0.06
Dec-20	5.66	-1.03	0.34
Jun-21	4.06	-1.60	0.12
Dec-21	3.14	-0.92	-0.87

*Data for 2019 and years prior to that are based on the trade date, while data from 2020 onwards are based on the value date.

2. The responsibility for managing Sri Lanka's foreign reserves is vested with the Central Bank of Sri Lanka in line with the provisions of the Central Bank Act, No. 16 of 2023 - CBA.

The relevant Sections of the Central Bank Act related to reserve management and operations are 7(1)(c), 37 and 40.

3. Gross Official Reserves includes the swap facility of the People's Bank of China - PBOC swap. Other than the PBOC swap and a marginal amount of encumbered foreign currency balances, Gross Official Reserves are readily available to meet debt service payment requirements and/or to intervene in the domestic foreign exchange market, if the need arises.

Reserve Adequacy in terms of Months of Imports
Gross Official Reserves (GOR) as at end June, 2026 (Provisional)

GOR including the PBOC swap (USD bn)	6.5
Months of Imports	3.2

Gross Official Reserves (GOR) as at end August, 2026 (Provisional)

GOR including the PBOC swap (USD bn)6.9	
Months of Imports	3.4

4. As per the recently published combined fifth and sixth reviews under the IMF-EFF Programme Staff Report, GOR projections are as follows.

Year	GOR (USD mn)
2026	8,645
2027	11,779
2028	13,939
2029	14,474

These projections are IMF's own projections and should not be considered as projections of the Sri Lankan authorities.

- The Gross Official Reserves is not a target set out under the IMF-EFF Programme. The relevant programme target is Programme Net International Reserves - NIR- as defined in the published IMF-EFF documents.

	End June,	End Sep, 2026	End Dec, 2026
Programme NIR (USD mn)	-778	284	944

- As per the recently published combined fifth and sixth reviews under the IMF-EFF Programme Staff Report, the projected sovereign bond issuances are set out in table 6 of that report. Sri Lanka: Gross External Financing, 2024-2031 is as follows:

	2026	2027	2028	2029
Source of Financing: Borrowing - Sovereign Bonds (USD mn)	-	1,500	1,500	-

These assumptions about borrowings through Sovereign Bonds are made by the IMF in arriving at the Gross Official Reserves path given above and should not be considered as projections of the Sri Lankan authorities. The Government will decide whether to issue Sovereign Bonds or not periodically after assessing the given situation.

5.

Month	Outstanding Forex Swaps (USD bn)		
	International	Domestic	Total
End May, 2026	1.8	2.3	4.1

- Outstanding domestic swaps amounting to approximately US Dollars 83 million are scheduled to mature beyond one year. All other domestic swaps are scheduled to mature within one year.
- There are no outstanding balances relating to forwards or other short-term foreign currency liabilities with domestic banks.
- Historically, the highest domestic swap outstanding amounting to US Dollars 2.7 billion was recorded during the month of August, 2016.

6. - The Central Bank issued a clarification on 13th August, 2026, addressing the misinterpretation of the Governor's remarks by certain media reports. The clarification is available on the official website of the Central Bank of Sri Lanka, which states, I quote:

> "The Central Bank of Sri Lanka (CBSL) has observed that certain remarks made by the Governor of the CBSL during a recent media interview have been misinterpreted and subsequently reported by several print and electronic media outlets. The CBSL wishes to clarify that, as communicated by the Governor at the latest Monetary Policy Review in July 2026, the current monetary policy stance was assessed to be appropriate in light of prevailing and anticipated global and domestic economic conditions.
>
> The CBSL conducts monetary policy in a forward looking and data-driven manner. Accordingly, decision on whether to increase, decrease or maintain policy interest rates is made at each monetary policy review, taking into account the latest available economic data, forecasts and risk assessments. The Governor's remarks were intended to convey this established policy framework. They did not constitute any commitment or indication regarding the future path or level of policy interest rates."

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

Basically, these data are sensitive and are not an indication of the future.

7. • **Policy on reserve accumulation and exchange rate flexibility**

The Central Bank of Sri Lanka maintains a flexible exchange rate regime in line with Flexible Inflation Targeting - FIT- framework. Under the flexible exchange rate regime, the exchange rate is determined based on the demand and supply conditions in the domestic foreign exchange market, and the Central Bank's intervention in the market is limited only to mitigate excessive volatility in the exchange rate and to build up reserves through purchases of foreign exchange from the market.

As mandated by the Public Debt Management Act, No. 33 of 2024, Liability Management Operations - LMOs - are to be undertaken with the objective of mitigating refinancing risk, interest rate risk and currency risk associated with the Government debt portfolio.

Accordingly, the Public Debt Management Office - PDMO - is currently taking necessary steps to strengthen the regulatory framework governing Liability Management Operations and is also assessing opportune market conditions and available instruments to undertake such operations.

So, what operations and strategies are to be taken will be announced then and there, because these are highly sensitive information.

8. For the financial year ended 31.12.2025, after the statutory adjustments as per Sections 95(2) (a) and 96 of the Central Bank of Sri Lanka Act, No. 16 of 2023, Rs. 44,985.19 million had been distributed to the Government.

And, details of the previous distributions are given in the Table below.

Central Bank Distributable Profit and Profit Transfers to Government: 2015-2025

Rs. Mn

Year	Profit Transfers to
2015	-
2016	6,378.27
2017	15,000.00
2018	-
2019	24,008.98
2020	15,016.74
2021	31,035.79
2022	-
2023	-
2024	-
2025	44,985.19

Specially, in 2016, 2017, 2019, 2020 and 2021, some dividends had been remitted to the Government.

Thank you very much.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Ravi Karunanayake.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, I thank the Hon. Minister for giving a selective Answer to some of the problems that are there. I know that you have a difficulty in answering it because it does not come directly under your purview. That is the problem.

The Central Bank has made a profit of about Rs. 200 billion and how much of that profit have they given to the Government is the question I would like to ask first. Talking about reserves, you accept that there is only US Dollars 6,800 million of reserves. After two years - it was US Dollars 6,100 million then - and getting three tranches from the IMF, which amounts to about US Dollars 1.1 billion, when you add those two amounts alone, it should be at least US Dollars 7.2 billion in hand. So, how is there a downward trend in reserves, when there should be an upward trend? Where is the FDI? When is the interest rates coming down? When is the rupee strengthening? Hon. Minister, we also would like to see a strong economy. One US Dollar in hand is far better than US Dollars one billion in the air.

Now, you could see the HSBC leaving. That was something I did when I was the Minister of Trade, Commerce and Consumer Affairs. We went to UK and got these 4,000 seats. Donnelley, which is a US company, is going out of the country. Hon. Minister, I would like you to emphasize as to how we could protect investments in this country. Do not let any investments go out. I do not want to dampen the spirits, but prefer any investment in the country to be retained rather than no investments coming in. But, I do not think a conducive climate is being created by you all in order to ensure that FDIs come in.

Today, the Governor of the Central Bank is saying that Rs. 280 billion has gone off from the stock exchange. Then, the stock market also has the impact of market capitalization dropping by Rs. 324 billion. So, while you give these figures, I am trying to see how you could fortify the economy. But, the Answer you read out was based on the information given to you. Hon. Minister, is it not time that you take stock of the situation and you guide the economy? It is you all who had got the mandate, not the Governor of the Central Bank. So, on this basis, how is it that you all are going to ensure there is an increase in investments? How are you going to ensure that the rupee is strengthened and that the interest rates drop? You, in your own statement, have said that more than 350,000 SMEs have crashed. And, the companies are being taxed beyond their affordability. They are willing to pay tax, but they do not have the affordability to pay thereafter. So, Hon. Minister, when 32 per cent of every invoice goes to the Inland Revenue Department, is it possible to have investments in this country? I am with you all in this; we must decolourize

this. But, in order to ensure that, we must have policies that are perdurable. Now, when we have a region with an absolutely profitable environment, we cannot let the country to lose out in the future. So, please ensure that we get together and forget the colourization of politics. We must build a strong economy that would be able to carry through upto April, 2028, when we have got to pay our debts on our own. The world is in a financial turbulence; you do not know what is going to happen next in the Middle East. So, if you all do not protect the dollars in hand, you are going to have a tough time. Not only you all, but the whole country, and that is why we are concerned about this.

Hon. Minister, I would greatly appreciate if these answers are not colorized. Whether we are on that side or you all are on this side, it is the same. But, we would like to see more purposefulness in the answers given. That is the requirement.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

Hon. Member, thank you very much for the comments. Whatever points that you just highlighted could be considered in decision-making, wherever relevant and appropriate.

For instance, when it comes to building Gross Official Reserves, of course, not only the current position, but global dynamics, trade and economic elements are also considered. Accordingly, we have projected the building of Gross Official Reserves by 2032, which would be over US Dollars 15 billion.

Then, apart from the development in the Current Account, we have other plans, as you also highlighted, such as promoting foreign direct investments. Of course, there are some threats at this particular moment especially due to the crisis situation in the Middle East. Investors also would take time because they are a little bit sceptical about this situation. But from our side, we are actually taking measures to create a level playing field and a conducive environment, implementing the digitalization process to facilitate them. There are constraints, but we are overcoming all those one by one.

When it comes to strengthening the currency, as of now, the actual exchange rate really goes along with the theoretical base. For example, the rupee interest rate is greater than the dollar interest rate. As a result, there is a gradual depreciation of the rupee, it is accepted. It is around 5 to 6 per cent. If it goes beyond that level, then, we need to be a little bit alarmed. So, as of now, the situation is under control. And, the Central Bank and the Ministry of Finance, Planning and Economic Development would, from time to time, take decisions pertaining to the stability of the financial sector without leaking information to the interested parties.

Then, if we take the situation at the Colombo Stock Exchange, of course, from time to time, temporary fluctuations could be seen happening. Due to that particular situation, interest rates change. However, we can observe that there is no such volatility in the Colombo Stock Exchange. Specially due to the war situation, some declines could be seen, but over time, it would recover and I can assure you that there is no volatility in the Colombo Stock Market.

Thank you very much.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා. 2026.09.10වැනි දින සහ 2026.09.23වැනි දින ගරු සජිත් ප්‍රේමදාස මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම.

එල් නිනෝ දේශගුණික සංසිද්ධියේ වත්මන් සහ අපේක්ෂිත බලපෑම: ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
எல் நினோ காலநிலை மாற்றத்தின் தற்போதைய மற்றும் எதிர்பார்க்கப்படும் தாக்கம்: பாதுகாப்புப் பிரதி அமைச்சரினது கூற்று
CURRENT AND PROJECTED IMPACT OF EL NIÑO CLIMATE PHENOMENON: STATEMENT BY DEPUTY MINISTER OF DEFENCE

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් 2026.09.10වැනි දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. දැනට වාර්තා වන, බලපෑමට ලක් වූ පවුල් පිළිබඳව තොරතුරු දිස්ත්‍රික් වශයෙන් ඇමුණුම 01හි දක්වා තිබේ. නියඟය හේතුවෙන් බලපෑමට ලක් වූ ජනගහනය වෙත ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙතින් පානීය ජලය බෙදා දීම සිදු කරනු ලබන අතර, 2026.10.12 දිනට පානීය ජලය බෙදා දීමේ විස්තර ඇමුණුම 01 පරිදි වාර්තා කරමි. තවද, මෙම තොරතුරු ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් අනුකම්ටුව වෙත ඉදිරිපත් කර ඇත.

   එය තවදුරටත් වර්ධනය වීමට ඉඩ ඇතැයි අනුකම්ටුව තක්සේරු කර ඇත.

2. මෙයට අදාළව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරෝකථනය පහත පරිදි වේ. පසුගිය මාසය - සැප්තැම්බර් මාසය - තුළ එන් නිනෝ තත්ත්වය තවදුරටත් ශක්තිමත් වූ අතර, නැඟෙනහිර සමක ආශ්‍රිත පැසිෆික් සාගර කලාපයේ සමහර කොටස්වල මුහුදු මතුපිට උෂ්ණත්වයේ විචලනයන් සෙල්සියස් අංශක

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

+4.0 ඉක්මවා ගොස් ඇත. තවද, 2026 අගෝස්තු මාසයේදී නිනෝ 3.4 දර්ශකයේ උෂ්ණත්වය සෙල්සියස් අංශක +2.1 දක්වා ඉහළ ගොස් ඇත. තවද, 2027 ජනවාරි - මාර්තු කාලසීමාව පුරාම ප්‍රබල හෝ ඉතා ප්‍රබල එන් නිනෝ තත්ත්වයක් පැවතීමට ඉඩ ඇත. ඒ සඳහා සියයට 83කට වැඩි සම්භාවිතාවක් පවතින බව පුරෝකථනය කර ඇත.

1950 සිට වාර්තා වූ පෙර එල් නිනෝ සිදුවීම්වල ප්‍රබලතාව ඉක්මවා යන (මාස 03ක RINO අගය සෙල්සියස් අංශක +2.5 හෝ ඊට වැඩි) ඓතිහාසික සිදුවීමක් ඇති වීමේ ඉහළ සම්භාවිතාවක් පවතින බවට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පුරෝකථනය කර තිබෙනවා. ඒ සඳහා සැප්තැම්බර් - නොවැම්බර් කාලයේ සියයට 54කද, ඔක්තෝබර් - දෙසැම්බර් කාලයේ සියයට 83කද, නොවැම්බර් - ජනවාරි කාලයේදී සියයට 70කද සම්භාවිතාවක් පවතී.

ඔබතුමා අහපු විධියට, මෙම නවතම පුරෝකථනය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් අනුකම්ටුව වෙත යොමු කර තිබෙනවා. මීට අදාළව 2026.10.12 දිනට පුරෝකථනය ඇමුණුම 02 පරිදි කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් යොමු කර තිබෙනවා.

ඒකේ විස්තර ගොඩක් තිබෙනවා. ඒ ටික කියන්න පුළුවන්. ඔබතුමා ඇහුවා වාගේ දිස්ත්‍රික්ක වශයෙන් - district-wise - වෙන වෙනම දීලා තිබෙනවා, දැනට affected families and persons. ඒ වාගේම, current water distribution එකත් දීලා තිබෙනවා. මුළු ප්‍රමාණයත් එහි සඳහන් කර තිබෙනවා. මම දැන් කිව්වා වාගේ ඇමුණුම 02හි සටහන් කර තිබෙනවා, 2026 ඔක්තෝබර් මාසයට, 2026 නොවැම්බර් මාසයට එන්න පුළුවන් දේ.

3. වාර්තා කර තිබෙනවා.

නියඟය සහ ගංවතුර අවදානම් තත්ත්වය පිළිබඳව ආපදා අවදානම් දර්ශක යොදා ගනිමින් සිතියම් සහ තොරතුරු මඟින් අමාත්‍ය, නිලධාරි අනුකම්ටුව දැනුවත් කිරීමට කටයුතු කර තිබෙනවා. තවද, වර්තමාන නියඟයෙන් වඩාත් පීඩිත මොනරාගල, බදුල්ල, අම්පාර, මඩකලපුව දිස්ත්‍රික්කවල ජනතාව සඳහා කලින් අනතුරු ඇඟවීම සහ ඉවත් කිරීම සිදු කිරීම සඳහා සූදානම් කළ යුතු අධිඅවදානම් ප්‍රදේශ ඓතිහාසික දත්ත සහ තොරතුරු මත පදනම්ව භූගෝලීය තොරතුරු පද්ධති භාවිත කර විශ්ලේෂණය කර හඳුනා ගැනීම සිදු කර ඒ පිළිබඳව කම්ටුව දැනුවත් කිරීමට අධ්‍යක්ෂ ජනරාල් (ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය) විසින් කටයුතු කර තිබෙනවා.

තවද, පවතින හා ඇති විය හැකි ආපදා තත්ත්වය පිළිබඳව පාර්ශ්වකාර ආයතන, විශ්වවිද්‍යාල, මහ ජනතාව දැනුවත් කිරීම සඳහා පහත පරිදි කටයුතු කර තිබෙනවා. ඒ අනුව බලපෑමට ලක් විය හැකි ප්‍රදේශ පහත ආකාරයට සවිස්තරාත්මකව දැනුවත් කිරීමට කටයුතු කර තිබෙනවා.

- **එල් නිනෝ බලපෑම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ප්‍රදේශ ගණනාවකට නියඟයෙන් බලපෑම් ද, තවත් ප්‍රදේශ ගණනාවකට ගංවතුර හා නායයාම්හි බලපෑම් ද සිදු වන බවට තක්සේරු කර තිබෙනවා.**

ඒ අනුව පහත ආකාරයට කාලගුණික කලාප වශයෙන් ශ්‍රී ලංකාවේ ජනතාව සහ ප්‍රදේශ බෙදී ඇති බවට හඳුනා ගෙන තිබෙනවා.

දේශගුණික කලාපය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව	ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව	මුළු ජනගහනය
ශුෂ්ක කලාප 01	10	65	104,232
ශුෂ්ක කලාප 02	14	285	584,788
වියළි කලාපය	143	3,466	5,071,409
මධ්‍යම කලාපය	121	4,548	5,430,090
තෙත් කලාපය	128	5,605	10,598,526

උක්ත හඳුනා ගැනීම් අනුව සමස්ත ග්‍රාම නිලධාරි වසම් 3,402ක 4,027,330ක් පමණ ජනතාවකට ජල හිඟයෙන් පීඩා ඇති විය හැකි බවයි සඳහන් වන්නේ. *[බාධා කිරීමක්]* මිලියන 4.027ක් පමණ. ඒ සඳහා පුරෝකථනය කරන ලද ජල අවශ්‍යතා වශයෙන් - එක් පුද්ගලයෙකු සඳහා ලීටර් 15ක් - දෛනිකව ජල ලීටර් 70,621,590ක් අවශ්‍ය වනවා.

එබැවින්, පෙර සූදානම් කටයුතු වශයෙන් නියඟය අවස්ථාවේදීත්, ගංවතුර අවස්ථාවේදීත් භාවිත කළ හැකි වන ආකාරයට -සුරක්ෂිත මධ්‍යස්ථාන හා පානීය ජලය සැපයීම සඳහා - යෙදවිය හැකි ජල බවුසර් 727ක් දිවයින පුරා දැනටමත් ස්ථානගත කර තිබෙනවා.

මූලිකව විශාල ජල ගැලීම් ඇති වීම සඳහා ප්‍රධාන ගංගා ද්‍රෝණි 103ක් හඳුනාගෙන ඇති අතර එමඟින් ඓතිහාසික දත්ත සහ "දිට්වා" තත්ත්වය තුළ ඇති වූ ගංවතුර ආපදා තත්ත්වය පදනම් කර ගනිමින් සිදු කරන ලද භූගෝලීය තොරතුරු පද්ධති භාවිතයෙන් සිදු කරන ලද විශ්ලේෂණය කිරීම්වලට අනුව ග්‍රාම නිලධාරි වසම් 11,068ක 17,781,884ක ජනතාවක් මේ සඳහා නිරාවරණය විය හැකි බවට තක්සේරු කර තිබෙනවා.

- **ජාතික මට්ටමින් ජනතාව දැනුවත් කිරීම සඳහා මාධ්‍ය දැනුවත් කරමින් ජනතාව වෙත තොරතුරු ක්ෂණිකව ලබා දීමට මේ වන විට කටයුතු කර තිබෙනවා.**

පෙර සූදානම් ක්‍රියාකාරකම් වශයෙන් 2026.07.24 දින පාර්ශ්වකාර ආයතන දැනුවත් කිරීම සඳහා පළමු දැනුවත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබුවා. මෙහිදී එල් නිනෝ ක්‍රියාකාරිත්වය, ආපදා පෙර සූදානම් ක්‍රියාකාරකම්, කාලගුණික ආන්තික තත්ත්වය ආදිය පිළිබඳ සියලු පාර්ශ්වකාර ආයතන දැනුවත් කිරීමට කටයුතු කර තිබෙනවා. සියලු දිස්ත්‍රික්ක ආවරණය වන ලෙස, එල් නිනෝ ක්‍රියාකාරිත්වය හා එහි බලපෑම, ඒ සඳහා පෙර සූදානම් විය හැකි ආකාරය පිළිබඳව පාර්ශ්වකාර ආයතන හා දිස්ත්‍රික් ඒකක සම්බන්ධ කර ගනිමින් සැලසුම් සකස් කිරීම සිදු කරනු ලැබුවා.

ජාතික මට්ටමින් ජනතාව දැනුවත් කිරීම වෙනුවෙන් මාධ්‍ය දැනුවත් කිරීම සඳහා මේ වන විට මාධ්‍ය දැනුවත් කිරීම් අවස්ථා 5කදී සිදු කර තිබෙනවා. එම දිනයන් තමයි, 2026 ජූලි 06, ජූලි 13, අගෝස්තු 03, අගෝස්තු 11 සහ සැප්තැම්බර් 04. පාර්ශ්වකාර ආයතන සහ පුද්ගලයන් දැනුවත් කිරීම සඳහා 2026 ජූලි 24, අගෝස්තු 20 සහ සැප්තැම්බර් 01 දිනයන්හි ද කටයුතු කර තිබෙනවා.

තවද, හදිසි ආපදා තත්ත්වයකදී කටයුතු කිරීම සඳහා පෙර සූදානම් ක්‍රියාකාරකමක් ලෙස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් විශේෂ සෙවීම් සහ මුදා ගැනීම් සඳහා පුහුණුව ලත් ත්‍රිවිධ හමුදාව, පොලිසිය සහ ජීවිතාරක්ෂක කණ්ඩායම්වලින් සමන්විත, ගංවතුර අවස්ථාවකදී කටයුතු කිරීම සඳහා සෙවීම් සහ මුදා ගැනීම් කණ්ඩායම් 321ක් - පුද්ගලයන් 2,382කින් සමන්විතව - මුදා ගැනීමේ බෝට්ටු 344ක් සමඟ රට පුරා අත්‍යවශ්‍ය ස්ථානවල ස්ථානගත කර තිබෙනවා. එම කණ්ඩායම් සතුව මුදා ගැනීම් ජීවිත ආරක්ෂක කබා 2,189කට අධික ප්‍රමාණයක් ද තිබෙනවා. තවද, හදිසි අවස්ථාවකදී අතකිරේක හට පිරිස් යොදා ගනිමින් කටයුතු කිරීමට ආරක්ෂක අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කරමින් කටයුතු කරනවා.

මීට අමතරව, පීඩාවට පත් විය හැකි දිස්ත්‍රික්ක සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ යන්ත්‍රණය ශක්තිමත් කර ඇති අතර, ගංවතුර හා නායයාම් වැනි ආපදාවලදී ඇති විය හැකි හදිසි ඉවත් කිරීම් සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් අදාළ මූලික පහසුකම් සහිතව සුරක්ෂිත මධ්‍යස්ථාන සූදානම් කර තබන ලෙස ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය දැනුවත් කර තිබෙනවා.

4. ආයතන විසින් එම ක්‍රියාකාරී සැලසුම් කමිටුවට ඉදිරිපත් කර ඇති අතර, එම ක්‍රියාකාරී සැලසුම් අනුව කටයුතු කිරීම ආරම්භ කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, පහත සඳහන් ආයතන තමයි එම ක්‍රියාකාරී සැලසුම් ඉදිරිපත් කර තිබෙන්නේ.

i. වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

ii. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

iii. වාරිමාර්ග දෙපාර්තමේන්තුව

iv. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

v. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වන කාල රාමුව - timeline එක - පිළිබඳව ඇමුණුම 03 ලෙස සඳහන් විස්තරාත්මක ලේඛනයක් ඉදිරිපත් කර තිබෙනවා. එයිනුත් ලොකු අවබෝධයක් ලබා ගන්න පුළුවන්, අප සකසා තිබෙන එම වැඩ පිළිවෙළ ගැන.

ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරමි.

5. 2026.10.05වන දින පෙ.ව. 6.00වන විට මහවැලි ජලාශ සහ මහා පරිමාණ ජල විදුලි ජනනය සඳහා භාවිත වන අනෙකුත් ප්‍රධාන ජලාශවල පවතින බලශක්ති සංචිත තත්ත්වය මෙසේයි.

ජලාශය	බලශක්ති සංචිතය (GWB)	සංචිත ප්‍රතිශතය (මුළු ගබඩා ධාරිතාවෙන්)
රන්දෙනිගල	48.7	44.9
වික්ටෝරියා	335.9	75.7
කොත්මලේ	112.3	78.4
කාසල්රී	92.8	90.9
මාවුස්සාකැලේ	275.7	89.6
සමනලවැව	35.5	20.5
මුළු සංචිතය	900.9	70.5

ජනන සැලැස්මට අනුව විදුලිය නිෂ්පාදනය සඳහා තාප විදුලි බලාගාර මත වැඩි වශයෙන් යැපීමට වන අවකාශයක් නොමැති බව නිරීක්ෂණය කර තිබෙනවා. ඒ අනුව, එමඟින් විදුලි පාරිභෝගික මිලට අමතර බලපෑමක් ඇති නොවන බව අවසාන වශයෙන් තහවුරු කර තිබෙනවා.

6. වර්ෂ 2026 යල කන්නයේ නියඟය නිසා හානියට පත්ව ඇති වී සහ අනෙකුත් ක්ෂේත්‍ර භෝග සඳහා වන්දි ගෙවීමේ කටයුතු මේ වන විටත් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මඟින් ආරම්භ කර ඇති අතර, 2026 සැප්තැම්බර් 10වන විට පොළොන්නරුව, අනුරාධපුරය, අම්පාර, කළුතර යන දිස්ත්‍රික්කයන්හි ගොවීන් 713දෙනෙකු සඳහා හානි වූ අක්කර 1,205ක් වෙනුවෙන් රුපියල් මිලියන 30ක මුදලක් වන්දි වශයෙන් ගෙවා තිබෙනවා.

2026 යල කන්නයේ කෘෂිකාර්මික වන්දි සහ සහනාධාර ගෙවීම්

දිස්ත්‍රික්කය	ගොවීන් ගණන	හානි වූ ඉඩම් (අක්කර)	වන්දි (රුපියල්)
අනුරාධපුරය	73	92.50	2,025,900.00
පොළොන්නරුව	365	666.00	17,919,000.00
කළුතර	21	17.63	235,296.00
අම්පාර	254	429.31	10,639,400.00
එකතුව	713	1,205.44	30,819,596.00

අනෙකුත් දිස්ත්‍රික්කයන්හි වන්දි ගෙවීමේ කටයුතු ද සැප්තැම්බර් මස 15වන විට කඩිනමින් ගෙවා අවසන් කිරීමට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය බලාපොරොත්තු වන බවයි දන්වා තිබෙන්නේ.

2026/2027 මහ කන්නය සඳහා බීජ වී නිෂ්පාදන කටයුතු හා පොහොර සහනාධාර ලබා දීමේ කටයුතු සාමාන්‍ය පරිදි සිදු කරන බව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව දන්වා ඇති බවත් මා සඳහන් කරන්න කැමැතියි. ගරු විපක්ෂ නායකතුමනි, ඇමුණුම්වල ලොකු විස්තරයක් තිබුණු නිසා තමයි මම ඒවා සභාගත කළේ.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පිළිතුර ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

මම ගරු කථානායකතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, විශේෂ කාරණයක් පිළිබඳව. ගරු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුර ලබා දෙමින් අවස්ථා කිහිපයකදීම "ඇමුණුම 01, ඇමුණුම 02, ඇමුණුම 03" කියා ප්‍රකාශ කරලා ඒවා සභාගත කරනවා කිව්වා. මම දන්නවා, ලොකු තොරතුරු ප්‍රමාණයක් තිබෙනවා කියලා. හැබැයි ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා අපට අතුරු ප්‍රශ්න අහන්නට බලය තිබෙන්නේ ලබා දෙන පිළිතුර කේන්ද්‍ර කරගෙන බව. ඇමුණුම් සභාගත කරනවා කියන කොට අපි දන්නේ නැහැ ඒවායේ තිබෙන දේවල්. ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අඩුම තරමින්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඒ පිළිතුර දෙන අතරවාරය තුළවත් ඒ අදාළ ඇමුණුම් ලිඛිතව අපට ලබා දෙන්න කියලා. එහෙම කරන්න පුළුවන් නම් අපේ පැහැදිලි කර ගැනීම වඩාත් ප්‍රශස්ත ආකාරයට කර ගන්න පුළුවන්. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, කරුණාකර මින් ඉදිරියට ඒ දෙය කරන්න කියලා. මොකද, ඒ දෙන උත්තරයෙන් උද්ගත වන කරුණු මත තමයි පැහැදිලි කරවා ගැනීමේ ප්‍රශ්නය අහන්නට පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා මින් ඉදිරියට "ඇමුණුම සභාගත කරනවා" කියන විට කරුණාකර එහි පිටපතක් අපටත් මෙම ස්ථානයට එවන්න කියන ඉල්ලීම මා කරනවා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා දන්නවා, එල් නිනෝ, ලා නිනා, ENSO - El Niño-Southern Oscillation - සහ Indian Ocean Dipole - IOD - කියන ප්‍රවණතා 4 තුළ අපට ඇත්ත වශයෙන්ම බලපෑම් රාශියක් සිද්ධ වෙනවා කියලා. ඔබතුමා බොහොම පැහැදිලිව සඳහන් කළා, ලංකාවේ සමහර ප්‍රදේශවලට නියං තත්ත්වයකුත්, සමහර ප්‍රදේශවලට වැඩි වර්ෂාපතනයකුත් ඇති වෙනවා, ඒ තුළ නියඟ, නායයාම්, සුළි කුණාටු ආදි වශයෙන් විනාශකාරී සිද්ධි ඇති වෙන්න පුළුවන් කියලා. හැබැයි ඔබතුමා පැහැදිලි කළේ, උත්තර දුන්නේ මේ ප්‍රශ්නය හේතුවෙන් ජලය කේන්ද්‍රීයව ඇති වන ගැටලු කිහිපයක් ගැන පමණයි. විශේෂයෙන්ම පානීය ජලය ගැන තමයි ඔබතුමා කථා කළේ. එක පැත්තකින් පානීය ජලය අහිමි වෙනවා වාගේම තවත් පැත්තකින් කෘෂි කර්මාන්තය සඳහා ජලය වැඩි වෙනවා. තවත් ප්‍රදේශවලට වැසි වැඩි වීම නිසා වගා හානි සිදු වෙනවා. ඒ වාගේම විදුලි ජනනයටත් බලපෑම් සිදු වෙනවා; ජල ප්‍රමාණ අනුව පාරිසරික බලපෑම් ද සිදු වනවා. මේ කරුණු 4ම පිළිබඳව වැඩිපුර දැනුවත්භාවයක් ලැබීම ඉතාම වැදගත් වනවා. එයත් කේන්ද්‍ර කරගෙන ඉදිරියේදී අඩුම ගණනේ අමාත්‍යාංශ නිවේදනයක් තුළින් හෝ පැහැදිලි කිරීමක් කරන්න කියන ඉල්ලීම මා කරනවා.

ඒ වාගේම, ඔබතුමාට මම කියන්න කැමැතියි, මේ එල් නිනෝ, ලා නිනා, ENSO, IOD කියන ප්‍රවණතා පිළිබඳව අප කොච්චර කථා කළත්, මේ පිළිබඳ බිම් මට්ටමේ දැනුවත් වීම ඇත්ත වශයෙන්ම බොහොම අඩු බව. ඒක තමයි මහ පොළොවේ සත්‍යය සහ යථාර්ථය. සමාජයේ යම් යම් කොටස් කිහිපයකට හැරුණු කොට මේ ප්‍රශ්නය පිළිබඳ හරියාකාර අවබෝධයක් නැහැ. දැන් ඔබතුමාම සඳහන් කළා, අවදානමට ලක් වුණා කියන ප්‍රදේශ ලෙස ග්‍රාම නිලධාරී වසම් 3,402ක් තිබෙනවා කියලා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ එක් වසමක රාජ්‍ය නිලධාරීන් හතරදෙනෙක් ඉන්නවා. ඒ අය තමයි, ග්‍රාම නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර, සමෘද්ධි සංවර්ධන නිලධාරී සහ ආර්ථික සංවර්ධන නිලධාරී. මම යෝජනා කරනවා, අවදානමට ලක් විය හැකියි කියන ප්‍රදේශ 3,402හිම රාජකාරී කරන ඒ නිලධාරීන් හතරදෙනාට පූර්ණ පුහුණුවක් ලබා දීලා, ඒ අය හරහා training of trainers වැඩසටහනක් වසම් මට්ටමින් ක්‍රියාත්මක කරලා ප්‍රජාව දැනුවත් කිරීම ඉතාම වැදගත් කියලා. ඒ වාගේම, මම අවසාන වශයෙන්- *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා දැන් විනාඩි 3ක් ගත්තා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේක පාර්ලිමේන්තුවද? මොකක්ද මේක?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ඇයි, මොකක්ද ප්‍රශ්නය? මොකක්ද ගැටලුව? අපට පැහැදිලි කිරීමක් කර ගන්න බැරිද?

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයට පිළිතුරු දුන්නාට පසුව අමතර පැහැදිලි කර ගැනීමක් පමණයි කරගන්න පුළුවන්. *[බාධා කිරීමක්]* මොකක්ද, මේ වෙලා තිබෙන්නේ? ඔබතුමාට මෙතැන ඕනෑ ඕනෑ ඒවා කියව කියවා ඉන්න බැහැ, ගරු විපක්ෂ නායකතුමනි. ගරු කථානායකතුමනි, ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර මෙතුමන්ලාගේ මේ විකාර නතර කරන්න කියලා. මොකක්ද මේ? ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමා මේ කාලය කන්නේ,- *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා දැනට විනාඩි 3ක් අරගෙන තිබෙනවා. දැන් අවසන් කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
මට කොච්චර කාලයක් තිබෙනවාද, කරුණු පැහැදිලි කර ගැනීමට?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ සඳහා ඔබතුමාට විනාඩි 3ක් ලැබෙනවා. ඒ විනාඩි 3ක කාලය දැන් ඉවරයි. ඒ නිසා දැන් අවසන් කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
එහෙම කටවල් වහන්න එන්න හොඳ නැහැ නේ, අපේ. එතුමන්ලාට ඕනෑ ඕනෑ විධියට මම ප්‍රශ්න අහන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

මම අවසාන වශයෙන් මේ කාරණය කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා අර සභාගත කරපු ඇමුණුම් හරහා ඉදිරිපත් කළ මුළු ගණන් හිලව් බලා ගන්න අපට බැරි වුණා. මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, මේ කියන වන්දි ලබා දීමේදී ඇත්ත වශයෙන්ම විපතට පත් වුණු අයට - විශේෂයෙන්ම "දිවිවා" සුළි කුණාටුවෙන් විපතට පත් වුණු අයටත් - ඔය එල් නිනෝ, ලා නිනා සම්භාවිතාව තුළ විපතට පත් වුණු ගොවීන්ටත් ප්‍රමාණවත් ලෙස වන්දි ලැබී නැහැ කියන කාරණය කෙරෙහි.

වන්දි ලැබිය යුතු අයටත් ඒ වන්දි ලබා දීම ප්‍රමාද වෙලා තිබෙනවා. ඒ පිළිබඳව අවධානය යොමු කරලා ඒවාට විසඳුම් ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු කථානායකතුමනි, පෙර පැහැදිලි කරපු විස්තරය අනුව ඒ ඒ ක්ෂේත්‍ර පිළිබඳව මම විග්‍රහයක් කළා. බලශක්ති ක්ෂේත්‍රය, කෘෂි ක්ෂේත්‍රය, වන්දි ලබා දීම, හානි සිදුවීම යනාදිය පිළිබඳව අපේ තිබෙන සැලසුම අනුව අපි විග්‍රහයක් කළා. වන්දි ලබා දීමේදී ඉතා ක්‍රමානුකූලව බිම් මට්ටමේ සිට - ග්‍රාම නිලධාරි ස්ථරයේ සිට ජාතික මට්ටමට යනකල් - හැම ක්ෂේත්‍රයක්ම සම්බන්ධීකරණය කරලා ඒ වන්දි මුදල් ලබා දීමේ කටයුතු සිදු කර තිබෙනවා. නමුත්, තාක්ෂණික හෝ වෙනත් කරුණු අනුව සමහර ප්‍රමාද වීම් සිද්ධ වෙලා ඇති කියා අපිත් විශ්වාස කරනවා. ඒවා සම්බන්ධයෙනුත් අපි කටයුතු කරගෙන යනවා. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය - NDRSC - ඇතුළු stakeholdersලාත් එක්ක සියලු අංශ සම්බන්ධීකරණය කරගෙන අපේ ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්තුමා චක්‍රලේඛය අනුව වන්දි මුදල් ගෙවීම ඉතාම පැහැදිලිව සිදු කර තිබෙනවා. ඒ අනුව තමයි ඔය පිළිතුර ඉදිරිපත් කළේ. තවත් විස්තර ඕනෑ නම් ඉදිරියේදී ඉදිරිපත් කරන්න පුළුවන්.

බොහොම ස්තුතියි.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානයකතුමනි, මා මතු කරපු ප්‍රශ්නය ඔබතුමා ලේකම් මණ්ඩලයට යොමු කළා. මට පිළිතුර ලැබී තිබෙනවා. කරුණාකර මට මේක ඔප්පු කරන්න ඉඩ දෙන්න. මොකද, මට චෝදනාවක් ආවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ කාරණාව ගැන මම හොයලා බලලා ඔබතුමාට පිළිතුරු ලැබෙන්න සලස්වන්නම්.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ඊයේ දිනයේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවල තිබුණු 8වන ප්‍රශ්නය අසිත නිරෝෂණ මන්ත්‍රීතුමා 2026.08.21වන දින භාර දීලා තිබෙනවා. *[බාධා කිරීමක්]* මට තත්පර කිහිපයක් දෙන්නකෝ, ගරු කථානායකතුමනි. Table Office එකෙන් අත් අකුරුවලින් මේ ලියා එවා තිබෙන්නේ. මම තත්පර කීපයයි ගන්නේ. 2026.09.25 දින න්‍යාය පුස්තකයට මේක ඇතුළත් වෙලා තිබෙනවා. 2026.10.21වන දා මේ ප්‍රශ්නය ඇහුවා. එතකොට මාස දෙකයි ගත වෙලා තිබෙන්නේ. චමින්ද විජේසිරිගේ ප්‍රශ්නය 2024.11.27 දින භාර දුන්නේ. 2026.09.25වන දා තමයි එය න්‍යාය පුස්තකයට යන්නේ. 2026.10.21වන දායි ඒක ඇහුවේ. ඒකට අවුරුදු 2ක් ගත වෙලා තිබෙනවා. මට ප්‍රශ්නය අහන්න අවුරුදු 2ක් ගත වෙන්නයි, එතුමාට මාස 2ක් ගත වෙන්නයි හේතුව මොකක්ද? ගරු කථානායකතුමනි, මේකට කියන්නේ මොකක්ද? මම ප්‍රශ්න 155ක් දීලා තිබෙනවාලු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්න 155ක් භාර දීලා තිබෙනවා. මේ දක්වා අසා ඇති සංඛ්‍යාව 30යි. ඉතින්, ගරු මන්ත්‍රීතුමා ඔච්චර ප්‍රශ්න දුන්නාම තෝරා ගන්න එපායැ. *[බාධා කිරීමක්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, පොඩ්ඩක් ඉන්නකෝ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 ඉදිරිපත් කිරීම, ගරු හර්ෂණ නානායක්කාර අමාත්‍යතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. *[බාධා කිරීම්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
උදේම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද ඔබතුමාගේ point of Order එක, ගරු විපක්ෂ නායකතුමා?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට දැනුම් දීලා තිබෙනවා, මම අහපු තවත් ප්‍රශ්නයකටත් ඒ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා උත්තර දෙනවා කියලා. එය ලිඛිතවම තිබෙනවා. මොකක්ද මේ විහිළුව? ඒකටත් කාගෙන් හරි order එකක් ආවාද, උත්තර දෙන්න එපා කියලා?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ, එහෙම manipulation එකක් නැහැ, ගරු විපක්ෂ නායකතුමනි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුර ලබා දී අවසන් කියපු නිසාත්, ඒ පිළිතුරු දෙකම එතැන ඇති කියලා හිතාගෙනත් තමයි මම ඊළඟ කාරණයට ගියේ.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු කථානායකතුමනි, අවසන් නැහැ. ගරු විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද තවත් ප්‍රශ්නයකට පිළිතුරක් ලබා දෙන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එහෙම නම් ඔබතුමා එම ප්‍රශ්නයටත් පිළිතුරු ලබා දෙන්න.

"දිට්වා" සුළි කුණාටුවෙන් පසු රට යළි ගොඩනැඟීමේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය: ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

தித்வா சூறாவளியின் பிறகு நாட்டை மீட்டெடுப்பதற்கான நிதி மற்றும் பௌதிக முன்னேற்றம்: பாதுகாப்புப் பிரதி அமைச்சரினது கூற்று

FINANCIAL AND PHYSICAL PROGRESS OF RESTORING THE COUNTRY AFTER CYCLONE "DITWAH": STATEMENT BY DEPUTY MINISTER OF DEFENCE

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු කථානායකතුමනි, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා 2026.09.23වැනි දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(1) "දිට්වා" සුළි කුණාටු ව්‍යසන තත්ත්වය ඇතිවීමෙන් පසු තක්සේරු දත්ත ගෝලීය පශ්චාත් ආපදා හානි ඇස්තමේන්තුව - Global Post-disaster Needs Assessment, පශ්චාත් ආපදා දත්ත වාර්තාව - Post-disaster Needs Assessment - 2026 අප්‍රේල් මස සකස් කර ඇති අතර, එය අදාළ පාර්ශ්වකාර ආයතන මඟින් දත්ත තහවුරු කරගෙන ඇති වාර්තාවකි. එම වාර්තාවට අමතරව වෙනත් දත්ත සහිත වාර්තාවක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙතින් නිකුත් කරලා නැහැ.

අ.අ	ජීවිත හානි	අතුරුදන්	අවතැන් වීම්	නිවාස හා දේපළ හානි		ජීවනෝපාය අහිමි වීම්
				පූර්ණ	අර්ධ	
01	646	173	169,642 වැඩි	5,945	107,832	ඇමුණුම අංක 01 යටතේ දක්වා ඇත

ඒ වාගේම දිස්ත්‍රික්ක වශයෙන් සවිස්තරාත්මක තොරතුරු ද ඇමුණුම 01 යටතේ සඳහන් කර තිබෙනවා.

එමෙන්ම, පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරුව - PDNA - අනුව එකිනෙක ක්ෂේත්‍රයන්ට අදාළ බලපෑම් දත්ත මෙසේය.

ක්ෂේත්‍රය	**සමස්ත බලපෑම (රුපියල් මිලියන**
1. සමාජීය ක්ෂේත්‍රය - (හානිය සහ පාඩුව)	
• නිවාස සහ වාසස්ථාන	137.7
• සෞඛ්‍ය	4.1
• අධ්‍යාපන	11.8
එකතුව	**153.6**
2. නිෂ්පාදන ක්ෂේත්‍රය - (හානිය සහ පාඩුව)	
• සංචාරක	10.4
• වාණිජ හා කර්මාන්ත	212.5
• කෘෂිකාර්මික හා ආහාර ක්‍රමවේදය	162.1
එකතුව	**385.0**
3. යටිතල පහසුකම් ක්ෂේත්‍රය - (හානිය සහ පාඩුව)	
• ජල හා සනීපාරක්ෂක	14.6
• ගමනාගමන	321.4
• වාරිමාර්ග	49.5
• බලශක්ති	29.7
එකතුව	**415.2**
4. අන්තර් සබඳතා ක්ෂේත්‍රය (Cross Cutting Sector) - (හානිය සහ පාඩුව)	
• Governance (පාලනය)	2.1
• පරිසරය	66.1
• රැකියා ජීවනෝපාය	5.4
• ආපදා අවදානම් අවම කිරීම	6.6
එකතුව	**80.2**

(2) "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් හානි වූ නිවාස සම්බන්ධ තොරතුරු පහත දක්වා ඇත.

(අ) අර්ධ නිවාස හානි දීමනාව ගෙවීම් ප්‍රගතිය

මුළු අර්ධ හානි නිවාස සංඛ්‍යාව - 98,463

ගෙවීම් සිදු කරනු ලබන ආකාරය	වන්දි ගෙවීම සඳහා සුදුසුකම් ලැබූ පවුල් සංඛ්‍යාව	ගෙවීම් සිදු කළ නිවාස ඒකක සංඛ්‍යාව	ගෙවීම් සිදු කිරීමට නියමිත නිවාස ඒකක සංඛ්‍යාව
(I) තක්සේරුවකින් තොරව ගෙවීම (රු.500,000)			
පළමු අදියර (රු.300,000)	57,851	46,565	11,286
දෙවන අදියර (රු.200,000)	57,851	4,222	53,629
(II) තක්සේරු කර වන්දි ගෙවීම	15,886	12,990	2,896

තක්සේරු කර වන්දි ගෙවීමේදී, තක්සේරුව රුපියල් ලක්ෂ 3ට අඩු සම්පූර්ණ වන්දි මුදල එකවර 7,611දෙනෙකු සඳහා ගෙවීම් සිදු කර ඇති අතර, රුපියල් ලක්ෂ 3ට වැඩි තක්සේරු 5,379ක් සඳහා මේ වන විට ගෙවීම් සිදු කර තිබෙනවා.

එමෙන්ම මෙහිදී පළමු අදියරේ සියයට 50ක්ද, දෙවන අදියරේ සියයට 25ක්ද, තෙවන අදියරේ සියයට 25ක්ද වශයෙන් ගෙවීම් සිදු කර තිබෙනවා.

ඊට අමතරව විවිධ හේතු යටතේ නිවාස 22,034ක් හා අලුතෙන් හඳුනාගත් නිවාස 1,145ක් සඳහා වන්දි ගෙවීම සම්බන්ධයෙන් කම්ටු තීරණ සඳහා යොමු කරලා තිබෙනවා. වතු නිවාස 1,547ක් සඳහාද ගෙවීම් කටයුතු ආරම්භ කර තිබෙනවා. එම හේතු පහත සඳහන් පරිදි වේ.

- ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ නොලැබීම.
- අයිතිය තහවුරු කර ගැනීමේ ගැටලු.
- අයදුම්පත්‍රවල පවතින අඩුපාඩු.
- ප්‍රතික්ෂේපිත අයදුම්පත්.
- රක්ෂිත සහ අනවසර පදිංචිවීම් සම්බන්ධ ගැටලු.

එවැනි තාක්ෂණික ප්‍රශ්න නිසා තමයි ප්‍රමාදයන් ඇති වෙලා තිබෙන්නේ.

(ආ) "දිවිවා" සුළි කුණාටුව හේතුවෙන් සිදු වූ පූර්ණ නිවාස හානි පිළිබඳ විස්තර පහත පරිදි වේ.

- පූර්ණ හානි නිවාස සංඛ්‍යාව - 7,370යි.
- අධි අවදානම් නිවාස සංඛ්‍යාව - 17,240යි.
- කටුමැටි වැනි තාවකාලික නිවාස සංඛ්‍යාව - 7,213යි.
- දිස්ත්‍රික්ක අතර මාරුවීම් සම්බන්ධයෙන් ශුද්ධ ප්‍රතිඵලය නිශ්චිතව හම්බ වෙලා නැහැ. නමුත්, 324ක් කියලා සටහන් වෙලා තිබෙනවා.

ඒ අනුව සම්පූර්ණ වශයෙන් හානි වූ නිවාස සංඛ්‍යාව - 32,147යි.

ගෙවීම් සිදු කරනු ලබන ආකාරය	වන්දි ගෙවීම සඳහා සුදුසුකම් ලැබූ පවුල් සංඛ්‍යාව	ගෙවීම් සිදු කළ නිවාස ඒකක සංඛ්‍යාව	ගෙවීම් සිදු කිරීමට නියමිත නිවාස ඒකක සංඛ්‍යාව
ප්‍රතිලාභියාට අයත් ඉඩමක නිවසක් ඉදිකිරීම සඳහා	8,815	4,613	4,202
රජයේ ඉඩමක නිවසක් ඉදිකිරීම සඳහා	7,035	880	6,155
නිවසක් මිලදී ගැනීම සඳහා	5,175	678	4,497
ඉඩමක් මිලදී ගැනීම හා නිවසක් ඉදිකිරීම සඳහා	1,964	208	1,756
වෙනත්	354	13	341

මෙම ගෙවීම්, පළමු අදියර යටතේ රුපියල් මිලියන 2ක්ද, දෙවන අදියර යටතේ රුපියල් මිලියන 1.5ක්ද, තෙවන අදියර යටතේ රුපියල් මිලියන 1.5ක්ද වශයෙන් අදියර 03ක් යටතේ සිදු කරනවා.

ඊට අමතරව, විවිධ හේතු නිසාවෙන් වන්දි ගෙවීම් සම්බන්ධයෙන් කම්ටු තීරණ සඳහා යොමු කර ඇති සංඛ්‍යාව 7,536ක් වන අතර, හඳුනා ගන්නා ලද වතු නිවාස 1,268ක් සඳහාද ගෙවීම් කටයුතු ආරම්භ කර තිබෙනවා. එම හේතු පහත පරිදි වේ.

- ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ නොලැබුණු නිවාස.
- අයිතිය තහවුරු කර ගැනීමේ ගැටලු.
- අයදුම්පත්‍රවල පවතින අඩුපාඩු.
- ප්‍රතික්ෂේපිත අයදුම්පත්
- රක්ෂිත හා අනවසර පදිංචිවීම් සම්බන්ධ ගැටලු.

(ඇ) නිවාස හානිවලට අමතරව සුළි කුණාටුවෙන් ආපදාවට පත්වූවන්ට ලබා දී ඇති සහන සැලසීමේ 2026.09.16 දිනට ප්‍රගතිය පහත පරිදි වේ.

අනු අංකය	යෝජිත සහන	සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ගෙවා අවසන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ගෙවීමට ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ගෙවා ඇති මුදල (රුපියල් මිලියන)	වෙනත්
1	පදිංචියට යෝග්‍ය පරිදි පිරිසිදු කර ගැනීම සඳහා ගෙවන රුපියල් 25,000ක දීමනාව	432,146	431,707	439	10,792.68	
2	නිවාසවල නැවත පදිංචියට අත්‍යවශ්‍ය මුළුතැන්ගෙයි බඩුමුට්ටු ආදිය මිලදී ගැනීම සඳහා ගෙවන රුපියල් 50,000ක දීමනාව.	172,067	167,866	4,201	8,393.30	
3	පදිංචි නිවාස අහිමි වූ හෝ නිවස පූර්ණ ලෙස හානි වීම හේතුවෙන් ස්ථිර ජීවනෝපාය කටයුතුවල නිරත විය නොහැකි පවුල් වෙත ගෙවනු ලබන මාසික දීමනාව	1,274	1,274	0	97.50	මාසිකව උපරිම මාස 03ක් දක්වා රුපියල් 25,000/ 50,000 බැගින්
4	නව නිවසක් ඉදි කර ගන්නා තෙක් වෙනත් ස්ථානයක තාවකාලිකව පදිංචි වීමට ලබා දෙන මාසික ගෙවල් කුලී දීමනාව.	10,767	10,144	623	1,469.28	මාසිකව උපරිම මාස 09ක් දක්වා රුපියල් 25,000 බැගින්
5	පාසල් සිසුන්ට පොත්පත් හා ඇඳුම් පැළඳුම් මිලදී ගැනීම සඳහා ලබා දෙන දීමනාව (එක් පාසල් දරුවෙකුට රුපියල් 15,000/- බැගින්)	207,171	205,487	1,684	3,082.31	
6	ජීවිත හානියකදී ගෙවනු ලබන දීමනාව.	630	603	108	670.10	
7	ව්‍යාපාර හානි සඳහා වන්දි ලබා දීම.	37,980	28,915	9,065	2,778	

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

(3) ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය -

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සඳහා වැය ශීර්ෂ අංක 103-02-18-7-2202 යටතේ "දිවිවා" ව්‍යසනයේ ගංවතුර හා නායයෑම් හේතුවෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මේ දක්වා රුපියල් මිලියන 151,734.3ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර, එයින් මේ දක්වා අර්ධ හානි නිවාස සඳහා රුපියල් මිලියන 16,687.87ක්ද, පූර්ණ හානි නිවාස සඳහා රුපියල් මිලියන 20,320ක්ද, ව්‍යාපාර හානි සඳහා රුපියල් මිලියන 2,794ක්ද, ව්‍යාපාර ගොඩනැඟිලි හානි සඳහා රුපියල් මිලියන 33.2ක්ද වශයෙන් රුපියල් මිලියන 39,835.07ක ප්‍රමාණයක් වැය කර ඇත.

- ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සඳහා වැය ශීර්ෂ අංක 103-02-18-011-2202, 011-2103 හා 011-2509 යටතේ ගංවතුර හා නායයෑම්වලින් බලපෑමට ලක් වූ ප්‍රදේශයන්හි පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ කටයුතු (යටිතල පහසුකම් සංවර්ධනය) සඳහා මේ දක්වා රුපියල් මිලියන 712.5ක්, රුපියල් මිලියන 20ක් හා රුපියල් මිලියන 100ක්ද වශයෙන් ප්‍රතිපාදන ලබා දී ඇති අතර, මේ යටතේ අන්තර්කාලීන නිවාස ඉදිකිරීම, උපකරණ මිලදී ගැනීමට හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මෙම මුදල් ලබා දී ඇති අතර, 2026.08.31 දිනට වියදම් වී ඇති මුදල රුපියල් මිලියන 74.5ක් හා රුපියල් මිලියන 18.17ක්ද වශයෙන් රුපියල් මිලියන 92.67ක ප්‍රමාණයක් වැය කර ඇත.

(4) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය -

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත මූල්‍යාධාර ලැබී නොමැති බව දන්වා තිබෙනවා.

2026.08.07 දින වනවිට බදු නිදහස් ක්‍රමවේදය යටතේ විදේශීය මානුෂීය ආධාර ලබා ගැනීම් අවසන් කර තිබෙනවා. ඒ අනුව ලැබී ඇති භාණ්ඩ හා ද්‍රව්‍යයන් පහත වගුවේ දැක්වේ.

භාණ්ඩ වර්ග (Asset type)	භාණ්ඩ තොග (Consignment)	ටොන් ගණන (Tons)	වටිනාකම (Value) (USD)
ස්ථාවර වත්කම් ආධාර Fixed Asset	60	1804.49	9,213,270.41
පරිභෝජන ආධාර Consumer Asset	152	3257.47	9,351,688.00
එකතුව	**212**	**5061.97**	**18,564,958.00**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සම්බන්ධීකරණය යටතේ ලබා දුන් ද්‍රව්‍යමය ප්‍රතිපාදන ඇමුණුම 02 යටතේ දක්වා ඇත.

එමෙන්ම, ආසියානු යටිතල පහසුකම් සංවර්ධන බැංකුවෙන්, ඉන්දීය රජය මඟින්, ආසියානු සංවර්ධන බැංකුවෙන්, සංක්‍රමණ සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය මඟින් තමයි ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත ඒ, ඒ භාණ්ඩ ලැබී තිබෙන්නේ. ඊට අදාළ විස්තර ඇමුණුම 03 මඟින් දක්වා ඇත.

(5) ආපදා කළමනාකරණ අංශය -

හඳුනා ගත් හිඩැස් මහ හරවා නව ආපදා අවදානම් කළමනාකරණ යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා ජාතික ආපදා කළමනාකරණ ඒකාබද්ධ යන්ත්‍රණයක් සැකසීම හා 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ කමිටුව නමින් කමිටුවක් පත් කළා.

මේ වන විට එම කමිටුවේ නිර්දේශ මත,

1. ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීමටත්,
2. ආපදා කළමනාකරණය කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය - NDRSC එක - ඒකාබද්ධ කර නව ආයතනික ව්‍යුහයක් ඇති කිරීමටත්,
3. ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා ආපදා අවදානම් කළමනාකරණ යන්ත්‍රණය නව ක්‍රමවේදයකින් ක්‍රියාත්මක කිරීම සඳහාත් කටයුතු කරමින් පවතිනවා.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය -

"දිවිවා" ව්‍යසනයෙන් හඳුනා ගත් අවදානම් හා අභියෝග අවම කිරීමේ ජාතික වැඩ පිළිවෙළ

<u>විද්‍යාත්මක පුරෝකථන / පූර්ව අනතුරු ඇඟයීම්</u>

- හානිය පදනම් වූ ආපදා කළමනාකරණ දත්ත සරලව මහජනතාවට ලබා දීම සඳහා සියලු පාර්ශ්වකරුවන්ගේ දත්ත හුවමාරු කර ගැනීමේ යන්ත්‍රණයක් සකස් කර එම දත්ත පද්ධතියට සම්බන්ධ කරමින් තීරණ ගැනීමේ ක්‍රමවේදයක් - decision support system එකක් - හා පද්ධතියක් සකස් කරමින් පවතින අතර 2026.12.31ට පෙර ප්‍රජාවට භාවිත කළ හැකි පරිදි ඒ සඳහා කටයුතු සූදානම් කරලා තිබෙනවා.
- ජාත්‍යන්තර සුනාමි අනතුරු ඇඟවීමේ ආයතනය හා එක්ව ජාතික මට්ටමින් තාක්ෂණික කමිටුවක් 2026.07.07 පත් කර, ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමටත් කටයුතු කර තිබෙනවා.

අවම කිරීම් යටතේ දිස්ත්‍රික් ආපදා අවදානම් තක්සේරුව යාවත්කාලීන කිරීම ආරම්භ කර තිබෙනවා.

පූර්ව සූදානම් යටතේ ජාතික ආපදා කළමනාකරණ සැලසුම් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කර තිබෙනවා. ආයතනික ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම සඳහා ව්‍යසන කළමනාකරණ ජාතික සභාවේ අනුමැතිය ලැබී තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, පිළිතුර කෙටි කරන්න.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු කථානායකතුමනි, NBRI එක ලබා දී තිබෙන විස්තර ඇමුණුම 04, ඇමුණුම 05 සහ ඇමුණුම 6 යටතේ සඳහන් කර තිබෙනවා.

(6) මීට අදාළව දීර්ඝ පිළිතුරක් තිබෙනවා.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් එල් නිනෝ තත්ත්වය පිළිබඳව සෑම සතියකම දැනුවත් කිරීම සිදු කරනවා. දකුණු ආසියානු දේශගුණික පුරෝකථන සංසදයේ සහභාගිත්වයෙන්, ජාත්‍යන්තර සහ දේශීය මට්ටමෙන් තිබෙන තාක්ෂණික ක්‍රමවේදවලට අනුව කටයුතු කර තිබෙනවා.

ජනාධිපතිතුමා විසින් පිහිටුවා ඇති එල් නිනෝ සම්බන්ධව වන ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී ප්‍රමුඛ කමිටුවට අධ්‍යක්ෂ ජනරාල්වරයා නිතරම සහභාගි වනවා. ඒ හැම අවස්ථාවකදීම එක්සත් ජාතීන්ගේ කාන්තාරීකරණයට එරෙහි සම්මුතියේ - UNCCD - COP17 සමුළුවේදී ඉදිරිපත් වූ යෝජනා හා අවස්ථාවන් මත ශ්‍රී ලංකාවට ලබා ගත හැකි තාක්ෂණික සහ මූල්‍ය සහාය ලබා ගැනීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති හා යෝජනා සකස් කිරීම සඳහා වන අනුකමිටුවට දායකත්වය ලබා දීලා තිබෙනවා. ඒ අනුව ඉදිරියේදී අනුකමිටුව විසින් පනත සංශෝධනය කරලා, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් විශේෂ උපායීය ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා වූ විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරන්න බලාපොරොත්තු වනවා. ඒ සම්බන්ධයෙන් වූ තොරතුරු පිටු ගණනකින් සමන්විත වෙනවා. ඒ විස්තර කියෙව්වාම ඔබතුමාට ඒ සම්බන්ධයෙන් අවබෝධය ලබා ගන්න පුළුවන්. ඔබතුමා ඇසූ ප්‍රශ්න හයටම පිළිතුරු එපමණයි, ගරු විපක්ෂ නායකතුමනි.

ඇමුණුම් 01, 02, 03, 04, 05 සහ 06 ද ඇතුළුව මීට අදාළ සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වෙනවා, පිළිතුරු ලබා දීම පිළිබඳව. විශේෂයෙන්ම ඔබතුමාගෙන් මේ පැහැදිලි කිරීම් ලබා ගන්න කැමතියි. පාර්ලිමේන්තුව රැස් වෙලා, "දිට්වා" කුණාටුවෙන් විපතට පත් වුණු ජනතාවට වාගේම යටිතල පහසුකම් සංවර්ධනයට යනාදී වශයෙන් රුපියල් බිලියන 500කට වැඩි මුදලක් ලබා දීමේ යෝජනාවට කිසිම භේදයකින් තොරව අපේ අනුමැතියත් ලබා දුන්නා. හැබැයි, ඒ ලබා දුන්නු මුදල් ජනතාව අතරට ගෙන යාමේදී මූල්‍ය ප්‍රගතියත්, භෞතික ප්‍රගතියත් ඉතාම දුර්වල මට්ටමකයි පවතින්නේ.

ඔබතුමා කිව්වා, සහන ලබා දීමේ categories කීපයක් ගැන. සමහර ඒවායේ ප්‍රගතිය සියයට 50යි; සමහර ඒවායේ ප්‍රගතිය සියයට 25යි; තවත් ඒවායේ ප්‍රගතිය සියයට 25යි. මම ඔබතුමාගෙන් අහන්න කැමතියි, මීට වැඩිය වැඩි ප්‍රගතියක් ලබා ගන්න ඔබ කටයුතු කරන්නේ නැත්තේ ඇයි කියලා. ඒ වාගේම විදේශ ආයතනවලින් ලැබුණු ආධාර ගැන මම ඔබතුමාගෙන් ඇහුවා. ඉතාම දුර්වල මුදල් ප්‍රමාණයක් තමයි විදේශ ආධාර ලෙස ලැබී තිබෙන්නේ "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වුණු අයට සහන ලබා දෙන්න. ඒකට මොකක්ද හේතුව කියන එකත් මම ඔබතුමාගෙන් අහනවා.

අවසාන වශයෙන් මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමතියි. ඇත්තවශයෙන්ම ගෝලීය කාලගුණික, දේශගුණික විපර්යාස තුළ නොසිතන ව්‍යසනවලට අපට මුහුණ දෙන්න සිදුව තිබෙන මොහොතක දැන් තිබෙන යන්ත්‍රණය සහ වැඩ පිළිවෙළ, අණපනත්, ව්‍යුහය කියන සියල්ලක්ම යල්පැන ගිහිල්ලා තිබෙන්නේ. මම ඔබතුමාගෙන් මේ ප්‍රශ්නයත් අහන්න කැමතියි. ඇත්තවශයෙන්ම අපට මුහුණ දෙන්න තිබෙන මේ විවිධ විපර්යාස සහ ව්‍යසන නිසා අපට අලුත් පනත් අවශ්‍යයි, ආපදා කළමනාකරණයට අදාළව අලුත් ආයතන අවශ්‍යයි, අලුත් ආයතනික ව්‍යුහයක් අවශ්‍යයි. ව්‍යසනයක් සිදු වුණාට පසුව ඒකට ප්‍රතිචාර දැක්වීමට පමණක් සීමා නොවී, මේ ව්‍යසනකාරී තත්ත්වයන් පිළිබඳව යම් පුරෝකථන කරලා, ඒවා අවම කරගැනීමේ යම්කිසි preventive, එහෙම නැත්නම් අගතිගාමී බලපෑම් අවම කිරීමේ - harmful impact minimization - අලුත් ව්‍යුහයකට, අණපනත්වලට, වැඩ පිළිවෙළකට යන්න ඔබ සූදානම්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා කෙටියෙන් පිළිතුරු ලබා දෙන්න. පෙර වරු 11.30 වනවිට අපට main Business පටන් ගන්න අවශ්‍යයි.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු විපක්ෂ නායකතුමනි, ඒ ප්‍රශ්නයේ කොටස් තුනක් තිබුණා නේ. තුන්වැනි කොටසට පැහැදිලිව මම පිළිතුරු දුන්නා නේ. මම දන්න විධියට ඒ සඳහා පිළිතුරු දුන්නා. ඔබතුමාත් හිටියා, National Disaster Management Council එකේ. We sat together and discussed this matter. We have appointed a committee, and a proposal to amend the Act has been submitted. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයයි, ආපදා සහන සේවා මධ්‍යස්ථානයයි කියන දෙකම ඒකාබද්ධ කරලා ව්‍යුහයක් හදලා උපායීය ක්‍රමවේදයක් සකස් කිරීම ගැන විස්තර මම මේ පිළිතුරුවලදීත් ලබා දුන්නා. ඉදිරියේදී තාක්ෂණික සහ අනෙකුත් ප්‍රායෝගික බලපෑම්වලට මුහුණ දෙන්න සිදු වෙන්න පුළුවන්. ඒක බොහොම පැහැදිලියි. මම මේ පාර්ලිමේන්තුවට ආවාට පසුව කවදාවත් මෙච්චර ෆයිල් ගොඩක් උස්සාගෙන ඇවිල්ලාත් නැහැ. මේක ඒ තරම් ලොකු පිළිතුරක්. මා ළඟ සම්පූර්ණ පිළිතුර තිබෙනවා. ඔබතුමාට අවශ්‍ය නම් දෙන්නම්. Bundles දෙකක් තිබෙනවා. ඔබතුමාගේ බෑග් එකත් මදි වෙයි, ඒවා දමා ගන්න. ගරු විපක්ෂ නායකතුමනි, වන්දි මුදල් ගෙවීමේ ප්‍රමාණය හරි. නමුත් ඒ ප්‍රමාණය වැඩි වෙනවා. ඉදිරියට ගෙවන්න තිබෙන ප්‍රමාණය ගත්තාම, මේ අවුරුද්ද අවසාන වනකොට එය ගෙවා අවසන් කරන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම, ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා. You have 13 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වී සාලි මහතා] මූලාසනාරූඩ විය.

අතන්පිටකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, පිරතිච් සභානායකර් අවර්කළ් [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත

நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம்

POISONS, OPIUM AND DANGEROUS DRUGS (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[පූ.භා. 11.31]

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත (එල්.ඩී. - ඕ 8/2026) දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත (එල්.ඩී. - ඕ 11/2026) ද මා ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතට - එකම පනතට - සංශෝධන දෙකක් ගෙන එනු ලබනවා. එක සංශෝධනයක් ගැන මා මුලින් කියන්නම්. මේ සමාජය තුළ යම් අදහසක් තිබුණා, - එය වැරදි නැහැ - මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගත්තාට පස්සේ ඒවා සම්බන්ධයෙන් නඩු අහලා ඉවර කරන්න යන කාලය තුළ මේ මත්ද්‍රව්‍ය නැවත සමාජගත වීමේ අවදානමක් තිබෙනවා කියලා. ඒ කියන්නේ ඒ drugs ඒ chain එකෙන් එළියට ඇවිල්ලා නැවත සමාජයට, එළියට එන තත්ත්වයක් තුළ මත්ද්‍රව්‍ය උවදුර සම්බන්ධයෙන් සටන් වැදීමේදී ගැටලු තත්ත්වයක් මතු වන බවට ජනතාව අතරත්, ඒ ක්ෂේත්‍රයේ ඉන්න පුද්ගලයන් අතරත් අවබෝධයක් තිබුණා. ඒ නිසා ජනාධිපතිතුමා විසින් මේ ගැන සොයා බලා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ප්‍රමුඛ කමිටුවක් හරහා ගෙන එනු ලබන සංශෝධනය, එනම් අත්අඩංගුවට ගන්නා මත්ද්‍රව්‍ය සාම්පල නඩු අවසන් වනතෙක් තබා ගන්නේ නැතිව යම් යම් අවස්ථාවලදී අධිකරණයේ අවසරය ඇතිව වෙනස් කරන ආකාරය පිළිබඳව වන සංශෝධනය ගැන තමයි මා මුලින් අදහස් දක්වන්නේ.

මේ සංශෝධනයේ මූලිකවම කරුණු කිහිපයක් තිබෙනවා. ඕනෑම පරීක්ෂකයෙක් ඒ මත්ද්‍රව්‍යයක් අත්අඩංගුවට ගත්තාට පස්සේ එහි ඡායාරූප ගැනීම අනිවාර්ය කරලා තිබෙනවා. ඒ මත්ද්‍රව්‍යය, එහෙම නැත්නම් ඒ භාණ්ඩය, එහෙම නැත්නම් ඒ preparation එක original තිබෙන විධියට පින්තූර ගන්න ඕනෑ. ඒ කියන්නේ, එහි තිබෙන seal, bag, package ඕනෑ දෙයක්. ඒ වාගේම අවශ්‍ය අවස්ථාවල සුදුසු විධියට video recordings පවා කරන්න ඕනෑ. ඊට පස්සේ වෙනත් වාර්තාවලට අමතරව මහෙස්ත්‍රාත්වරයාට ඒ මත්ද්‍රව්‍ය ඉදිරිපත් කරන අවස්ථාවේ ඒ ගන්නා ලද ඡායාරූප සහ ඒ විස්තරත් ඉදිරිපත් කරන්නට ඕනෑ. මේකෙන් අපේක්ෂා කරන්නේ, චිත්තිකාරයන්ට වැරදි විධියට මත්ද්‍රව්‍ය plant කිරීම, එහෙම නැත්නම් introduce කර දීම වළක්වා ගැනීමයි. ඒ වාගේම පරීක්ෂකයාටත් අවස්ථාවක් දීලා තිබෙනවා, මෙය විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ 54(අ) වගන්තිය යටතේ ගැනෙන වරදක් නම් කෙළින්ම රස පරීක්ෂක වෙත ඒ සාම්පල යවන්න. මහෙස්ත්‍රාත්වරයාටත් එසේම කළ හැකියි.

ඒ වාගේම ගංජා වාගේ දේවල් අත්අඩංගුවට ගැනීමේදී - ගංජා වාගේ දේවල් කිලෝ ගණන්; කිලෝ 20, 25, 30 හම්බවෙන අවස්ථා තිබෙනවා. ඒවා රඳවා තබා ගන්නත් අපහසුයි, ඉඩ ප්‍රමාණයක් යනවා - එම මත්ද්‍රව්‍ය සාම්පලයක් පමණක් රස පරීක්ෂක වෙත යවලා, අවශ්‍ය නම් ඉතිරි කොටස කොන්දේසිවලට යටත්ව විනාශ කරන ලෙසට මහෙස්ත්‍රාත්වරයා විසින් නියෝගයක් දෙන්න පුළුවන්.

මෙහි වඩා වැදගත් දේ මෙයයි. අපි සියලු දෙනාම දන්නවා බන්ධනාගාරවල සෙනඟ වැඩි වෙන්න හේතුවක් වුණේ රස පරීක්ෂක වාර්තා ප්‍රමාදයයි කියන එක. ඒක රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වරදක් නොවෙයි. පුරප්පාඩු රාශියක් තිබුණා. ඊට පස්සේ අපේ රජය යටතේ ඒ පුරප්පාඩු පුරවා ගෙන, අලුතෙන් යන්ත්‍ර ගෙනැල්ලා, රස පරීක්ෂක වාර්තා දෙන එක ඉතාම වේගවත් කළා. කලින් රස පරීක්ෂක වාර්තා දෙන්න අවුරුද්දක්, එකහමාරක් පමණ ගියත් මේ වන විට අපි ඒ backlog එක ඉවර කර ගනිමින් යනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, රස පරීක්ෂක වාර්තා අගෝස්තු සහ සැප්තැම්බර් මාසයට විතරක් 17,506ක් නිකුත් කරලා තිබෙනවා. රස පරීක්ෂක වාර්තා ලැබීම වේගවත් වීම නිසා බන්ධනාගාරයේ රැඳවියන් ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. ජූලි 01වැනි දා වනකොට බන්ධනාගාරගතව සිටියා රැඳවියන් 41,993ක්. එදා තමයි අපි ව්‍යාපෘතිය පටන් ගත්තේ. සැප්තැම්බර් 30වන දා වනකොට රැඳවියන් ප්‍රමාණය 36,925ක් දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ, රස පරීක්ෂක වාර්තා ලැබීම වේගවත් වුණොත්, ඉතා ඉක්මනින් prisons ඇතුළේ තිබෙන ප්‍රශ්නත් විසඳා ගන්න පුළුවන්. ඒ සියලු දේ සලකා බලලා, පනත් කෙටුම්පතට ඇතුළත් කර තිබෙනවා, භාණ්ඩයක් හෝ සැකසුමක් හෝ සාම්පලයක් පිළිබඳ පරීක්ෂණයක් කරන්න රස පරීක්ෂකවරයාට ලැබුණාම මාස 2ක් ඇතුළත රස පරීක්ෂණ වාර්තාව දෙන්න ඕනෑ කියලා. එතකොට රස පරීක්ෂක වාර්තාව ප්‍රමාද වීම කියන කාරණය මත කිසි කෙනෙකුට අනවශ්‍ය ලෙස රිමාන්ඩ්ගත වෙලා ඉන්න අවශ්‍ය වෙන්නේ නැහැ.

ඒ වාගේම රස පරීක්ෂකවරයාටත් වගකීමක් පැවරෙනවා, තමන්ට ලැබෙන ඒ මත්ද්‍රව්‍ය වර්ගය, භාණ්ඩය හෝ package එක කලින් විධියටම පින්තූර අරගෙන අවශ්‍ය නම් වීඩියෝගත කිරීමත් කරලා එයත් මහෙස්ත්‍රාත් අධිකරණයට දැනුම් දීමට. ඒ වාගේම නඩුව මුල්වරට අධිකරණය ඉදිරියේ කැඳවන අවස්ථාවේ රස පරීක්ෂක වාර්තා සමඟ එම පින්තූර සියල්ලම තිබෙන්නට ඕනෑ. ඉන් පසුව, මහෙස්ත්‍රාත්තුමා අවශ්‍ය අවස්ථාව අනුව සුදුසු විධියකට, එක්කෝ එම සාක්ෂිය ආරක්ෂා කරන ලෙස රස පරීක්ෂකට කිව්වොත්, නඩුව අවසන් වනතුරු එය එසේ තබා ගන්න ඕනෑ. එහෙම නැත්නම්, එය විනාශ කළ යුතු යැයි මහෙස්ත්‍රාත්වරයා කොන්දේසි සහිතව හිතන්නේ නම් එයට ඉඩ තිබෙනවා.

මෙම පනත් කෙටුම්පත බැලුවොත්, පැහැදිලිව අපි උත්සාහ කර තිබෙන්නේ, නඩුවක් ඉවර වන කල් මත්ද්‍රව්‍ය සම්පූර්ණ package එකම තියා ගන්නවා වෙනුවට හැකි අවස්ථාවලදී නීතියට අනුකූලව ඒවා විනාශ කිරීමටයි. ඉතින්, අපි විශ්වාස කරනවා මේ හරහා අපට හැකියාව ලැබෙනවාය කියලා, ඉතා ඉක්මනින් ඒ ගැටලුව අවසන් කර ගන්න. ඒ වාගේම drugs නැවත සමාජයට යන ප්‍රශ්නයත් ඒ හරහා වළක්වා ගන්න පුළුවන්. මොකද, නඩුව අවසන් වනතුරු ඉන්නේ නැතුව ඉතා ඉක්මනින් ඒවා විනාශ

කිරීමට මහෙස්ත්‍රාත්වරයාට බලය තිබෙනවා. නමුත්, අවශ්‍ය අවස්ථාවලදී අවශ්‍ය කොන්දේසිවලට යටත්ව, ඒ වාගේම චිත්තිකාරයාගේ අයිතීන්වලට අගතියක් නොවන ලෙසට එය කළ යුතුයි. මොකද, නඩුවකදී සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමේ වගකීම තිබෙන්නේ රජයට. එහිදී ඒවාට අගතියක් නොවන ලෙසට කටයුතු කළ යුතුයි. එය තමයි පළමුවැනි සංශෝධනයේ මූලික හරය වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි සංශෝධනය නම් අපි වසර ගණනාවක් තිස්සේ කරපු එකක්. ඒ, ඇප සම්බන්ධයෙන් වූ ප්‍රශ්නය. විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතට 2022දී සංශෝධනයක් ගෙනෙන්න කලින් ශුද්ධ බර ග්‍රෑම් 2කට වඩා වැඩි අවස්ථාවලදී මහාධිකරණය විසින් ඇප දෙනු ලැබුවා. නමුත්, 2022දී සංශෝධනයක් ගෙනාවා. ඒකෙන් පසුව ශුද්ධ බර ග්‍රෑම් 10ට වඩා වැඩි නම් කොළඹ අභියාචනාධිකරණයට පමණයි ඇප දීමේ බලය තිබුණේ. එහිදී ඇති වුණු ගැටලුව තමයි, මිනිසුන්ට අධික වියදමක් දරන්න වීම. ඒ කොහොමද? යාපනයේ ඉන්න කෙනාත් කොළඹ එන්න ඕනෑ. ගාල්ලේ ඉන්න කෙනාත් කොළඹ එන්න ඕනෑ. ඒ වාගේම අධික නීතිඥ ගාස්තු. Now, when it comes to access for justice, the cost, physical access and the location matters. යුක්තියට ප්‍රවේශ වෙන්න මිනිසුන්ට අයිතියක් තිබෙන්න ඕනෑ. ඒ අයිතියට මුදල්මය බාධා එනවා නම් ඒක වැරදියි. ඒ වාගේම හැමෝටම කොළඹ එන්න වනවා නම්, එය geographically අමාරුයි. ඒකෙන් සිදු වුණු දේ තමයි, රස පරීක්ෂක වාර්තා එන කල් නඩු පවරන්න නොහැකි වීම.

2022දී එම සංශෝධනය ගෙනාවේ ඇයි කියලා අපි හෙව්වාට කිසිදු සාධාරණ හේතුවක් අපට හම්බ වුණේ නැහැ. මෙවර සංශෝධන ගෙන ඒමේදී ඉතා ඉක්මනින් පනත් කෙටුම්පත සකස් කිරීම පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගිහාන් කුලතුංග මහතා ඇතුළු කණ්ඩායමට මම ස්තුතිවන්ත වනවා. දැන් කෙනකුට ඇප දෙන්න ඕනෑ නැත්නම් ඇප නොදී සිටියාට කමක් නැහැ. මොකද, නඩුකාරතුමා තමයි එය තීන්දු කරන්නේ. නඩුව බරපතළ වැඩියි, එහෙම නැත්නම් ඔහුට තව නඩු තිබෙනවා ආදී කාරණා නිසා. නමුත්, කෙනෙකුට හරි කාලයට අනුව ඇප ඉල්ලන්න අඩුම ගණනේ අවස්ථාවක්වත් තියෙන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඇප නොදෙන එක වෙනම දෙයක්. නමුත්, if the man cannot state his grievance, what is the point? 2022 ගෙනාපු සංශෝධනයෙන් වුණු දේ තමයි, රස පරීක්ෂක වාර්තාව එන කල් නඩුව පවරන්න බැරි වීම. මොකද, ශුද්ධ බර දන්නේ නැහැ. ග්‍රෑම් ගණන දන්නේ නැතුව නඩුව පවරන්න බැහැ. හැබැයි, රස පරීක්ෂක වාර්තා ආවත් තව මාස 4ක් හෝ 5ක් යනවා ඇප ඉල්ලීම සලකා බැලීම ඉවර වෙන්න. ඒ කියන්නේ, මිනිසුන්ට තමන්ගේ ප්‍රශ්නය කියන්න අවුරුදු එකහමාරක් විතර යනවා. ඒක තමයි ප්‍රධාන හේතුවක් වුණේ, බන්ධනාගාරයේ සෙනඟ වැඩි වෙන්න.

අපි මෙය බන්ධනාගාරයේ සෙනඟ අඩු කරන්න කරන දෙයක් නොවෙයි. මෙම පනත් කෙටුම්පතින් කියන්නේ නැහැ, ඇප අනිවාර්යයෙන්ම දෙන්න කියලා. But, people must have that right; මිනිසුන්ට අයිතියක් තිබෙන්න ඕනෑ, අඩුම ගණනේ තමන්ගේ ප්‍රශ්නය කලට වේලාවට කියන්න. අපි මෙම පනත් කෙටුම්පතින් එය achieve කරලා තිබෙන්නේ කොහොමද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක කරලා තිබෙන විධිය මා කියන්නම්.

ඒ වාගේම අපි තව දෙයක් කල්පනා කළා. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගෙන් අපේ රට ආරක්ෂා කර ගන්නත් ඕනෑ. මත්ද්‍රව්‍යවලින් මිනිස්සු ආරක්ෂා කර ගන්නත් ඕනෑ. අපේ "ඉවත් වෙනු" කියන ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම මත්ද්‍රව්‍යවලට එරෙහිව යන එකක්.

ඒ වාගේම, මිනිසුන්ගේ අයිතිවාසිකම් ද ආරක්ෂා කරන්න ඕනෑ. රටක් කරනවා කියන්නේ ඒකයි. රටේ පොදු ජනතාව අපරාධවලින්, මත්ද්‍රව්‍යවලින් ආරක්ෂා කර ගන්න ඕනෑ. හැබැයි, ඒ වාගේම සැකකරුවන්ගේ මානව හිමිකම් ද රැකෙන ආකාරයෙන් නීති සකස් වෙන්න ඕනෑ. අපි දැන් මේ ප්‍රශ්නය විසඳන්න මැදිහත් වුණේ මෙහෙමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඇප දෙන 84 සහ 85 වගන්තිවල- මෙහිදී අපි සංශෝධනයක් ගෙන එනවා, මෙන්න මෙහෙම. රස පරීක්ෂකවරයා විසින් නිකුත් කරන ලද වාර්තාව ප්‍රකාරව මත්ද්‍රව්‍ය ග්‍රෑම් සියයක් හෝ ඊට වඩා වැඩි නම් - ඒ කියන්නේ, රස පරීක්ෂකවරයා ඉදිරිපත් කරන්නේ, ශුද්ධ බර - ඊට අදාළව ඇප දීමේ අයිතිය තිබෙන්නේ අභියාචනාධිකරණයටම තමයි. යම් හෙයකින්, රස පරීක්ෂක වාර්තාවක් නැත්නම්, ඒ කියන්නේ අල්ලපු ගමන්ම වාගේ නම් - රස පරීක්ෂක වාර්තාව එන්න මාස දෙකක් විතර යනවා නේ - එම වාර්තාව එන්න කලින් ගොනු කරනවා නම්, දළ බර ග්‍රෑම් සියයට වඩා වැඩි නම් ඊට අදාළව ඇප දීමේ බලය අභියාචනාධිකරණයට - Court of Appeal එකට - තිබෙනවා. ඒ කියන්නේ, දළ බර. ඒ කියන්නේ, දළ බර ග්‍රෑම් සියයට වඩා අඩු හෝ pure බර ග්‍රෑම් සියයට වඩා අඩු ඒවාට අදාළව නැවත High Court එකෙන් ඇප දෙන්න පුළුවන්. තම තමන්ගේ ප්‍රදේශයේ High Court එකට යන්න පුළුවන් ඒ ඇපය ඉල්ලා ගන්න. ඒ වාගේම, මෙවැනි අවස්ථාත් තිබෙන්න පුළුවන්. දළ බර ග්‍රෑම් එකසිය පනහයි කියලා Court of Appeal එකේ නඩුව දාලා තිබෙනවා; නමුත් රස පරීක්ෂක වාර්තාව එනකොට pure ප්‍රමාණය හෙවත් ශුද්ධ බර තිබෙනවා, ග්‍රෑම් 70ක් හෝ 80ක්. එවන් අවස්ථාවක නැවත මහාධිකරණයට එන්න ඕනෑ නැහැ. Court of Appeal එකටම පුළුවන් එය දිගටම අහලා ඇප දෙන්න. ඉතින් අපි මේවා හදලා තිබෙන්නේ, මේ සංශෝධන පනත් කෙටුම්පත් දෙකම ගේන්නේ ඒ අවශ්‍යතා මත. එක සංශෝධනයක් හරහා, මිනිසුන්ට තමන්ගේ දුක කියා ගන්න හැකියාවක් නැතුව - ඒ කියන්නේ you need a forum - එහෙම forum එකක් නැතුව අවුරුද්දක් එකහමාරක් කල් ඇදෙන එක වළක්වා ඒගොල්ලන්ගේ grievance එක දැන් වේලපහින් ගේන්න පුළුවන්. ඒ වාගේම අනෙක් සංශෝධනය හරහා, මත්ද්‍රව්‍ය වැනි භාණ්ඩ නඩුව අවසන් වනකල් තියාගෙන ඉන්නේ නැතුව යම් යම් අවස්ථාවලදී කොන්දේසි සහිතව විනාශ කරන්න පුළුවන්. මේ දෙකෙන්ම පෙන්නුම් කරන්නේ මේ රජයේ එක approach එකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Harshana Nanayakkara, you have two more minutes at your disposal.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷண நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
I will finish in two minutes, Sir.

මේ දෙකෙන්ම පෙන්වන්නේ අපේ ආණ්ඩුවේ approach එක. මොකක්ද ඒ? Zero tolerance for drug trafficking; අපි මත්ද්‍රව්‍යවලට විරුද්ධයි. ඒ නිසා ඉවත් වෙන්න ඕනෑ. පාතාලය, මත්ද්‍රව්‍ය විකිණීම අපි නවත්වනවා. මත්ද්‍රව්‍ය අල්ලනවා. ඒ සියල්ලම අපි කරනවා. ඒ වාගේම මත්ද්‍රව්‍ය අල්ලා ගත්තාට පස්සේ ඒවා නැවත සමාජගත වෙනවා නම්, ඒකත් නවත්වන්න අවශ්‍ය සංශෝධන ගෙන එනවා. අනෙක් පැත්තෙන්, සෑම සැකකරුවෙකුටම අයිතියක් තිබෙනවා තමන්ගේ නඩු කටයුත්ත වේලපහින් අධිකරණයට ඉදිරිපත් කරගෙන තමන්ගේ සහනය ඉල්ලන්න, සහනයක් හම්බ වුණත්, නැතත්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අන්න ඒ නිසා තමයි මම කියන්නේ අපේ රජය

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

එක පැත්තකින් අපරාධ නැවැත්වීමටත්, අනෙක් පැත්තෙන් ජනතාවගේ මානව හිමිකම් ආරක්ෂා කිරීමටත් බැඳෙනවා කියලා. රාජ්‍ය කරනවා කියන්නේ ඔය දෙකේ තුලනයයි.

එහෙම නම්, මා හිතනවා විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාත්, ආණ්ඩු පක්ෂයේ අපේ මන්ත්‍රීවරුන් සියලු දෙනාත් මේ සංශෝධන පනත් කෙටුම්පත් දෙකට පක්ෂව ඡන්දය දේවි කියලා. ගොඩක් අසරණ පවුල්වලට, දුක් විඳින පවුල්වලට මේ හරහා සහනයක් වේවි කියන බලාපොරොත්තුවෙන් තමයි අපි මේවා ගෙන ආවේ.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිණා එදුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Hector Appuhamy. You have 12 minutes.

[පූ.භා. 11.44]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත් දෙක පිළිබඳ විවාදයේදී කථා කරන්න මටත් අවස්ථාව ලබා දීම සම්බන්ධව.

මේවා ඉතාම හොඳයි. ගරු අධිකරණ අමාත්‍යතුමා ගෙනාපු මේ සංශෝධන පනත් හොඳයි; මේ සංශෝධන සියල්ලම හොඳයි. හැබැයි, මෙතැන තිබෙනවා වෙනත් ප්‍රශ්නයක්. ග්‍රෑම් 100ට අඩුවෙන් සන්තකයේ තබා ගත්තු කෙනෙකුට දැන් ඇප ගන්න පුළුවන් High Court එකෙන්. හැබැයි, ඊට ඉස්සෙල්ලා එවැනි අයෙකුට High Court එකෙන් ඇප ගන්න හැකියාව තිබුණේ නැහැ. ඒකට අවුරුද්දක් එකහමාරක් විතර ගියා. සමහර විට අවුරුදු දෙකක්, තුනක් ගිහින් ඇප ලබන අයත් ඉන්නවා. හැබැයි, මේ කියන විධියට ඇප දෙන විට බොහෝ වෙලාවට බන්ධනාගාරවල රැඳවියන්ගේ යම් අඩුවීමකුත් වන බව අපි දන්නවා. හැබැයි මේ එක්කම අපි අහනවා, අන්තරායදායක ඖෂධයක් විධියට ගංජාත් මේකට ඇතුළත් කරලා තිබෙනවාද කියලා. එතකොට මා අර කලින් කියපු විධියට එක පැත්තකින්, බන්ධනාගාරගත වන යම් පිරිසක් අඩු වුණත් අනෙක් පැත්තෙන් සමහර වෙලාවට තවත් පිරිසක් වැඩි වෙන්නත් පුළුවන්, ගංජා නිසා. මා හිතන විධියට ගංජා අන්තරායදායක ඖෂධයක් හැටියට තිබුණේ නැහැ. එහෙම නම්, අන්තරායදායක ඖෂධයක් හැටියට ගංජා සැලකුවාම එය සන්තකයේ තබාගත් අය සම්බන්ධයෙන් ඇප ගන්නේ හෝ වැඩ සැලසුම සිද්ධ වෙන්නේ හෝ කොහොමද කියන එකත් මේ ගරු සභාවට කියන්න ඕනෑ කියලා මම හිතනවා.

ගරු අධිකරණ ඇමතිතුමාගේ වචනවලින්ම දැන් කිව්වා, මේක දුප්පත්, අහිංසක මිනිසුන්ට සහනයක් ලබා දෙන වැඩසටහනක් කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම් මේ පනත් කෙටුම්පත් සම්මත කරනවාත් එක්කම යම්කිසි මුදලක් වෙන් කරන්න ඕනෑ ජනතාව දැනුවත් කරන වැඩසටහන් කරන්න. ඒක ඉතාම වැදගත්. කෙනෙකු වරදක් කළාට පසුව අල්ලාගෙන ගිහින් දඩුවම් දීලා හදන්න යනවාට වඩා මුලදීම දැනුවත් කරලා මේ ජන සමාජය හදන්න පුළුවන් නම් අපට බොහෝ වාසි ලැබෙනවා. එක පැත්තකින් ආණ්ඩුවට මුදල් ඉතිරි වෙනවා. ඒ වාගේම, මේ ජන සමාජය විනාශ වන එක නතර වෙනවා. විශේෂයෙන්ම, පවුල්වල ප්‍රශ්න අවම වෙනවා. ඒ හා සමානවම මේ රට දියුණු කරන්න අවශ්‍ය කරන විශාල ආර්ථික ශක්තියක් ඇති කරන්න ජනතාවගේ ශ්‍රමය ලබා ගන්න පුළුවන් වෙනවා. ජනතාවගේ යහපත් ආකල්ප රටේ දියුණුවට යොදා ගන්න අපට පුළුවන් වෙනවා; ජනතාවගේ හොඳ සැලසුම් ලබා ගන්න අපට පුළුවන් වෙනවා. එහෙම නම්, මේ වාගේ පනත් සංශෝධනය කරන කොට වැඩි මුදලක් වෙන් කරන්න ඕනෑ, ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් කරන්න. මම දන්නේ නැහැ එහෙම නොකරන්නේ ඇයි කියලා. අපට මෙය ග්‍රාමීය වශයෙනුත් කරන්න පුළුවන්, ගමේ ප්‍රභූවරුන් යැයි කියන සියලුදෙනා ද, ආගමික නායකයන් ද සහභාගි කරවා ගෙන සාකච්ඡා කරලා. ඔබතුමන්ලා ආගමික නායකයන්ට නම් කියන්නේ වෙනත් කථාවක්. හැබැයි, අපි ගම්වල ඉන්න ආගමික නායකයන්ට ගරු කරනවා. ඒ ආගමික නායකයන් සියලුදෙනාත් ඒක රාශි කරගෙන ඒ කටයුත්ත කරන්න පුළුවන්. මේ සම්බන්ධයෙන් යම්කිසි වැඩසටහනක් සකස් කරලා නැති එක ගැන, මෙවැනි සංශෝධන ගෙනෙන කොට මේ සංශෝධනත් එක්ක ජනතාව දැනුවත් කිරීම කියන කාරණය ඇතුළත් කරලා නැති එක ගැන විපක්ෂයේ අපි කනගාටු වෙනවා. අපට පුළුවන් මේ සඳහා අවශ්‍ය කරන ප්‍රතිපාදන වැඩි වශයෙන් ලබා දීලා පාසල මඟිනුත් දැනුවත් කිරීමේ වැඩසටහන් කරන්න. මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව කියා දෙන්න ඕනෑ; එමඟින් තමන්ගේ ශරීරයට මොකක්ද වෙන්නේ, මනසට මොකක්ද වෙන්නේ, මොළයට මොකක්ද වෙන්නේ, මේවා භාවිත කරන අයට පසු කාලීනව සිද්ධ වෙලා තිබෙන දේවල් මොනවාද යනාදිය සම්බන්ධව හොඳින් දැනුවත් කරන්න ඕනෑ. ඔබතුමන්ලාත් දැනට සාමාන්‍ය වශයෙන් කරන දැනුවත් කිරීම් තිබෙනවා. වැඩිපුර සල්ලි වියදම් කරන්න ඕනෑ ඒවා සඳහායි කියන එක විපක්ෂයේ අපේ මතය බව මම විශේෂයෙන් සඳහන් කරනවා.

මෙවැනි පනත් කෙටුම්පත් ගෙනෙන ගමන්ම ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පතකුත් ගෙනෙනවා. ඉස්සෙල්ලා තිබුණා, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත හෙවත් PTA එක. ලෝකයේ මානව හිමිකම් කණ්ඩායම් සියල්ලම කිව්වා, ඒක ක්‍රියාත්මක කරන්න එපා, ඒකෙන් කරන්නේ මිනිසුන් අරගෙන ගිහින් අවුරුදු ගණනක් හිරේ දමාගෙන වද දෙන එකයි, ප්‍රශ්න ඇති කරන එකයි කියලා. භයානක මුහුණුවරක් පෙන්වා ඔබතුමන්ලා දැන් ඒ පනත අයින් කරනවා. ඒක අයින් කරලා PSTA එක වෙනම ගෙනැල්ලා දමන්න යනවා. ඒකේ මොකක්ද තිබෙන්නේ? ඔබතුමන්ලා කුඩු ගහන කෙනාට ඇප ලබා දෙන වැඩසටහන එක පැත්තකින් ක්‍රියාත්මක කරද්දී මුළු ජන සමාජයම පීඩාවට පත් කරන නීතිත් ගෙනෙනවා. කවුරු හරි තමන්ට අකමැති නම්, ආණ්ඩුවට අකමැති නම් අධිකරණ නියෝගයකුත් නැතුව, අවුරුද්දක්, අවුරුදු දෙකක් රඳවා ගැනීමේ බලතලත් එක්ක වෙනම කණ්ඩායමක් විසින් ඒ මිනිහාගේ බෙල්ලෙන් අල්ලලා මිරිකලා අරගෙන ගිහින් කුඩුවට දමනවා. එතකොට අධිකරණයට මොකක්ද වෙන්නේ? අධිකරණය හැල්ලුවට ලක් වෙනවා. විනිශ්චයකාරවරුන්ගේ නීන්දුවලට මොකක්ද වෙන්නේ? මේ රටේ උත්තරීතර ආයතන තුනක් තිබෙනවා. ඒවා තමයි විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය. මේ තුන්කට්ටුව තමයි මේ රට පාලනය කරන්නේ. ඒ විධියට තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදලා තිබෙන්නේ; ව්‍යවස්ථාවෙන් නීති පනවා තිබෙන්නේ. ඒ අනුවයි, පාර්ලිමේන්තුව තුළින් නීති සම්මත කරන්නේ. එහෙම නම්, මේ කියන කාරණයේදී කෝ අධිකරණය? අධිකරණය නැහැ. ගෙනැල්ලා රඳවා ගෙන තියාගන්නේ කවුද කියලා වෙනම

කණ්ඩායමක් විසින් තීන්දු ගන්න යනවා. කාටද ඒ තීන්දු ගන්න බලය තිබෙන්නේ? මේක ඒකාධිපති ක්‍රමවේදයක්. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ කාට හරි විරුද්ධව කවුරු හරි ඉන්නවා නම්, තමුන්නාන්සේලාගේ මිත්‍ර පොලිසියේ කාට හරි ප්‍රශ්නයක් වෙච්ච කෙනෙකු ඉන්නවා නම්, කොණ්ඩය වවාගෙන හිටියත් එයාව අල්ලාගෙන ඇවිල්ලා ඇතුළට දමන්න පුළුවන්, "ත්‍රස්තවාදියෙක්" කියලා. එයා පව්වයක් කොටාගෙන හිටියා නම්, ඒ පව්වය ගහගෙන හිටපු එකට "ත්‍රස්තවාදියෙක්" කියලා ගෙනැල්ලා රඳවා තබා ගන්න පුළුවන්.

මත්ද්‍රව්‍ය ග්‍රෑම් 100ට අඩුවෙන් ළඟ තබාගත්තු කෙනාට High Court එකෙන් ඇප ලබා ගන්න අවස්ථාව හම්බ වෙනවා. හැබැයි High Court එකට, අභියාචනාධිකරණයට, ශ්‍රේෂ්ඨාධිකරණයට නොව ඒ මොකකටවත් ඉදිරිපත් කරන්නේ නැතුව අවුරුද්දක්, තවත් අවුරුද්දක් වශයෙන් අවුරුදු දෙකක් ඔබතුමන්ලාට ඕනෑ විධියට පුද්ගලයන් වෙනම තියාගෙන ප්‍රශ්න කරන්නත් පුළුවන් වෙනවා. ප්‍රශ්න කරන්න විතරක් නොවෙයි, හිරිහැර කරලා අවශ්‍ය කරන දේවල් ලබා ගන්නත් පුළුවන් වෙනවා. එතකොට කවුරු හරි දේශපාලන වශයෙන් හෝ පෞද්ගලිකව හෝ තරහක් තිබෙනවා නම් ඔහුව ගෙනැල්ලා කූඩුවට දමලා තියන්න පුළුවන්, "කට වහගෙන හිටපන්, අවුරුදු කීයක් හරි අපේ ආණ්ඩුව කරනකල්" කියලා. එහෙම නම්, ඔබතුමන්ලාට ඡන්දය දීපු හැටනව ලක්ෂයට දැන් ඔය කරපු දේ හරිද? රටේ ජනතාව හිතුවාද මෙහෙම දෙයක් කරනවා කියලා? අපි නම් කිව්වා ඔය වාගේ තහංචි එනවා කියලා. අපි කිව්වා, පෙරහැරට තහංචි එනවා, එක එක විධියේ තහංචි එනවා කියලා. ඒ විතරක් නොවෙයි, චීනයේ විධියට තමුන්නාන්සේලා කියන්න යන්නේ මොකක්ද? "අපි කියන විධියට උඹලා කොණ්ඩෙත් කපලා තියාගනිල්ලා, වෙනත් විධියකට උඹලාට කොණ්ඩය කපන්න බැහැ, උඹලා අපි කියන විධියට කොණ්ඩෙ කපලා ඉන්න ඕනෑ, කොණ්ඩෙ වවන එක උඹලාට ලස්සන වුණාට අපිත් එක්ක ඒවා කරන්න හම්බ වෙන්නේ නැහැ, අපේ ආණ්ඩුවට ඕනෑ විධියට මේක කරපල්ලා" කියලා තමයි කියන්න යන්නේ. රට එතැනට තල්ලු කරගෙන යනවා. හැබැයි, එහෙම තල්ලු කරගෙන යද්දී මතක තබාගන්න ඕනෑ කාරණාවක් තිබෙනවා.

ඊයේ පෙරේදා නියම වැඩක් සිද්ධ වුණා. තායිලන්තයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරිය ලංකාවට ආවා. එතුමිය ආවේ විහාරස්ථානයක ඉතාම ගෞරවනීය වැඩක් කරන්න. හැබැයි, එතුමිය ගියේ බස් එකේ. එතුමියට රාජ්‍ය අනුග්‍රහය දෙන්න ඕනෑ නැද්ද? එතුමිය එන්න ඇත්තේ හාමුදුරුවන් වහන්සේලාගේ ආරාධනාවක් මත වෙන්න ඇති. ඒ හාමුදුරුවන් වහන්සේ කවුද, අපේ රටේ? සිවුර ඇඳගෙන විශේෂයෙන්ම මිහින්තලේ හාමුදුරුවන් වහන්සේ මොනවාද කරන්නේ? වැරදි වැඩක්ද එතැන කරන්නේ? එතැන කරන දෙයට තායිලන්තයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරිය ඇවිල්ලා සහභාගි වීම වැරදිද? එතකොට තායිලන්තය මේ රටේ කරලා තිබෙන්නේ වැරදි වැඩක්ද? එතුමියට සැලකුවේ නැත්තේ ඇයි? කෝ, අපේ රාජ්‍ය තාන්ත්‍රික හිතවත්කම් ටික? කෝ ඇගයීම? ඒවා නැහැ. හැබැයි ඉන්දියාවෙන් ස්වාමිවරයෙක් එනකොට ඒ ස්වාමිවරයාට හෙලිකොප්ටරයක් දීලා, ආරක්ෂාව දීලා ඒත් එක්කම තමුන්නාන්සේලාත් එහි නැහලා යනවා. ආගම එපා කියපු, නිරාගම්කයි කියපු තමුන්නාන්සේලා - අඩු ගානේ ජනාධිපතිතුමා හරි - උදේට සුදු ඇඳගෙන ගිහිල්ලා මල් ටිකක් පූජා කරන දර්ශනයක් මේ රටට පෙන්වන්නේ නැතුව, වෛරය විතරක් පෙන්වන්න ඉන්දියාවෙන් ආපු ස්වාමිවරයා ඉස්සරහා පිට දණ ගහලා තිබෙනවා. ඇයි ඒ? මේ දවස්වල වස් කවියක් හදලා තිබෙනවා නේ. අපට පෙනෙන්නේ දැන් මේ වස් කවියට බය වෙලා කියලා. මෙච්චර කල් කිසි දෙයකට බය වෙන්නේ නැහැ කියලා කයිවාරු ගහපු, ගණන්කාරයෝ වාගේ සරම උස්සලා කෑගහපු අය දැන් වස් කවියට බය වෙලා ස්වාමිවරයා ඉස්සරහ දණ ගහලා මොනවා කරලා දෙන්න කියලා ඉල්ලුවාද දන්නේ නැහැ. ඉරකින් දෙකට බෙදලා වාගේ නේ දැන් ඔබතුමන්ලා කටයුතු කරන්නේ. ඉන්දියාවේ ස්වාමිවරයෙක් ආවාම හෙලිකොප්ටරයක් දීලා, ආරක්ෂාවත් දීලා තමුන්නාන්සේලා ඒ කෙනාගේ පස්සෙන් ගිහිල්ලා කරපු වැඩසටහන මොකක්ද, තායිලන්තයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍යතුමිය ඇවිල්ලා මේ රටේ කරපු දේ මොකක්ද කියලා හරියට රටට පහදලා දෙන්න. කියන්න ඇත්ත කථාව, මොකක්ද සිද්ධ වුණේ කියලා. එම නිසා මේ රටට මොකක්ද වෙලා තිබෙන්නේ කියන එක මම මේ වෙලාවේ විශේෂයෙන් මතක් කරනවා.

මානව හිමිකම් සම්බන්ධයෙන් කටයුතු කරන ජාත්‍යන්තර ක්ෂමා සංවිධානයත් දැන් කියනවා, ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සම්මත වුණොත් ඒ තුළින් බරපතළ ප්‍රශ්නයක් රටේ ජනතාවට ඉදිරි කාලයේදී ඇතිවෙන්න පුළුවන් කියලා. ඊළඟට, ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මැතිතුමා කියලා තිබෙනවා, මේක බරපතළ වැරැද්දක් කියලා. PTA එක හරහා මානව හිමිකම් උල්ලංඝනය කරන්න එපා කියන එක තමයි අපි කිව්වේ. තමුන්නාන්සේලාත් පොරොන්දු වුණේ ඒක. සාමාන්‍ය ජනතාවට එහෙම පොරොන්දු වෙලා දැන් වෙන එකක් කරනවා. මොකද, මේ පනත් කෙටුම්පත සම්බන්ධව අධිකරණයට ගිහිල්ලා අහන්න තිබෙන්නේ, මෙය ව්‍යවස්ථාවට පටහැනිද, නැද්ද කියන එක. ව්‍යවස්ථාවට පටහැනි නැත්නම් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කියනවා ප්‍රශ්නයක් නැහැ කියලා. හැබැයි, මේක ඇතුළේ මානව හිමිකම් කඩවීම් සිද්ධ වනවා නම්, වෙනත් නඩුවකට යන්න වෙයි. මේකට නඩු යනවාට වඩා තමුන්නාන්සේලා වැඩක් කරද්දි මොකක්ද මේ කරන්නේ කියලා මතක තියාගන්න. මේකෙන් අවසාන වශයෙන් තමුන්නාන්සේලාටත් කන්න වෙනවා කියලා මතක තියාගන්න. මොකද, තමුන්නාන්සේලාත් කන්න තමයි මේ සූදානම් වන්නේ.

මෙතැන මහ මිනිස්සු ටික ඉඳීවි. මේ පාර්ලිමේන්තුවේත් ඉන්නවා, ජනතා විමුක්ති පෙරමුණේ, මාලිමාවේ හොඳ කණ්ඩායමක්. ඒ කණ්ඩායමේ සහෝදරයාටත්, ඒ කණ්ඩායමේ හිතවතාටත් කොණ්ඩය වවාගෙන ගියාම කන්න වෙන දවසක් එයි කියලා මතක තියාගන්න. පොලීසියේ හරි, වෙනත් කවුරු හරි එක්ක මොනවා හරි විරෝධතාවක් ඇතිවෙච්ච දවසට "කෑවෝ, කෑවෝ" කියලා කෑගහන්න එපා කියලා අපි මේ වෙලාවේ විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. අපේ නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් කොණ්ඩය වවලා ඉන්නේ. බලාගෙන ඉන්න, මේ කණ්ඩායම ඇතුළේ ඔබතුමා එක්කත් විරුද්ධ කණ්ඩායමක් ඉන්න බව අපි දන්නවා. ඒ කණ්ඩායම ඉදිරි කාලයේ ඔබතුමාටත් කොයි විධියට වැඩේ දෙයිද දන්නේ නැහැ. ඔබතුමා පව්වයක් ගහලා නැහැ නේ. පව්ව ගහලා නැත්නම් බේරෙයි. හැබැයි, කොණ්ඩය නිසා බේරෙයිද දන්නේ නැහැ. පව්ව ගහපු අයත් ඉන්නවාලු, ඔය පැත්තේ. පව්ව ගහපු අයටත් පරිස්සමින් ඉන්න කියලා අපි කියනවා. මොකද, ඔබතුමන්ලා ත්‍රස්තවාදයට බොහොම ළඟින් හිටපු අය කියලා කියාවි.

එක් අමාත්‍යවරයෙකුත් කියනවා, කවුරු හරි දේශපාලන වශයෙන් රාජ්‍යයෙන් කොටසක් ඉල්ලන එක ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත යටතේ වැරැද්දක් වෙන්නේ නැහැ කියලා. මේක මාර වැඩක් නේ. රටෙන් කැල්ලක් ඉල්ලනකොට ඒක ත්‍රස්තවාදී වැරැද්දක් වෙන්නේ නැහැ. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමා වාගේ කොණ්ඩය වවලා හිටියොත්, ත්‍රස්තවාදියෙක් වෙන්න පුළුවන්. එතකොට අර ලංකාවෙන් කොටසක් ඉල්ලන කෙනා ත්‍රස්තවාදියෙක් නොවෙයි. හැබැයි, ඔබතුමා ත්‍රස්තවාදියෙක් වෙන්න පුළුවන්. එහෙමනම් මේ වෙනස මොකක්ද කියලා මතක තබාගන්න.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වනකොට අපේ රටේ මිනිස්සු රුපියල් ට්‍රිලියන 1.1ක - කෝටි 110ක - රත්‍රන් බඩු උකස් කරලා තිබෙනවා. එදා රුපියල් කෝටි 66ක විතර රත්‍රන් බඩු උකස් කරලා තිබ්බිච්ච අය මේ වනකොට රුපියල් කෝටි 110ක රත්‍රන් බඩු උකස් කරලා තිබෙනවා. ඒ කියන්නේ සියයට 23.6ක් වැඩි වෙලා තිබෙනවා, රත්‍රන් බඩු උකස් කිරීම. එතකොට මිනිස්සු එහෙම රත්‍රන් බඩු උකස් කළේ ඇයි? තමුන්නාන්සේලා මිනිස්සු එදිනෙදා කන්න, බොන්න, අඳින්න පාවිච්චි කරන දේවල්වලට ගෙවාගන්න බැරි තරම් බදු ගහලා තිබෙනවා. ඒ නිසා තමන්ගේ දරුවන්ට කන්න දෙන්න බඩු ටික ගෙදරට ගෙනෙන්න සල්ලි නැතිව, ළමයාට උගන්වන්න අවශ්‍ය කරන බඩු ටික ගන්න සල්ලි නැතිව තමයි මිනිස්සු රත්‍රන් බඩු ටික උකස් තියන්නේ. ඊළඟට තම ව්‍යාපාරය කරගන්න බැරි වනකොට, ව්‍යාපාරයේ ණය ගෙවාගන්න බැරි වනකොට මිනිස්සු රත්‍රන් බඩු ටික උකස් තියනවා. දැන් අලුත්ම එක මොකක්ද දන්නවාද? තමුන්නාන්සේලා භාණ්ඩාගාරය පුරවලා තිබෙනවා, බදු සල්ලිවලින්. හැබැයි, සමහර ව්‍යාපාරිකයින් බදු ගෙවලා තිබෙන්නේ රත්‍රන් බඩු ටික උකස් තියලායි. මොකද, ව්‍යාපාරයේ සල්ලි නැහැ, පාඩුයි. එහෙම නම් තමුන්නාන්සේලාගේ භාණ්ඩාගාරය බදුවලින් පුරවන්න තමයි ජනතාව රත්‍රන් බඩු උකස් කරලා තිබෙන්නේ.

පුද්ගල ආදායම් බද්ද, සංස්ථාපිත ආදායම් බද්ද, රඳවා ගැනීමේ බද්ද, ප්‍රාග්ධන ලාභ බද්ද, VAT එක, සෙස් බද්ද, ආනයන අපනයන තීරු බදු, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද, ගුවන් තොටුපළ සංවර්ධන බද්ද, සෙස් බද්ද යන බදු අපේ රටේ ක්‍රියාත්මක වනවා. ඒ වාගේම රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ සේවය කරන මාසයකට රුපියල් 150,000ට වඩා ආදායමක් ගන්න කෙනාටත් බද්දක් ගහනවා. එතකොට ඔබතුමන්ලා ඒ බද්දත් එකතු කර ගන්නවා. මේ රට හදලා තිබෙන්නේ බදු මුදල්වලින්. ඔබතුමන්ලා මේ රට වෙනත් ක්‍රමවේදයකින් පාලනය කරලා නැහැ. ඒ නිසා මතක තියාගන්න, රත්‍රන් බඩු උකස් තියලා බදු ගෙවන්න තරම් රටේ මිනිස්සුන්ට කරපු හානියට, ඒ වාගේම හැටනව ලක්ෂයක් වූ ජනතාවට මේ කරපු වැඩේට තමුන්නාන්සේලාට ජනතාව එළියේ හෙණ ඉල්ලනවා කියලා. එම නිසා අපි මේ සමස්ත රටටම කියනවා, ආණ්ඩුව පොහොසත්, ජනතාව දුප්පත්, ආණ්ඩුවේ ඉන්න අයගේ ජීවිත ලස්සනයි, ජන ජීවිත දුක්බරයි කියලා. ඉන්න හිටින්න, කන්න බොන්න, අඳින්න, නිදහසේ ඇවිදින්න, සතුටින් ඉගෙන ගන්න, ආගම අදහන්න, නිදහස ඉල්ලන්න යන්න ඔබේ ආගමික ස්ථානයට. මේ ආණ්ඩුව තිබෙනකල් වෙනත් කෙනෙක් නම් කවදාවත් පිහිට වෙන්නේ නැහැ. ඒ නිසා පරිස්සම් වෙන්න, මේ දවස්වල කියන වස් කවියට, ඉස්සරහට මොකක්ද වෙන්නේ කියලා අපි බලාගෙන ඉඳිමු.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Chandana Thennakoon. You have nine minutes.

[පූ.භා. 11.57]

ගරු චන්දන තෙන්නකෝන් මහතා
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ විවාදයට ගැනෙන මේ සංශෝධන පනත් කෙටුම්පත් දෙක පිළිබඳ විවාදයට අවතීර්ණ වෙන්න කලින්, පසුගිය දිනවල අපේ ප්‍රදේශයේ සිදුවුණු විශේෂ සිදුවීමක් ගැන කියන්න මා කැමැතියි. අපි කවුරුත් දන්නවා, කාවන්තිස්ස හස්තියා ජීවත් වුණේ ගල්ගමුවට ආසන්න ප්‍රදේශවල බව. එම නිසා මේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් මා යම් අදහසක් ඉදිරිපත් කළ යුතුයි කියා මම හිතනවා. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
It is not related to this, Hon. Member.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තත්පර 10ක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Point of Order එකක්ද, Hon. Member?

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
Point of Order එකක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පවතින අධික වර්ෂාව නිසා මේ වෙලාවේ දැදුරු ඔය ජලාශය වාන් දමමින් තිබෙන නිසා එහි වාන් දොරටු අටම ඇරලා තිබෙනවා. ඒ හේතුවෙන් අපේ පුත්තලම දිස්ත්‍රික්කය සම්පූර්ණයෙන් විනාශ වනවා. එම නිසා කරුණාකරලා මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I have given you time, Hon. Member.

The Hon. Chandana Thennakoon, you may continue.

ගරු චන්දන තෙන්නකෝන් මහතා
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)
කාවන්තිස්ස හස්තියා පහුගිය දිනවල මිය ගියා. එම හස්තියාගේ වියෝව වෙනුවෙන් ගල්ගමුව ප්‍රදේශය නියෝජනය කරන මහජන නියෝජිතයා විධියට මගේ කනගාටුව ප්‍රකාශ කරන්නත්, එම ක්‍රියාවලිය සම්බන්ධයෙන් කෙටි අදහසක් ඉදිරිපත් කරන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

එම ඇතා තුවාල ලබා සිටිනවා කියලා ගල්ගමුව වනජීවී කාර්යාලයට දුරකථන ඇමතුම එන්නේ සැප්තැම්බර් මාසයේ 22වන දා උදෑසනයි. ඒ අවස්ථාවේම ක්‍රියාත්මක වූ වනජීවී කණ්ඩායම් විසින් එම හස්තියා නිරීක්ෂණය කරනවා, උදෑසන 5.30ට පමණ ජුසේවාස්පුර ප්‍රදේශයේදී පාර හරහා මාරු වෙද්දි. එහිදී කාවන්තිස්සට යම් තුවාලයක් සිදුවෙලා තිබෙනවා කියලා නිරීක්ෂණය වනවා. වනජීවී කණ්ඩායම් එදිනම ඇවිල්ලා මහගල්ගමුව වැව් තාවුල්ලේදී එම ඇතාට ප්‍රතිකාර ආරම්භ කරනවා. එදා රාත්‍රියේ එම ඇතා සියඹලෑව, පාඩිපංවාව, ලස්සනගම හරහා සියඹලෑව වැව් තාවුල්ලට යනවා. එම වනජීවී කණ්ඩායම් පහුවදා සිටම අඛණ්ඩව එම ඇතා සම්බන්ධයෙන් ප්‍රතිකාර ආරම්භ කරනවා. වෛද්‍ය කණ්ඩායම් තුනක් විටින් විට ඇවිල්ලා එම ඇතාට ප්‍රතිකාර කරනවා. ඒත් එක්කම ඇතා නිරීක්ෂණය කිරීම සඳහාත් වනජීවී කණ්ඩායම් යොදවා තිබුණා.

ඒ මාසයේම - සැප්තැම්බර් මාසයේ - 30වැනි දා අපේ ගරු ඇමතිතුමා ඇවිල්ලා මේ ක්‍රියාවලිය නිරීක්ෂණය කරනවා. අපි දැක්කා, ඒ අවස්ථාවේ වනජීවී වෛද්‍යවරුන් ප්‍රකාශ කරනවා, ඇතාගේ තුවාලය සුව අතට හැරිලායි තිබෙන්නේ කියලා. දින කිහිපයකට පස්සේ එම ඇතා මකුලෑව හරහා කලා ඔයෙන් එගොඩට ගිහිල්ලා එප්පාවල ප්‍රදේශයට යනවා. ඔක්තෝබර් මාසයේ 4වැනි දා අනුරාධපුර දිස්ත්‍රික්කයේ තරුණයෙක් එම ඇතාගේ වීඩියෝවකුත් දාලා තිබෙනවා. ඒ වීඩියෝවෙනුත් අපට බලන්න පුළුවන්, ඇතා සුව අතට හැරිලා නීරෝගීව ජීවත් වන ආකාරය. පසුව තමයි ඇතා නැවත යම් සංකූලතාවකට පත්වෙලා සිටින ආකාරය වනජීවී නිලධාරීන් දකින්නේ. ඊට පස්සේ නැවතත් ප්‍රතිකාර ආරම්භ කරනවා. ප්‍රතිකාර ආරම්භ කළාට පස්සේ නැවත ඒ ඇතා කලා ඔය හරහා ගල්ගමුව ප්‍රදේශයට එනවා. ගරු ඇමතිතුමා 15වැනි දා නැවත ඇවිල්ලා ඇතාව නිරීක්ෂණය කරනවා. අපි මේ සියල්ල එකට අරගෙන බලපුවාම අපි දකිනවා, අපේ ගරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේ හස්තිරාජයා වෙනුවෙන් විශේෂ අවධානයක් යොමුකොට තිබුණා කියලා. මොකද, ඒ අය අදාළ ක්‍රියාමාර්ග ගන්නවා අපි ඇස් දෙකෙන්ම දැක්කා.

මෙවැනි හස්තීන්ගේ ඉතිහාසයත් අපි දන්නවා. සියඹලන්ගමුව හස්තියා, දළ පූට්ටුවා වාගේ විශාල වටිනාකමක් සහිත ඇතුන් සම්බන්ධයෙන් මේ විධියේ ක්‍රියාවලියක් නොවෙයි ඉතිහාසයේ තිබුණේ. සියඹලන්ගමුව ඇතා පරණ ලොරියකට පටවලා, ඒ ලොරියේ තට්ටුව කඩාගෙන වැටුණාට පස්සේ, බෙල්ලට ලණුවක් දාලා ඒ ලණුව ගහේ බැඳලා තමයි ලොරිය ඉස්සරහට ඇද්දේ. ඒ කාලයේ සිදු වූ එවැනි සිදුවීම් මේ කාවන්තිස්ස හස්තියා සම්බන්ධයෙන් වුණේ නැහැ. රජය විධියටත්, ප්‍රාදේශීය දේශපාලඥයින් විධියටත්, ඒ වාගේම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විධියටත් මෙම ක්‍රියාවලියට විශාල මැදිහත් වීමක් කළා.

අනික් පැත්තෙන්, හුදෙක් මේ සිද්ධිය විතරක් අරගෙන නොවෙයි අපි මේ තත්ත්වය දෙස බලන්න ඕනෑ. අද ලංකාව ගත්තොත්, ආසියානු අලි ඝනත්වය වැඩිම රටක් තමයි අපේ රට. අපි ඉන්දියාවට සාපේක්ෂව බැලුවොත්, ඉන්දියාවේ වර්ග කිලෝමීටර 10,000කට අලි ඝනත්වය 91යි. හැබැයි, ශ්‍රී ලංකාවේ වර්ග කිලෝමීටර 10,000කට අලි ඝනත්වය 1,136ක්. අපේ රට අලි ඝනත්වය ඉහළ අගයක තිබෙන රටක්. ඉන්දියාවට සාපේක්ෂව ලංකාවේ අලි සංඛ්‍යාව ගණනය කරලා බැලුවොත්, අපට ඉන්න පුළුවන් අලි සංඛ්‍යාව 580යි. හැබැයි, ගල්ගමුව, ඇහැටුවැව, අඹන්පොල, නිකවැරටිය, පොල්පිතිගම සහ කලාවැව කලාපයේ විතරක් අලි 580කට වැඩි සංඛ්‍යාවක් ජීවත් වනවා. ඒ නිසා මේ ප්‍රදේශයේ අලින්ට ජීවත් වෙන්න වනාන්තර නැහැ. සියලුම අලි ආහාර ගන්නේ මිනිස්සුන්ගේ හේන්වලින්, කුඹුරුවලින් සහ ගෙවතුවලින්. මේ තත්ත්වය අපි තේරුම් ගන්න ඕනෑ. අපි පරිසරවේදීන්ටත්, ඔබටත් කියනවා, හුදෙක් සිද්ධියක් විතරක් අරගෙන මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන්න එපා කියලා. මේ ප්‍රශ්නය සංකීර්ණයි. එකදු වනාන්තරයක්වත්, එකදු රක්ෂිත අභය භූමියක්වත් නැති ප්‍රදේශවල විශාල අලි ඝනත්වයක් තිබෙනවා. අපේ ප්‍රදේශයේ ජනතාවටත් අපි ගරු කරනවා, මේ වනඅලි ආරක්ෂා කර ගනිමින් විවිධ දුක් ගැහැට විඳිමින් කාලය ගෙවීම සම්බන්ධයෙන්.

අපි මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් විශාල මැදිහත්වීමක් කළා. අපි අලුතින් වනජීවී උප කාර්යාල ආරම්භ කළා. මේ ගැටුම අවම කරන්න අපි සියඹලන්ගමුව, අඹන්පොල, ඇහැටුවැව, නන්නෙරිය වැනි ප්‍රදේශවල අලි වැට ශක්තිමත් කිරීම වැනි වැඩසටහන් විශාල ප්‍රමාණයක් ආරම්භ කරලා තිබෙනවා. නමුත්, මේ තිබෙන බරපතළ තත්ත්වයේ සංකීර්ණකම නිසාම ඒවා තවදුරටත් ප්‍රමාණවත් වෙලා නැහැ කියන එක තමයි අපේ හැඟීම. ඒ නිසා අවසන් වශයෙන් නැවතත් මේ හස්තියාගේ වියෝව සම්බන්ධයෙන් කනගාටුව පළ කරමින්, අද දවසේ විවාදයට එකතු වෙන්න මම කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීමට අදාළව ගෙනෙන පනත් කෙටුම්පත් හා පිළිබඳ විවාදයේදී කියන්න ඕනෑ, මේ නෛතික ක්‍රියාවලිය ඇතුළේ ප්‍රායෝගිකව මතු වෙච්ච ගැටලුවලට අදාළව තමයි මේ සංශෝධන ඉදිරිපත් වෙලා තිබෙන්නේ කියන එක. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ සංශෝධන තුළින් අපේ අධිකරණ ක්‍රියාවලිය පහසු වෙන්නත්, ඒ වාගේම මත්ද්‍රව්‍ය ක්‍රියාවලියට එරෙහිව අපි ආරම්භ කරලා තිබෙන මේ දැවැන්ත සටන වඩාත් වේගවත් කරන්නත් මේක හේතුවක් වෙයි කියලා.

අපි දන්නවා, මත්ද්‍රව්‍ය කියන්නේ නීතිය හා සාමය පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි කියලා. මේක අපේ රටේ තරුණ පරම්පරාවේ අනාගතය පිළිබඳ ප්‍රශ්නයක්; රටේ දරුවන්ගේ අනාගතය පිළිබඳ ප්‍රශ්නයක්; ඒ වාගේම පවුල් සංස්ථාවේ පැවැත්ම පිළිබඳ ප්‍රශ්නයක්; අනෙක් පැත්තෙන් අපේ රටේ ජාතික ආර්ථිකයට බලපාන ප්‍රශ්නයක්. ඒ නිසා අපි මත්ද්‍රව්‍යවලට එරෙහි සටනට රජය විධියට දැවැන්ත මැදිහත්වීමක් කරලා තිබෙනවා. අපි දන්නවා, මත්ද්‍රව්‍ය තිබෙන ලෝකයේ ප්‍රබලම රටවල් අතරට ශ්‍රී ලංකාව අයත් නොවුණත්, මුහුදු මාර්ගයේ කේන්ද්‍රස්ථානයක පිහිටීම නිසාම අපේ රට මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ලෝකයේම යම් අවධානයට ලක් වෙලා තිබෙන බව.

මම කියන්න කැමැතියි, 2024 වර්ෂයේදී අපේ රටේ 47,783ක් බන්ධනාගාරගත වුණු බව. ඒකෙන් සියයට 65ක් ඒ කියන්නේ, 31,314ක ප්‍රමාණයක් මත්ද්‍රව්‍ය ආශ්‍රිත ගැටලුවලට තමයි බන්ධනාගාරගත වුණේ. ඒ වාගේම 2025 වර්ෂයේදී මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි කරපු අය 262,321ක් අත්අඩංගුවට ගත්තා. ඒකෙන් අපට පෙනෙනවා, මේ මත්ද්‍රව්‍ය උවදුර කොපමණදුරට අපේ රට වෙළාගෙන තිබෙනවාද කියලා. කොළඹ නගරයේ වාගේම පොදු ප්‍රවාහන සේවයක් නැති ඇත ගම් දනව්වල පවා මේ මත්ද්‍රව්‍ය උවදුර පැතිරිලා තිබෙනවා. ඒ නිසාම තමයි අපි මෙතෙක් දේශපාලන අනුග්‍රහය ලබපු මත්ද්‍රව්‍ය ව්‍යාපාරය පරාජය කරන්න ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික මෙහෙයුම් කමිටුවක් ආරම්භ කළේ. එය, මහජන ආරක්ෂක ඇමතිතුමා, පොලිස්පතිතුමා, ත්‍රිවිධ හමුදාපතිවරුන්, අධ්‍යාපන, සෞඛ්‍ය හා ජනමාධ්‍ය, බුද්ධශාසන, අධිකරණ ආදී අමාත්‍යාංශවල ලේකම්වරුන්ගෙන් ප්‍රමුඛ ජාතික මෙහෙයුම් කමිටුවක්. ඒ වාගේම මේ ගැටලු සාකච්ඡා කරන්න දිස්ත්‍රික් මට්ටමින් අපි ආරම්භ කරලා තිබෙනවා, දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපතිගේ ප්‍රධානත්වයෙන් තවත් කමිටුවක්. ප්‍රාදේශීය වශයෙනුත් මේ සම්බන්ධව කටයුතු කරන්න අපි කමිටුවක් ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම මහජන ආරක්ෂක කමිටු රට පුරා ග්‍රාම නිලධාරී වසම් සියල්ලේම ආරම්භ කරලා, මේ වෙනුවෙන් ජනතාව සහභාගි කර ගත් විශාල ප්‍රවේශයක් අපි ලබා ගෙන තිබෙනවා, මේ මත්ද්‍රව්‍ය උවදුර පරාජය කිරීම සම්බන්ධයෙන්. ඒ කමිටු තුළින් අපි ක්‍රියාමාර්ග ගණනාවක් අරගෙන තිබෙනවා. ඒ අනුව පොලීසියේ වැටලීම් හා අත්අඩංගුවට ගැනීම් සක්‍රිය කරන්න, ඒ වාගේම මුහුදු මාර්ගයෙන් රට තුළට පැමිණෙන මේ මත්ද්‍රව්‍ය ජාවාරම අඩපණ කරන්න සහ අදාළ පුද්ගලයින් අත්අඩංගුවට ගන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ගුවන් තොටුපොළ සහ රේගු නිරීක්ෂණ ශක්තිමත් කරන්න, මත්ද්‍රව්‍ය ජාලයේ මූල්‍ය ජාවාරම සම්බන්ධ විමර්ශන දැඩි කරලා ඒ මූල්‍ය බලය බිඳින්න අවශ්‍ය වැඩසටහන් අපි ක්‍රියාත්මක කරනවා. අනෙක් පැත්තෙන් පුනරුත්ථාපන හා ප්‍රතිකාර

[ගරු වන්දන තෙන්නකෝන් මහතා]

වැඩසටහන් ශක්තිමත් කරන්නත්, පාසල් දරුවන් හා තරුණ ප්‍රජාව දැනුවත් කරන්නත් වැඩසටහන් විශාල ප්‍රමාණයක් අපි ආරම්භ කර තිබෙනවා.

අපේ ජනාධිපතිතුමා වරක් ප්‍රකාශ කළා වාගේම මත්ද්‍රව්‍යවලට, පාතාලයට එරෙහිව කරන සටන භයානකයි. හැබැයි, ඒවාට එරෙහිව සටන් නොකර සිටීම ඊට වඩා භයානකයි. ඒ ප්‍රකාශයට අනුව යමින් අපි ඒ සටන ආරම්භ කර තිබෙනවා. මත්ද්‍රව්‍යවලට මෙතෙක් තිබුණු දේශපාලන අනුග්‍රහය අපි අවසන් කර තිබෙනවා. මත්ද්‍රව්‍යවලට අදාළ මෙහෙයුම් ක්‍රියාවලියෙන් ඔබ්බට ගිහිල්ලා අපේ රටේ දරුවන්, තරුණයින් මත්ද්‍රව්‍ය ව්‍යසනයෙන් බේරාගන්න අපි වැඩසටහන් විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරනවා කියන එක ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Leader of the Opposition.

[අ.භා. 12.07]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මත්ද්‍රව්‍ය ප්‍රශ්නය අද අපේ රටේ ජන සමාජයේ තිබෙන බරපතළම ප්‍රශ්නයක් හැටියට සඳහන් කරන්න පුළුවන්. මේ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය පිළිබඳව අපි මීට වඩා ගැඹුරින් හිතන්න ඕනෑ. විශේෂයෙන්ම රජයට වාගේම සමාජයටත්, අපටත් වගකීමක් තිබෙනවා, මේ මත්ද්‍රව්‍ය - කුඩු බිස්නස් එක - ප්‍රවර්ධනය, එහෙම නැත්නම් ව්‍යාප්තිය සහමුලින්ම විනාශ කර දමන්න. ඒ වාගේම දෙමව්පියන් හැටියට බොහෝදෙනෙක් දන්නවා ඇති, මේ මත්ද්‍රව්‍ය ජාවාරම අද පාසල් පද්ධතියටත් ව්‍යාප්ත වෙලා තිබෙන බව. මේක පාසල් පද්ධතිය තුළ ඉතාම ශීඝ්‍රයෙන් වර්ධනය වනවා. මේක තමයි මහ පොළොවේ සත්‍යය; යථාර්ථය. අද අපේ රටේ දරු පරපුර මත්ද්‍රව්‍ය රකුසා ගිලගෙන හමාරයි. ඒ නිසා මත්ද්‍රව්‍ය ව්‍යාපාර සහ ඒවාට සම්බන්ධ සියලු ම පද්ධති විනාශ කරන්නට ඕනෑ. අපි පැහැදිලිවම ඒ ස්ථාවරයේ ඉන්නවා. කුඩා දරුවන්ගේ ඉඳලා පාසල් පද්ධතියේ සිටින දරුවන් දක්වා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම නතර කරන්නේ කොහොමද කියන එක ගැන අපි සොයා බලන්න ඕනෑ. ඒ සඳහා අපි රටක් හැටියට, පුරවැසියන් හැටියට, ව්‍යවස්ථාදායකය හැටියට පැහැදිලි, සාර්ථක ක්‍රමවේදයක් සකස් කරන්නට ඕනෑ. නමුත් එහෙම ක්‍රමවේදයක් නැහැ.

මම සරල ප්‍රශ්නයක් අහන්න කැමැතියි. සිංගප්පූරුවේ මත්ද්‍රව්‍ය ජාවාරම බරපතළ ලෙස අඩපණ වෙන්නටත්, අපේ රටේ ව්‍යාප්ත වෙන්නටත් හේතුව මොකක්ද? සිංගප්පූරුවේ පුද්ගලයෙකු මත්ද්‍රව්‍යයක් සමඟ අහුවුණොත්, ඒකට දෙන්න ඕනෑ හොඳම දඬුවම ලබා දෙනවා. නමුත් අපේ රටේ මොකක්ද වෙන්නේ? ලොකු පරිශ්‍රමයක් යොදා මත්ද්‍රව්‍ය ජාවාරම්කරු අල්ලා රිමාන්ඩ් කරනවා. හැබැයි, එළියේ ඉඳලා කළාටත් වඩා ලොකුවට ඒ බිස්නස් එක ඒ අය ඇතුළෙදි කරගෙන යනවා. ඔන්න, අද රටේ තිබෙන යථාර්ථය. හැබැයි, එක දෙයක් තිබෙනවා. මේ වැරදිකරුවන්ට බරපතළ දඬුවම් ලබා දෙමින් සිංගප්පූරුවේ ඒ ක්‍රමවේදය ක්‍රියාත්මක වනකොට, අපේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය, විශ්වසනීයත්වය සහ විනිවිදභාවය තහවුරු වන ආකාරයට යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය අපිත් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ නිසා මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම කියන්න කැමැතියි, මත්ද්‍රව්‍ය ජාවාරම, මත්ද්‍රව්‍ය ව්‍යාපාරය ප්‍රවර්ධනය කරන අය පැහැදිලිවම විනාශ කරන්නට ඕනෑ බව. ඒ ස්ථාවරයේ අපි ඉන්නවා. ඒ උදෙසා දිය හැකි උපරිම සහයෝගය, සමගි ජන බලවේගය හැටියට; සමගි ජන සන්ධානය හැටියට අපි අනිවාර්යයෙන්ම ලබා දෙනවා.

ඒ වාගේම අද මේ සභාවේදී සාකච්ඡාවට භාජන වුණා, කාවන්තිස්ස ඇතා ගැන. ඒ ඇතා රෝගී තත්ත්වයට පත්වන බව නිරීක්ෂණය වුණේ සැප්තැම්බර් මාසයේ විසි ගණන්වල. මටත් ඒ පිළිබඳව දැනුවත් කිරීම කළාම මමත් පෞද්ගලිකව ඒ පශු වෛද්‍යවරයාට කථා කළා. ඉසුරු කියන පශු වෛද්‍යවරයා තමයි වයඹ පළාත භාරව සිටින්නේ. මේ ඇතා පොඩි කාලයක් ගල්ගමුව, සියඹලන්ගමුව යනාදි ප්‍රදේශවල සැරිසරලා නීරාවිය පැත්තට යනවා අපි දැක්කා. නීරාවිය පැත්තට යනකොට ඒ ප්‍රදේශයේ ජනතාව ඒ ඇතා පිළිබඳව නිරීක්ෂණය කළා. මේ ඇතාට පොඩි diarrhea තත්ත්වයක්, ඒ කියන්නේ බඩ යෑමේ තත්ත්වයක්, ආහාර අනුභව කරන්නට බැරි තත්ත්වයක් තිබුණා. ඒ තත්ත්වය තුළ පශු වෛද්‍ය කණ්ඩායම් රැසක් මේ ඇතාට ප්‍රතිකාර කරන්නට කටයුතු කළා. මේ සභාවේදී කියනවා මට ඇහුණා, අදාළ ඇමතිවරයා ගිහිල්ලා ඇතාව බැලුවාලු, හොඳට සුව වෙලා හිටියාලු කියලා. මම ඒ නිගමනයට එන්නේ නැහැ. මොකද, කාවන්තිස්ස ඇතා බඩ යෑමේ - diarrhea - තත්ත්වය තුළ කෑම කෑවේ නැහැ. ඒ නිසා පශු වෛද්‍යවරුන්ට ඒ ඇතාගේ බෙටි පරීක්ෂා කරන්නට අවස්ථාවක් ලැබුණේ නැහැ. ඒ diarrhea තත්ත්වයත් එක්ක වැසි කාලයත් උදා වුණු නිසා ඒ බෙටි යම් ප්‍රමාණයක් හෝ තිබුණා වුණත් ඒවා පරීක්ෂා කරන්නට බැරි වුණා. ඒ නිසා, ඇමතිතුමා ඇවිල්ලා බැලුවා, ඇතා හොඳින් ඉන්නවාය කියපු ඒ කථා මම පිළිගන්නේ නැහැ. ඇමතිතුමා එනකොටත් ඇතා දවල් කාලයේ හිටියේ ඇළේ, වතුරේ. රාත්‍රී කාලයට ගොඩට යනවා. දවල් කාලයේ දිගින් දිගටම වතුරේ ඉන්නකොට පශු වෛද්‍යවරුනුත් හීන්දු කළා, මේ ඇතාට ප්‍රශ්නයක් තිබෙනවාය කියලා. ඒ අනුව ඔවුන් ඇතාට විවිධාකාරයේ ප්‍රතිකාර කරන්නට කටයුතු කළා.

මම මේ කාරණාව කියන්නේ මේකයි. ඇත්තවශයෙන්ම කාවන්තිස්ස කියන ඇතා අපේ රටට අහිමි වුණා. දැන් අපි කළ යුත්තේ දැනට ඉන්න ඇත් සම්පත ආරක්ෂා කිරීමයි. දැනට ඉන්න ඇත් සම්පත වාගේම අලි සම්පත ආරක්ෂා කරන්නට ප්‍රජා කේන්ද්‍රීය, ප්‍රජා මූලික, ප්‍රජා නායකත්ව පරිසර සංරක්ෂණයකට අපි යන්නටම ඕනෑ. ඒ සතා සිවුපාවා රැක ගැනීම රජයේත්, පශු වෛද්‍ය අංශයේත්, ඒ වාගේම ඒ අලි, ඇතුන් සැරිසරන ප්‍රදේශවල ප්‍රජාවගේත් සහභාගිත්වය ඇතිව කරන්නට ඕනෑ. එසේ නම්, සංචාරක කර්මාන්තය -ecotourism-, පරිසර කේන්ද්‍රීය සංචාරක කර්මාන්තය වැනි ව්‍යාපෘති හරහා ඒ වනඅලි සම්පතෙන් ඒ ප්‍රේරක කලාපයේ - buffer zone එකේ - ප්‍රජාවට යම්කිසි ප්‍රතිලාභයක් - ආදායමක් - ලැබෙන ආකාරයේ ප්‍රජා කේන්ද්‍රීය සංරක්ෂණ වැඩසටහනකට අපි යා යුතුමයි.

ඒ වාගේම මම යෝජනා කරනවා, දැනට ඉතිරි වෙලා ඉන්න ඒ ඇත් සම්පත ආරක්ෂා කරන්නට විශේෂිත ආරක්ෂක වැඩසටහනක් අපි ක්‍රියාත්මක කරන්නට ඕනෑය කියා. සිවිල් ආරක්ෂක බලකාය, යුද හමුදාව, STF එක, අනෙකුත් හමුදා බලකායන් - මේ සියලු දෙනා - එකතු කරගෙන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත්, පරිසර අමාත්‍යාංශයත් කේන්ද්‍ර කරගෙන ඒ වෙනුවෙන් වෙනමම හට කණ්ඩායමක් යොදවන්නට ඕනෑ.

මම කැමැතියි, අවදානම් කාරණාවක් කියන්න. දැන් ඇත්තවශයෙන්ම දළෙන් බැලුවොත් මේ කාවන්තිස්ස ඇතාට වඩා ලංකාවේ ඉන්න ලොකුම ඇතා මහසෙන් කියන ඇතා. ඒ ඇතා සැරිසැරුවේ මරදන්කඩවල බලප්‍රදේශයේ. හපිදියාගම ආශ්‍රිතව තමයි මේ ඇතා හිටියේ. කාලයෙන් කාලයට ඒ ඇතා සංක්‍රමණය වෙනවා. වෙලාවකට ඒ ඇතා රිටිගලට යනවා, කන්තලේට යනවා, තවත් වෙලාවකට සෝමාවතියට යනවා, වෙලාවකට කවුඩුල්ලට යනවා, වෙලාවකට මින්නේරියට යනවා. දැන් ඒ ඇතා අතුරුදහන් වෙලා. අපි හිතන ආකාරයට වාගේම මම ඇසට නිරීක්ෂණය කරපු ආකාරයට දළෙන් බැලුවොත් ලංකාවේ ලොකුම ඇතා ඒ මහසෙන් ඇතා. නමුත් ඒ ඇතා අද වනකොට පෙනෙන්නට නැහැ. අර අග්බෝ කියන ඇතා සොයන්නට විශේෂිත කණ්ඩායමක් යොදලා බොහොම ප්‍රශංසනීය කර්තව්‍යයක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත්, ආරක්ෂක අංශයත් විසින් සිදු කළා. මේ මහසෙන් කියන ඇතා ඇතුළුව තවත් විශාල ඇත් පරපුරක් ඉන්නවා. මේ ඇත් පරපුර වෙනුවෙන්, මේ සුවිශේෂී සතුන් කණ්ඩායම - special species එක - ආරක්ෂා කිරීම වෙනුවෙන් ඉතාම පැහැදිලි වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ.

ඒ වාගේම මම රජයේ පාර්ශ්වයේ සියලුදෙනාටම කියන්න කැමැතියි, වයඹ වනජීවී කලාපයේ චතුර ගුණරත්න නැමති ඉතාම දක්ෂ නිලධාරියෙකු ඉන්න බව. චතුර ගුණරත්න මහත්මයා, ඔලුගල මහත්මයා යන මේ දෙගොල්ලන්ම එක්කහු කරලා විශේෂයෙන්ම මේ රටේ ඇත් පරපුර ආරක්ෂා කරන කලාපීය වැඩසටහනකට යොමු වෙන්න ඕනෑ. ඒ දෙය ඉෂ්ට කිරීම අද යුගයේ අවශ්‍යතාවක්.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද මම ප්‍රශ්නයක් ඇහුවා, 2026 අය වැයේ ප්‍රගතිය පිළිබඳව. ඒ කියන්නේ, ජනාධිපතිවරයාගේ 2025 අය වැය කථාවේ යෝජනාවල සඳහන් මුදල් කොහොමද වැය වුණේ, භෞතික ප්‍රගතිය සහ මූල්‍ය ප්‍රගතිය මොකක්ද කියලා මම ඇහුවා. ඒකට උත්තර දෙන්න බැහැ, මුදල් අමාත්‍යතුමා නියෝජනය කරන අනිල් ජයන්ත නියෝජ්‍ය ඇමතිවරයාට. මම අහන්න කැමැතියි, ඒ ප්‍රගතිය පිළිබඳව රජයට උත්තර නැත්නම් 2027 අය වැය වෙනුවෙන් නොවැම්බර් 12වැනි දා ජනාධිපතිවරයා කථාව පවත්වන්නේ කොහොමද කියලා. මේ රජයට අවබෝධයක් නැද්ද, 2026 මූල්‍ය ප්‍රගතිය සහ භෞතික ප්‍රගතිය පිළිබඳව? ඒ අය වැය යෝජනාවල ප්‍රගතිය ඇයි හංගන්නේ? ඒකට හේතුවක් තිබෙනවා. ඇත්තවශයෙන්ම මූල්‍ය ප්‍රගතිය, භෞතික ප්‍රගතිය බැලුවොත් අපි විශ්වාස කරනවා, ඒකට උත්තර නොදුන්නේ ප්‍රගතිය ඉතාම අවම මට්ටමක තිබෙන නිසා කියලා. ඒක රටට හෙළිදරව් වෙයි කියන එක නිසා තමයි ඒකට උත්තර නොදුන්නේ. හැබැයි, ඒකට උත්තර ලබා දෙන්න මාස 6ක් යනවා කියලා කියනවා මට ඇහුණා. මාස 6ක් නැහැ නේ, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා තව සති 3කින් - නොවැම්බර් 12වැනි දා - අය වැය කථාව ඉදිරිපත් කරනවා නේ. කොහොමද එතුමා අය වැය කථාව කරන්නේ, 2026 මොනවාද සිදු වුණේ කියන එක නොදැන? ඒකයි මම අහන්නේ.

වර්තමාන පාලනය තුළ අපේ රට ඉතාම අනතුරුදායක තත්ත්වයකයි තිබෙන්නේ. ජනාධිපතිවරයා ප්‍රමුඛ මේ ආණ්ඩුවට, මේ රටට ප්‍රශස්ත, ප්‍රබුද්ධ රාජ්‍ය පාලනයක් ක්‍රියාත්මක කරන්නට කිසිසේත්ම හැකියාවක් නැහැ. අපි විශ්වාස කරනවා, මේ රට ගොඩ ගන්නට තිබෙන එකම විකල්පය, එකම කණ්ඩායම සමගි ජන බලවේගය; සමගි ජන සන්ධානයයි කියන කාරණාව.

ස්තුතියි.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Minister of Environment?

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරිසර ඇමතිවරයා ලෙස මා සම්බන්ධ කර ගනිමින් ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ කරුණ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. මා සම්බන්ධයෙන් සඳහන් කරපු නිසා,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, take a short time because we have another speaker before the Sitting is suspended for lunch. We are not going in for a debate, Hon. Minister.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ඉතා කෙටි කාලයකින් මම මේ පැහැදිලි කිරීම අවසන් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාවන්තිස්ස හස්තියා සම්බන්ධයෙන් ඉදිරිපත් කළ වැරදි ප්‍රකාශය මම නිවැරදි කළ යුතුයි. මොකද, මේක අපේ රටට සංවේදී ප්‍රශ්නයක්. විශේෂයෙන්ම අපි හස්තියාගේ රෝගී තත්ත්වය නිරීක්ෂණය කළේ සැප්තැම්බර් මාසයේ 23වැනි දා. 24වැනි දා අපි ප්‍රතිකාර ලබා දීම ආරම්භ කළා. 25වැනි දා එම සත්වයා නිර්වින්දනය කරලා අවශ්‍ය කරන සාම්පල් අරගෙන, blood samples අරගෙන ප්‍රතිකාර දෙවැනි දිනයේදීත් කළා. ඉන් පසු දිනපතා අපි මේ හස්තියාට ප්‍රතිකාර කළා. 30වැනි දා තමයි මම ගල්ගමුව ප්‍රදේශයට නිරීක්ෂණය සඳහා ගියේ. ඊට කලින් දවස වනකොට මේ හස්තියා සුවය ලබා හොඳින් පාද හතරටම බර අරගෙන ඇවිදින තත්ත්වයක හිටියේ. ඒ වාගේම පුද්ගලයින් සහ සතුන් පසුපස එළවා පහර දීමට උත්සාහ කර තිබුණා. 30වැනි දා මම යනකොට හස්තියා මට නිරීක්ෂණය කරන්න ලැබුණේ නැහැ. නමුත්, පශු වෛද්‍යවරුන් සහ වනජීවී නිලධාරීන් සමඟ සාකච්ඡාවේදී මම ඒ blood samplesවල reports ඔක්කොම බැලුවා. ඒවා සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගත්තා. ඒ වනකොට ගල්ගමුවේ කාවන්තිස්ස ඇතාගේ ඉදිරි පාදයේ තිබුණු රෝගී තත්ත්වය සුව අතට පත් වෙලා තිබුණා. ඉන් පසුව දින කිහිපයක් මේ හස්තියා නිරීක්ෂය වුණේ නැහැ. නමුත්, 4වැනි දා මේ හස්තියා අනුරාධපුර ප්‍රදේශයේදී නිරීක්ෂණය වෙලා තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, could you make it very brief, please. There is one more speaker before the Sitting is suspended for lunch.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

6වැනි දා තමයි මේ සත්වයාගේ අර කියන පාවන තත්ත්වය නිරීක්ෂණය වෙන්නේ, වාර්තා වෙන්නේ. පළමුවැනි රෝගී තත්ත්වය අපි සුව කළත්, අනුරාධපුර ප්‍රදේශයට ගියාට පස්සේ ඇති වූ දෙවන රෝගී තත්ත්වය තමයි අපට සුවපත් කර ගන්න බැරි වුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේක සංවේදී ප්‍රශ්නයක්. මම ගරු විපක්ෂ නායකතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ සම්බන්ධයෙන් වැරදි අර්ථකථන, වැරදි අවබෝධ හැදෙන විධියට කටයුතු කරන්න එපා කියලා. පශු වෛද්‍යවරු සහ වනජීවී නිලධාරීන් ඇතුළු සියලුදෙනා වෙන කිසිදු හස්තියෙකුට මැදිහත් නොවන තරමින් මැදිහත් වෙලා තමයි ඒ ප්‍රතිකාර සිදු කළේ. පරිසර අමාත්‍යාංශය මේ වෙනකොට හෙට දිනයේ දහවල් කාලයේ සාකච්ඡාවක් දාගෙන තිබෙනවා වනජීවී නිලධාරීන් සහ ආරක්ෂක අංශ සම්බන්ධ කරගෙන, අපේ රටේ ආරක්ෂා කර ගත යුතු ඉතිරි ඇතුන් ආරක්ෂා කර ගැනීම පිළිබඳව කථා කරලා වැඩ පිළිවෙළක් හදන්න. ඒ අනුව අපි මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරමින් කටයුතු කරනවා කියන අවබෝධය මම ලබා දෙනවා.

ගරු විපක්ෂ නායකතුමාගෙන් මා ඉල්ලා සිටිනවා මේක දේශපාලන අවියක් කර ගන්න උත්සාහ කරන්න එපා කියලා. අපේ රටේ වනජීවීන් ආරක්ෂා කර ගැනීම, විශේෂයෙන් අලි ඇතුන් ආරක්ෂා කර ගැනීම අපි කාගෙත් සාමූහික වගකීමක්. ඒ නිසා මේ කර්තව්‍යයේදී වනජීවී නිලධාරීන්, පශු වෛද්‍යවරුන්, ඒ ක්ෂේත්‍රයේ අය අධෛර්යවත් කරන ආකාරයේ හැසිරීම්වලට යන්නේ නැතිව කරුණාකරලා ජාතික සම්පතක් වන වනසතුන් ආරක්ෂා කර ගැනීම සඳහා සද්භාවයෙන් කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you have made yourself clear.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker
We are not going in for a debate, Hon. Leader of the Opposition. I will give you only a minute because we have another speaker. Do not drag this, please.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණය දේශපාලනීකරණය කරන්නෙත් නැහැ, කිසිසේත්ම දේශපාලනය ගාවා ගන්නෙත් නැහැ. ගරු ඇමතිතුමාට පොට වැරදිලා. ඔබතුමාට පෙර කථා කළා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රදේශය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා. එතුමා ඉදිරිපත් කළ කරුණු කාරණාවල නිවැරදි කිරීමක් මම කළේ. කිසිම දවසක වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පශු වෛද්‍ය ක්ෂේත්‍රය අඩපණ කරන්නට අපි කටයුතු කරන්නේ නැහැ. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. පශු වෛද්‍ය ක්ෂේත්‍රයට ඔව්වර ආදරේ නම් ඇයි ඒ පශු වෛද්‍යවරු වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කරලා ඒ අයගේ අතිකාල දීමනා ටික, දුෂ්කර දීමනා ටික, අවදානම් දීමනා ටික ලබා දීලා ඒ අයට සලකන්නේ නැත්තේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, I will now call upon the next speaker.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාට පැහැදිලි කරන්නට ඕනෑ-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You have made your point, Hon. Leader of the Opposition.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න.

මම කළේ ඔබතුමාට පෙර කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයා ඉදිරිපත් කළ වැරදි තොරතුරු නිවැරදි කිරීම මිස ඔබතුමාට අවලාද, විවේචන එල්ල කිරීම නොවෙයි, ගරු ඇමතිතුමනි. ඔබතුමා පොට වරද්දාගෙන තිබෙන්නේ. පොට වරද්දා ගන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Sandaruwan Madarasinghe. You have nine minutes.

[අ.භා. 12.24]

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතට සංශෝධන ගෙන එන වෙලාවේ ඒ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන ගමන් මම මුලින්ම විපක්ෂ නායකතුමාගේ කථාවට අදාළව කරුණු කිහිපයක් කියන්න කැමැතියි.

එතුමා කුරුණෑගල ඉන්න අලින් ගැන කථා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එතුමාගෙන් අහන්න කැමැතියි, 2015-2019 කාලයේ හම්බන්තොට වන සංරක්ෂණ භූමිය ඇතුළේ ගම්මාන කීයක් එතුමා ඉදි කළාද කියලා. තිස්සමහාරාම, ලුණුගම්වෙහෙර ප්‍රදේශවල ඉදි කළ ඒ ගම්මානවල නිවාස සංඛ්‍යාව සම්පූර්ණ කළා නම් කමක් නැහැ. එතුමා වන සංරක්ෂණ භූමිය ඇතුළේ නිවාස දෙකක්, තුනක් තිබෙන ගම්මාන කීයක් ඉදි කරලා, ඒවායේ වැඩ භාගෙට නවත්වලා, අලින්ට ඉන්න තිබෙන

තැන නැති කරලා තිබෙනවාද? ඒ වාගේම මම අහන්න කැමැතියි, වරෙක මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සමඟ සම්බන්ධකම් තිබෙනවා කියා පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයෙකු පවා කියපු දුමින්ද සිල්වා වැනි පුද්ගලයෝ කාත් එක්කද දේශපාලනය කළේ කියලා. ඒ වාගේම මම ඔබතුමාට තව ඌන පූරණයක් කරන්න කැමැතියි. සිංගප්පූරුවේ වාගේ අපේ රටේ මත්ද්‍රව්‍ය පාලනය සිදු නොවුණේ ඇයි කියන එකත්, - විශේෂයෙන්ම අයිස් වාගේ සමහර මත්ද්‍රව්‍ය 2010 වාගේ කාලයේ මේ රටේ තිබුණේ නැහැ - 2017-2018 කාලයේ අයිස් වාගේ මත්ද්‍රව්‍ය මේ රටට ඇවිල්ලා, දැන් මේ තරම් දුරට ව්‍යාප්ත වෙන්න ඔබතුමන්ලා පාලනය කරපු රජයන් කොච්චර දුරට මේවාට අනුග්‍රහය දැක්වුවාද කියන ප්‍රශ්නයත් මම ඔබතුමන්ලාගෙන් අහන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ජාතික ජන බලවේගය විධියට අපි 2024දී භාර ගත්තේ ආර්ථිකමය වශයෙන් බංකොලොත් වෙච්ච රටක් පමණක් නොවෙයි, ගම් දනව් පුරා මත්ද්‍රව්‍ය විශාල වශයෙන් පැතිරුණු රටක්. මේ විධියට මත්ද්‍රව්‍ය පැතිරෙන්න විශේෂයෙන්ම මේ රට පාලනය කරපු දේශපාලනඥයින් සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් විශාල වශයෙන් හේතු වුණා. අපි හොඳාකාරවම දන්නවා, ඒගොල්ලන් බලය ලබා ගන්න, ඒගොල්ලන් භූමිය ඇතුළේ දේශපාලන රැස්වීම් පවත්වන්න සහ වෙනත් ක්‍රියාකාරකම් කරන්න මේ මත්ද්‍රව්‍ය ජාලය සහ ඒ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් විශාල වශයෙන් ප්‍රයෝජනයට ගත් බව. දේශපාලනඥයින් ගමට එනකොට, නගරයට එනකොට එක්කෝ ඒගොල්ලන් එන වාහනයෙන්, එහෙම නැත්නම් පිටි පස්සෙන් එන වාහනයෙන් බහින්නේ ගමේ, නගරයේ ඉන්න ජාවාරම්කරුවන් බව අපි ඕනෑ තරම් දැක තිබෙනවා. හැම පක්ෂයකම දේශපාලනඥයින් ජාවාරම්කරුවන් එක්ක සම්බන්ධකම් පවත්වමින් තිබුණා. ඔවුන් ඒ තරමටම ජාවාරම්කරුවන්ට ළං වෙලා තිබුණා. සමහර අවස්ථාවලදී ආරක්ෂක අංශ විසින් ජාවාරම්කරුවන් වටලනකොට සමහර දේශපාලන පක්ෂවල නායකයෝ ගිහිල්ලා ජාවාරම්කරුව වැළඳ ගත්තා. සමහර අපරාධකරුවන් දේශපාලන පක්ෂවල කෘත්‍යාධිකාරී මණ්ඩල වැනි ඉහළ මණ්ඩල නියෝජනය කළා. සමහර අපරාධකරුවන් දේශපාලනඥයින්ගේ bodyguardsලා වෙලා හිටියා. එහෙම තමයි ඒගොල්ලන් ඒ අපරාධකරුවන්ට, ජාවාරම්කරුවන්ට අනුග්‍රහය ලබා දුන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා තමයි අදටත් ඒගොල්ලන්ගේ සමහර රැස්වීම්වලදී ප්‍රධාන කථිකයින් කරන කථාවල අන්තර්ගතයන්ට වඩා, මත්ද්‍රව්‍ය භාවිත කරලා මත්වෙලා ඒ රැස්වීම්වලට එන කට්ටිය වැටෙන් වැටෙන ඒවා, ස්පීකර් සවි කරපු කණු උඩ නගින ඒවා, අවයව නැහැ කියලා දුවන ඒවා සමාජ මාධ්‍ය ඇතුළේ වැඩිපුර ප්‍රචාරය වෙන්නේ. ඒගොල්ලන් ඒ තරමට මත්ද්‍රව්‍යත් එක්ක ළං වෙලා තිබෙනවා.

මා ළඟ දත්ත කිහිපයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප රට භාර ගන්න මොහොතේ මේ රට මොන තරම් ව්‍යසනයකද තිබුණේ කියලා මේ දත්ත මඟින් මනාව ඔප්පු වෙනවා. විශේෂයෙන්ම 2020දී - එම වසර ඇතුළත - හෙරොයින් වාගේ මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 1,629කට වැඩි ප්‍රමාණයක් අත්අඩංගුවට ගනිද්දි, ඒක 2024දී කිලෝග්‍රෑම් 832ක් දක්වා අඩු වුණා. හැබැයි අයිස් වාගේ මත්ද්‍රව්‍ය ගත්තොත්, 2020දී කිලෝග්‍රෑම් 812ක් අත්අඩංගුවට ගනිද්දි, 2024 වනවිට කිලෝග්‍රෑම් 1,364ක් වාගේ ප්‍රමාණයක් දක්වා වැඩි වෙලා තිබෙනවා.

ඊළඟට, අත්අඩංගුවට ගත් පුද්ගලයින් සංඛ්‍යාව බැලුවොත්, 2020දී 97,000ක් වාගේ සංඛ්‍යාවක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. 2024දී එය 220,000කට වඩා වැඩි සංඛ්‍යාවක් දක්වා වැඩි වී තිබෙනවා. එයින් අයිස් මත්ද්‍රව්‍යය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයින් සංඛ්‍යාව 23,000 ඉඳලා 68,000ක් වැනි සංඛ්‍යාවක් දක්වා, තුන් ගුණයකින් විතර වැඩි වී තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තාවන් සම්බන්ධව ගත්තොත්, 2020දී මත්ද්‍රව්‍ය වැරැදි සම්බන්ධයෙන් කාන්තාවන් 600දෙනෙක් පමණ අත්අඩංගුවට පත් වෙද්දි, 2024 වසර වෙනකොට එය 1,579ක් වැනි සංඛ්‍යාවක් දක්වා වේගයෙන් වැඩි වෙලා තිබෙනවා.

අවුරුදු 30ට අඩු තරුණ තරුණියන් ගත්තොත්, 2020දී 4,240දෙනෙක් අත්අඩංගුවට පත් වෙද්දි, 2024දී 9,519ක් වැනි සංඛ්‍යාවක් දක්වා වැඩි වෙලා තිබෙනවා. මෙය ප්‍රතිශතයක් විධියට ගත්තොත්, විශේෂයෙන්ම 2020දී මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් සියයට 47ක් බන්ධනාගාරගත වෙනවා; මත් පැන් සම්බන්ධයෙන් සියයට 13.7ක් බන්ධනාගාරගත වෙනවා. ඒ කියන්නේ 2020දී සියයට 60ක් වැනි ප්‍රමාණයක් බන්ධනාගාරගත වෙනවා, මත් පැන් සහ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන්. 2024 වාගේ වෙනකොට මේ සංඛ්‍යාව සියයට 75ක් දක්වා ශීඝ්‍රයෙන් වැඩි වෙලා තිබෙනවා; එහි ප්‍රවණතාවක් තිබෙනවා. මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් සියයට 65ක් ලෙසත්, මත් පැන් සම්බන්ධව සියයට 10ක් ලෙසත් ඒ ප්‍රතිශතය දැක්වෙනවා.

මෙහි බේදනීයම කරුණ වන්නේ, 2024දී මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයින් ප්‍රමාණය සමස්ත ජනගහනයෙන් සියයට 1ක් විධියට හැඳින්වීමයි. ඒ කියන්නේ හැම 100 දෙනෙකුගෙන්ම එක් අයෙක් කුමන හෝ මත්ද්‍රව්‍යයක් සම්බන්ධ වැරැද්දක් සඳහා අත්අඩංගුවට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප භාර ගත් සමාජය මොන තරම් මත්ද්‍රව්‍ය ගහන සමාජයක්ද කියලා ඔබතුමාටත්, අපි සියලු දෙනාටත් හොඳටම පැහැදිලි වෙනවා. එහෙම නම්, ඒ තරම් තත්ත්වයක් දක්වා මේ සමාජය පත් කළේ කවුද? දැන් සිංගප්පූරුවක් ගැන කථා කළා. ඒ රටේ නීතිය ක්‍රියාත්මක වනවා වාගේ මෙහේ නොවන්නේ ඇයි කියලා ඇහුවා. මෙතෙක් කාලයක් අපේ රට පාලනය කළ දේශපාලනඥයින් විසින් තමයි මේවාට නීතිය ක්‍රියාත්මක කරන්නේ නැතුව, අණ පනත් ගෙනෙන්නේ නැතුව ඉඳලා ඒ සඳහා අනුග්‍රහය දක්වලා, මේ තරම් තත්ත්වයක් දක්වා අපේ රට පත් කරලා තිබෙන්නේ.

ඒ වාගේම මේ හා සම්බන්ධ නව ප්‍රවණතා තිබෙනවා. පළමුවැනි එක, කලින් ශාක මත පදනම් වෙලා තිබිච්ච මත්ද්‍රව්‍ය වෙනුවට කෘත්‍රිමව නිෂ්පාදනය කරන මත්ද්‍රව්‍ය තමයි දැන් වැඩිම ප්‍රමාණයක් පරිහරණය වෙන්නේ. ඒ නිසා තමයි මේ පනත් කෙටුම්පත තුළින් අයිස් මත්ද්‍රව්‍යයත් මරණ දඬුවම, ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලැබිය හැකි වැරදිවලට අදාළ මත්ද්‍රව්‍ය කාණ්ඩයට ඇතුළත් කරලා තිබෙන්නේ. ඒ වාගේම මුහුදේදී මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන්, විශේෂයෙන්ම ජාත්‍යන්තර මුහුදේදී කරන නිෂ්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට අපේ අධිකරණයට බලයක් ලබා දීමත් මේ සංශෝධන තුළින් සිදු කරනවා.

මේ මත්ද්‍රව්‍ය ජාලය සහ සංවිධානාත්මක අපරාධ අතර හැම වෙලාවේම ඍජු සම්බන්ධයක් තිබෙනවා. ඒ වාගේම නාගරික, අර්ධ නාගරික ප්‍රදේශවල විතරක් නොවෙයි, දැන් ග්‍රාමීය ප්‍රදේශ දක්වාත් මත්ද්‍රව්‍ය උවදුර පැතිරිලා තිබෙනවා. ජාතික ආරක්ෂාව, පවුල් සංස්ථාව බිඳ වැටීම, දරුවන් අනාරක්ෂිත තත්ත්වයට පත් වීම වාගේම රටේ නිෂ්පාදන ආර්ථිකය බිඳ වැටීම දක්වාත් මේ මත්ද්‍රව්‍ය උවදුර විශාල වශයෙන් බලපා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැන් ඒ ජාවාරම්කරුවන් සඳහා නීතිය ක්‍රියාත්මක කිරීම ඉතාම තදින් සිදු කරනු ලබනවා. මම සඳහන් කරන්න කැමැතියි, 2025.10.30වැනි දා ඉඳලා 2026.10.19වැනි දා දක්වා "රටම එකට" ජාතික මෙහෙයුම මඟින් හෙරොයින් කිලෝග්‍රෑම් 2,486ක් අත්අඩංගුවට ගෙන තිබෙන බව; අයිස් මත්ද්‍රව්‍යය කිලෝග්‍රෑම් 3,302ක් අත්අඩංගුවට ගෙන තිබෙන බව; ගංජා කිලෝග්‍රෑම් 111,000ක් අත්අඩංගුවට ගෙන තිබෙන බව; මත් පෙති 4,500,000කට වැඩි ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන තිබෙන බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, would you please wind up?

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)
ඒ වාගේම ගිනි අවි විශාල ප්‍රමාණයකුත් අත්අඩංගුවට ගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහිදී විශේෂම කාරණය තමයි, ඒ ජාවාරම්කරුවන් සතුව තිබුණු රුපියල් මිලියන 5,229ක පමණ විශාල දේපළ ප්‍රමාණයක් හඳුනාගෙන, මේ වනකොට ඒවා රාජසන්තක කර තිබීම. මම හිතන විධියට, මීන් පෙර කිසිදු රජයක් එවැනි ක්‍රියාවලියක් අනුගමනය කරලා නැහැ. අපි කිසි විටෙකත් කිසිම ජාවාරම්කරුවෙකුට රාජ්‍ය අනුග්‍රහයක්, අපේ රජයේ කිසිම දේශපාලනඥයෙකුගේ අනුග්‍රහයක් ලබා දෙන්නේ නැහැ. විෂ මත්ද්‍රව්‍යයෙන් තොර සමාජයක් බිහි කිරීම සඳහා අපි උපරිම වශයෙන් කැප වී සිටිනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of this House shall stay suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව නාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon.Namal Rajapaksa. You have eight minutes.

[අ.භා. 1.00]

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ ආණ්ඩු පත් වුණාම හිතාගෙන ඉන්නවා, විෂ මත්ද්‍රව්‍ය පාලනය කරන්න, එහෙම නැත්නම් මත්ද්‍රව්‍ය පාලනය කරන්න පොලීසියට target එකක් දීලා කරන්න පුළුවන් කියලා. හැබැයි, යථාර්ථය තමයි target එකක් දීලා ඒක කරන්න බැහැ කියන එක. ඒ ක්‍රමය ෆේල්. මේ හැම ආණ්ඩුවක්ම උත්සාහ කරන්නේ, තමන්ගේ ආණ්ඩුව යටතේ පොලීසිය දවසකට අත් අඩංගුවට ගන්නා ප්‍රමාණය වැඩි කරලා පෙන්වන්නයි. ඊයේ දිනයේදී අපේ රටේ පොලිස්පතිවරයා එහෙම කරන්න ගිහිල්ලා අමාරුවේ වැටෙනවා අපි දැක්කා. ඇයි? පොලිස්පතිවරයාත් තේරුම් ගන්න ඕනෑ, තමා මේ මාලිමාවේවත්, ජේවීපී එකේවත් පොලිස්පතිවරයා නොවෙයි කියලා. ඔහු ශ්‍රී ලංකා පොලීසියයි නියෝජනය කරන්නේ. ආණ්ඩුවට කඩේ යන්න ගිහිල්ලා අවසානයේදී ඔහුට මොකක්ද වුණේ? පොලිස්පතිවරයාටත් අධිකරණයට අපහාස කිරීමේ නඩුවක් ගොනු වෙන්න පටන් ගත්තා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විෂ මත්ද්‍රව්‍ය පාලනය කරන්න ඕනෑ. ඒකේ සැබෑ මොළකරුවන්ට, ඒවා ගෙන්වන අයට, වෙළෙඳාම් කරන අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒ කිසිම කෙනෙකුට නීතිය ක්‍රියාත්මක කරන්න එපා කියලා මම කියන්නේ නැහැ. හැබැයි, ආණ්ඩුව විකල්පය විධියට දකින්නේ අත් අඩංගුවට ගැනීම සහ රිමාන්ඩ් කිරීම නම්, ඒ කාරණය සාර්ථක වෙන්නේ නැහැ කියන එකත් ආණ්ඩුව තේරුම් ගත යුතුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඒ බව විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

මොකද, මේ අත් අඩංගුවට ගන්නා බහුතරයක් දෙනා addictsලා. ඒ අය පුනරුත්ථාපනය කිරීම තමයි කරන්න ඕනෑ. අනුරාධ ජයරත්න මැතිතුමා අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විධියට හිටපු කාලයේ පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් හදන්න අවශ්‍ය ඉඩම් පවා ගත්තා. ඊට පස්සේ යම්කිසි හේතුවකින් ආණ්ඩුව මාරු වුණාම මේ ආණ්ඩුව නීන්දු කළා, මේ අල්ලා ගන්නා අය පුනරුත්ථාපනය කරනවා වෙනුවට හැමදාම අත් අඩංගුවට අරගෙන news එකක් විධියට දමන එක තමයි කළ යුත්තේ කියලා. ඉතින් පොලීසියේ මහත්වරුත් මොකද කරන්නේ? ආණ්ඩුවේ target එක දෙන්න ඕනෑ හින්දා ගමේ ඉන්න කෙනා අල්ලාගෙන ගිහින් 54 ගහලා ඇතුළට දානවා. එතකොට බන්ධනාගාර පිරෙනවා. අවසානයේදී මොකක්ද වෙන්නේ? බන්ධනාගාරවල තදබදයකුත් ඇති වෙනවා; සමාජ විරෝධයකුත් ඇති වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දැන් මේ බන්ධනාගාර ඇතුළේ තිබෙන තත්ත්වය බලන්න. ඒවා නිකම් මිහිපිට අපායවල් වාගෙයි. 20ක් දාන්න පුළුවන් කාමරේක 300ක් විතර ඉන්නවා. වැසිකිළි-කැසිකිළි පහසුකම් නැහැ. දැඩි තදබදයක් තිබෙනවා. ඒවා ගැන ආණ්ඩුව සොයන්නේ නැහැ. හැබැයි, අවසානයේදී මොකක්ද වෙන්නේ? ආණ්ඩුව තමන්ගේ නීති, තමන්ගේ ක්‍රියාකාරිත්වය පෙන්වන්න ගිහිල්ලා අහිංසක මිනිසුන් remand කරනවා. ඒකට හොඳම උදාහරණය තමයි පොලිස්පතිවරයාට ඊයේ සිද්ධ වෙච්ච දේ. පාරේ ඉන්න ළමයින් අල්ලාගෙන ගිහින් 54 ගහලා ඇතුළට දැම්මා කියලා මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ.

දැන් ඉතින් ග්‍රෑම් 10ක මත්ද්‍රව්‍ය ප්‍රමාණය ග්‍රෑම් 100 කළා නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ඉතින් ඔබතුමන්ලාගේ පොලිස්පතිවරයාට කරුණාකර කියන්න, හෙට ඉඳන් අල්ලන අය සන්තකයේ මත්ද්‍රව්‍ය ග්‍රෑම් 101ක් තිබුණා කියලා දාන්න එපා කියලා. මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10ක් හසු වුණාම ග්‍රෑම් 11ක් කියලා දමනවා නේ. ග්‍රෑම් 100ක් හසු වුණාම ග්‍රෑම් 101ක් කියලා දමනවා. අවසානයේ මොකක්ද වෙන්නේ? අර න්‍යාය පත්‍රය ඒ විධියටම ක්‍රියාත්මක වෙනවා. ඒ හින්දා මේ අල්ලා ගන්නා අය බන්ධනාගාරගත කිරීම, රිමාන්ඩ් කිරීම මේ ආණ්ඩුව ලබපු මහා ලොකු ජයග්‍රහණයක් විධියට දකින්න එපා. විශේෂයෙන්ම, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන්. ඒ දරුවන් පුනරුත්ථාපනය කරලා නැවත සමාජගත කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්න ඕනෑ.

එක පැත්තකින්, ඔබතමුන්නාන්සේලා බන්ධනාගාර පුරවනවා. හැබැයි, අනෙක් අතට නිලධාරීන්ගේ පැත්ත බලන්න. අද බන්ධනාගාර නිලධාරීන්ගේ දැවැන්ත හිඟයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද බන්ධනාගාර නිලධාරීන් ප්‍රමාණවත් නැහැ. ඒ නිලධාරීන්ගේ පඩිය කොච්චරද බලන්න. තමන් මහන්සි වන එකට, තමන්ගේ ජීවිත අවදානම අරගෙන

කටයුතු කරන එකට, ඒ කරන කැපවීම්වලට සරිලන පඩියක් ඔවුන්ට ලැබෙනවා ද? අඩු ගාණේ ආහාර දීමනාවක් හෝ අවදානම් දීමනාවක්වත් හෝ ඔවුන්ට ලැබෙනවා ද? අද මේ කිසිම බන්ධනාගාර නිලධාරියෙකුට අවදානම් දීමනාව ලැබෙන්නේ නැහැ. හැබැයි ඔබත් දන්නවා, මමත් දන්නවා, ඔවුන් තමන්ගේ ජීවිතය සම්බන්ධයෙන් අවදානමක් අරගෙන තමයි ඒ රස්සාව කරන්නේ කියලා. ඒ අය හැප්පෙන්නේ සංවිධානාත්මක අපරාධකරුවන් එක්ක. පාරේ යන මනුස්සයෙකුට වෙඩි තබන එක නවත්වා ගන්න ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා. ජනාධිපතිවරයාත් පසුගිය කාලයේ රැස්වීම්වල ගිහිල්ලා කිව්වා නේ, පොහොර මිටි තරමට කුඩු ඇල්ලුවා කියලා. එහෙම ඇල්ලුවාට සමාජයේ කුඩුවලින් අඩුවක් නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපට වාර්තා වන්නේ නැහැ නේ, කුඩු හිඟයක් හින්දා පාරේ මිනිස්සු සික් එක හැදිලා වැටුණා කියලා. එවැනි ආරංචියක් එන්නේ නැහැ නේ. තුවක්කු මෙච්චර මෙච්චර ඇල්ලුවා කිව්වා; තුවක්කු මෙච්චරක් ඇල්ලුවා කියලා ජනාධිපතිතුමා කිව්වත් ඔබතුමාට, අපට වාර්තා වෙනවාද වෙඩි තැබීම් අඩු වෙලා කියලා? හැම දවසකටම දෙකකට සැරයක් කොහේ හරි තැනක වෙඩි තබනවා.

ඒ කියන්නේ ආණ්ඩුවේ ක්‍රියාදාමය, ආණ්ඩුවේ වැඩ පිළිවෙළ ෆේල්. මේ වැඩ පිළිවෙළ සාර්ථකයි නම් රටේ කුඩු භාවිත කරන ප්‍රමාණයට අනුව ඒ supply එක අඩු වෙන්න එපායැ. හැබැයි, අඩු වෙලා නැහැ නේ. වරායෙන් පන්නපු කුඩු කන්ටේනරයක් ඇල්ලුවාම, ඒ කුඩු කන්ටේනරය අල්ලපු කෙනාට විරුද්ධවත් ආණ්ඩුව පරීක්ෂණයක් කරනවා. බන්ධනාගාරය ඇතුළේ ඉන්නවා, බෝට්ටුවලින් මත්ද්‍රව්‍ය ගෙනැල්ලා අහු වෙලා අවුරුදු 7, 8 රක්ෂිත බන්ධනාගාරගත වෙලා ඉන්න අය. ඒවායේ මහා මොළකරුවෝ නැහැ; ඒවායේ මහා පරිමාණ ව්‍යාපාරිකයෝ නැහැ. මුහුදු යනවා කියලා අවුරුදු 18 - 19 ළමයින් බෝට්ටුවල එක්කර ගෙන යනවා. කුඩු ප්‍රවාහනය කරනවා කියලා මහදී ඒ බෝට්ටු අල්ලනවා. ඒ බෝට්ටුවේ කුඩු තිබෙනවා කියලා අර ළමයි දන්නේ නැහැ. හැබැයි, ඒ අය අල්ලාගෙන ඇවිල්ලා, තම සන්තකයේ කුඩු තබා ගත්තා කියලා ඇතුළට දමනවා. අවුරුදු 6, 7 ඇතුළේ. අවුරුදු 20දී බන්ධනාගාරගත වුණාම, ඒ අයට අවුරුදු 25, 30 වනකල් බන්ධනාගාරය ඇතුළේ ජීවත් වෙන්න සිදු වෙලා තිබෙනවා . ඉතින් මේවා පිළිබඳව ප්‍රායෝගික ක්‍රියාවලියක් අනුගමනය කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අනෙක් අතට, බන්ධනාගාර නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් ටික දෙන්න; අවදානම් දීමනාව දෙන්න. ඒ සමහර නිලධාරීන් සතියේ දවස් හතම duty කරනවා; උදේ ය duty කරනවා. Night shift එක ඇදලා ආයේ උදේත් duty එක කරලා පහුවදාත් night shift එක කරන්න ඕනෑ. ඒ තරම් පීඩනයක් තිබෙන්නේ. වෙන රටවල නම් බන්ධනාගාර නිලධාරීන්ට අඩුම ගණනේ අවුරුද්දකට මාස දෙකක් පඩි ගෙවලා නිවාඩු දෙනවා, තමන්ගේ ගෙදර දරුවන් එක්ක ජීවත් වෙන්න. අපි රිමාන්ඩ් වෙලා දුකෙන් ඉන්නවා, අපේ දරුවන් බලන්න විධියක් නැහැ කියලා. හැබැයි, අපේ අතට මාංචු දමන මනුස්සයාටත් ඒ මනුස්සයාගේ දරුවන් බලන්න විධියක් නැහැ, දවස් 7ක් යනකල්. ඒ රිමාන්ඩ් වෙලා නොවෙයි, රස්සාව කරන්න ඇවිල්ලා. රස්සාව කරන්න ඇවිල්ලාත් රිමාන්ඩ් වෙලා වාගේ තමයි ඒ අයට බන්ධනාගාර ඇතුළේ ඉන්න සිද්ධ වෙලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

පසුගිය කාලයේ මොනවාද නොකිව්වේ? නුවරඑළියේ ICE factory එකක් තිබෙනවා කිව්වා. කියපු නැති කාරණයක් නැහැ නේ. නමුත් වරායෙන් කන්ටේනර් 323ක් පැන්නුවා; ගල් අඟුරු වංචාවක් සිදු වෙලා තිබෙනවා. ඉතින් මේ කාරණා දිහා පැහැදිලිවම මීට වඩා විවෘත මනසකින් ආණ්ඩුව බලන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම, ප්‍රායෝගිකව බලන්න ඕනෑ; ප්‍රායෝගික ක්‍රියාදාමයකට අනුව කටයුතු කරන්න ඕනෑ. ඉතින් ඒ සඳහා නීති ගෙනෙන්න ඕනෑ. හැබැයි, ඒ නීති ගෙනෙන්නේ ජනතාව රක්ෂිත බන්ධනාගාරගත කිරීමේ න්‍යාය පත්‍රයකට අනුකූලව නම්, ඒක තවදුරටත් සාර්ථක වෙන්නේ නැහැ. පසුගිය දවසක මීගමුව බන්ධනාගාරයේ සිද්ධියක් වුණා; මහර බන්ධනාගාරයේ සිද්ධියක් වුණා; මැගසින් බන්ධනාගාරයේත් සිද්ධියක් වුණා. බන්ධනාගාර නිලධාරීන් දසදෙනෙකුගේත් ජීවිත නැති වුණා. හැබැයි, එදා ඇමතිවරයා ගිහිල්ලා කිව්වා, "අරක දෙන්නම්, මේක දෙන්නම්" කියලා. පසුගිය සති කිහිපයකට කලින් ඒ මිය ගිය අයගේ තුන්මාසයේ දානය පැවැත්වුවා. එදා ඒ පොරොන්දු වුණු දේවලින් මොකක්ද දීලා තිබෙන්නේ? ඒ එක පවුලකට රුපියල් කෝටියක් දෙනවා කිව්වා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද වනකොට රුපියල් කෝටියත් නැහැ, ඇමතිත් නැහැ හොයාගන්න. අඩු ගණනේ, තුන්මාසයේ දානයට මොකක්ද වෙන්න ඕනෑ කියලා හරි කථා කරලා අහන්න එපායැ. එහෙම ඇහුවේවත් නැහැ. ඒ වාගේම තමයි unit එකේ සමහර මාරුවීම්. පසුගිය කාලයේ හමුදාවේ ඉඳලා විශ්‍රාම ගිය අය unit එකට බඳවා ගත්තා. ඒ සමහර මාරුවීම් දේශපාලන වුවමනාව මත සිද්ධ වෙනවා කියන එක අද අපට දැනගන්න තිබෙනවා. ඉතින් මේවා ගැනත් ආණ්ඩුව සොයන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලීසිය තනිකරම දේශපාලනීකරණය වෙලා. මේ රට පොලිස් රාජ්‍යයකට අරගෙන යන ආකාරයට පොලීසිය හැසිරෙන කොට, අනෙක් පැත්තෙන් ජීවන වියදම වැඩි වෙනවා; විරැකියාව වැඩි වෙනවා. දැන් පාන් පිටි මිල වැඩි වෙලා. ඒක හරිම ප්‍රශ්නයක්. ඇයි? පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ඒ ගැන දන්නේ නැති ලු. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියටත් ලජ්ජා නැහැ නේ, පාන් පිටි මිල වැඩි වුණා කියලා තමන් දන්නේ නැති බව මාධ්‍යයට ඇවිත් කියන්න. පාන් පිටි මිල වැඩි වුණා කියලා තමන් දන්නේ නැහැ කියා ඔවුන් කියනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ලැජ්ජයි නේ! අඩු ගණනේ, දන්නවා වාගේ ඉන්න ඕනෑ. එහෙම නැත්නම්, ගිහිල්ලා අහගන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමතිතුමා පසුගිය කාලයේ කියපු කථා එක්ක සංසන්දනාත්මකව බලද්දී අද වනකොට හිතා ගන්න පුළුවන් නේ, රට කොතැනද තිබෙන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ඉතිහාසයේ ඉඳන්ම මහ පාරට බැස්සේ නැත්තේ මහා සංඝ රත්නය විතරයි. අද ඔබතුමන්ලාගේ ආණ්ඩුවට පින් සිද්ධ වෙන්න, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ක්‍රියාකලාපය නිසා, ඔබතුමන්ලාගේ ආණ්ඩුව මේ රටේ මහා සංඝ රත්නයට කරන අසාධාරණය සහ සම්බුද්ධ ශාසනයට කරන අසාධාරණය නිසා අද මහා සංඝ රත්නයත් පාරට ඇවිල්ලා බුද්ධ ශාසනය ආරක්ෂා කර ගන්නා තැනට, ඒ සම්බන්ධව කථා කරන තැනට පත් වෙලා ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තවත් තත්පර 30ක් දෙන්න.

ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා "නීතිය හැමෝටම සමානයි" කිව්වා නේ. අපි ඒ දිහා බලාගෙන ඉන්නවා. ගෞරවනීය ඥානසාර හාමුදුරුවන් වහන්සේටත් තිබෙන චෝදනාවක් තමයි, එල්.ටී.ටී.ඊ.

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

ත්‍රස්තවාදීන්ට සම්බන්ධ වෙච්ච පුද්ගලයෙකු සම්බන්ධයෙන් අධිකරණයේදී කරපු ප්‍රකාශයකින්, විශේෂයෙන්ම බුද්ධි අංශ නිලධාරීන් සහ රණ විරුවන් ආරක්ෂා කිරීම සඳහා කරපු ප්‍රකාශයකින් අධිකරණයට අපහාස වුණා කියන කාරණය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බලාගෙන ඉන්නවා අධිකරණ තීන්දුව පැහැර හැරලා, අධිකරණයට බොරු තොරතුරු දීලා, මේ රටේ අසරණ, අහිංසක මිනිසුන්ට බොරු චෝදනා දාලා නඩු දමන එකට විරුද්ධව ගරු විනිශ්චයකාරවරයෙකු තීන්දුවක් දුන්නාම, ඒ තීන්දුව පැහැර හැරපු පොලිස්පතිවරයාට මොකක්ද වෙන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, Hon. Lasith Bhashana Gamage. You have nine minutes.

[අ.භා.1.10]

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

විෂ මත් ද්‍රව්‍ය සම්බන්ධ මේ නීති සංශෝධන පිළිබඳ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේ අපි සාකච්ඡා කරන්න ඕනෑ, "ආණ්ඩුව විධියට අප කරගෙන යන වැඩසටහන මොකක්ද? අපේ ආණ්ඩුවේ කාර්යභාරය මොකක්ද?" කියන කාරණය. ආණ්ඩුවේ කාර්යභාරය වන්නේ මේ රට සංවර්ධනය කිරීමයි. ඒ දිහා මේ රටේ ජනතාව බලාගෙන ඉන්නවා. මේ රට සංවර්ධනය කරද්දී මංමාවත්, පාලම්, බෝක්කු සංවර්ධනය කරනවා වාගේම මානව සම්පත සංවර්ධනය කරන්නේ කොහොමද, මානව සම්පත ගොඩනඟන්නේ කොහොමද කියන පුළුල් සාකච්ඡාවත් අපි කර ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මානව සම්පත සංවර්ධනය කරද්දී අධ්‍යාපනය පැත්තෙන් සිදු වන සංවර්ධනය කොයි වාගේද, ක්‍රීඩා සංස්කෘතියක් හරහා ඒ මානව සම්පත සංවර්ධනය කරන්නේ කොහොමද, කලාව හා සාහිත්‍ය මඟින් ඒ මානව සම්පත සංවර්ධනය කරන්නේ කොහොමද කියන පුළුල් සාකච්ඡාව අපේ ආණ්ඩුවට තිබෙනවා.

අධ්‍යාපනය ගැන කථා කරද්දී, කුඩා දරුවාගේ සිට, ඒ දරුවා වැඩිවියට පත් වෙලා වැඩිහිටියෙකු වී අවසානයේ උපරිම ආයුෂ භුක්ති විඳලා මිය යන තෙක්ම ඒ මානව සම්පත මේ රට තුළ කළමනාකරණය කරන්නේ කොහොමද, සංවර්ධනය කරන්නේ කොහොමද කියන පුළුල් සාකච්ඡාව අපි කරන්න ඕනෑ. අඩු බර දරු උපත් සංඛ්‍යාව අඩු කිරීම, සියලු දරුවන් වෙනුවෙන් ගුණාත්මක පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ඇති කිරීම, පුළුල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් ඔස්සේ මේ නවීන ලෝකයට ගැළපෙන තරුණයෙකු, පුරවැසියෙකු බිහි කිරීම, විශේෂ අවශ්‍යතා සහිත දරුවන්, තරුණයන්, කාන්තාවන්, වැඩිහිටියන් රැක බලා ගැනීම, මේ තරඟකාරී සමාජය තුළ හොඳ රැකියා වෙළෙඳ පොළක් තරුණයන් වෙත ඉදිරිපත් කිරීම, වැඩිහිටියන් විශ්‍රාම ගියාට පසුව හොඳ විශ්‍රාම වැටුපක් ලබා දී රජය මඟින් ඔවුන් රැක බලා ගැනීම ආදි කාරණා ඔස්සේ මානව සම්පත රැක බලා ගැනීම සිදු කළ යුතුව තිබෙනවා. එක පැත්තකින් ගත්තාම, මානව සම්පත සංවර්ධනය කිරීම කියන එක ආර්ථිකයත් එක්ක දැවැන්ත විධියට බද්ධ වුණු කාරණයක්. හැබැයි, අපි ආණ්ඩුව විධියට මේ මානව සම්පත රැක බලා ගන්න මොනවා කළත් අපට අතරමැද්දේදී එනවා, ප්‍රශ්නයක්, ගැටලුවක්. ආණ්ඩුවක් විධියට, රටක් විධියට අපට දැවැන්ත බෙදවාචකයකට මුහුණපාන්න සිදු වෙලා තිබෙනවා. ඒක තමයි, මත්ද්‍රව්‍ය නිසා මේ සමාජයට ඇති වෙලා තිබෙන බෙදනීය තත්ත්වය. මේ මත්ද්‍රව්‍ය උවදුර මැඩලන්න ආණ්ඩුව විධියට අපේ ජනාධිපති අනුර දිසානායක සහෝදරයා මැදිහත් වෙලා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කළා, "රටම එකට" ජාතික මෙහෙයුම කියලා. "රටම එකට" ජාතික මෙහෙයුම ක්‍රියාත්මක කරලා මේ වනකොට අවුරුද්දක් වනවා. සමහර අම්මලා අපිව හමු වෙලා කථා කරලා තිබෙනවා. පළමුවන වතාවට තමයි ඔවුන් අපිව හමු වෙන්නේ. ඔවුන් තමන්ගේ පුතා, දුව මේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම නිසා ඇති වී තිබෙන තත්ත්වය ගැන අපි එක්ක කථා කරමින් අඬනවා. ඒ අම්මලා අඬන්න ඕනෑ කටිටිය නොවෙයි. ඔවුන් අපිව දැකලාවත් නැහැ. කවදාවත් අපි ඔවුන්ව හමු වෙලා නැහැ, කථා බහ කරලා නැහැ. හැබැයි, මේ ප්‍රශ්නය ගැන කථා කරලා අඬන තත්ත්වයකට මේ රටේ අම්මලාව, තාත්තලාව පත් කරලා තිබෙනවා. ඔවුන් ඒ තත්ත්වයට පත් කරන්න කොච්චර කාලයක් ගත වුණාද? මේ රටේ දේශපාලන සංස්කෘතිය ඇදගෙන ඇවිල්ලා අවසානයේදී අපේ තරුණ පරම්පරාව, ළමා පරපුර පත් කරලා තිබෙන්නේ කොතැනටද කියන කාරණය ගැන මම හිතන්නේ අපි පුළුල් විධියට සාකච්ඡා කරන්න ඕනෑ. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු දැන් ඇහැරිලා නිකම් කියවනවා වාගේ තමයි කථා කරන්නේ.

නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා සභාවට ඇවිල්ලා කථා කරලා දැන් පිටව ගියා. එතුමා කොහොමත් කරන්නේ සභාවට ඇවිල්ලා කථාව කරලා යන එකයි. මම දන්නේ නැහැ, දැන් එතුමාට අත් වෙලා තිබෙන තත්ත්වයත් එක්ක මොළේ කර වෙලාද කියලා. අලුතෙන් ඉපදිලා වාගේ නේ දැන් කථා කරන්නේ. අපි මේ රටේ බලයට පත් වෙලා තවම අවුරුදු දෙකයි.

"රටම එකට" ජාතික මෙහෙයුම තුළින් බලාපොරොත්තු වන ප්‍රධාන කාරණා තුනක් තිබෙනවා. මේක දැවැන්ත මානුෂීය මෙහෙයුමක්. මේ මානුෂීය මෙහෙයුම තුළින් අපි බලාපොරොත්තු වෙනවා, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා ඉන්න තරුණ පරම්පරාව ඇතුළු සමස්තය පුනරුත්ථාපනය කරන්නේ කොහොමද කියන සාකච්ඡාව ඉදිරියට අරගෙන යන්න. අනෙක් කාරණය තමයි, මේ මත්ද්‍රව්‍ය ජාලය අඩපණ කරන්න කටයුතු කරන එක. අනෙක තමයි, ඒ හැම දෙයටම අවශ්‍ය නීතිය සම්පාදනය කරන එක. කොහොම හරි ඒ නීතිය සම්පාදනය කරන්න ඕනෑ. නීති සංශෝධනයක් කරන්න ඕනෑ නම් ඒවා සංශෝධනය කරන එක, අලුත් නීති ගෙනෙන්න ඕනෑ නම් ඒවා ගෙනෙන එක කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024 වර්ෂයේ බන්ධනාගාරගත වූවන්ගෙන් සියයට 65ක් මත්ද්‍රව්‍ය නිසා බන්ධනාගාරගත වූවන් බව අපි දන්නවා. පුද්ගලයින් 47,783කින්, 31,314ක්ම මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන්ම බන්ධනාගාරගත වූවන්. මේ රටේ මානව සම්පතට තමයි මේ විධියට බන්ධනාගාර තුළ ඉන්න සිද්ධ වෙලා තිබෙන්නේ. අපි 2025 වර්ෂය ගත්තොත්, මත්ද්‍රව්‍ය ආශ්‍රිත ගැටලු හේතුවෙන් 6,030ක් මේ ප්‍රතිකාරවලට යොමු වෙලා තිබෙනවා. මේ 6,030න් අවුරුදු 25-29 යන වයස් කාණ්ඩයේ සියයට 28.9ක් ඉන්නවා. අවුරුදු 30-34 කියන වයස් කාණ්ඩයේ ඉන්නවා, සියයට 22.2ක්. ඒ කියන්නේ මොකක්ද? මේ තරුණයින්ට වුවමනාවක් තිබෙනවා, ඔවුන් වැරදි පාරේ ගිහිල්ලා තිබෙන නිසාත්, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා තිබෙන නිසාත් ඒකෙන් ඉවත් වෙන්න. එලෙස මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි

වූවන්ගෙන් සියයට 50කට ආසන්න ප්‍රමාණයක් පසුගිය අවුරුද්දේදී ප්‍රතිකාරවලට යොමු වෙලා තිබෙනවා. එලෙස ප්‍රතිකාරවලට යොමු වෙලා තිබෙන අයගෙන් සියයට 50ක් මේ තරුණ පරම්පරාව නියෝජනය කරන පිරිස්.

මත්ද්‍රව්‍ය මෙරටින් තුරන් කිරීම වෙනුවෙන් අපට දැවැන්ත වගකීමක් පැවරී තිබෙනවාය කියලා මම හිතනවා. මොකද, අපි මොන පාර හැදුවත්, මොන පාලම හැදුවත්, මොන දැවැන්ත සංවර්ධනයක් මවා පාලා පෙන්වූවත් මේ මානව සම්පත කොයිතරම් දුරට සංවර්ධනය වෙනවාද, මේ මානව සම්පත කොයි තරම් දුරට අපව රැක බලා ගන්නවාද කියන කාරණයේදී මේ විෂ මත්ද්‍රව්‍ය මේ රටින් තුරන් කරන එක ජාතික වගකීමක්, ජාතික මෙහෙවරක් විධියට සලකා කටයුතු කරන්න ඕනෑ.

අපි ඒ දූෂිත මත්ද්‍රව්‍ය ජාලය ගත්තොත්, එම ජාලයට සමහර විට රජයේ නිලධාරින්, ඉහළ පෙළේ නිලධාරින් සම්බන්ධ වෙලා තිබෙනවා. මට මතකයි, අපේ ආනන්ද විජේපාල ඇමතිතුමාත් එක අවස්ථාවක පොලීසියේ කොයි වාගේ තත්ත්වයක්ද තිබුණේ කියලා ප්‍රකාශ කළ බව. පොලීසියේ 1,000කට ආසන්න ප්‍රමාණයක් interdict වෙලා තිබෙනවා. මෙහිදී පාතාල නායකයින් එක්ක දේශපාලනඥයින්ගේ තිබුණු සම්බන්ධතා මොනවාද කියන කාරණය පිළිබඳවත් අපි හොඳට සාකච්ඡා කර ගන්න ඕනෑකම තිබෙනවා. විවිධ පක්ෂවල තරුණ සංවිධායකවරු පාතාල නායකයින් එක්ක එකතු වෙලා ඩීල් දාපු විධිය, මත්ද්‍රව්‍ය ගෙනෙන්න කටයුතු කළ විධිය අපි දැක්කා. "තාරුණ්‍යයට හෙටක්" හදන්නද එහෙම නැත්නම් තරුණ පරම්පරාව ගොඩනඟන්නද, තරුණ පරම්පරාව සංවර්ධනය කරන්නද එලෙස ඩීල් දැමීමේ? තරුණ පරම්පරාවට වින කටින්න ක්‍රියා කළ විධිය අපි පසුගිය කාල සීමාව තුළදී දැක්කා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මත්ද්‍රව්‍ය, විශේෂයෙන්ම විෂ මත්ද්‍රව්‍ය මේ රටින් තුරන් කිරීම සම්බන්ධව ආණ්ඩුව දැඩි මතයක ඉන්නවා. අයිස්, හෙරොයින්, ගංජා වැනි විෂ මත්පැන් ඇතුළු සියලු මත්ද්‍රව්‍ය මේ රටින් තුරන් කරලා මීසක් අපේ රටේ මානව සම්පතට පුළුල් සංවර්ධනයක් කරා යන්න බැහැ. එය දැන් මේ තිබෙන තත්ත්වයට සාපේක්ෂව ලංකාවේම ක්‍රමවේදයක් ගොඩනඟාගෙන ඒ ඔස්සේ කරනවා විනා සිංගප්පූරු ක්‍රමයක් හෝ වෙන කොහේවත් රටක තිබෙන ක්‍රමයක් ස්ථාපිත කරන එක නොවෙයි අපි කරන්න ඕනෑ. මොකද, සිංගප්පූරුවේ ඒ මොහොතේදී ඒ ක්‍රියාවලියට එන්න හොඳ දේශපාලන නායකත්වයක් තිබුණා. ඒ හා සමාන දැවැන්ත දේශපාලන නායකත්වයක් සහිත දේශපාලන ව්‍යාපාරයක් අපිත් ගොඩනඟලා තිබෙනවා. ඒ දේශපාලන ව්‍යාපාරය තුළ ඉන්න මහ ජනතාව එයට සහාය දෙන්න සූදානම් වෙලා ඉන්නවා. රාජ්‍ය සේවයට අවශ්‍ය සහයෝගය ලබා දෙමින්, දේශපාලන අධිකාරියත්, රාජ්‍ය යන්ත්‍රණයත්, ප්‍රජාවත් එකතු වෙලා ඇත්තවශයෙන්ම මේ මත්ද්‍රව්‍ය ජාලය මැඩ පවත්වන්නේ කොහොමද, මත් රකුසා ඇත්තවශයෙන්ම මේ රටින් තුරන් කරන්නේ කොහොමද කියන ක්‍රමවේදයක් හදනවා. විපක්ෂයෙන් චෝදනා, අවලාද කොතරම් කළත්, මොන හූනියම් කළත්, මොන වස් කවිය කිව්වත් අපේ මේ ගමන අනිවාර්යයෙන්, අඛණ්ඩව, එක පෙළට, එක මිටට යනවාය කියලා මතක් කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා.1.19]

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත් දෙක අද දින විවාදයට ගැනීම සම්බන්ධයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියටත්, දැනටත් බන්ධනාගාරගත වෙලා ඉන්න මන්ත්‍රීවරයෙක් හැටියටත් මා ගරු අධිකරණ ඇමතිතුමාට හිස නමා ආචාර කරනවා. මෙම පනත් කෙටුම්පත්වලට ඡන්දයක් ගන්නවා නම් ඒවාට පක්ෂව මම අත් දෙකම ඔසවනවා. ඒකට හේතුව මේකයි. මම හරි දෙයට, හරි තැන, හරි විධියට හිට ගන්න මන්ත්‍රීවරයෙක්. ගරු නියෝජ්‍ය කථානායකතුමාත් ඒක පිළිගෙන තිබෙනවා. මේ කාරණයේදී විපක්ෂයේ අපව වැරදි චෝදනාවලට, අනවශ්‍ය දේවල්වලට හිරේ දැමීමා කියන කාරණා අදාළ නැහැ. ඔබතුමා දන්නවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට මා පාර්ලිමේන්තුවේදී හරි දෙයට, හරි විධියට, විවෘතව කථා කළ බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට අවුරුද්දයි මාස අටකට කලින් මම රිමාන්ඩ්ගත වෙලා ඉන්නකොට මේ සභාවට ඇවිල්ලා අධිකරණ ඇමතිතුමාට කිව්වා, මෙම පනත සංශෝධනය කරලා ගෙනෙන්න ඕනෑ කියලා. පනතේ ලොකු වැරැද්දක් තිබෙනවා. එම පනතට ඒ වැරැද්ද වුණේ අපේ ආණ්ඩුව කාලයේදී. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා අපි ආණ්ඩුවේ ඉන්නකොට තමයි මෙම පනතට සංශෝධන ගෙනැල්ලා මේ වැරැද්ද වුණේ. එම වැරැද්ද නිසා බන්ධනාගාරවල හිටපු රැඳවියන් 20,000ක ප්‍රමාණය 40,000ක් බවට පත් වුණා. අධිකරණ ඇමතිතුමා පනත් කෙටුම්පත විවාදයට ඉදිරිපත් කරමින් කළ කථාවේදී කියනවා මම අහගෙන හිටියා, ලංකාවේ දැනට රස පරීක්ෂක වාර්තා 17,000ක් ඉල්ලුම් කර තිබෙනවා කියලා. එම වාර්තා ලැබෙන කල් බන්ධනාගාරවල මාස 6, 7 රැඳවියෝ ඉන්නවා. ඒවායේ වැඩි ප්‍රමාණයක් අඩංගු වෙලා තිබෙන්නේ මොනවාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාර්තා එළියට එනකොට ඒවායේ අඩංගු වෙලා තිබෙන්නේ පිටි එහෙම නැත්නම් පැනඩෝල් කුඩු. පිටි සහ පැනඩෝල් කුඩු! අන්තිමට උසාවියට ගෙනැල්ලා රුපියල් 1,000ක් දඩ ගහනවා. මාස 6ක් කන්න දෙමින් රැඳවියෝ බන්ධනාගාරවල තියාගෙන ඉන්නවා.

හිර ගෙවල්වල ඉන්න බැරි තරමට රැඳවියන් දමනවා. එක කාමරයක කීදෙනෙක් දමනවාද? නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා වාගේ සමහර දවස්වලට කීදෙනෙක් දමනවාද? දැන් මම ඉන්නේ කොළඹ CRP එකේ. ඒකේ තිබෙනවා, "L" කියලා කාමරයක්. ඒකට සෙනසුරාදාට 140ක් දානවා. දාන්න පුළුවන් 30යි. නමුත්, සෙනසුරාදා දවසට 140ක් අනිවාර්යයෙන් දානවා. ලංකාවේ ඉන්න රැඳවියෝ ඔක්කෝම එතැනට ගෙනෙනවා. එතකොට 150ක්, 160ක් විතර වනවා. සමහර වාට්ටු තිබෙනවා, රැඳවියන් 400ක්, 500ක් ඉන්න. ඔවුන් හරි අමාරු ජීවිතයක් ගත කරන්නේ. කඝන රෝග ඇතුළු සියලු රෝග එතැන තිබෙනවා. මේ පනත් කෙටුම්පත අනුව ග්‍රෑම් 100ට අඩුවෙන් තිබුණොත් High Court එකෙන් ඇප ගන්න පුළුවන් කිව්වා. පාර්ලිමේන්තුවට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා කිව්වාම රැඳවියෝ ඔක්කෝම අත්පුඩි ගැහුවා; සතුටු වුණා. ඔවුන් එහෙම සතුටු වුණේ ඇයි? මෙච්චර කල් ග්‍රෑම් 10ට වැඩි ඒවාට ඇප ලබා ගන්න අභියාචනාධිකරණයට - Appeal Court එකට - යන්න වුණා. මේ කුඩු බොන එක කොහොමත් නවත්වන්න බැහැ, කුඩු බොන මිනිස්සු කොහොමත් බොනවා. ඊට ඉහළින් ඉන්න කුඩු මුදලාලිලාගේ ඉඳලාම ඒක නතර වෙන්න ඕනෑ.

දැන් කුඩු අල්ලනවා නේ. හැමදාම පෙන්වනවා නේ, නැව් ගණන් කුඩු ඇල්ලුවා කියලා. කෝ, ලංකාවේ කොහේවත් කුඩුවල නිහයක් තිබෙනවාද? කොහේ හරි කුඩු නැතිවෙලා තිබෙනවාද?

[ගරු වාමර සම්පත් දසනායක මහතා]

නැහැ. නැව් ගණන් කුඩු ඇල්ලුවාට, මුහුදෙන් ඇල්ලුවා, අරහෙන් ඇල්ලුවා, මෙහෙන් ඇල්ලුවා කිව්වාට කුඩු හිඟයක් තිබෙනවාද? කුඩු නැති නිසා සික්කාරයෝ වුණු අය කොළඹ ඉන්නවාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා කොලොන්නාව ආසනයේ නේ. කුඩු නැතුව සික් හැදිච්ච මිනිස්සු ඉන්නවාද? වැඩියෙන්ම කුඩු තිබෙන ආසනය තමයි, කොලොන්නාව. මේ, ගරු නියෝජ්‍ය කථානායකතුමා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසය. ඒ වුණාට රට ප්‍රවෘත්තිවලට පෙන්වන්නේ කුඩු මෙච්චර ඇල්ලුවා, අච්චර ඇල්ලුවා කියලා. හැබැයි, වැඩිම රූඳවියන් ඉන්නේත්, ඔබතුමාගේ ආසනයේ. CRP එකේ ඉන්න කුඩුවලට අල්ලපු රූඳවියන් පිරිසෙන් වැඩිම පිරිසක් කොලොන්නාව ආසනයේ අය.

මේ පනත් කෙටුම්පත අද සම්මත කරලා, ගරු කථානායකතුමා අදම අත්සන් කරලා, අධිකරණ සේවා කොමිෂන් සභාවට යවන්න. මගේ විශ්වාසයේ හැටියට මේ පනත නිසා ලබන සතිය වනකොට High Court එකෙන් ඇප ලබා දීලා රූඳවියන්ගෙන් සියයට 40ක් විතර එළියට යනවා. ඔවුන් මේ පනත් කෙටුම්පත ගේනතුරු බලාපොරොත්තුවෙන් හිටියා. මොකක්ද දැන් කරන්නේ? පොලීසියෙන් පැනඩෝල් කුඩු හරි පිටි හරි ග්‍රෑම් 10ක් දාලා යම් යම් අය හිරේ දානවා. දැන් ඒකට කෙනෙක් සතුව ග්‍රෑම් 100ක් තිබෙන්න ඕනෑ. පොලීසියට දැන් පිටි ග්‍රෑම් 100ක් හොයාගන්න වෙනවා. නැත්නම් පැනඩෝල් කුඩු ග්‍රෑම් 100ක් හොයා ගන්න වෙනවා. එහෙම හොයලා කෙනෙක් හිරේ දැම්මාම මොකද වෙන්නේ? ඒ කෙනාට මාස හයක් හතක් දුක් විඳින්න සිද්ධ වෙනවා. එතකොට ඔහුට බිරිඳ නැහැ, දරුවෝ නැහැ, අම්මා තාත්තා නැහැ, බිරිඳ අනාථයි, දරුවෝ අනාථයි. ඇයි? ග්‍රෑම් 3ට මාස 6යි, ග්‍රෑම් 4ට මාස 8යි ආදී වශයෙන් තමයි රක්ෂිත බන්ධනාගාරගත වෙලා ඉන්නේ.

තවම ජාතික ජන බලවේගයේ අය ඇතුළට ගියේ නැහැ නේ. ඒගොල්ලන් යන්නේ ඊළඟ අවුරුදු පහේ නේ. එතකොට ඒ අයටත් ඒ අත්දැකීම් ගන්න පුළුවන්. දැන් අපි නේ මේ අත්දැකීම් ගන්නේ. මම දැන් දෙවතාවක් රක්ෂිත බන්ධනාගාරගත වුණා නේ. පළමුවෙනි වතාවේ මාස 3ක් රක්ෂිත බන්ධනාගාරගත වෙලා ඉඳලා ආවා. දැන් දෙවැනි වතාවටත් ඉන්නවා. මම ඒකයි හොඳ දේට හොඳයි කියන්නේ. හැබැයි, මේකෙන් තව වැරැද්දක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලීසිය කරන වැරැද්ද බලන්න. රස පරීක්ෂක වාර්තාව එනකොට එන්නේ පිටි, එහෙම නැත්නම් පැනඩෝල් කුඩු හරි මොනවා හරි තිබුණා කියලා. එතකොට අර මිනිහා මාස 6ක් හිරේ දුක් විඳලා ඉවරයි. ඊළඟට උසාවි ගාණේ ගිහිල්ලා බිරිඳත් දුක් විඳලා. සමහර විට බිරිඳ වෙන මිනිස්සුත් එක්ක ගිහිල්ලා, දරුවෝ අනාථ වෙලා මේ විධියට නොයෙකුත් ප්‍රශ්න ඇති වුණාට පස්සේ එන රස පරීක්ෂක වාර්තාවේ මොකක්වත් නැහැ.

අන්න, කොන්ද කෙළින් තියාගෙන වැඩ කරන නඩුකාරතුමෙක් ගම්පහ ඉන්නවා. ඊයේ පොලිස්පතිට විරුද්ධව තීන්දුවක් දීලා තිබුණා. කොහොමද දැන් පොලිස්පතිට? එකපිට නඩු දෙකක් දාලා තිබෙනවා, බොරු නඩු. ඒ නඩු දෙක සම්බන්ධව පොලිස්පතිට විරුද්ධව අභියාචනාධිකරණයේ නඩු පවරන්න කියලා තීන්දුවක් දුන්නා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සමහර වැරදි හින්දා මිනිස්සු හරියට දුක් විඳිනවා. අර නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා වාගේ දැන් ග්‍රෑම් 101ක් දමාවි. ඒක නිසා මේක නතර කරන්න. දැන් දඩ ගහන්න ඕනෑ පොලිස් නිලධාරියාටයි. කුඩු වෙනුවට බොරුවට පැනඩෝල් කුඩු, පිටි දාන පොලිස් නිලධාරින්ට විරුද්ධව නඩු දාන්න ඕනෑ. වැරදි විධියට, බොරුවට මිනිස්සු හිරේ යවන ඒ වාගේ පොලිස් නිලධාරින් අල්ලලා, ඇයි බොරුවට මිනිස්සු හිරේ යැව්වේ කියලා මාස 6ක් බන්ධනාගාරයෙන් ඒ මිනිස්සුන්ට කන්න දීපු ඒවාටත් ගණන් හදලා, ඒ පොලිස් නිලධාරියාගෙන් අය කර ගන්න ඕනෑ. ඒක තමයි ඇත්ත කථාව. ඒ නිසා ඒකත් මේ වෙලාවේ මම කියන්න ඕනෑ.

ඊළඟ කාරණය තමයි, දැන් බන්ධනාගාරවල ඉන්න පුළුවන්ද කියන එක. බන්ධනාගාරවල ප්‍රශ්න වැඩියි නේ. ඔයගොල්ලන් මහ ලොකුවට කයිය ගැහුවා නේ. අර මීගමුව බන්ධනාගාරයේ දහදෙනෙක් මැරුණාම ගිහිල්ලා කිව්වා, රුපියල් කෝටියක වන්දියක් දෙනවා කියලා. කෝ, දුන්නාද? තවම මේ ආණ්ඩුවට රුපියල් කෝටියක වන්දිය දෙන්න බැරි වුණා. ඒ වුණාට කිව්වේ, අපි වන්දි දෙනවා, ඒ පවුල් ආරක්ෂා කරනවා කියලා. රුපියල් ලක්ෂ 20ක් ඒගොල්ලන් වෙනුවෙන් ලැබිලා තිබෙනවා. ළමයින්ට රුපියල් ලක්ෂ 10යි, බිරිඳට රුපියල් ලක්ෂ 10යි පොතේ දාලා තිබෙනවා. ඒ දීලා තිබෙන්නේත් මේ ආණ්ඩුවෙන් නොවෙයි. ආණ්ඩුවෙන් රුපියල් කෝටියක් දෙනවා කියලා කයිවාරු ගැහුවාට තවම ඒ මුදල් දීලා නැහැ.

ඊළඟ කාරණය මේකයි. දැන් මම ඉන්න CRP එකේ රූඳවියන් 3,500ක් ඉන්නවා. බලන්න, අද මේ රටේ ළමයි 10දෙනෙකුට එක ගුරුවරයෙක් ඉන්නවා; 10 பிள்ளைகளுக்கு ஒரு teacher இருக்கு. හැබැයි, බන්ධනාගාරයේ ඉන්න දරුණු මානසිකත්ව තිබෙන, මානසික රෝග තිබෙන, ආම්බාන් කරන්න බැරි, අම්මාට තාත්තාට හදන්න බැරි දාමරික මිනිස්සු 30කට ඉන්නේ එක නියාමකවරයායි. අපේ රක්ෂිත බන්ධනාගාරයේ - CRP එකේ - රූඳවියන් තුන්දහස් ගණනක් ඉන්නවා. නමුත් නිලධාරීන් ඉන්නේ කීයද? ඔක්කෝම 150යි. ගරු නියෝජ්‍ය කථානායකතුමා, අලි බලන්න ලෙහෙසියි, මිනිස්සු බලාගන්න හරි අමාරුයි. අලි බලනවා වාගේ නොවෙයි, මිනිස්සු බලනවා කියන්නේ. මිනිස්සු 20ක් කියන්නේ, ඒ අය එහේ යනවා, මෙහේ යනවා, ඉතින් හරි අමාරු තැනක් තමයි හිරකාරයින් ඉන්න තැන. ඒක හින්දා මේ කටයුත්ත කරන්න හරි අමාරුයි. ඒ මිනිස්සු මාර දුකක් විඳිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බන්ධනාගාර නියාමකවරුන් පැය 24ම වැඩ කරනවා; quarters නැහැ; හරිහමන් වාහන නැහැ. අපටත් දෙන්නේ බස් එකක්. අපි දෙන්නෙක් ගේන්නේත් බස් එකක. මොන තරම් අපරාධයක්ද? පසුගිය ටිකේ නාමල් රාජපක්ෂ මහත්තයා විතරයි බස් එකේ හිටියේ. ඒ බස් එක තියාගෙන ඉඳලා ආයෙත් හවස යනවා. ඕක නොවෙයි නේ, වෙන්න ඕනෑ. පොඩි වාහන ටිකක් අරගෙන දීලා ඒ කටයුතු කරන්න අවශ්‍යයි.

බන්ධනාගාර නියාමකවරුන්ගේ වැටුප ගත්තත්, හරිහමන් වැටුපක් ඔවුන්ට ලැබෙන්නේ නැහැ. පොලිස් නිලධාරීන්ට ඉහළ වැටුපක් දෙන්න එපා කියලා අපි කියන්නේ නැහැ. පොලීසියට දෙනවා වාගේම, හමුදාවට දෙනවා වාගේම බන්ධනාගාර නියාමකවරුන්ටත් දෙන්න. මොකද, බන්ධනාගාර නියාමකවරුන්ට තවම හරි හමන් වැටුපක් ලැබෙන්නේ නැහැ. ඒ නියාමකවරුන් 150ක් විතර කොයි තරම් දුකක් විඳගෙනද සිරකරුවන් විශාල පිරිසක් බලාගෙන ඉන්නේ. විනාඩියෙන් විනාඩියට ඒ නිලධාරීන් ගේට්ටුවට ඉබ්බා දානවා. කොයි වෙලාවේ පනිවිඩ දන්නේ නැහැ නේ. පැනපු ගමන් ඒ නිලධාරීන්ගේ ජොබ් එක නැතිවනවා. පෙරේදා "L" වාට්ටුවේ එක්කෙනෙක් මැරුණා. ඇයි? හතිය හැදුණා. ගෙනිච්චා, PH එකට. PH එකට ගෙනියලා නැවත ගෙනාවා. එක්කෙනෙක් මැරුණා. Load එක වැඩියි, දරාගන්න බැහැ, හුස්ම ගන්න බැහැ. මේ දේවල්වලට බන්ධනාගාර නිලධාරීන්ට දොස් කියන්නත් අපට බැහැ.

බන්ධනාගාරවල ඉන්නේත් මිනිස්සු නේ. අර ගහලා තියෙන්නේ, හිරගෙදර ඉස්සරහ. වැලිකඩ හිරගෙදර තාප්පයේ ගහලා තිබෙන්නේ. මොකක්ද ගහලා තිබෙන්නේ? "සිරකරුවෝද මනුෂ්‍යයෝය" කියලා නේ. මනුෂ්‍යයෝ තමයි ඒකෙත් ඉන්නේ. මේවා ගැන ආණ්ඩුව හොයා බලන්න ඕනෑ. මම අපේ හර්ෂණ නානායක්කාර ඇමතිතුමාට කිව්වා, මේවා ගැන හොයලා බලන්න කියලා. හැබැයි, මේ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් අද ගොඩක් අය සතුටු වෙනවා. මොකද, එහෙම නැත්නම් පොලීසිය තමයි මේවායේ බොරදියේ මාළු බෑවේ. දැන් පොලීසියට පිටි ග්‍රෑම් 100ක් හොයාගන්න වෙනවා. පිටිත් නැහැ නේ, මේ දවස්වල. මොකද, පිටි ගණන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chamara Sampath, your time is up.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
පිටිත් ගණන් ගිහිල්ලා නේ තිබෙන්නේ. පිටිත් ගණන් ගිහිල්ලා තිබෙන නිසා පොලීසියට දැන් පිටි දාන්නත් බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙලාවේදී අපි කියන්නේ බන්ධනාගාරය ගැන මීට වැඩිය මේ ඇමතිතුමාටත්, ආණ්ඩුවටත් හොයා බලන්න කියලායි. මොකද, ජනාධිපතිතුමා ඒ දවස්වල විපක්ෂයේ ඉන්න කාලයේ කිව්වේ නම්, බන්ධනාගාර ගැන බලන්න ඕනෑ; හොයන්න ඕනෑ; අපි සලකන්න ඕනෑ කියලායි. හැබැයි, එහෙම දෙයක් දැන් පේන්න නැහැ. ඒ නිසා මේවා ගැන හොයා බලා ඒ මිනිස්සුන්ගේ වැටුප් හරියට වැඩි කරලා, ඒ මිනිස්සුන්ට දෙන දීමනා ටික දීලා මේ ඉන්න රැඳවියෝ බලාගන්න අවශ්‍යයි.

මේ පනත් කෙටුම්පත් දෙක සම්බන්ධයෙන් අද ඡන්දයක් තියයි කියලා මම හිතන්නේ නැහැ; විශ්වාස කරන්නේ නැහැ. හැබැයි, ඡන්දයක් තිබුණොත් හැමෝම ඡන්දය දෙන්න ඕනෑ. විපක්ෂයේ අයටත් මම ඒක කියනවා. චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාත් බන්ධනාගාරයේ හිටියා. එතුමාත් දන්නවා, ඒ විඳින දුක. ඡන්දයක් ආවොත්, විපක්ෂය කියලා නැහැ, අපි ඡන්දය දෙනවා. මොකද හේතුව, මේ පනත් කෙටුම්පත අත්‍යවශ්‍ය වෙලාවක ගේන්න ඕනෑ පනත් කෙටුම්පතක් ය කියන එක මතක් කරමින් මා නිහඬ වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Rathna Gamage. You have 11 minutes.

[අ.භා. 1.31]

ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ 54අ වන වගන්තියේ (1) උපවගන්තිය සහ 83වන වගන්තියේ (2)වන උපවගන්තිය සහ තුන්වන උපලේඛනය සඳහා වන යෝජිත සංශෝධනවලට අදාළව තමයි මේ අවස්ථාවේ අපට අදහස් දක්වන්න තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රජය බලයට එන්න මේ රටේ ජනතාව වෙත ඉදිරිපත් කරපු අපේ වැඩ පිළිවෙළ තුළ අපි ජනතාවට දැනුම් දුන්නේ, "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන තේමාව. රට පොහොසත් කිරීමට අදාළ ආර්ථික ක්‍රමෝපායයන් අපි ක්‍රමානුකූලව ගොඩනඟනවා. ඊළඟට, අපට තිබෙන්නේ මේ රටේ ජනතාවගේ ජීවිත ලස්සන කරන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දේශපාලනය හඳාරනකොට ඉගෙන ගන්නවා, රටේ සංස්කෘතිය, සදාචාරය, නීතිය, අධිකරණය, කලාව සහ සාරධර්ම යන සියල්ලම "ආර්ථිකය" කියන පදනම මත පිහිටා තිබෙනවාය කියලා. ඒ නිසා අපි විශ්වාස කරන්නේ නැහැ, නීතිය පමණක් හැදූ පමණින් සියල්ල හරි යනවා කියලා. රට පොහොසත් කරලා, ජනතාවගේ ජීවිත ලස්සන කරනවා කියන්නේ ඒකයි. අපි දේශපාලනයේදී ඉගෙන ගන්නවා, මේක පදනම හා උත්තර නිර්මිතය කියලා. ආර්ථිකයේ පදනම මත ගොඩනැඟුණු ව්‍යුහයේ තිබෙන උත්තර නිර්මිතයේ තමයි තිබෙන්නේ නීතිය, අධිකරණය, සදාචාරය, සංස්කෘතිය, ප්‍රජාතන්ත්‍රවාදය සහ සාරධර්ම පිළිබඳව. මෙන්න මේ නිසා නීතියට අදාළ සංශෝධන අපි ඉදිරිපත් කරන්නේ ආර්ථිකයේ පදනමත් හදා ගෙනයි. ආර්ථිකයේ පදනම හැදුණොත් තමයි අපට රට ලස්සන කරන්න, ජනතාවගේ ජීවිත පොහොසත් කරන්න පුළුවන් වෙන්නේ. ඒ වාගේම රට පොහොසත් කරලා, ජනතාවගේ ජීවිත ලස්සන කරන්න නම් ව්‍යවස්ථා සංශෝධන එක දෙක අපට ඉදිරිපත් කරන්න සිද්ධ වෙනවා.

ගරු අධිකරණ ඇමතිතුමා විසින් ඉදිරිපත් කරපු මේ සංශෝධන පනත් කෙටුම්පත් අපට වැදගත් වෙනවා. මොකද, අපි රජය භාර ගන්නකොට මේ රටේ අමුතු, පිස්සු විකාරයක් තිබුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තරුණ පිරිස දැවැන්ත විධියට මත්ද්‍රව්‍ය සඳහා ගොදුරු වෙලා හිටියා. ගැටලුව හැටියට තිබෙන්නේ මේවා වැළැක්වීම සඳහා උත්සාහයක්වත් ගත්තාද නැද්ද කියන එකයි. පොලීසිය එය වැළැක්වීම වෙනුවෙන් යම්කිසි ක්‍රියාමාර්ගවල නියැළුණා. ආරක්ෂක අංශ යම් යම් ක්‍රියාමාර්ගවල නියැළුණා. අධිකරණ ක්‍රියාවලියක් පැවතුණා. එහෙම අධිකරණ ක්‍රියාවලියක් පැවතුණා තමයි. නමුත් ඒ සඳහා අවශ්‍ය රාජ්‍ය නායකත්වයක්, මැදිහත්වීමක් තිබුණේ නැහැ. අපි දැක්කා, ඒ කාලය තුළ සමහර දේශපාලනඥයින් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගන්නකොට රාජ්‍ය නායකයා ගිහිල්ලා ඔවුන් බදා ගත්ත - hug කරන - ආකාරය. රාජ්‍ය නායකයින් එහෙමයි කටයුතු කළේ. දේශපාලනඥයා කුඩු විකුණනවා නම්, මත්ද්‍රව්‍ය ජාවාරම් කරනවා නම්, රාජ්‍ය නායකයා ගිහිල්ලා ඔහු බදාගෙන උම්මා දෙනවා නම් මොකක්ද ඒකේ තත්ත්වය? මේ, ඔවුන්ට උම්මා දීපු රටක්. "උම්මා" කියලා kiss කරනවා. මම කියන්නේ, ජාවාරම්කාරයින්ට මේ රටේ එහෙම තත්ත්වයකුයි තිබුණේ කියන එකයි.

නමුත්, බොහොම පැහැදිලිව අපට කියන්න පුළුවන්, අපේ රජය බලයට පත් වුණාට පස්සේ දේශපාලනය, රාජ්‍ය නායකත්වය -මේ රටේ ආණ්ඩුකරණ ක්‍රියාවලිය- මත්ද්‍රව්‍ය හා සංවිධානාත්මක අපරාධ කල්ලිවල ක්‍රියාකාරිත්වයට එරෙහිව සම්පූර්ණයෙන්ම කටයුතු කළා කියන එක. ඒ කියන්නේ, ප්‍රධාන කොටස ගැලෙව්වා. මෙතෙක් තිබුණේ ප්‍රධාන කොටස. මම ඒකයි කිව්වේ, ආර්ථිකයේ පදනමයි, අධිකරණ නීතිය කියන උත්තර නිර්මිතයයි අපි ඉගෙන ගත්ත දේශපාලනය තුළ තිබුණාය කියලා. ඒක තමයි අපි ඉගෙන ගත් දේ. ඒ නිසා අපි ආර්ථිකයේ පදනම සවිමත් කරමින්, ආර්ථික විෂමතාව දුරු කරමින් සිටිනවා. අපේ රටේ ජනතාවගේ ජීවිත ආර්ථික පැත්තෙන් ශක්තිමත් කරනවා වාගේම අනෙක් පැත්තෙන් මත්ද්‍රව්‍ය ජාවාරම්වලට සහ සංවිධානාත්මක අපරාධවලට රාජ්‍ය නායකත්වයෙන් ලැබෙන අනුග්‍රහය මුළුමනින්ම ගලවා දමනවා. ඒ කොටස අපි ගැලෙව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය උවදුර ජාතික ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන බව අපි දන්නවා. එහි ප්‍රධාන ලක්ෂණයක් තමයි, මහජන සෞඛ්‍යයට හානි පැමිණවීම.

[ගරු රත්න ගමගේ මහතා]

අපි දන්නවා, මේ රටේ ප්‍රධාන වශයෙන්ම ව්‍යාප්ත වෙලා තිබෙන අයිස් වාගේ දෙයක් භාවිත කළහොත් එය ජනතාවගේ මධ්‍ය ස්නායු පද්ධතියට බලපානවාය කියලා. ජනතාව නන්නත්තාර කිරීමක් මේ කරන්නේ. ඒ පාලකයින් මෙච්චර කල් කළේ ජනතාව නන්නත්තාර කරන එක, ඔවුන්ගේ ඔළුව විකාර කරන එක. මෙය රටේ ජාතික ආරක්ෂාවට ප්‍රධාන ප්‍රශ්නයක් වුණා. මේ තත්ත්වය හේතුවෙන් සංවිධානාත්මක අපරාධ ජාල අතර සම්බන්ධය වැඩි කළා වාගේම බන්ධනාගාර සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ පද්ධති වෙත ඉහළ බලපෑමක් සිදු කළා.

විශේෂයෙන්ම 2017 - 2020 දක්වා තිබුණේ, ශාකමය සාර මත පදනම් වූ විෂ මත්ද්‍රව්‍ය. ඊටපස්සේ ඒක පරිවර්තනය වුණා, කෘත්‍රිමව නිපදවන මනෝ වර්තක ගණයේ විෂ මත්ද්‍රව්‍ය වෙත. ඒ කියන්නේ "අයිස්" මට්ටමට වැඩි වුණා. නාගරික සහ අර්ධ නාගරික ප්‍රදේශවල මේ කටයුත්ත වර්ධනය වුණා. ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ජාලයන්හි අතරමැදි centre එකක් බවට ලංකාව සහ මාලදිවයින පත් වුණා. මත්ද්‍රව්‍ය ජාලයයි, සංවිධානාත්මක අපරාධයි අතර තිබෙන අන්තර් සම්බන්ධය පසුගිය කාලය පුරාවටම වැඩි වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලය තුළ මත්ද්‍රව්‍ය ආශ්‍රිතව අත්අඩංගුවට ගත් පුද්ගලයින් සංඛ්‍යාව ගත්තොත්, එය 2020 වර්ෂයේදී 97,416යි; 2021 වර්ෂයේදී 110,031යි; 2022 වර්ෂයේදී 150,979යි; 2023 වර්ෂයේදී 162,088යි; 2024 වර්ෂයේදී 228,450යි; 2025 වර්ෂයේදී 262,321යි; 2026 වර්ෂයේ ඔක්තෝබර් 20 දක්වා - පෙරේදා දක්වා - 237,546යි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024 වර්ෂයේදී මත්ද්‍රව්‍ය ආශ්‍රිතව දළ වශයෙන් ලංකාවේ පුද්ගලයින් ලක්ෂයකට 1,000ක් - සියයට 1ක් - අත්අඩංගුවට අරගෙන තිබෙනවා. 2025 වර්ෂයේදී දළ වශයෙන් පුද්ගලයින් ලක්ෂයකට 1,205ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය - United Nations Office on Drugs and Crime - විසින් 2024දී ප්‍රකාශයට පත් කළ "World Drug Report 2024" වාර්තාවට අනුව පැහැදිලි වුණා, මුහුදු මාර්ග හරහා සිදු වන නීති විරෝධී වෙළෙඳාම පදනම් කර ගනිමින් අතරමැදි මධ්‍යස්ථානයක් බවට ලංකාවයි, මාලදිවයිනයි පත් වෙලා තිබෙනවා කියලා. අන්න ඒවා තමයි ප්‍රධාන හේතු මේ සංශෝධන පනත් කෙටුම්පත් ගෙනෙන්න. පසුගිය කාලය තුළ ලංකාවේ මත්ද්‍රව්‍ය සම්බන්ධව visual and statistical data විශ්ලේෂණය කළාම, ඒ වාගේම මේ සම්බන්ධ සිතියම් හා සංඛ්‍යාත්මක දත්ත විශ්ලේෂණය කළාම පෙනී යනවා, කොළඹ කේන්ද්‍ර කරගනිමින් බස්නාහිර වෙරළබඩ තීරයත්, ගාල්ල කේන්ද්‍රගත කරගනිමින් දකුණු වෙරළබඩ තීරයත් දැවැන්ත ලෙස මත්ද්‍රව්‍ය අවදානමට ලක් වුණු බව.

ලංකාවේ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය නිකුත් කළ "Annual Statistical Bulletin 2025"හි තිබෙනවා, හෙරොයින්, ගංජා, අයිස් - methamphetamine - සම්බන්ධව. අයිස් ආශ්‍රිතව ගත්තාම එහි ව්‍යාප්තිය බරපතළයි. ඒ අනුව අධිඅවදානම් දිස්ත්‍රික්ක තුනක් පිළිබඳව සඳහන් වෙනවා. සාමාන්‍යයෙන් කොළඹ ගත්තාම ගංජා, හෙරොයින්, අයිස් සම්බන්ධව පුද්ගලයින් ලක්ෂයකට 4,940ක් අත්අඩංගුවට ගැනීම් කර තිබෙනවා. ගාල්ලේ පුද්ගලයින් ලක්ෂයකට 1,280ක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. ගම්පහ පුද්ගලයින් ලක්ෂයකට අත්අඩංගුවට ගැනීම් 1,080යි. මේ දිස්ත්‍රික්ක තුන අධිඅවදානම් දිස්ත්‍රික්ක තුනක් බවට පත් වෙලා තිබෙනවා. ඒකට හේතුව වෙරළබඩ තීරය සහ බෝට්ටු ආශ්‍රිතව මෙහි ව්‍යාප්තිය වර්ධනය වීමයි. ඊට පසුව අවදානම් තීරය වශයෙන් ඉහළට එනවා, ගම්පහ, මාතර සහ කළුතර.

විශේෂයෙන් ධීවර යාත්‍රා යොදාගෙන මේ සම්බන්ධව මැදිහත් වෙනවා කියලා අපට චෝදනාවක් ආවා. අපි ඒ සම්බන්ධව වහාම ක්‍රියාත්මක වුණා. විශේෂයෙන් ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ආරක්ෂක කවුන්සලය මේ සම්බන්ධව උපදෙස් දීලා තිබුණා. ඒ උපදෙස්වලට අනුව රජය වහාම කටයුතු කළා. ධීවර අමාත්‍යාංශය මැදිහත් වෙලා, සියලු ධීවර වරායන්වලට විශේෂ කාර්ය බලකාය, පොලීසිය යොදවලා මේකට අදාළ වැට බැඳීමට උත්සාහ ගත්තා. අපේ රජය ඒ වෙනුවෙන් මැදිහත් වුණා, ක්‍රියාත්මක වුණා. ඒකට අදාළව වැඩ කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ 2026 අංක 79 දරන විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් ලබා දෙන දායකත්වය තුළ අපි මේ රටේ ආර්ථිකය වෙනුවෙන්, සමාජය වෙනුවෙන් විශාල බලපෑමක් කරනවා. ගරු අධිකරණ ඇමතිතුමා ගෙනාපු සංශෝධන පනත් කෙටුම්පත්වලට අදාළව ඉතාම වැදගත් සමාජයීය බලපෑම් තිබෙනවා. ඒ තමයි, මත්ද්‍රව්‍ය නැවත සමාජගතවීම වැළැක්වීමට වන සමාජයීය බලපෑම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලීසිවල, නඩු භාණ්ඩ තිබෙන ගබඩාවල මීට පස්සේ මත්ද්‍රව්‍ය නැහැ. මේ පනතට අදාළව ඕනෑ නම් ඒවා විනාශ කිරීමට හැකියාව තිබෙනවා. ඒ වාගේම මේ හරහා මහජන විශ්වාසය තහවුරු වෙනවා. ඒ කියන්නේ, ගරු මහෙස්ත්‍රාත්තුමාගේ අධීක්ෂණය යටතේ ඡායාරූප ගන්නවා, වීඩියෝ කරනවා. ඒ තුළින් මහ ජනතාව තුළ පොඩි විශ්වාසයක් හැදෙනවා. ඒ වාගේම මේ තුළින් සාධාරණව නඩු විසඳන්න හැකියාවක් ලැබෙනවා. ඒ නිසා මේ පනත් සංශෝධනය බොහොම වැදගත්. ඒ තුළින් ආර්ථිකයට විශාල බලපෑමක් එනවා. බන්ධනාගාර පිරිවැය අඩු කරගන්න පුළුවන්. ඒ වාගේම ගබඩා පිරිවැය අඩු කරගන්න පුළුවන්. අධිකරණය කාර්යක්ෂම කරගන්න පුළුවන්. මේ සංශෝධනයෙන් අත් වන වාසි රැසක් තිබෙනවා. ප්‍රතිපත්තිමය වශයෙන් සහ නීතිමය වශයෙන් බලපෑම් තිබෙනවා. සාක්ෂි නීතිය තාක්ෂණික පරිවර්තනයකට ලක් වෙනවා. භෞතික නඩු භාණ්ඩ වෙනුවට ඩිජිටල් මඟින් කටයුතු කරන්න පුළුවන් නේ. ඒක බොහොම වැදගත්. ඒ නිසා අපට නැවුම් පියවරකට යන්න පුළුවන්. ආයතනික වැටලීම් කිරීමට පොලීසිය විතරක් නොවෙයි, සුරාබදු දෙපාර්තමේන්තුව, රේගුව මැදිහත් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලය පුරාවටම - විශේෂයෙන් 2017 සිට 2020 දක්වා- ලංකාවේ අයිස් ආශ්‍රිතව අත්අඩංගුවට ගැනීම් ඉතා පොඩි ප්‍රමාණයක් වුණේ. එය 2018 වර්ෂයේදී 257යි; 2019 වර්ෂයේදී 2,073යි; 2020 වර්ෂයේදී 2,387යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2020 වර්ෂයේ ඉඳන් මේ තත්ත්වය වැඩි වුණා, සියයට 1,200කින්. 13,720ක්, 20,631ක් වශයෙන් ප්‍රමාණය වැඩි වුණා. 2024 වර්ෂය ගත්තාම මේ ප්‍රමාණය වැඩි වෙලා ඉහළ මට්ටමකට ගියා. මා සතුව ඒ සම්බන්ධව දත්ත ඇතුළත් වගුවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ රජය ආවට පසුව වැටලීම් ප්‍රමාණය වැඩි කළා. මගේ ළඟ තිබෙන මේ ප්‍රස්තාරයට අනුව වැටලීම් වැඩිවීමේ අනුක්‍රමණය වැඩි වෙලා තිබෙනවා. ඊට පස්සේ මොකද වෙලා තිබෙන්නේ? මේක "X" අක්ෂයට සමාන්තර වෙලා තිබෙනවා. ඒ කියන්නේ මොකක්ද? කිසියම් තැනකට පාලනය කරලා තිබෙනවා. Turn එක ගන්න පුළුවන්, නැවත අනෙක් පැත්තට. Zero කරන්න පුළුවන්.

ඒ නිසා අපේ රජය, අධිකරණය, පොලීසිය එකතු වෙලා මේ ගෙන යන වැඩ පිළිවෙළ ජනතාවට විශ්වාසවන්ත වෙනවාය කියලා අපි හිතනවා. ඒ වැඩ පිළිවෙළ සාර්ථක වෙයි කියලා අපට දැන් කියන්න පුළුවන්. පොලීසිය, විශේෂයෙන්ම Police Narcotics Bureau එක, ඒ වාගේම නාවික හමුදාව, ආරක්ෂක අමාත්‍යාංශයත් එක්ක ඒකාබද්ධව කරන මේ වැඩ පිළිවෙළ, අධිකරණ අමාත්‍යාංශය මඟින් ගනු ලබන ක්‍රියාමාර්ග අනාගතයේදී මේ රටේ විෂ මත්ද්‍රව්‍ය තුරන් කිරීමට ප්‍රධාන හේතුවක් වෙයි කියලා අපි විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Kaveenthiran Kodeeswaran. You have 16 minutes and the Floor is yours. .

[பி.ப. 1.43]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் இந்தச் சபையில் நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலத்தின் இரண்டாம் மதிப்பீடு மீதான விவாதம் நடைபெறுகின்றது. இந்தச் சட்டமூலத்தைக் கொண்டுவந்தமைக்காக அரசாங்கத்துக்கு எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

கடந்த காலங்களில் இந்த நாடு போதைப்பொருளாலும் ஊழலாலும் மிகவும் பின்தள்ளப்பட்ட நிலையிலே இருந்தது. இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னர், பல நல்ல விடயங்கள் முன்னெடுக்கப்பட்டு வருகின்றன. குறிப்பாக, போதைப்பொருள் கடத்தல்காரர்கள், போதைப்பொருள் பாவனையாளர்கள் மற்றும் அதனுடன் சம்பந்தப்பட்டவர்களைக் கைதுசெய்து சிறையில் அடைப்பது உண்மையிலேயே சிறப்பானதொரு விடயமாகும். போதைப்பொருள் விற்பவர்களுக்குத் தகுந்த தண்டனை கொடுக்கப்பட வேண்டும். அது கடுமையான தண்டனையாக இருக்கவும் வேண்டும். ஏனென்றால், ஹெரோயின், 'ஐஸ்' மற்றும் ஏனைய போதைப் பொருட்களை விற்கின்றவர்கள் எதிர்காலச் சந்ததியினரை அழிக்கின்ற செயற்பாடுகளில்தான் கூடுதலாக ஈடுபடுகின்றார்கள்.

நான் இங்கு குறிப்பாக செம்மணி புதைகுழி சம்பந்தமான விடயத்தைச் சொல்லலாமென நினைக்கின்றேன். அண்மையில் செம்மணி புதைகுழி சம்பந்தமான அகழ்வாராய்ச்சி அறிக்கை - 2025/2026ஆம் ஆண்டுக்கான நான்காவது இடைக்கால அறிக்கை - Interim Report - வெளியிடப்பட்டு இருக்கின்றது. இந்த அறிக்கை தொல்லியல் ஆய்வாளரான ராஜ் சோமதேவ அவர்களாலே வெளியிடப்பட்டு இருக்கிறது. இந்த அறிக்கையானது, மாறுபட்ட ஓர் அறிக்கையாகக் காணப்படுகின்றது. ஏனெனில், இந்த அறிக்கையில் உண்மைக்குப் புறம்பான சில விடயங்கள் இருப்பதை நாங்கள் பார்க்கின்றோம்.

ஆரம்பத்தில் வெளியிடப்பட்ட முதலாம், இரண்டாம், மூன்றாம் அறிக்கைகளில் இருக்கின்ற விடயங்கள் அண்மையில் வெளியிடப்பட்டுள்ள நான்காவது அறிக்கையில் திரிபுபடுத்தப்பட்டு இருப்பதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. முக்கியமான விடயம் என்னவென்றால், ஆரம்பத்தில் கொடுக்கப்பட்ட அறிக்கைகளில் சொல்லப்பட்ட விடயங்கள் மற்றும் செயற்பாடுகள் பின்னர் மாற்றப் பட்டிருக்கின்றன. இது திட்டமிடப்பட்ட முறையில் குறித்த ஆய்வாளரான ராஜ் சோமதேவ அவர்களால் மேற்கொள்ளப் பட்டிருப்பதாகவே நாங்கள் கருதுகின்றோம். ஏனெனில், அண்மையில் வெளிவந்த அறிக்கையானது, கொல்லப் பட்டவர்கள் இயற்கை அனர்த்தத்தாலும் தொற்று நோயாலும் உயிரிழந்து இருக்கலாமென்ற செய்தியைச் சொல்கின்றது. அதனால்தான் நாங்கள் இதனை உண்மைக்குப் புறம்பான ஓர் அறிக்கையாகப் பார்க்கின்றோம்.

ராஜ் சோமதேவ அவர்கள் ஒரு தொல்லியல் ஆய்வாளரே தவிர, மருத்துவ ரீதியாக நிபுணத்துவம் பெற்றவரோ அல்லது தடயவியல் மருத்துவ நிபுணரோ அல்ல. மேலும், மானுடவியல் சம்பந்தமான அறிவோ அல்லது உடற்கூற்றுப் பரிசோதனை பற்றிய அறிவோ அவரிடம் இல்லை. அவர் ஆராய்ச்சியை விடுத்து, தனக்கு விருப்பமானபடியே அந்த அறிக்கையை வெளியிட்டு இருக்கிறார். அவர் தனது முதலாவது, இரண்டாவது, மூன்றாவது அறிக்கைகளில் சொல்லியிருக்கிறார், "இது formal burialஆக இருப்பதற்கான சாத்தியக்கூறு இல்லை என்றும் இது குற்றவியல் சம்பந்தமான ஒரு விடயமாக இருப்பதனால், அந்த இடத்தை ஒரு குற்றவியல் பிரதேசமாகக் கருதித்தான் ஆய்வுகள் மேற்கொள்ளப்பட வேண்டும்" என்று. ஆனால், அவர் கடைசியாகச் சமர்ப்பித்த தனது நான்காவது அறிக்கையில் இதனை formal burialஆக குறிப்பிட விரும்புகிறார். ஆரம்பத்தில் இது தமிழர்கள் படுகொலை செய்யப்பட்டதற்கான ஆய்வொன்றாக மேற் கொள்ளப்பட்டாலும், பின்பு அதனை மறைப்பதற்கான, சர்வதேசத்தை ஏமாற்றுவதற்கான ஒரு சூழ்ச்சிகரமான வேலையாக மாறியிருக்கிறது. அவ்வாறே நாங்கள் இதனைப் பார்க்கின்றோம்.

செம்மணி மனித புதைகுழியானது, ஓர் இந்து மயானமாகத்தான் இருந்திருக்கிறது. அங்கு புதைக்கப்பட்டுள்ள உடலங்கள் வித்தியாசமான முறையிலே புதைக்கப்பட்டு இருக்கின்றன. அப்போது அங்கிருந்த சோமரத்ன ராஜபக்ஷ அவர்கள், இந்த மனிதப் புதைகுழி தோண்டப்படுவதற்கு முன்னரே, இந்தப் பிரதேசத்தில் 600க்கும் மேற்பட்ட உடலங்கள் புதைக்கப்பட்டு இருப்பதாகக் கூறியிருந்தார். இன்று அப்பிரதேசத்திலிருந்து 572 எலும்புக்கூடுகள் கண்டெடுக்கப்பட்டு இருக்கின்றன.

அண்மையில் வெளிவந்துள்ள reportஇல், அங்கு புதைக்கப் பட்டுள்ள உடலங்கள் 1995-1996 காலப்பகுதியில் புதைக்கப் பட்டவை அல்ல; அவை கிட்டத்தட்ட 50 வருடங்களுக்கு முன்பு புதைக்கப்பட்டவையாக இருக்கலாமென ராஜ் சோமதேவ அவர்கள் குறிப்பிட்டிருக்கிறார். இது எந்தவிதத்தில் உண்மை யாக இருக்க முடியும்? அங்கு மேற்கொள்ளப்பட்ட அகழ்வு நடவடிக்கைகளின்பொழுது, நாணயங்கள் கண்டுபிடிக் கப்பட்டு இருக்கின்றன. அவை 1995-1996ஆம் ஆண்டுக் குரியவை. அதனை அவர் இந்த அறிக்கையில் சுட்டிக் காட்டவில்லை. அதேபோல், அங்கு புதைக்கப்பட்டிருக்கும் உடலங்களை ஆரம்பத்தில் புகைப்படம் எடுத்தபொழுது இருந்த விதமும் அவர் இந்த அறிக்கையில் குறிப்பிட்டுள்ள விதமும் வித்தியாசமானதாக இருக்கின்றது. அந்த வகையில், அவர் பல விடயங்களை மறைத்துக் குறிப்பிட்டுள்ளது போல் தெரிகின்றது.

ராஜ் சோமதேவ அவர்கள் ஓர் ஆய்வாளரே தவிர, ஒரு வைத்திய நிபுணர் அல்லர். உடற்கூற்றுப் பரிசோதனை, தடயவியல் மருத்துவம் சம்பந்தமான விடயங்கள், மானிடவியல் சம்பந்தமான விடயங்களில் நிபுணத்துவம் பெற்றவர் அல்லர். ஆனால், அவர் மானிடவியல் சம்பந்தமான,

[ගරු කවින්දිරන් කෝඩීශ්වරන් මහතා]

உடற்கூற்றுப் பரிசோதனை சம்பந்தமான விடயங்களைப் பரிசோதித்தது போல் இந்த அறிக்கையை வெளியிட்டு இருக்கிறார். அவருக்கு இந்த அதிகாரத்தை யார் கொடுத்தது?

இந்த விடயங்களைப் பார்க்கின்றபோது, இது ஏதோ ஒரு விதத்தில், அங்கு படுகொலை செய்யப்பட்டு புதைக்கப்பட்ட தமிழர்களின் உடலங்கள் தொடர்பான நீதி விசாரணையை முடக்குவதுபோல் இருக்கின்றது. அவ்வாறானதொரு செயற் பாடாகவே நாங்கள் இதனைப் பார்க்கின்றோம். அதனால் தான் நாங்கள் சொல்கின்றோம், உள்நாட்டுப் பொறிமுறை அல்லது உள்நாட்டில் இருக்கின்ற ஆய்வாளர்களைக்கொண்டு செய்யப்படுகின்ற ஆய்வுகள் திருப்திகரமானதாக இருக்க மாட்டாது என்று. சர்வதேச விசாரணை அல்லது சர்வதேச நீதியில் நிபுணத்துவம் பெற்றவர்களைக்கொண்டு இந்தப் புதைகுழிகளைத் தோண்டி மனித எச்சங்களை ஆராயும் பொழுது உண்மையான விடயங்களை வெளிக்கொண்டுவர முடியும்.

இந்த விடயத்தைக் கையாளுகின்ற பொறுப்பை ஏற்றுள்ள ராஜ் சோமதேவ அவர்கள் வெளியிட்டு இருக்கின்ற நான்காவது அறிக்கை என்பது முன்னுக்குப் பின் முரணான விடயங்களை உள்ளடக்கிய ஒரு பிழையான அறிக்கையாகவே இருக்கின்றது. ஏனென்றால், அங்கு அகழ்வு நடவடிக்கைகளை மேற்கொள்ளும்பொழுது, சப்பாத்து அணிந்த சிறுபிள்ளைகளின் எலும்புக்கூடுகள் கண்டெடுக்கப்பட்டு இருக்கின்றன; வயோதிபர்களின் எலும்புக்கூடுகள் கண்டெடுக்கப்பட்டு இருக்கின்றன; குழந்தைகளின் எலும்புக்கூடுகள் கண்டெடுக்கப்பட்டு இருக்கின்றன. அதுமாத்திரமல்ல, பாடசாலை மாணவர் களின் சப்பாத்துகள், செருப்புகள், school bags மற்றும் உடுப்புகள் கண்டெடுக்கப்பட்டு இருக்கின்றன. ஆரம் பத்தில் சப்பாத்து, செருப்புகளுடன் கூடிய புகைப்படங்கள் எடுக்கப்பட்டு இருக்கின்றன. ஆனால், இந்த reportஇல் அவை பற்றி எதுவும் குறிப்பிடப்படவில்லை.

ராஜ் சோமதேவ அவர்கள் தனது அறிக்கையில், இது 40 -50 வருடங்களுக்கு முன்னர் புதைக்கப்பட்ட உடலங்களாக இருக்கலாமென்ற சந்தேகத்தை வெளியிட்டு இருக்கிறார். இது முன்னுக்குப் பின் முரணான விடயமாக இருக்கின்றது. ஒட்டுமொத்த தமிழ் மக்களையும் சர்வதேசத்தையும் ஏமாற்றுகின்ற ஒரு செயற்பாடாகத்தான் இதனை நாங்கள் பார்க்கின்றோம். ஆகவே, இதனை இந்த அரசு கவனத்திலெடுக்க வேண்டும். உள்நாட்டில் இருக்கின்ற நிபுணத்துவம் வாய்ந்தவர்களை மட்டும் பயன்படுத்தி இதனை மேற்கொள்ளாமல், சர்வதேசத்தில் இருக்கின்ற நிபுணத்துவம் வாய்ந்தவர்களையும் உள்வாங்கி, இந்த அகழ்வாராய்ச்சிகளை மேற்கொள்ள வேண்டும். இதுவரை செம்மணி மனிதப் புதைகுழியின் 65 சதவீதமான இடமே தோண்டப்பட்டு இருக்கின்றது. இன்னும் 35 சதவீதமான இடம் தோண்டப்பட வேண்டும். அதில், 1,200க்கும் மேற்பட்ட உடலங்கள் இருக்குமென சந்தேகம் வெளியிடப்பட்டு இருக்கின்றது.

சோமரத்ன ராஜபக்ஷ அவர்கள் அங்கு 600க்கும் மேற்பட்ட உடலங்கள் புதைக்கப்பட்டு இருப்பதாகக் கூறியிருக்கிறார். அவர் 1995-1996ஆம் ஆண்டு காலப்பகுதியில் அந்தப் பிரதேசத்தில் இராணுவச் சிப்பாயாகக் கடமை புரிந்தவர்; இந்தப் படுகொலையை நேரடியாகக் கண்டவர்; இது தொடர்பில் சாட்சியமளித்தவர். இன்று அவரை CIDஇனர் மீண்டும் விசாரணைக்கு அழைத்திருக்கிறார்கள். சிப்பாயாக இருந்த சோமரத்ன ராஜபக்ஷ அவர்கள், இதனைக் கனவு கண்டா சொன்னார், மந்திரத்திலா சொன்னார்? அவர் அங்கு இருந்தபொழுது நடந்த படுகொலையின் அடிப்படையில்தான் சொல்லியிருக்கிறார். அண்மையில் வெளியிடப்பட்டு இருக்கின்ற அறிக்கையில், இது இயற்கை அனர்த்தம் அல்லது கொள்ளை நோய் காரணமாக இறந்தவர்களின் உடலங்களாக இருக்கலாம் என்ற ஊகம் எழுவதாக குறிப்பிடப்பட்டு இருக்கிறது. மக்களையும் சர்வதேசத்தையும் ஏமாற்றுகின்ற ஒரு செயற்பாடாகத்தான் நான் இதனைப் பார்க்கின்றேன்; மக்களும் சந்தேகப்படுகின்றார்கள். மீதமாகவுள்ள 35 சதவீத இடத்தையும் அகழ்வாராய்ச்சி செய்வதற்குரிய வேலைத் திட்டங்களை அரசாங்கமானது சர்வதேசத்தின் ஒத்துழைப் புடன் செய்ய வேண்டும். அரசாங்கத்துக்கு அந்தக் கடமையும் பொறுப்பும் இருக்கின்றது.

கடந்த கால அரசாங்கத்தால் மேற்கொள்ளப்பட்டதாகக் கூறப்படும் பட்டலந்த படுகொலை சம்பந்தமாக விசாரணை செய்கின்ற நீங்கள், செம்மணிப் புதைகுழியின் மீதி இடங் களையும் ஆய்வு செய்ய வேண்டும். கடந்த கால அரசாங்கம்தான் இதனைச் செய்தது. அது மஹிந்த ராஜபக்ஷவின் அரசாங்கமாக இருக்கலாம், அதற்கு முன்னர் இருந்த சந்திரிக்கா அம்மையாரின் அரசாங்கமாக இருக்கலாம்!

மேலே குறிப்பிட்ட அறிக்கையானது, தமிழினப் படுகொலையை மறைப்பதற்காக மேற்கொள்ளப்பட்ட ஒரு விடயமாக இருக்கலாம் என்ற சந்தேகம் இருக்கின்றது. ராஜ் சோமதேவ அவர்கள், இலங்கை தொல்லியல் ஆணைக் குழுவின் சிரேஷ்ட உறுப்பினராக, முக்கியத்துவம் வாய்ந்த ஒருவராக இருக்கிறார் என்பது இந்த இடத்தில் குறிப்பிடத்தக்க ஒரு விடயமாக இருக்கின்றது. மேற்குறித்த விடயங்களின் அடிப்படையில் பார்க்கின்றபோது, இந்த reportஆனது கேள்விக்குரிய ஒன்றாகவே இருக்கின்றது. இந்த விடயம் தொடர்பான முதலாவது, இரண்டாவது மற்றும் மூன்றாவது reportஇல் 'மனிதப் புதைகுழி' என்று குறிப்பிடப்பட்டு இருந்தது. ஆனால், நான்காவது reportஇல் ராஜ் சோமதேவ அவர்கள் 'மனிதப் புதைகுழி' என்ற விடயத்தைக் குறிப்பிட வில்லை. எனவே, இது திட்டமிடப்பட்ட, சர்வதேசத்தை ஏமாற்றுகின்ற ஒரு செயலாக இருக்குமென்ற செய்தியைக் கூறிக்கொள்வதோடு, இதற்கான தகுந்த நீதியான விசாரணையை இந்த அரசு மேற்கொள்ள வேண்டுமெனவும் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Bimal Rathnayake. You have nine minutes and the Floor is yours, Hon. Minister.

[අ.භා. 1.59]

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනයේදී සාකච්ඡාවට ගැනෙන පනත් කෙටුම්පත් සම්බන්ධව කරුණු රාශියක් ඉදිරිපත් වෙලා තිබෙන මේ අවස්ථාවේ, ඉතාම වැදගත් වන වෙනත් කරුණු දෙක තුනක් පොදු අවධානයට යොමු කරන්න මා ඔබතුමාගේ අවසරය ඉල්ලා සිටිනවා.

එයින් පළමුවැනි එක තමයි ඊයේ දිනයේදී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ කාරණය. එක පැත්තකින් ගත්තාම එතුමා ව්‍යාජ සහ අනෙක් පැත්තෙන් අසාධාරණ විවේචනයක් එල්ල කළා, දුමින්ද හුලංගමුව මැතිතුමා පිළිබඳව. මම හිතන විධියට එය මාධ්‍යවලත් වාර්තා වුණා. එතුමා කිව්ව කාරණය බැලුවොත්, "දුමින්ද හුලංගමුව තමයි වර්තමාන ජනාධිපති අනුර දිසානායක මැතිතුමාගේත් ආර්ථික උපදේශක. ඒ වාගේම දුමින්ද හුලංගමුවම තමයි මීට කලින් රනිල් වික්‍රමසිංහ මහතාගේත් ආර්ථික උපදේශක වෙලා හිටියේත්. ඒ නිසා දැන් රනිල් වික්‍රමසිංහ තමයි අනුර දිසානායක ජනාධිපතිතුමාගේත් ආර්ථික උපදේශක" කියන විධියට තමයි බොහොම අපහාසාත්මක විධියට ඒ මන්ත්‍රීවරයා ඊයේ කරුණු ඉදිරිපත් කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉස්සෙල්ලාම කියන්න කැමැතියි, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියපු කාරණය සම්පූර්ණයෙන්ම; සහමුලින්ම බොරුයි කියන එක. දුමින්ද හුලංගමුව මහතා දන්වා තිබෙනවා, රනිල් වික්‍රමසිංහ මහතාගේ හෝ වෙනත් ජනාධිපතිවරයෙකුගේ හෝ වෙනත් අගමැතිවරයෙකුගේ ආර්ථික උපදේශක ලෙස එතුමා කිසිම දවසක කටයුතු කර නැහැ කියන කාරණය. එතුමා Ceylon Chamber of Commerceහි සභාපතිවරයා වශයෙන් ඉන්නකොට එතුමා විවිධ කමිටුවල සාමාජිකයෙක් විධියට තනතුරුවලට පත් වෙලා තිබුණා. ඒ, එතුමාගේ Ceylon Chamber of Commerceහි සභාපතිකම නිසා මිසක් රනිල් වික්‍රමසිංහගේ පත් කිරීමක් ලෙස නොවෙයි. දුමින්ද හුලංගමුව මහතා දැනුම් දීලාත් තිබෙනවා, එතුමා යම්කිසි ආණ්ඩුවක ආර්ථික උපදේශක තනතුරක් දරනවා නම්, එසේ දරන්නේ මේ NPP ආණ්ඩුවේ විතරයි කියා.

රනිල් වික්‍රමසිංහ මහතාගේ ආර්ථික උපදේශක වෙන කවුරුවත් නොවෙයි, සාගල රත්නායක. රනිල් වික්‍රමසිංහගේ ආර්ථික උපදේශක වශයෙන් පත් කර තිබුණේ සාගල රත්නායක. මම හිතන විධියට ඒ වෙලාවේ මුදල් ඇමතිකමට හෝ මුදල් ඇමතිකමෙන් භාගයකට හෝ සම්බන්ධ කරගෙන තමයි ඔය කියන මන්ත්‍රීතුමා හිටියේ. ඒ නිසා අපි හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි, ඒ කියපු කථාව කරුණාකරලා ඉල්ලා අස් කරගන්න කියලා. මොකද, ජනාධිපතිවරයාගේ ආර්ථික උපදේශක ලෙස පත් කර තිබෙන දුමින්ද හුලංගමුව මහතා වෙන කාගේවත් ආර්ථික උපදේශක ලෙස කටයුතු කර නැහැ. ඒ නිසා හර්ෂ ද සිල්වා මහතා විසින් ඒ කාරණය සම්පූර්ණයෙන්ම නිවැරදි කරගත යුතුයි කියන කාරණය තමයි අපි කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට මම තවත් කාරණයක් ගැන සඳහන් කරන්න කැමැතියි. ඒ තමයි, සිවරාසා අනෝජන් තරුණයාගේ ජීවිතය බේරා ගැනීම පිළිබඳ කාරණය. රටේ බොහෝ දෙනකු එය අගය කරමින් කථා කර තිබෙනවා. රටක් වශයෙන් අපිට තිබෙන ශක්තීන් ගැනත් අප කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම සවුදි අරාබියේදී මරණ දණ්ඩනය නියම වෙලා හිටපු අනෝජන් කියන ශ්‍රී ලාංකික පුරවැසියාගේ ජීවිතය බේරා ගැනීම සඳහා සවුදි අරාබි ආණ්ඩුවෙන් අප කළ ඉල්ලීම් සහ එතුමන්ලාගේ නීති රීති අනුව සලකා බලා එතුමන්ලා එම මරණ දඬුවම ඉවත් කර තිබෙනවා. මගේ දැනීමේ හැටියට සවුදි අරාබි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රථම වතාවට තමයි දේව නීතිය යටතේ දඬුවම් ලැබූ පුද්ගලයෙකුට ඒ දඬුවම් අඩු කරලා ඒ ආකාරයට කටයුතු කළේ. මම අසා තිබෙන විධියට ප්‍රථම වතාව ලෙස තමයි මෙය සැලකෙන්නේ. ඒ නිසා අපි ඒ සම්බන්ධව සවුදි රජයට ඉතා ස්තුතිවන්ත වෙනවා. මොකද, එම කාරණය නිසා අපේ ශ්‍රී ලාංකීය හදවත් විශාල ලෙස තුවාල වෙලා තිබුණේ. එම හදවත් heal කරන්න, නිවන්න සවුදි රජය විසින් අරගත් තීන්දුව හේතු වුණා. ඒ අවස්ථාවේදී පක්ෂ-විපක්ෂ භේදයෙන් තොරව කටයුතු කළ සියලුම ඇමතිවරුන්ටත්, මන්ත්‍රීවරුන්ටත්, ඒ වාගේම ඒ සඳහා විශේෂයෙන්ම මහන්සි වුණු නීතිඥවරුන්ටත්, සවුදි අරාබියේ තිබෙන ශ්‍රී ලංකා තානාපති කාර්යාලයටත් - ඒ හැම කෙනාටම - අපි ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී තවත් එක කරුණක් ගැන කියන්න කැමැතියි. අපේ කෝඩිස්වරන් මැතිතුමා වෙම්මනි සමූහ මිනී වළ ගැන සඳහන් කළා. අපි දන්නවා, ඒක ඉතාම සංවේදී, විශාල බේදවාචකයක් බව. අපි එතුමාට කියන්න ඕනෑ, ඒ හා සම්බන්ධ කටයුතුවලට කිසිම බලපෑමක් කරන්න අපට අවශ්‍යතාවක් නැහැ කියන කාරණය. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, උතුරු පළාතේ ජනතාවත්, දකුණු පළාතේ ජනතාවත්, නැගෙනහිර පළාතේ ජනතාවත් එකතු වෙලා තමයි මේ ආණ්ඩුව පත්කර තිබෙන්නේ කියා. ඔබතුමා සඳහන් කරන වෙම්මනි මිනී වළ තිබෙන අරියාලෙයි කොට්ඨාසය දිනා තිබෙන්නේත් NPP එක. අපි කිසිසේත්ම එම කටයුතුවලට බාධා කරන්නේ නැහැ. 2024 සැප්තැම්බර්වල අපේ ආණ්ඩුව බලයට එන්න කලින් එම ස්ථානයෙන් මිනිස් ඇටකටු 15යි, හොයා ගෙන තිබුණේ. නමුත් දැන් වනවිට මිනිස් ඇටකටු 550ගණනක් සොයා ගෙන තිබෙනවා. ඒ, ආණ්ඩුව එම කටයුතුවලට මුදල් වෙන් කරන නිසා; ආණ්ඩුව forensic anthropologistsලා එම කටයුතුවලට යොදවන නිසා; විශේෂයෙන්ම නඩුකාරවරුන් ඒ වෙනුවෙන් යොදවන නිසා.

ඔබතුමා බලන්න, අවුරුදු විසි ගණනක් පරණයි ඔය මිනී වළේ ඉතිහාසය. අවුරුදු විසි ගණනටම 15යි හොයා ගෙන තිබුණේ. නමුත්, මේ අවුරුදු දෙකට පන්සිය ගණනක් හොයා ගෙන තිබෙනවා. තව හොයන්න තිබෙනවා. ඒ කියන්නේ, බේදවාචකයක් තමයි. අනෙක් එක තමයි, තනි පුද්ගලයෙකුට ඒ පිළිබඳ නිගමන දෙන්න හැකියාවක් නැහැ. මම ඉලංකුමාරන් මන්ත්‍රීතුමාගෙනුත් දැන් ඇහුවා. ඔබතුමා හොඳටම දන්නවා, ඒ හැම දෙයක්ම විනිශ්චයකාරවරයෙක් බලා ගෙන ඉන්නවා කියන එක. විනිශ්චයකාරවරු ඇතුළු ඒ සියලුම නිලධාරීන් බලාගෙන ඉන්නවා. ඒ නිසා ඔවුන් ඔක්කොම එකතු වෙලා දෙන නිගමන මිසක් වෙන නිගමනවලට යන්න හේතුවක් නැහැ. අනෙක් එක, ඒක අවසන් නැහැ. මම විශේෂයෙන්ම කෝඩිස්වරන් මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමා ජාතික සමගිය වෙනුවෙන් ඉන්න මන්ත්‍රීවරයෙක්. ඔබතුමන්ලා වැදගත් විධියට මේ රටේ කටයුතු කරන මන්ත්‍රීතුමන්ලා. ඔබතුමන්ලාගේ හැඟීම ගැන මට තේරෙනවා. නමුත්, කරුණාකරලා මේ පරීක්ෂණවලින් අනවශ්‍ය පුද්ගලයන්ට වාසි ගන්න පුළුවන් වෙන විධියට කටයුතු කරන්න එපා. ගැටලුවක් තිබෙනවා නම්, ඔබතුමා පාර්ලිමේන්තුවේදී කථා කරනවා වාගේම කෙළින්ම අපට කියන්න. ඔබතුමාට අධිකරණ ඇමතිතුමාට කියන්න පුළුවන්. එතුමන්ලා මැදිහත් වෙනවා, ඒක සාධාරණව කරන්න. ඒ වාගේම ඔබතුමා පිළිගන්න, බටලන්ද පරීක්ෂණ වාර්තාවේ AG's Report එක දැනුයි අපට ඇවිල්ලා තිබෙන්නේ. මාතලේ අපේ සහෝදරවරු සිය ගණන් මරලා වළදාපු එකක් තිබෙනවා. ඒවායේ මිනී වළවල් වහලා තිබෙනවා. ඔබතුමා දන්නවා, කොක්කුතුඩුවායිවල grave එක ගැනත් ඒ professorම තමයි කළේ. මම හිතන විධියට, ඒ professorවම ඊට පස්සේ වෙම්මනිවලටත් යෝජනා කළේ ඒ judgesලාමයි. ඒ නිසා මම හිතනවා, විශේෂඥයන්ට චෝදනා කරද්දී අපි හැම පැත්තම හොයලා බලලා කරනවා නම් හොඳයි කියලා. මොකද, අපට ඔවාට අදාළ කරන පුද්ගලයෝ ගොඩක් නැහැ.

අනෙක් කාරණය මෙකයි. විදේශීය අය ගෙන්වන්න ඕනෑකම තිබෙන්නේ දේශීය යන්ත්‍රණය බිඳවැටිලා නම් තමයි. දේශීය යන්ත්‍රණය බිඳ වැටෙනවාද නැද්ද කියලා එක කථාවකින්, එක සිද්ධියකින් මනින්න එපා. ඒකෙන් වෙන්නේ මේවා jeopardize වෙන එක, මේවා delay වෙන එක, මේවාට මිනිස්සු ඉදිරිපත්

[ගරු බිමල් රත්නායක මහතා]

වෙන්නේ නැති එක. ඒ නිසා ඒ පැත්තත් හිතන්න කියලා ඉල්ලා සිටිනවා. මරා දැමුවන්, අතුරුදහන් කරපු හැමකෙනාම වෙනුවෙන් උපරිම වශයෙන් යුක්තිය ඉටු කරන්න තමයි, මේ ආණ්ඩුව ඇවිල්ලා තිබෙන්නේ. උතුරෙත්, දකුණෙත්, නැඟෙනහිරත් හැම අම්මා තාත්තාගේම දුක දන්නා ආණ්ඩුවක් මේ ඇවිල්ලා තිබෙන්නේ. අපි උපරිම වශයෙන් මේකට මැදිහත් වෙනවා. මොනවා හරි සැකයක් තිබෙනවා නම්, අධිකරණ ඇමතිතුමාට ඔබතුමාගේ කරුණු කියන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මම කියන්න කැමැතියි, මයිලත්තමඩු ප්‍රදේශයේ ගැටලුව ගැනත් විශාල සාකච්ඡාවක් රටේ සිද්ධ වෙමින් තිබෙන බව. ඒ, මඩකලපුව දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ඉඩම් සහ ගව පාලනය සම්බන්ධව. එහිදී ගරු ජනාධිපතිතුමා මැයි 20වැනි දා මඩකලපුව DCC එකේදී සාකච්ඡා කරලා තීන්දුවක් දැනුම් දුන්නා. ඒ සාකච්ඡාව සම්බන්ධයෙන් මඩකලපුව දිස්ත්‍රික් ලේකම් ඔක්තෝබර් 05වැනි දා යවපු ලිපියක් තිබෙනවා. මම ඒ ලිපිය **සභාගත*** කරනවා.

එම ලිපියේ මෙසේ සඳහන් වෙනවා:

> "2026.05.20 දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ පැවැත් වූ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී අදාළ ප්‍රදේශයේ තණබිම් ලෙස පරිහරණය කරන ඉඩම් ගැසට් කිරීමට කටයුතු කළ යුතු බව තීරණය ගත් බවද ඔබ වෙත වැඩිදුරටත් දන්වා සිටිමි."

ආණ්ඩුව ප්‍රතිපත්තිමය තීන්දුව අරගෙන තිබෙන්නේ, අක්කර 3,000ක් pasture lands ගැසට් කරන්න. හැබැයි, අද බංකොලොත්, ජාතිවාදී දේශපාලන කල්ලි දැන් මේ සම්බන්ධයෙන් සිංහල මිනිස්සුයි, දෙමළ මිනිස්සුයි අවුස්සන්න බලනවා. ඒ නිසා විශේෂයෙන්ම අපි රජයේ නිලධාරීන්ගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි, මහවැලි අධිකාරියේ හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ මහාමාර්ග අමාත්‍යාංශය හෝ ඕනෑම දෙපාර්තමේන්තුවක අදාළ අය ඉන්නවා නම්. මේ වාගේ ප්‍රශ්නවලට විශාල මැදිහත්වීමක් කරලා මේ ප්‍රශ්න විසඳීම අවශ්‍ය වෙනවා. මොකද, ජනාධිපතිතුමා නියෝගය දීලා මාස පහක් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Bimal Rathnayake, you get additional nine minutes from the Hon. Sanjeewa Ranasingha; he has given you nine minutes.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Okay, thank you.

මම කියන්න කැමැතියි, මේක මැයි මාසයේ දීපු තීන්දුවක් බව. මැයි මාසයේ දීපු තීන්දුව ක්‍රියාත්මක වීමේ ප්‍රමාදය විසින් අද එතැන යම් කිසි ජාතිවාදී තත්ත්වයක් ඇති වෙමින් තිබෙනවා. ඒ දේවල් ඇති වුණාට පස්සේ නිවන්න අමාරුයි. ඒ නිසා මම අදාළ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමන්ලාගෙනුත්, විශේෂයෙන්ම රජයේ නිලධාරීන්ගෙනුත් ඉල්ලීමක් කරනවා. අපි ඊයේ ලාල් කාන්ත ඇමතිතුමාටත් කථා කළා. එතුමා මේකට මහන්සි වෙමින් ඉන්නවා. මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ටත් අපි කථා කළා. අපි කියනවා, මේ වාගේ ප්‍රශ්න විසඳීම අත්‍යවශ්‍ය බව. එහෙම නැත්නම් ඔය හත වැදිලා, අනාථ වෙලා ඉන්න, දෙපැත්තේම හොල්මන් අවතාර බවට පත් වෙමින් තිබෙන සුළු ජාතිවාදී කණ්ඩායම් හරකෙක් හරි අල්ලා ගෙන මතු වෙන්න හදනවා. අද අපට ආරංචි වෙලා තිබෙනවා, අපේ සමහර මන්ත්‍රීවරුන් කියන ආකාරයට, සමහර අයට වාහන පවා අරන් දීලා, මුදල් පවා ලබා දීලා තමයි මෙම උද්ඝෝෂණ කරවන්නේ කියලා. මෙම කාරණයේදී දෙපැත්තේම ගැටලු ඇති. නමුත්, ප්‍රශ්නය විසඳීම සඳහා ජනාධිපතිතුමා විසින් නියෝගයක් ලබා දී තිබියදී ඒක ඉටු කිරීම රාජ්‍ය නිලධාරීන්ගේ ප්‍රධාන වගකීමක් ලෙස මා දකිනවා. රටේ නායකයා මන්ත්‍රීවරුන්ට මෙන්ම නිලධාරීන්ටද ඇහුම්කන් දීලා නියෝගයක් නිකුත් කළාම - නිකම් *ad hoc* decisions නොවෙයි - ඒක ක්‍රියාත්මක කරන්න බැරිද? ජනාධිපතිතුමා මඩකලපුවට ගිහිල්ලා decision එකක් දීලා මාස 5ක් ගතවෙලාත් ඒක ක්‍රියාත්මක කරන්න බැරි වෙලා තිබෙනවා නම් මොකක්ද මේකේ තේරුම?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශාල වශයෙන් වංචා, දූෂණ, අධිකරණයට අපහාස කිරීම්, අධිකරණ නියෝග නොසලකා හැරීම්, නීතියට ඉහළින් කටයුතු කිරීම්, හොරකම්, වංචා, මිනී මැරුම් වැනි විවිධ අක්‍රමිකතාවල නිරත වූ යම් පිරිස් පසුගිය වසර 15ක්, 20ක් තිස්සේ සිටියේ නීතියට උඩින්. ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ. අපි දැක්කා, නීතිය ක්‍රියාත්මක කිරීමට ගිය අවස්ථාවලදී පවා ඔවුන් නීතිය නවාගත්ත හැටි, නැත්නම් නීතිය කඩපු හැටි. ඒ වාගේ විවිධ දේවල් කළා.

පසුගිය දිනවල අපි විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගත්තා. ඒ වෙලාවේ ඇති වුණු සාකච්ඡාවක් තමයි, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා අධිකරණයට බලපෑම් කරන්න ආණ්ඩුව උත්සාහ කරනවාද කියන කාරණය. ඒක තමයි විපක්ෂය ඉදිරිපත් කළ ප්‍රධාන චෝදනාව. නමුත් ඔබතුමාත් දන්නවා, අද අධිකරණය හමුවේ නඩු තිබෙන, මෙතැනට ඇවිල්ලා බොරුවට කෑ ගහලා යන එක්කෙනෙක් දෙන්නෙක් ඉන්න බව. ඒ වාගේම නඩු වැටිච්ච තවත් විශාල පිරිසකුත් ඉන්නවා. අපේ ආණ්ඩුව පළි ගැනීම් කරන්න මේ දෙවල් කරනවා කියලා තමයි ඒගොල්ලන් කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Anti-Corruption (Amendment) Bill එක විවාද කරපු අවස්ථාවේදී මම කිව්වා, අපි කිසිදු පුද්ගලයෙකුගෙන් පළිගැනීමේ චේතනාවෙන් මේ දේවල් කරලා නැහැ කියලා. දේශපාලනඥයින් අතිවිශාල ප්‍රමාණයකට අදාළව දැනට විභාග වන නඩු සහ විධිමත්ව විමර්ශනය වන නඩු අතරින් අතිවිශාල ප්‍රමාණයක් 2010, 2012, 2013, 2015, 2018, 2019 සහ 2020 යන වසරවල පටන් ගත් ඒවා බව මම ඒ අවස්ථාවේ පෙන්වා දුන්නා. එම නිසා මට පළමුවෙන්ම කියන්න ඕනෑකම තිබෙන්නේ, අපි දේශපාලන පළි ගැනීම් සිදු කරන්නේ නැහැ, අපි දැනට කරමින් ඉන්නේ අතීතයේදී ආරම්භ වුණු, අතීතයේදී පැමිණිලි කර තිබුණු, නැත්නම් විමර්ශන ආරම්භ කරලා පසුව යටගසා තිබුණු හෝ කුමන හෝ හේතු නිසා ඉදිරියට ක්‍රියාත්මක නොවූ නඩු නැවත අධිකරණයට යොමු කිරීමයි. එහෙම නැතුව, අපි නඩු අහනවා නොවෙයි. එම නිසා මෙතැන කිසිදු පළි ගැනීමක් නැහැ. ඒ කාරණය තමයි මට මූලික වශයෙන් කියන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් මම 100ත්, 150ත් අතර පිරිසකගේ විශාල ලැයිස්තුවක් සකස් කරමින් ඉන්නවා. එම ලැයිස්තුවේ අතිවිශාල පිරිසක්, එනම් හතළිස්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගණනක්ම ඉන්නේ දේශපාලනඥයින්. නමුත්, එදා මම එහි නම් කියවද්දි රජයේ විවිධ තනතුරු දරන නිලධාරීන් දෙතුන්දෙනෙකුගේ නම් කියැවුණා. මේක පළි ගැනීමක් නොවෙයි කියන එක අදාළ විය යුත්තේ දේශපාලනඥයින්ට සහ දේශපාලන පත්වීම් ලැබූ අයට විතරයි. රාජ්‍ය නිලධාරීන්ට යම් යම් චෝදනා එල්ල වෙලා තිබුණත්, ඔවුන් එම චෝදනාවලින් නිවැරදිකරුවන් වෙන්නත් පුළුවන්, වැරදිකරුවන් වෙන්නත් පුළුවන්. එම නිසා ඒ නම් කියවූ නිලධාරීන් තිදෙනෙකු සම්බන්ධයෙන් මට concern එකක් තිබෙනවා. ඒ තමයි, රූපවතී කේතීස්වරන් මහත්මිය, තිලාන් විජේසිංහ මහතා සහ ජයන්ත ප්‍රනාන්දු මහතා. ඔහු හිටපු අමාත්‍යාංශ අතිරේක ලේකම්වරයෙක්. ඒ තිදෙනාගේ නම් මගෙන් කියැවුණා. මෙම පසුබිම යටතේ, ඔවුන් සම්බන්ධයෙන් විවේචනයක් ඉදිරිපත් කිරීමේ පදනමක් නැහැ වාගේම එය අත්‍යවශ්‍ය නැහැ කියලා මා හිතනවා. මොකද, ඔවුන් තවමත් රාජ්‍ය නිලධාරීන් හැටියට කටයුතු කරනවා වෙන්නත් පුළුවන්, නොවෙන්නත් පුළුවන්. මගේ මූලික තර්කය සනාථ කිරීමට එම නිලධාරීන් තිදෙනාගේ කරුණු අවශ්‍ය වන්නේ නැහැ. එම නිසා ඒකෙන් ඔවුන්ට යම් බලපෑමක් වුණා නම් මා ඒ පිළිබඳව කනගාටු වනවා. ඔවුන්ට අදාළව යම් පරීක්ෂණයක් සිදුවනවා නම්, මගේ ප්‍රකාශයෙන් ඊට කිසිදු බලපෑමක් සිදුවන්නේ නැහැ. නමුත්, නිශ්චිත වශයෙන්ම රාජපක්ෂවරුන් හෝ වෙනත් අය සම්බන්ධයෙන් අපි පරීක්ෂණ සිදු කරන්නේ පළි ගැනීමේ චේතනාවෙන් නොවන බවත්, අපි මේ දේවල් කරන්නේ අතීතයේ සිට පැවති කරුණු පදනම් කරගෙන මිස ඔවුන් හඹාගෙන ගිහිල්ලා නොවන බවත් තමයි මට මූලික වශයෙන්ම කියන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවක් ලෙස අපි යන අරමුණුවලට විරුද්ධව කටයුතු කරන්නේ නැහැ. රට ශිෂ්ට සම්පන්න, සාමකාමී රටක් බවට පත් කරන්න අපට අරමුණක් තිබෙනවා. ජාති, ආගම්, කුල භේදවලින් විතරක් නොවෙයි, දූෂණ කටයුතුවලිනුත් සමාජය ඇතුළේ වෙනත් දේවල්වලට තිබෙන focus එක වෙනස් කරනවා. එම නිසා අවුරුද්දක් හෝ දෙකක් ඇතුළත මහා පරිමාණ දූෂණවලට අධිකරණවලින් සාධාරණ තීන්දු ලබා දීලා, අපේ සාකච්ඡාව, අපේ ශ්‍රමය රටේ සුබසාධනය සහ සංවර්ධනය දිශාවට යොමු කළ යුතුයි කියලා අපි විශ්වාස කරනවා. තීව්‍ර ලෙස බෙදී ගිය රටක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවක් අපට නැහැ. ඒ නිසා තමයි අරමුණක් වශයෙන් අපි දේශපාලන වශයෙන් පළි ගැනීම් නොකරන්නේ. මැතිවරණයෙන් පසුව අපි දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියාවලට හෝ පළි ගැනීම්වලට යොමු නොවුණේ ඒ නිසායි. අදත් එහෙමයි.

එම කරුණු අවධාරණය කරමින්, විශේෂයෙන්ම ජනාධිපති ආර්ථික උපදේශකවරයා සම්බන්ධයෙන් ගරු හර්ෂ ද සිල්වා මහතා කළ ප්‍රකාශයට අදාළව එතුමා මෙහිදී පිළිතුරු ලබා දේවි කියලා අපි බලාපොරොත්තු වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න වැඩිපුර කාලය ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Ajith P. Perera. You get six minutes, Hon. Member.

Order, please! Will an Hon. Member propose the Hon. (Prof.) Sena Nanayakkara to the Chair?

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[අ.භා. 2.15]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත් දෙකට අපගේ පූර්ණ සහයෝගය ලබා දෙන බව මම පළමුවෙන්ම කියන්න කැමැතියි. මෙම පනත් කෙටුම්පත් බොහොම කලින් එන්න තිබ්බව ඒවා. කලින් මේ පනතට කරපු සංශෝධනය හරහා ග්‍රෑම් 10ට වැඩි මත්ද්‍රව්‍ය සන්තකයේ තිබුණු අය පිළිබඳ අධිකරණ බලය අභියාචනාධිකරණය වෙත පැවරීම හේතුවෙන් සහ ඒ සමහම ගැළපුණු රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්තා නිකුත් කිරීමේ අධික ප්‍රමාදය හේතුවෙන් සම්පූර්ණයෙන්ම බන්ධනාගාර පිරී ගියා. අදටත් බන්ධනාගාරවල සිටින සම්පූර්ණ සිරකරුවන් සංඛ්‍යාව 42,000ක් විතර වනවා. ඒකෙන් තුනෙන් දෙකකට ආසන්න ප්‍රමාණයක් මත්ද්‍රව්‍යවලට සම්බන්ධ සැකකරුවන්. මේක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. ඒ කනගාටුදායක තත්ත්වය මහ හැරීම සඳහා මෙම සංශෝධනය මීට වසර එකහමාරකටවත් කලින් අරන් එන්න තිබුණා. කෙසේ වෙතත්, මේ සංශෝධනය මේ අවස්ථාවේදී ගෙන ආ එකත් ඉතා වැදගත්. අපි විටින් විට මේ ගැන කියා තිබෙනවා. අය වැය විවාදයේදීත් කියා තිබෙනවා. මේක කළ යුතු දෙයක්. මේ සඳහා අපේ පූර්ණ සහයෝගය ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනතේ දැනට තිබෙන නීතිය අනුව විශේෂයෙන්ම 54 වගන්තිය අයුතු ලෙස භාවිත කිරීම පිළිබඳව ඊයේ ගම්පහ මහෙස්ත්‍රාත්තුමා ඉතා වැදගත් නියෝගයක් ලබා දුන්නා. අහිංසක මිනිස්සු වෙනත් විවිධ හේතු නිසා, පළි ගැනීම් නිසා, ඒ වාගේම වෙනත් වැරදිවලට සම්බන්ධ තැනැත්තන්ට දැඩි දඬුවම් ලබා දීමේ සහ පීඩා කිරීමේ අරමුණින් පොලිස් ස්ථානාධිපතිවරුන් විසින් මේ 54 වගන්තිය පාවිච්චි

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

කරනවා. අද සමාජයේ 54 වගන්තිය කියන්නේ ඒ මනුස්සයාගේ ජීවිතයට, පවුල් ජීවිතයට, දරුවන්ගේ ජීවිතවලට මරණීය දඬුවම ලැබුණා හා සමාන දෙයක්. බන්ධනාගාරය තුළ තිබෙන නරක තත්ත්වය නිසා වරදකරුවන් සහ සැකකරුවන් කියන සියලුදෙනා අද ඉන්නේ එතැන. ඒ අතර සිටින මත්ද්‍රව්‍ය සැකකරුවනුත්, අනෙක් වරදකරුවනුත් කියන සියලුදෙනාම බන්ධනාගාර ඇතුළේ අද ඉතාම අසරණ තත්ත්වයකින් සහ දුෂ්කර තත්ත්වයකින් ජීවත් වන අතර, පළමුවරට සැකකරුවන් ලෙස එතැන සිටින අය බරපතළ අපරාධකරුවන්ගෙන් යම් යම් දේවල් ඉගෙන ගන්නවා. එම නිසා අද මේ බන්ධනාගාර අපරාධකරුවන්ට විශ්වවිද්‍යාලයක් වාගේයි. මේ බරපතළ තත්ත්වය නිසා අද මේ සියලුදෙනාම ඉතාම දුෂ්කර තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ මොහොතේ මේ අරන් එන සංශෝධනය ඉතාම වැදගත් එකක් වනවා. මේ හරහා නැවත වරක් මහාධිකරණය වෙත ඉල්ලීමක් කරලා ඒ සැකකරුවන්ට ඇප ලබා ගැනීමට හැකියාව ලැබෙනවා.

ඒ වාගේම ගම්පහ මහෙස්ත්‍රාත්තුමාත් මේ කරුණු කිව්වා. මීට කලින් ගල්කිස්ස මහෙස්ත්‍රාත්තුමාත් මෙවැනි තත්ත්වයක් පිළිබඳව සඳහන් කළා. ඒ නිසා පොලීසියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව, පොලීසියේ ප්‍රමිති පිළිබඳව, පොලීසියේ පරීක්ෂණ ක්‍රියාදාමයේ තිබෙන අපක්ෂපාතීභාවය සහ පක්ෂපාතීත්වය පිළිබඳව රජයක් වශයෙන් මීට වඩා සොයා බලා කටයුතු කිරීමේ බරපතළ වගකීමක් තිබෙනවා. ඒ වාගේම ඒ පිළිබඳව පැහැදිලි කිරීම් ද අවශ්‍ය වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී තවත් ඉතාම විශේෂ කාරණයක් කියන්න තිබෙනවා. දැන් අපට ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අලුත් පනත් කෙටුම්පතක්, අලුත් නීතියක් ඇවිල්ලා තිබෙනවා. මේ අලුත් නීතිය, පීඩාකාරී නීතියක්. මේ අර්ථ නිරූපණය ඉතා පුළුල් එකක්. ඒ වාගේම මේ තුළින් මහෙස්ත්‍රාත්වරුන් වෙත තිබූ තීරණ ගැනීමේ බලය සම්පූර්ණයෙන්ම අහිමි කරලා තිබෙනවා. යම් පුද්ගලයෙකු යම් හේතුවක් නිසා අත්අඩංගුවට ගැනීම පොලීසියට විතරක් නොවෙයි, මෙතැනදී පොලීසියේ නොවන වෙනත් නිලධාරීන්ටත් කරන්න පුළුවන්. වෙරළ ආරක්ෂක භටයෙකුට වුණත් පුළුවන්, කෙනෙක්ව අත්අඩංගුවට ගන්න. එහෙම අත්අඩංගුවට අරගෙන රැඳවුම් නියෝගයක් නිකුත් කළාට පස්සේ ඒ පුද්ගලයාගේ ජීවිතය ඉතාම අනතුරුදායක තත්ත්වයකට පත් වනවා. ඒ වාගේම පාපෝච්චාරණ පිළිබඳවත් ඉතා බරපතළ තත්ත්වයක් ඇති වනවා.

ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත විශාල වශයෙන් දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් විවේචනයට ලක් වුණු බව අපි දන්නවා. මේක වැරදි විධියට පාවිච්චි වුණා. මේ ආණ්ඩුවේ ඉන්න මැති ඇමතිවරුන්ගෙන් විශාල පිරිසක් මේ නීතිය යටතේ අත්අඩංගුවට පත් වෙච්ච අය; මේ නීතිය යටතේ දඬුවම් ලබපු අය; මේ නීතිය යටතේ පීඩාවට පත් වෙච්ච අය; එහෙමත් නැත්නම් වරදක් නොකර අත්අඩංගුවට පත් වෙච්ච අය; ඒ වාගේම සුළු වරදකට අත්අඩංගුවට පත් වෙලා දඬුවමේ කාලයටත් වඩා වැඩි කාලයක් රක්ෂිත භාරයේ හිටපු අය. ඒ නිසා මේ ආණ්ඩුවේ ඉදිරි පෙළ ඉන්න බොහෝදෙනෙකුට මේ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ නරක අත්දැකීම් තිබෙනවා. දැන් මේ අරන් එන පනත් කෙටුම්පත ඊටත් වඩා නරකයි. ඒ නිසා මේක ඉතාම බරපතළ දෙයක්. ශ්‍රේෂ්ඨාධිකරණයට කළ හැක්කේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමඟ ගළපා පරස්පරද, නැද්ද, ජන මත විචාරණයක් ඕනෑද කියන එක සොයා බලන එක විතරයි. හැබැයි ආණ්ඩුවට වගකීමක් තිබෙනවා, ප්‍රතිපත්තිය පිළිබඳව සලකා බලන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ ප්‍රතිපත්තිය අරන් එන එකේ වගකීම තිබෙන්නේ ආණ්ඩුවට.

ඒත් එක්කම සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත, ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ නව පනත් කෙටුම්පතටත් වඩා බරපතළයි. මට තේරුම් ගන්න බැහැ, හදිසි නීති රෙගුලාසිවලින් බැට කාපු, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතෙන් බැට කාපු ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයෙන් යුතු කණ්ඩායමක් රාජ්‍ය බලය දරන කාලයේ මෙවැනි පීඩාකාරී, මර්දනකාරී පනත් කෙටුම්පත් අරගෙන එන එක ගැන.

මත්ද්‍රව්‍ය උවදුර මේ රටේ බරපතළ ප්‍රශ්නයක් බව අපි දන්නවා. මත්ද්‍රව්‍ය උවදුර හා සම්බන්ධ ඉහළ පෙළේ ජාවාරම්කරුවන් මර්දනය කිරීම සඳහා සහ ප්‍රධාන ජාවාරම්කරුවන්ට එරෙහිව, මත්ද්‍රව්‍ය හා සම්බන්ධව අදාළ සංශෝධන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතට අරගෙන එනවා නම් අපට ඒක තේරුම් ගන්න පුළුවන්. එතකොට පරාසය පටුයි. එතකොට ඒක මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට පමණයි අදාළ වෙන්නේ. හැබැයි, අද වනකොට මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සියයට 75ක් ඉන්නවා. වෙනත් වැරදි සියයට 25ක් තිබෙනවා. ඒ නිසා දණ්ඩ නීති සංග්‍රහයෙන් දැනට ආවරණය වන වැරදිවලින් විශාල ප්‍රමාණයක් සඳහා මෙම සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ නව පනත් කෙටුම්පත ගෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දිනවල ජනප්‍රිය කථාවක් තිබෙනවා. පව්වයක් කොටන එක ඇත්තටම සමහරු සුළු දෙයක් වශයෙන් සලකනවා. නමුත් මේක එහෙම එකක් නොවෙයි. මේ පනතින්, පව්වයේ ස්වභාවය අනුව පාතාල කණ්ඩායමකට සම්බන්ධද කියලා වර්ගීකරණය කිරීමේ බලය පොලීසියට ලැබෙනවා. ඒකයි තිබෙන අනතුර. ඒ වාගේම අඳින පළඳින විධිය පිළිබඳව තීරණ ගැනීමේ බලයත් පොලීසියට ලැබෙනවා. ඒකයි තිබෙන අනතුර. දැන් 54 වගන්තිය අයුතු ලෙස පොලීසිය පාවිච්චි කරනවා. රීයේ ගම්පහ මහෙස්ත්‍රාත්තුමා කිව්ව පරිදිම 54 වගන්තිය අයුතු ලෙස පාවිච්චි කරලා අහු වෙලා, ඒ පිළිබඳව අධිකරණයේ අවවාද ලබා, ඒ පිළිබඳව අධිකරණයේ නිර්දේශ නිකුත් කරන්න කියන තත්ත්වයක් තුළ, මෙම සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත අනුව පාපොච්චාරණ භාවිත කරන්න පුළුවන්, එක් පාපොච්චාරණයක් අනෙක් කෙනාට විරුද්ධව පාවිච්චි කරන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා මහෙස්ත්‍රාත්වරුන්ට දෙන පාපොච්චාරණ නොවෙයි, පොලිස් නිලධාරියෙකුට දෙන පාපොච්චාරණ. ඒක, ඔහුටත්, අනෙක් අයටත් විරුද්ධව පාවිච්චි කිරීමට විධිවිධාන අරගෙන එනවා, මේ තුළින්. මේක මානව හිමිකම් බරපතළ විධියට උල්ලංඝනය කිරීමක්. මේ ආණ්ඩුවට ලැබුණු ජන වරමට මේක අයිති වෙන්නේ නැහැ. මේ ආණ්ඩුවට ජන වරම ලැබුණේ මෙවැනි මර්දනකාරී, පීඩාකාරී නීති අරගෙන එන්න නොවෙයි. මේ පිළිබඳව පළපුරුදු නීතිඥවරයෙක් හැටියටත්, ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරිකයින්ගේ නඩු සිය ගණනකට පෙනී ඉදලා එම හැම නඩුවකින්ම ඒ සියලුදෙනාම නිදහස් කරගත් පුද්ගලයෙක් හැටියටත්, ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් වසර ගණනක් මගේ ජීවිතයත් කැප කරපු කෙනෙක් හැටියටත් මම මේ රජයට ආයාචනා කරනවා, කරුණාකර මේ නීතිය පිළිබඳව නැවත වරක් හිතා බලන්න කියලා. මර්දනකාරී අණපනත්වලින් මේ රටේ මිනිස්සුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වෙන්නේ නැහැ. ඒකෙන් රටේ තත්ත්වය පහළට යනවා. ඒක රටේ අපරාධ වර්ධනය වෙන්න චක්‍ර ලෙස හේතුවක් වෙනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.23]

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත් දෙකක් පිළිබඳ විවාද කරන මේ වෙලාවේදී මම කියන්න කැමතියි, ඉතාම කාලෝචිත වැඩක් ඉටු කරන්න ඇමතිවරයා උත්සාහ දරනවාය කියන එක. ඒක හොඳයි. මොකද, පසුගිය කාලයේ බන්ධනාගාරවල තදබදය ඇති වෙනකොට තමයි ආණ්ඩුව තේරුම් ගත්තේ, ඒ තදබදයට ලක් වුණු රැඳවියන්ගෙන් අතිවිශාල පිරිසක් සුළු ප්‍රමාණයක මත්ද්‍රව්‍ය ළඟ තබාගෙන අහු වෙලා 54 වගන්තිය යටතේ අත්අඩංගුවට ගැනීම හරහා මේ බන්ධනාගාර පිරුණාය කියන කාරණය.

ඒ ගැන කථා කරන්න කලින් මම කාරණයක් කියන්න ඕනෑ. සභානායකතුමා ඇවිල්ලා අපේ හර්ෂ ද සිල්වා හිටපු ඇමතිතුමාට අභියෝගයක් කරලා ගියා. ඒ වාගේම මම එතුමාට අභියෝග කරනවා, දුමින්ද හුලංගමුව කියන පුද්ගලයා ගෝඨාභයගේ ආණ්ඩුවේ උපදේශක හැටියට හිටියාද නැද්ද කියන කාරණයත් කියන්න කියලා. ඒ කාරණයත් ඇවිල්ලා කියන්නකෝ, ඔය වාගේ. ඒ විතරක් නොවෙයි, හාන්ස් විජේසූරිය, දුමින්ද හුලංගමුව, ඉෂාර නානායක්කාර, ධම්මික පෙරේරා වාගේ බොහෝ දෙනා වියත් මහෙන් ඇවිල්ලා ආර්ථිකය බිඳ වැටිව්ව, ආර්ථිකය කඩා වැටිව්ව, බංකොලොත් වෙව්ව ගෝඨාභයගේ ආණ්ඩුවට උපදෙස් දීපු උදවිය. ඒ අය තමයි ඔබේ ආණ්ඩුවේත් ඉන්නේ. ඒ නිසා වෙනසක් නැහැ. ඒ නිසා රනිල් වික්‍රමසිංහ ළඟ හිටියාද, ගෝඨාභය ළඟ හිටියාද, දැන් අපි ළඟ ඉන්නවාද නැද්ද කියන කාරණය කියනකොට රිදෙනවා ඇති, දැනෙනවා ඇති. ඒ නිසා තමුන්නාන්සේලාත් යන්නේ පරණ ගමනම, පරණ විධියටමයි කියන කාරණය අද අපිට දැනෙනවා. ඒක සමාජයත්, රටත් දන්නවා. එක පැත්තකින් ඔබේ ආර්ථික වැඩ පිළිවෙළ කෙසේද, කොහොමද කියන කාරණය ඔබ කෙසේ කිව්වත් රටේ ජනතාව දන්නවා.

බදුල්ලේ රැස්වීමක් තියලා වතුකරයේ ඉන්න කාන්තාවෝ ටික ඒ රැස්වීමට ගෙනාවා. නමුත් ඔවුන් ගෙදර ගිහිල්ලා ඇඳගෙන හිටපු සාරිය ගලවනකොටම පිටි මිල වැඩි කළා. අපේ වතුකරයේ ඉන්න දමිළ ජනතාවගෙන් වැඩි දෙනෙක් රොටී කාලා ජීවත් වෙන්නේ. ඔවුන්ට කොකා පෙන්නුවා. ඒ නිසා බොරුව කියන දේ බොරුවෙන්ම නැති වෙනවා කියන කාරණය තමුන්නාන්සේලා තේරුම් ගන්න ඕනෑ. දැන් ආණ්ඩුව බණිනවා, මේ ආණ්ඩුව පෙරළන්න හදනවා කියලා. නැහැ, මේ ඔබතුමන්ලාගේ පෙර කියමන්.

මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඥානසාර හාමුදුරුවන්ට ජනාධිපති සමාව ලබා දීම ගැන බලන්න. උන්වහන්සේට සමාව ලබා දීම පැත්තකින් තියන්නකෝ. ජනාධිපති සමාව ගැන පෙර කියමන් ගත්තොත්, ඔන්න ජනාධිපති අනුර කුමාර මහත්මයා විපක්ෂයේ ඉඳිද්දී නාළිකාවලට ගිහින් දීපු interviewsවල කියපු ඒවා දැන් පළ වෙනවා. "ජනාධිපති සමාව දෙන්න ඕනෑ. ඒක අවශ්‍යයි. අධිකරණයෙන් අසාධාරණයක් වෙනකොට ඒකට සාධාරණයක් ඉෂ්ට කරන්න ඒ පුද්ගලයාට ඒ මොහොතේදී ජනාධිපති සමාව ලැබෙන්න ඕනෑ" කියලා අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා විපක්ෂයේ සිටියදී කියා තිබෙනවා. අද එතුමා ජනාධිපති වුණාට පස්සේ, "අපි කොහොමද අධිකරණයෙන් කියන දෙයට ඇඟිලි ගහන්නේ, ජනාධිපති සමාව දෙන්නේ කොහොමද?" කියන කාරණය කියනකොට, අර පෙර කියමන මාධ්‍යයේ පළ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මාධ්‍යයෙන් ඒ පෙර කියමන, දැන් කියමනත් එක්ක සන්සන්දනය කරනකොට, ඒ මාධ්‍ය චැනල්වලට ඇඟිලි දිගු කරලා, ලෝගුව පෙන්වලා, ඒවා ගලවන්න ගිහිල්ලා ඒවාට තර්ජනය කරනවා. දැන් එවැනි තර්ජන ගණනාවක් තිබෙනවා.

මෙතුමන්ලා කියනවා, නීතියට පහළින් ඒ අය ඉන්නවාය කියලා. අපට දැන් කියන්නකෝ මහත්වරුනි, ඔබතුමන්ලාගේ ඔය හිටපු විදුලිබල ඇමතිවරයා පිළිබඳව. විදුලිබල ඇමතිවරයෙක් හිටියා නේ. එතුමාට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඉදිරිපත් කරපු පැමිණිල්ලක් තිබෙනවා නේ. එතුමාගේ වංචා, දූෂණ පිළිබඳව අපි කරපු පැමිණිලි බොහොමයක් පිළිබඳව ඔබතුමන්ලා ගන්නා ක්‍රියාමාර්ග කියන්න. කුමාර ජයකොඩි මහත්මයා නීතියට උඩින් නේ දැන් ඉන්නේ. සාමාන්‍යයෙන් අල්ලස් කොමිසමට පැමිණිල්ලක් දැම්මාම අල්ලස් කොමිසමෙන් ඒ පුද්ගලයා ගෙන්වලා අත්අඩංගුවට ගන්නවා. එහෙම අත්අඩංගුවට අරගෙන උසාවියට ඉදිරිපත් කරනවා. එතුමා සම්බන්ධයෙන් එහෙම කළාද? එතුමා කට උත්තරයක් දීලා ගෙදර ගියා. ඔවුන් නීතියට උඩින් ඉන්නේ.

ඒ විතරක් නොවෙයි, ඒක උජාරුවට කියපු,- මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

නේ ඇවිල්ලා මේ ගැන කිව්වේ. කන්ටේනර් 323 ගැන අපි පැමිණිලි කරලා තිබෙනවා. කෝ, අද පැමිණිල්ලක් විභාග කරලා තිබෙනවාද? ඒ අය නීතියට උඩින් ඉන්නේ. එතුමා ගැන කියන්න ගියොත්, එතුමා ඇවිල්ලා මේ විපක්ෂයට කථා කරන විධිය බලන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

කියන කාරණය අපට කියන්න පුළුවන්. හැබැයි, අපි එහෙම කියන්නේ නැහැ. අපි ශීලාචාර විධියට මේ පාර්ලිමේන්තුවේ හැසිරෙන්න කැමැතියි. අපි එකක් කියනවා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඔබතුමාගේ ඔය කථාවේදී කියන්න ඕනෑ කෙනාට කියන්න ඕනෑ, නම් කරලා, නම කියලා අපි කියනවා වාගේ. පොදුවේ විපක්ෂයට කථා කරනවා නිකම් එතුමාගේ අත පල්ලෙන් වැටිලා වාගේ. එතුමා අත පල්ලෙන් වැටිලා ජාතක වෙව්ව හැටි, කොහේද කියන මුල්ලේ කියලා අපට කියන්න පුළුවන්. හැබැයි, ඒ තැනට අපිව පත් කරගන්න එපාය කියලා අපි

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

[ගරු චමින්ද විජේසිරි මහතා]

කියනවා. ඒ නිසා කියන්න ඕනෑ දේ නම් කරලා කියන්න, අපි කියනවා වාගේ.

ඒ වාගේ අය තව ඉන්නවා. ගල් අහුරු වංචාව පිළිබඳව අපි පැමිණිලි කරලා තිබෙනවා. ඩොලර් මිලියන 2.5ක වංචාව පිළිබඳව අපි පැමිණිලි කරලා තිබෙනවා. කෝ, ඒ අය සම්බන්ධව ගත්ත තීන්දු? ඔබතුමන්ලාගේ කාලයේ වංචා කරන කට්ටිය නීතියට උඩින් තියලා දැන් කියනවා, පසුගිය කාලයේ ඒවා නීතියට පහළින් කියලා. ඒක හොඳයි. හැමෝටම නීතිය එක සමාන වෙන්න ඕනෑ කියලා අපි කියනවා. ඒ නිසා මම කියන්න ඕනෑ, චාමර සම්පත් මන්ත්‍රීතුමා කිව්වා වාගේ විශේෂයෙන් අද මේ පනතට එකතු වන මේ සංශෝධන කිහිපය වාගේම තවත් සංශෝධනය විය යුතු බොහෝ දේවල් තිබෙන බව. මේ පනත සම්මත වෙනකොට, ඒ වෙලාවේ පහළ උසාවියක යම් නඩුවක් දාලා ඔහුට දඩුවම් දෙනවා, ඔහු ඒක appeal කරනවා. ඒ appeal එක විභාගයට යම්කිසි කාලයක් ගත වෙනවා. ඒ appeal එක අහලා, ඒ දඩුවමම Court of Appeal එකෙනුත් නියම වෙනකොට, අර සිරගත වෙලා හිටපු කාලය අහෝසි වුණා, 2024න් පස්සේ. හැබැයි, ඉතිහාසයට බලපාන විධියට ඒක අනුමත වුණේ නැහැ. මම ඒ ගැනත් දීර්ඝ කාලයක් තිස්සේ ඇමතිවරයාට කියනවා. හැබැයි, ඇමතිවරයා බන්ධනාගාරවලට ගිහිල්ලා පොරොන්දු වුණා ඒවා ඉටු කරනවාය කියලා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද බන්ධනාගාර පිරිලා තිබෙන්නේ ඇයි? ඔබේ ආණ්ඩුව ආවාට පස්සේ කිසි කෙනෙකුට ජනාධිපති පොදු සමාව ලැබිලා නැහැ. පොදු සමාව ලබා දෙන්න ඕනෑ අවස්ථා ගණනාවක. ඒ සියල්ල අද වනකොට අහිමි කරලා තිබෙනවා, ඔබේ ආණ්ඩුව. ඒ නිසා කිඹුල් කඳුළු හෙළන්නේ නැතිව ඉන්න. ආණ්ඩුව කළ යුතු තවත් බොහෝ කාරණා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා කියනවා මම දැක්කා, වයස අවුරුදු 70ට වැඩි කට්ටිය medical condemn වෙලා තිබෙනවා කියලා. ඒ conditions ටික බැලුවාම, නාඩි වැටෙනවා නම් ඒ පුද්ගලයා නිදහස් කරන්න බැහැ. ඒ කියන්නේ, මළ මිනියක් වුණාට පස්සේ තමයි අනිවාර්යයෙන් සිරකාරයෙක් එළියට දමන්න ඕනෑ කියලා තමයි මේ නිර්ණායක දාලා තිබෙන්නේ. අධිකරණ ඇමතිතුමා හැටියට ඔබතුමා ඒ දාලා තිබෙන නිර්ණායක ගැන හොයා බලන්න. වයස අවුරුදු 70ට වැඩි කට්ටිය එළියට දමන්න නිර්ණායක වගයක් දාලා තිබෙනවා. ඒවා Sri Lanka Medical Council එකට දමන්න ඕනෑ. ඒ Sri Lanka Medical Council එකේ නිර්දේශ ටික බැලුවාම, යම් සිරකරුවෙකුට අවුරුදු 70ට වැඩි නම්, නාඩි වැටෙනවා නම් ඒ පුද්ගලයාව නිදහස් කරන්න බැහැ. ඒ ගැන හොයා බලලා කටයුතු කරන්න කිව්වාට ඒක කරන්නේ නැහැ. මේ කරනවා වාගේ තවත් බොහෝ දේවල් නීතිමය වශයෙන් කරන්න අවශ්‍යව තිබෙනවා, අධිකරණ ඇමතිතුමනි.

මම විශේෂයෙන්ම කියන්න ඕනෑ මේ කාරණයත්. මේ අධිකරණ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනකොට, මේ හදන නීති සියල්ලම ක්‍රියාත්මක වෙන්න පටන් ගන්නකොට, ඒ ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලය තමුන්නාන්සේලාටත් එල්ල වෙනවා.

පසුගිය කාලයේ බොහෝ දෙනා හිතුවා, නීති හදලා ඒ නීතිවලින් ආණ්ඩුව රකින්න පුළුවන් කියලා. ආණ්ඩුව රැකගන්න එහෙම උත්සාහ දැරුවා. සියලු දේවල් වසන් කරන්න, ආණ්ඩුවට විරුද්ධව කථා කරන, ආණ්ඩුවට විරුද්ධව ආණ්ඩුවේ බොහෝ වැරදි පෙන්වන මාධ්‍ය ආයතන නිර්විනිදනය කරන්න බොහෝ උත්සාහ දැරුවා. හැබැයි මොකද වුණේ? ඒගොල්ලන්ට ගෙදර යන්න වුණා, හිතුවාටත් වඩා කලින්. ඔබතුමන්ලාගේ පෙර කියමන් එක්ක වර්තමානයේ හැසිරීම වැරදියි කියලා සමාජය දකිනකොට අලුත් නීති පද්ධති ගෙනැල්ලා, සිරගත කරලා, ඒවා මර්දනය කරන්න, ඒවා නතර කරන්න, ඒවා වසන් කරන්න උත්සාහ දරනවා නම් මම හිතන්නේ ඔබතුමන්ලාටම තමයි මේ හදන සෑම පනතකින්ම සිරගත වෙලා ඒවාට දඬුවම් විඳින්න වෙන්නේ කියන කාරණය මතක් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු භාග්‍ය ශ්‍රී හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.31]

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

අද දින විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතට සංශෝධන දෙකක් ගෙන එනවා. ඒ සම්බන්ධයෙන් පැවැත්වෙන විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලැබීම ගැන මුලින්ම මම සතුටු වෙනවා. මේ සංශෝධන සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ප්‍රථම විපක්ෂ නායකතුමා මෙම සභාවේදී මතු කළ කාරණයක් ගැන මම කියන්න ඕනෑ.

පසුගිය දිනෙක මිය ගිය ඇතා පිළිබඳ කාරණයේදී ආණ්ඩුව විසින් ඒ සම්බන්ධයෙන් අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද, precautions මොනවාද කියන එක පිළිබඳව එතුමා ප්‍රශ්න කළා. අනුරාධපුරයේ ජීවත් වන මන්ත්‍රීවරයෙකු හැටියට මා කාරණයක් අහන්න කැමැතියි. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජීවත් වන මන්ත්‍රීතුමෙකුත් මේ ප්‍රශ්නයම ඇහුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015-2016 කාලයේ එතුමා එවකට ආණ්ඩුවේ ඇමතිකම් දරපු කාලයේ එතුමා මූලික වෙලා හදපු; නාච්චාදුව සහ කලාවැව ආශ්‍රිත අලි කොරිඩෝව අහුවෙන්න - ඒ කොරිඩෝව මැද - කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉහළගම සහ කරඔවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හදපු, "දිවිදිනුගම" සහ "හිරුකිරණගම" කියලා ගම්මාන දෙකක් තිබෙනවා. අලින්ව ඉඹලා ඒවායේ photos දමන, කැළේට ගිහිල්ලා photos ගන්න විපක්ෂ නායකතුමා එකතු වෙලා හදපු මේ නිවාස සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසර ගත්තාද කියලා මම අහන්න කැමැතියි. අවසර අරගෙන නැහැ.

ඒ වාගේම තමයි, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දේවානම්පියතිස්සපුර ප්‍රදේශයේ තිබෙනවා, "පූජ්‍ය ගිරාඹේ ආනන්දභිමිගම" කියලා නිවාස යෝජනා ක්‍රමයක්. එහි නිවාස කිහිපයක් අලි කොරිඩෝවේ තමයි ඉදි කරලා තිබෙන්නේ. තමන්ගේ දේශපාලන වුවමනා වෙනුවෙන් අලි කොරිඩෝව වහලා ඒ හදපු සමහර ගෙවල් වසා දමා තිබෙන්නේ. සමහර ඒවා භාගෙට හදපු ගෙවල්. අදටත් තිබෙන්නේ එහෙමයි. මම අහන්න කැමැතියි, මේවා හදද්දි මේ අලි කොරිඩෝ ගැන, අලි ගැන සංවේදීතාවක් ඇති වුණේ නැද්ද කියලා. ඇතුන් ගැන, ඇතුන්ගේ ගමන් මාර්ග ගැන එතකොට සංවේදීතාවක් ඇති වුණේ නැද්ද? ඒ වාගේම ඊට පස්සේ කථා කළ නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ

තාත්තාගේ කාලයේදී ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුංචිකුලම ග්‍රාම නිලධාරී වසමේ ගෙවල් 1,500ක් විතර හදලා, රණවිරු ගම්මානයක් හැදුවා. ඒ ප්‍රදේශයම අලි ප්‍රශ්නයකට මුහුණ දෙමින් ඉන්නවා. අදටත්, අද රෑටත් එහි ප්‍රශ්නයක්.

ඒ වාගේම මම මුලින් කියපු, සජිත් ප්‍රේමදාස මහත්මයා හදපු නිවාස යෝජනා ක්‍රම නිසාත් අද රෑටත් අලි ප්‍රශ්නයක් තිබෙනවා. එතකොට සංවේදී වුණේ නැද්ද? ප්‍රශ්න වවාගෙන කනවාය කියන්නේ ඕවාට තමයි. ඒ අය විසින් හදපු ප්‍රශ්නවලින් බැට කන, ඒවාට මුහුණ දෙන මිනිසුන් ඉන්න සමාජයක, ඒ ප්‍රශ්න විසඳන්න ආණ්ඩුවක් විධියට අපි උත්සාහ ගනිද්දී, ඒ අය විසින් නිර්මාණය කරපු ප්‍රශ්න ටික අපි විසඳන්නේ නැද්ද, ආණ්ඩුව විසඳන්න ප්‍රමාද මොකද කියලා අහලා තමයි ඒ අය දේශපාලනය කරන්න ලැහැස්ති වෙන්නේ. ඒ ප්‍රශ්නය විතරක් නොවෙයි. හොයලා බැලුවොත්, ඒ හැම දිස්ත්‍රික්කයකම තමන්ට කැමති කැමති, හිතුණු හිතුණු තැන්වල නිවාස සංකීර්ණ හදන්න අරගෙන, භාගෙට හදලා, හදපු ටිකත් දේශපාලන හෙන්චයියන්ට දීලා, ඒකෙනුත් අලින් පිළිබඳ ප්‍රශ්න වැඩි කරලා, තවත් පරිසර ප්‍රශ්න ගොඩක් හදලා, ඒ ප්‍රශ්නවලට උඩගෙඩි දීලා, ඒ ප්‍රශ්න නිසාම අද ඇති වෙලා තිබෙන අතුරු ප්‍රශ්නවලට විසඳුම් හොයන්න හදනවා. ඒ නිසා ඔය සත්ව ලෝලියාගෙන් අහන්න කැමැතියි, ඒවාට මොකක්ද කියන්නේ කියලා.

ඒ වාගේම, ඒ විධියේම ප්‍රශ්නයක් තමයි අද දවසේ මේ අපි කථා කරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග අඥාපනතට අද සිද්ධ වන මේ සංශෝධනයට අදාළ කාරණයත්. ඇත්තටම සතුටුයි, මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම මේ වෙද්දී බන්ධනාගාරවල තිබෙන තත්ත්වය සැබෑ ලෙසම අත්විඳිමින් මේ ගරු පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශ කිරීම ගැන. මම හිතන විධියට, දැන් තමයි ඒ ගැන සංවේදීභාවයක් ඇති වෙලා තිබෙන්නේ. ඒක හොඳයි, එක පැත්තකින් සතුටු වෙනවා. කොහොම හරි, හැමෝම සතුටුයි මේ සංශෝධනය ගැන.

ඇත්තටම මුලින්ම 2022දී මේ ආඥාපනතට සංශෝධනය ගෙනෙන්නේ කුමන අරමුණක් අරභයාද කියන එක තවම පැහැදිලි නැහැ. 2022 අංක 41 දරන පනත ගෙනැල්ලා තිබෙන්නේ කුමක් හේතුවෙන්ද කියන එක දන්නේ නැහැ. ඒ කොහොම වුණත්, සමහර ඒවා ගළපා ගන්න පුළුවන්. දැන් මේ විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරනකොට අපි කථා කළා, මුළු රටම මත්ද්‍රව්‍ය උවදුරට ලක්වෙලා තිබෙනවාය කියලා; අපේ රටට ලොකු අභියෝගයක් වෙලා තිබෙනවාය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2021 අවුරුද්දේදී මත්ද්‍රව්‍ය පාවිච්චි කරන අවුරුදු 14ට අඩු දරුවනුත් අහු වෙලා තිබෙනවා. 2022 වසරේදීත් අවුරුදු 14ට අඩු, මත්ද්‍රව්‍ය පාවිච්චි කරන දරුවන් අපේ රටේ ඉඳලා තිබෙනවා. කුඩාම දරුවන්ගේ සිට, පාසල් ශිෂ්‍යයන්ගේ සිට වැඩිහිටියන් දක්වා මේ මත්ද්‍රව්‍ය උවදුරෙන් දැඩි ලෙස ආක්‍රමණය කරමින් තිබුණා.

ඒ වාගේම සමහර පක්ෂත් මේ මත්ද්‍රව්‍ය උවදුරෙන් ආක්‍රමණය කළාද කියලාත් හිතෙනවා. ඔය කථා කළ සමහර මන්ත්‍රීවරුන්ගේ පක්ෂවල, සමහර නායකයන්ගේ පක්ෂවල ආසන සංවිධායකයෝ අහු වුණා, මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයින් එක්ක ඩීල් දමලා. ආසන සංවිධායකයෝ! මීට කලින් අපේ නියෝජ්‍ය ඇමතිතුමා කියපු විධියට සමහර අය ගිහිල්ලා බදා වැලඳ ගත්තා. ප්‍රාදේශීය සභාවට - පළාත් පාලන ආයතනයට - ඡන්දය ඉල්ලපු අපේක්ෂකයෝ අහු වුණා, කන්ටේනර් පිටින් ගෙවල් අස්සේ භංගාගෙන ඉඳලා. ඒ නිසා මේගොල්ලන්ට ඒවාත් එක්ක ඉතා සමීප අන්තර් සම්බන්ධයක් තිබෙනවා. ඒ නිසා තමයි සමහර විට අද දවසේ අපට මේ සංශෝධනය කරන්න වෙන පනත එන්න ඇත්තේ.

අද දවසේ සංශෝධනය වෙන්නේ මොකක්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අපේ රටේ ඕනෑ තරම් මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් වෙනවා. ඒ සැලකිය යුතු ප්‍රමාණයක් අත්අඩංගුවට ගන්නේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච පුද්ගලයන් අතරින්. ඒ අතරේ යම් යම් ජාවාරම් ඔවුන් අතර සිද්ධ වෙන්න පුළුවන්. ඔවුන් මහා පරිමාණ ජාවාරම්කරුවන් නොවෙයි. ඔවුන් ගම්වල ඉන්න, නගරයේ ඉන්න, ඉතාම පහළ ආර්ථික මට්ටමක්, සමාජ මට්ටමක්, අධ්‍යාපන මට්ටමක් තිබෙන සාමාන්‍ය පුරවැසියන්. හැබැයි, මොකක් හරි හේතුවක් නිසා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා තිබෙනවා. පසුගිය කාලයේ ඔවුන් අත්අඩංගුවට ගත්තාම ඔවුන්ට මහාධිකරණයෙන් ඇප ගන්න පුළුවන්කම තිබුණා. හැබැයි, සංශෝධනයක් එනවා, මත්ද්‍රව්‍යවල බර ප්‍රමාණය ග්‍රෑම් 10ට වඩා වැඩියි නම්, ඇප ගන්න පුළුවන් අභියාචනාධිකරණයෙන් කියලා. ග්‍රෑම් 10ට වඩා වැඩියි නම්, අභියාචනාධිකරණයෙන් ඇප ගන්න පුළුවන්. හැබැයි, රස පරීක්ෂක වාර්තාව ආවාට පස්සේ ග්‍රෑම් 10ට වඩා අඩුයි නම්, කොහෙන්ද ඇප ගන්නේ කියන ප්‍රශ්නයත් තිබෙනවා. ඒ ප්‍රශ්නය නිසා කාලාන්තරයක් තිස්සේ අපේ රටේ මත්ද්‍රව්‍ය ජාවාරම් සඳහා අත්අංගුවට පත් වෙච්ච සැකකරුවන්, ඒ වාගේම ඔවුන්ගේ පවුල්වල මිනිස්සු දැඩි ලෙස පීඩාවට පත් වුණා. ඒ නිසා එක පැත්තකින් බන්ධනාගාරත් පිරෙමින් තිබුණා. එම නිසා ඇත්ත වශයෙන්ම සංශෝධනය විය යුතු පනතක් තමයි අද දවසේ මේ සංශෝධනය වන්නේ. මේ සංශෝධන අනුව රස පරීක්ෂක වාර්තා එන්න කලින් වුණත්, ආවාට පසුව වුණත් ඇප ගන්න නිශ්චිතතාවක් සහිතව මේ පනත සංශෝධනය වෙනවා. එම නිසා මේ පනත යටතේ යම් පුද්ගලයෙකු අත්අඩංගුවට පත් වුණාට පසුව ඔහු සන්තකයේ තිබුණු මත්ද්‍රව්‍ය ප්‍රමාණයට අදාළව රස පරීක්ෂක වාර්තාව එනවාද, නැද්ද කියන කාරණය මත නොව එම ප්‍රමාණයේ දළ බර මත තමන් ඇප ඉල්ලීම කළ යුත්තේ කුමන අධිකරණයෙන්ද කියන එක තීරණය කරන්න පුළුවන්. ඒ වාගේම එම ද්‍රව්‍යවල ග්‍රෑම් 100කට වැඩි දළ බරක් තිබෙන අවස්ථාවක අභියාචනාධිකරණයෙන් ඇප ඉල්ලීමක් කරලා තිබියදීත් ඒ අතරතුර රස පරීක්ෂක වාර්තාව ඇවිල්ලා තිබුණා වුණත් කිසිදු ව්‍යාකූලතාවක් නැතිව අභියාචනාධිකරණයට බලය ලැබෙනවා, ඒ නඩුව අහලා අදාළ සැකකරුට ඇප ලබා දීමට.

මේ සංශෝධන සඳහා සියලුදෙනා එකඟ වෙලා තිබෙන අතරතුර විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් නැඟුවා. විශේෂයෙන්ම නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා මේ පනත් කෙටුම්පත් ගැන කිසිවක් කථා කරන්නේ නැතිව, කිසිවක් සඳහන් කරන්නේ නැතිව කිව්වා, "මේ පනත් කෙටුම්පත් ගෙනැල්ලා බලමු" කියලා. හරියට එක පාර ලොකු විප්ලවයක් සිදු වෙමින් එන්න නියමිතයි වාගේ දෙයක් තමයි ඔහුගෙන් ප්‍රකාශ වෙන්නේ. "ආ, බලමු මේ පනත් ගෙනැල්ලා! මහ ජනයා පීඩාවට පත් කරන්න, මහ ජනයාව control කරන්න, සාමාන්‍ය මිනිස්සු හිර කරන්න මෙවායින් පුළුවන් වෙයිද කියලා බලමු" කියලා කියනවා, මේ පනත් කෙටුම්පත පෙන්වලා. මේ එක් පනත් කෙටුම්පතකින් කියන්නේ සාමාන්‍ය පුරවැසියෙකු අත්අඩංගුවට පත් වුණාම ඉක්මනින් ඇප ගන්න පුළුවන් ක්‍රමවේදයක්. මේකේ කියන්නේ නඩුවලින් නිදහස් වන ක්‍රමයක් ගැන නොවෙයි. මේක මිනිස්සුන්ගේ පැත්තෙන් හරිම හොඳයි; සැකකරුවන්ටත් හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් සංශෝධන මඟින් ගෙනෙන ඊළඟ වැදගත්ම සංශෝධනය මේකයි. කාලයක් තිස්සේ අපේ රටේ මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගන්නවා. නමුත් එසේ අත්අඩංගුවට ගත්තු සැකකරුවෙකු චූදිතයෙකු වෙලා වරදකරු වීම සඳහා තිබෙන සම්භාවිතාව ගොඩක් අඩුයි. සමහර විට ඒ සඳහා හේතු වනවා අත්අඩංගුවට ගත්තු භාණ්ඩයේ ස්වභාවය, අත්අඩංගුවට ගත්තු විධිය ප්‍රශ්නගත වීම. නමුත්, මෙමඟින් ඉතා හොඳ ක්‍රමවේදයක් හදලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

භාණ්ඩ අත්අඩංගුවට ගත්තු මොහොතේ ඉඳලා එම භාණ්ඩ නිසි පරිදි රස පරීක්ෂකවරයා වෙත යන තැන දක්වාත්, රස පරීක්ෂකවරයාගෙන් නැවත මහෙස්ත්‍රාත් අධිකරණයට හෝ මහාධිකරණයට පැමිණෙන අවස්ථාව දක්වාත් ඉතාම සුරක්ෂිතව වීඩියෝගත වෙලා, ඡායාරූපගත වෙලා ඒ ඡායාරූපත් අධිකරණයට ලැබිලා ඒ මත ඉතා පැහැදිලි නඩු විභාගයක් සඳහා අවශ්‍ය අවකාශය මේ පනත හරහා හැදිලා තිබෙනවා. මේ පනත හරහා, එක පැත්තකින්, සැකකරුවෙකු වෙලා අත්අඩංගුවට ගත්තු පුද්ගලයකුගේ අයිතිවාසිකම් ආරක්ෂා වෙනවා වාගේම අත්අඩංගුවට පත් වෙච්ච සැකකරුවා සම්බන්ධයෙන් ද පැහැදිලි නඩු විභාගයකට ගිහිල්ලා වැරැදිකරු කිරීම සඳහා තිබෙන සම්භාවිතාවත් ඉතා හොඳින් තිබෙනවා. නිවැරැදිකරු වීම සඳහාත් ඒ හා සමානව පැහැදිලි, හොඳ අවකාශයක් තිබෙනවා. ඒ අනුව, සාධාරණ නඩු විභාගයක් සඳහා මෙම පනත් ඉතාම වැදගත් කියන පැහැදිලි කිරීම කරමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.41]

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ (සංශෝධන) පනත් කෙටුම්පත් යටතේ ප්‍රධාන කාරණා දෙකක් සංශෝධනයට භාජන වෙනවා. මේ සංශෝධනවල අරමුණ මේකයි. අපි පසුගිය වසර දෙක පුරාවටම අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය අනුව යමින් විෂ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් රට පුරා දැවැන්ත මෙහෙයුමක් ක්‍රියාත්මක කළා. ඒ මෙහෙයුමට අදාළව අපට අවශ්‍ය වුණා, එක පැත්තකින් අණ පනත් සංශෝධනය කරලා, විෂ මත්ද්‍රව්‍ය වැටලීම් කරලා සැපයුම් ජාලය අඩාළ කරන්න වාගේම විෂ මත්ද්‍රව්‍ය හරහා රටේ ඇති වෙලා තිබෙන මේ ව්‍යසනකාරී තත්ත්වයෙන් ජනතාව මුදා ගන්න, දරුවන් මුදා ගන්න, අනාගත පරපුර මුදා ගන්න. ඒ සඳහා වූ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන අතරතුර අපි දැකපු ප්‍රධාන ගැටලු දෙකක් මුල් කර ගනිමින් තමයි අද දින මේ සංශෝධන පනත් කෙටුම්පත් දෙක විවාදයට ගනු ලබන්නේ.

කාලයක් තිස්සේ ජනතාව තුළ සැකයකට භාජන වෙලා තිබුණා, අත්අඩංගුවට ගන්නා මත්ද්‍රව්‍ය නැවත සමාජගත වෙනවාද කියලා. ඒ තරමටම මත්ද්‍රව්‍ය දිගින් දිගටම සමාජගත වෙලා තිබුණා. අපි පසුගිය වසර දෙක පුරාවටම වරින් වර ඒ මත්ද්‍රව්‍ය විනාශ කළා, ඒ නඩු කටයුතු අවසන් වුණාට පසුව. නමුත් අපට අවශ්‍ය වුණේ ඒවා දීර්ඝ කාලයක් රඳවා තබා ගැනීමට වඩා යම් ක්‍රමවේදයක් සකස් කරලා, ඉතාම කෙටි කාලයක් තුළ රස පරීක්ෂක වාර්තා ලබා ගන්නා ක්‍රමවේදයකට යෑම සහ අත්අඩංගුවට ගන්නා විෂ මත්ද්‍රව්‍ය එම කාලය අතරතුර විනිවිදභාවයකින් යුතුව විනාශ කිරීමයි. මොකද, මේ සමාජයේ ඒ සම්බන්ධයෙන් කතිකාවක් ඇති වෙලා තිබෙනවා. ඒ හින්දා මේ පනතෙන් ඒ කටයුත්ත සඳහා ඉඩ කඩ ලැබෙනවා. මාස දෙකක් වැනි කෙටි කාලයක් තුළ රස පරීක්ෂක වාර්තාව ලබා ගන්නත්, අත්අඩංගුවට ගන්නා දෑ ඒ කාලය ඇතුළත විධිමත්ව සුරක්ෂිතව ගබඩා කරන්නත්, ඒවා වීඩියෝගත කරන්නත්, - පොලිසිය ඒවා අත්අඩංගුවට ගන්නා අවස්ථාව වීඩියෝගත කරනවා. ඒ වාගේම, රස පරීක්ෂක වෙත භාර දුන්නාට පසුව ඒ අවස්ථාවලත් වීඩියෝගත කරනවා - ඊට පසුව රස පරීක්ෂක වාර්තා ලබා ගන්නත්, යම් සාම්පල් ප්‍රමාණයක් තබා ගන්නත්, ඉතිරි ඒවා විනාශ කරන්නත් අවශ්‍ය ප්‍රතිපාදන හදා ගැනීම තමයි මේ මඟින් කරන්න යන්නේ. මේක එක සංශෝධනයක්. එක පැත්තකින් මේ හරහාත් බන්ධනාගාර තදබදය අඩු වෙනවා. දෙවැනි සංශෝධනය තමයි මේකට සෘජුව බලපාන්නේ. මෙතෙක් තිබුණේ අත්අඩංගුවට ගන්නා අන්තරායදායක ඖෂධයේ බර ග්‍රෑම් 10ට වැඩි නම් අභියාචනාධිකරණය වෙත ගිහින් ඇප අයදුම් කිරීමයි. නමුත්, මේ සංශෝධනය හරහා මහාධිකරණයට ඉඩ කඩ ලැබෙනවා, ග්‍රෑම් 100ට අඩු විෂ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඇප ලබා දීම සිද්ධ කරන්න. බන්ධනාගාර තදබදය අඩු කිරීමට මේ හරහා සුවිශේෂ පිටුවහලක් ලැබෙනවා. ඒ අතරම අපි පසු ගිය කාලය පුරාවටම බන්ධනාගාර තදබදය අඩු කිරීම සඳහා රස පරීක්ෂක වාර්තා විශාල ප්‍රමාණයක් ලබා දීමේ සේවාව කාර්යක්ෂම කරලා තිබෙනවා. ගරු අධිකරණ ඇමතිතුමා ප්‍රකාශ කළ ආකාරයට පසුගිය මාස දෙකට විතරක් රස පරීක්ෂක වාර්තා 14,000කට අධික ප්‍රමාණයක් නිකුත් කරලා තිබුණා. එක පැත්තකින්, දීර්ඝ කාලයක් බන්ධනාගාරගත වීම වැළැක්වීම මෙමඟින් අපේක්ෂා කරනවා. මොකද, සැකකරුවන් හැටියට දීර්ඝ කාලයක් බන්ධනාගාරගත වීම එතරම් සාධාරණ නැහැ. නීතිය ඉදිරියට ගෙනැවිත් වැරැදිකරුවන් කරන තුරු ඔවුන් සැකකරුවන් හැටියට තමයි අපට හඳුනා ගන්න වෙන්නේ. ඒ කර්තව්‍යයත් මේ හරහා සිද්ධ වෙනවා. බන්ධනාගාරවල අධික තදබදය වැළැක්වීමත් මේ සංශෝධන හරහා සිද්ධ වෙනවා.

සමස්තයක් හැටියට ගත්තාම, විශේෂයෙන් මෙහි අරමුණු කිහිපයක් තිබෙනවා. අපි මේ වනකොට අත්අඩංගුවට ගැනීම් වේගවත් කර තිබෙනවා; මහා පරිමාණ අත්අඩංගුවට ගැනීම් සඳහා කටයුතු කර තිබෙනවා; ජාවාරම්කරුවන්ගේ ජාල හඳුනා ගනිමින් ඉන්නවා. ඒ ජාලවල පිරිස් අත්අඩංගුවට ගැනීම් සිදු කරමින් ඉන්නවා. ඒ වාගේම ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සහ ප්‍රතිකාර වැඩසටහන් සඳහා යොමු කරමින් ඉන්නවා. මත්ද්‍රව්‍ය ආශ්‍රිතව අපරාධ ඇති වී තිබෙනවා වාගේම මත්ද්‍රව්‍ය ව්‍යසනය නිසා රටේ විශාල පිරිසක් ඒවාට ඇබ්බැහි වෙලා ඉන්නවා; දරුවෝ; අනාගත පරපුර මේ ව්‍යසනයේ ගොදුරු බවට පත් වෙලා ඉන්නවා. මේ ව්‍යසනය මේ සමාජයෙන් තුරන් කිරීම තමයි මේ ගන්නා සියලු ක්‍රියාමාර්ගවල අරමුණ වන්නේ, මේ අණ පනත්වල අරමුණ වන්නේ. සාධනීය ක්‍රියාමාර්ග තමයි මේ හැම අණ පනතකම තිබෙන්නේ.

විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු මෙහිදී අදහස් ප්‍රකාශ කළා, මේ ගෙනෙන අණ පනත් සම්බන්ධයෙන්. ජාතික ජන බලවේගය ආණ්ඩුව කිසිදු ජනතා ද්‍රෝහී අණ පනතක් මේ සභාවේ සම්මත කරන්නේ නැහැ. මර්දනකාරී නීති රීති මේ සභාවේ අනුමත කරන්න ජාතික ජන බලවේගය ආණ්ඩුව කිසිසේත් සූදානම් නැහැ. ජනතාවාදී අණ පනත් තමයි අපි අනුගමනය කරන්නේ. අපි

දන්නවා, මත්ද්‍රව්‍ය භාවිතය හරහා මේ රටේ ඇති වී තිබෙන දැවැන්ත ව්‍යසනකාරී තත්ත්වයට දරු පරපුර ගොදුරු වෙමින් සිටින බව. ඔවුන් ඒ ව්‍යසනයෙන් බේරා ගැනීම අපේ එක් කාර්යයක්.

මේ සම්බන්ධව කථා කරන කොට කියන්න ඕනෑ, මත්ද්‍රව්‍ය ජාවාරම පාතාල ක්‍රියාකාරකම් හා ඍජුව සම්බන්ධ වෙලා තිබෙන බව. එය, එක කාසියේ දෙපැත්ත වාගේ තමයි. පාතාල ක්‍රියාකාරකම් හරහා තමයි මේ මත්ද්‍රව්‍ය ජාවාරම සිද්ධ වන්නේ. ඒ හින්දා මේක දෙකක් හැටියට නොව, එකක් හැටියටයි හඳුනා ගන්නේ. එම නිසා මේ අපරාධකාරී සියලු කාර්යයන් මේ සමාජයෙන් තුරන් කිරීම අත්‍යවශ්‍ය කාරණයක්.

සමාජයක් විධියට අපි හැම වෙලාවේම කියනවා, අතීතය දෙස බැලුවාම අප පසු කර ආවේ මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයන් සහ පාතාල අපරාධකරුවන්, එහෙම නැත්නම් සංවිධානාත්මක අපරාධකරුවන් සමඟ ඍජු දේශපාලන සම්බන්ධතා තිබුණු සමාජයක් බව. එහි ප්‍රතිඵලයක් විධියට තමයි වර්තමානය වනකොට මත්ද්‍රව්‍ය ජාවාරම සහ පාතාල ක්‍රියාකාරකම් හරහා මතු වී තිබෙන මේ ව්‍යසනකාරී තත්ත්වය සම්පූර්ණයෙන්ම ඇති වෙලා තිබෙන්නේ.

කුඩු ජාවාරම්කාරයන්ගේ මුදල්වලින් යැපෙන බොහෝ පිරිස් දැන් කලබලයට පත් වෙලා සිටිනවා. මේ සමහර අණ පනත් සම්බන්ධයෙන් ඔවුන් ව්‍යාජ ප්‍රකාශ, සාහසික ප්‍රකාශ නිකුත් කරනවා. අපට අවශ්‍යයි, රටේ අනාගත පරපුර වෙනුවෙන් සද්භාවයෙන් මේ අණ පනත් ගෙනැල්ලා අපරාධකරුවන්ගෙන් මේ සමාජය මුදා ගන්න, යහපත් සමාජයක් රටට දායාද කර දෙන්න, අනාගත පරපුරට යහපත් රටක් දායාද කර දෙන්න. හොඳ සමාජ වටපිටාවක් නිර්මාණය කර දීම අපේ එක අරමුණක්. ඒ අරමුණ වෙනුවෙන් තමයි අප මේ සියලු අණ පනත් ගෙන ඒමට සහ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබෙන්නේ. අපි ඒ සඳහා තීන්දු තීරණ අරගෙන තිබෙනවා. ඒ හින්දා කිසිවෙකුටත් කියන්න බැහැ, වර්තමාන රජය ඒවාට එරෙහිව ක්‍රියාත්මක වන්නේ පටු අරමුණු සහිතවයි කියලා. ඔවුන් අතීතයේ පැවැති දේශපාලන සබඳතා සහිතව මේ පාතාල සංවිධානවල ක්‍රියාකාරකම් වර්ධනය කර තිබුණා. අප දිගින් දිගටම ප්‍රකාශ කරන පරිදි ඔවුන් තමන්ගේ බලය පවත්වාගෙන යෑම සඳහා සංවිධානාත්මක අපරාධ සහ මත්ද්‍රව්‍ය ජාවාරම් භාවිත කර තිබුණා; ඒවායෙන් උපයන මුදල් පාවිච්චි කර තිබුණා. ඒ පිළිබඳව ඇති තරම් උදාහරණ තිබෙනවා. නමුත් අද අප ඒ සියල්ල නතර කරලා, රටේ අනාගත පරපුර වෙනුවෙන් යහපත් සමාජ වටපිටාවක් සකස් කිරීම සඳහායි මේ සියලු ක්‍රියාමාර්ග ගෙන තිබෙන්නේ.

අප බලයට පත් වූ දා සිට ගත වුණු පසුගිය වසර දෙක පුරාවට මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වැටලීම් 5,88,180ක් සිදු කර තිබෙනවා. එමෙන්ම පුද්ගලයන් 5,86,824 දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබෙනවා. අපි එම විමර්ශන ක්‍රියාවලිය වඩාත් වේගවත් කර තිබෙනවා; කාර්යක්ෂම කර තිබෙනවා; පුළුල් කර තිබෙනවා. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට සහ සංවිධානාත්මක අපරාධකරුවන්ට තම උපායමාර්ග අනුව හිතූ හිතූ විධියට මිනිසුන් ඝාතනය කරමින්, ධනය ඒක රාශි කරගෙන සමාජය බියගැන්වීමට තිබූ ඉඩ කඩ අපි සම්පූර්ණයෙන්ම අහුරා තිබෙනවා; ඒ වෙනුවෙන් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ හින්දා තමයි, අපට මේ 5,86,824 දෙනා අධිකරණය ඉදිරියට ගෙනෙන්න හැකියාව ලැබිලා තිබෙන්නේ. මේක බරපතළ ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙන බව මෙයින්ම පෙනෙනවා. සමස්ත වැටලීම් ප්‍රමාණයෙන් 3,04,652ක්ම සිදු කර තිබෙන්නේ, "රටම එකට" ජාතික වැඩ පිළිවෙළ යටතේයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහිදී තව විශේෂ කාරණයක් මතු කිරීමට අවශ්‍යයි. එසේ අත්අඩංගුවට පත්වූවන් අතර අවුරුදු 21ට අඩු ළමුන්ගේ කාණ්ඩයට අයත් 11,970 දෙනෙක් සිටියා. ඒ අතර ගැහැනු ළමයි 233 දෙනෙකුත්, පිරිමි ළමයි 11,737 දෙනෙකුත් සිටියා. මෙය බරපතළ තත්ත්වයක්. වයස අවුරුදු 18ත් 21ත් අතර පිරිමි ළමයි 10,673 දෙනෙකුත්, ගැහැනු ළමයි 216 දෙනෙකුත් සිටියා. එමෙන්ම අවුරුදු 18ට අඩු පිරිමි ළමයි 1,064 දෙනෙකුත් ගැහැනු ළමයි 17 දෙනෙකුත් සිටියා. මේ ව්‍යසනය සෑම සමාජ තලයකටම ව්‍යාප්ත වෙලා තිබෙනවා. වයස් භේදයකින් තොරව පුද්ගලයන් - ළමුන් පවා - ගොදුරු බවට පත් කර ගන්නා ජාවාරමක් බවට මෙය පත්ව තිබෙනවා.

මෙම ජාවාරම් හරහා ඔවුන් විශාල වශයෙන් මුදල් උපයා ගන්නවා; ඒ හරහා සමාජ බලය අත්පත් කර ගන්නවා; ඒ වාගේම, යම් යම් දේශපාලන සබඳතා වැඩිදියුණු කර ගන්නවා. ඒ නිසාම අප බලයට පත් වූ දා සිට සිදු කළ ප්‍රධානතම කාර්යය වුණේ, මත්ද්‍රව්‍ය ජාවාරම් හෝ සංවිධානාත්මක අපරාධ හරහා මොන ආකාරයෙන් කොතරම් මුදල් ප්‍රමාණයක් උපයා ගත්තත්, ඒ කිසිදු මුදලක් ඔවුන්ට පරිහරණය කිරීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ කියන පණිවුඩය ලබා දෙන අණ පනත් මේ පාර්ලිමේන්තුවේදී සම්මත කිරීමයි. අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත අපි සම්මත කළා. ඒ වාගේම, PCID කියලා වෙනම පොලිස් කොට්ඨාසයක්ද පිහිටුවා අපරාධකරුවන්ගේ වත්කම් පිළිබඳ විමර්ශන සිදු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ, ගරු ඇමතිතුමනි.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩියක කාලයක් වැඩිපුර දෙන්න.

ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ, 2024 සැප්තැම්බර් 23වන දිනෙන් පසු මිලියන 13ක වත්කම් නිෂ්ක්‍රිය කර තිබෙනවා. ඒ වාගේම, 2025 වසර තුළ මිලියන 1,834ක වත්කම් ද, 2026 වසරේදී පමණක් මිලියන 8,192ක වත්කම් ද වශයෙන් සමස්තයක් ලෙස මිලියන 10,040ක නීති විරෝධී වත්කම් නිෂ්ක්‍රිය කරලා රජය සතු කර ගන්න අපි මේ වනකොට කටයුතු කර තිබෙනවා. ඒ හින්දා මත්ද්‍රව්‍ය ජාවාරම් හෝ වෙනත් සංවිධානාත්මක අපරාධ ක්‍රියාකාරකම් හරහා මොන තරම් දේපළ අත් පත් කර ගත්තත් ඒවා භුක්ති විඳීමට ඒ කිසිවෙකුටත් ඉඩ කඩ ලැබෙන්නේ නැහැ. අපි ඒ පණිවුඩය මේ සමාජයට දෙන්න අවශ්‍යයි. මොන තරම් මිනී මරලා මොන තරම් දේවල් අත්පත් කර ගත්තත් ඒ අත්පත් කරගත් කිසි දෙයක් ඔවුන්ට භුක්ති විඳින්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. වර්තමාන රජය යටතේ නීති රීති සම්පාදනය කරලා තිබෙනවා, ඒවා රජය සතු කර ගන්න. එසේ කිරීම අවශ්‍යයි. මොකද, ඒවා විවිධාකාර ජාවාරම්වලින් උපයාගත් දේපළ. ඒවා අල්ලස, මත්ද්‍රව්‍ය ජාවාරම, වෙනත් සංවිධානාත්මක අපරාධ ක්‍රියාකාරකම් හරහා, කප්පම් ගැනීම් හරහා, වෙනත් ආකාරයකින් අනීතික ලෙස ඉඩම් අත්පත් කර ගැනීම් හරහා උපයා ගත් ඒවා වෙන්න පුළුවන්. එසේ ඕනෑම අනීතික කටයුත්තකින් යම් දේපළක් අත් පත් කරගෙන තිබෙනවා නම් ඒ සියලු දේපළ රජය සතු කර ගැනීමේ වැඩ පිළිවෙළ ශක්තිමත්ව ක්‍රියාත්මක වෙලා තිබෙනවා; ඊට අදාළ විමර්ශන ක්‍රියාවලිය දියත් වෙලා තිබෙනවා. ඒ අනුව තමයි පසුගිය වසර දෙක තුළ - මේ වන කොට - මිලියන 10,000කට අධික වත්කම් ප්‍රමාණයක් නිෂ්ක්‍රිය කරලා තිබෙන්නේ. අපි එම කටයුතු සිදු කරන අතරතුරදී තමයි පවතින අණ පනත් කිහිපයක් මෙසේ සංශෝධනය කර ගැනීමට අවශ්‍ය වෙලා තිබෙන්නේ.

[ගරු ආනන්ද විජේපාල මහතා]

මෙම ක්‍රමවේදයන් වඩාත් කාර්යක්ෂම කිරීමට, වින්දිතයන්ට වාගේම සැකකරුවන්ට යම් සාධාරණයක් ඉෂ්ට කිරීමට, බන්ධනාගාර තදබදය අඩු කිරීම ඇතුළුව යුක්තිය පසඳලීමේ සමස්ත ක්‍රියාවලියම කාර්යක්ෂම කිරීමට තමයි මෙම සංශෝධන ගෙනැවිත් තිබෙන්නේ.

මෙහිදී විපක්ෂය පැත්තෙන් තවත් විශේෂ චෝදනාවක් මතු වුණා, පොලීසිය දේශපාලනීකරණය කරනවා කියලා. ඔවුන්ගේ පාලන කාලවලදී තමයි පොලීසිය දේශපාලනීකරණය කරලා තිබුණේ. ඒක මේ රටේ කවුරුත් දන්නවා. ඒක වෙන වෙනම කියන්න අවශ්‍ය නැහැ. දේශපාලනීකරණය කරලා තිබුණු පොලීසිය අපි දේශපාලනීකරණයෙන් මුදාගෙන තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එසේ මුදා ගැනීමේ ප්‍රතිඵලයක් හැටියට තමයි පොලීසිය කාර්යක්ෂමව මේ විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් කරලා තරාතිරම නොබලා අදාළ අය නීතියේ රැහැනට හසු කර ගන්න අවශ්‍ය පියවර අරගෙන තිබෙන්නේ. එකී කාර්යය තමයි මේ ක්‍රියාකාරකම් හරහා සිද්ධ වෙන්නේ. අනාගත පරපුර මේ මත්ද්‍රව්‍ය ව්‍යවසනයෙන් බේරා ගැනීම වෙනුවෙනුයි මේ දැවැන්ත මෙහෙයුම දියත් කරලා තිබෙන්නේ; මත්ද්‍රව්‍ය ජාවාරම, එහෙම නැත්නම් මත්ද්‍රව්‍ය සැපයුම අඩාළ කරන්න තමයි මේ සියලු මෙහෙයුම් දියත් කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ ශ්‍රී ලංකා පොලීසියටත්, විශේෂ කාර්ය බලකායටත්, ශ්‍රී ලංකා නාවික හමුදාව ඇතුළු ත්‍රිවිධ හමුදාවේ නිලධාරින්ටත් විශේෂ ස්තුතියක් පුද කරන්න අවශ්‍යයි, මේ මත්ද්‍රව්‍ය මෙහෙයුම් වෙනුවෙන්, එහෙම නැත්නම් මේ මත්ද්‍රව්‍ය සැපයුම් ජාල අඩාළ කිරීම වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන්.

ඒ විතරක් නොවෙයි, අනෙක් පැත්තෙන්, මත්ද්‍රව්‍ය සැපයුම අඩාළ කිරීම සඳහා පුනරුත්ථාපන සහ ප්‍රතිකාර ක්‍රම තිබුණාටත් වඩා ශක්තිමත් කරලා තිබෙනවා. පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කරලා තිබෙනවා; දැනුවත් කිරීමේ වැඩසටහන් ශක්තිමත්ව සමාජය තුළ දියත් කරලා තිබෙනවා. මා හිතන විධියට, පසුගිය අවුරුද්ද තුළ මිලියන 3,000කට වැඩි මුදලක් ඒ වෙනුවෙන් වැය කරලා තිබෙනවා. "රටම එකට" ජාතික සභාව සකස් කරලා තල 4ක් ඔස්සේ මේ සමාජය ජාලගත කරලා සංවිධානය කරලා තිබෙනවා. ජාතික සභාව, දිස්ත්‍රික් සභාව හදලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල පදනම් කරගෙන ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු හදලා, බිම් මට්ටමින් මහජන ආරක්ෂක කමිටු 14,150ක් හදලා සමස්ත සමාජය මේ මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව සංවිධානය කරලා තිබෙනවා. එහෙම කරන්න අවශ්‍යයි. මේ රටේ එකදු දරුවෙකුවත් අනාගතයේදී මේ ව්‍යසනයට ගොදුරු නොවන තැනට වගබලා ගන්න ජාතික ජන බලවේගය ආණ්ඩුව අවශ්‍ය සියලු තීන්දු තීරණ ක්‍රියාත්මක කරමින් ඉන්නවා. ඒ සඳහා පොලීසියේ සක්‍රිය දායකත්වය ලබා දීලා තිබෙනවා. ඒ නිසා ඔවුන්ට නැවත නැවතත් මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ ගැනත් කියන්න ඕනෑ. අපි මේ වැඩ පිළිවෙළ දෙස සමස්තයක් හැටියට බලන්න ඕනෑ. එක පැත්තකින්, අණ පනත් සංශෝධනය කරමින්, නීතිය ඉදිරියට වඩා යුක්ති සහගතව ඒ කරුණු කාරණා ඉදිරිපත් කරන ගමන්ම, විමර්ශන ක්‍රියාවලිය පුළුල් කරලා අවශ්‍ය අය නීතියේ රැහැනට හසු කරන ගමන්ම මේ රටට දැවැන්ත විනාශයක් අත්පත් කර දුන් මේ ව්‍යසනයෙන් මේ රට බේරා ගැනීම මොන අභියෝග ආවත් අප අතරමඟ නතර කරන්නේ නැහැ කියන කාරණයත් මේ ගරු සභාවට පසක් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.56]

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய விவாதத் தலைப்புக்கு அப்பால், இன்று பேசுபொருளாக இருக்கின்ற ஒரு விடயம் குறித்து பேச விரும்புகின்றேன். அதாவது, யாழ்ப்பாணம், செம்மணி புதைகுழி சம்பந்தமாக இரண்டு நாட்களுக்கு முன்பு பேராசிரியர் ராஜ் சோமதேவ அவர்கள் வெளியிட்டிருக்கும் அறிக்கை குறித்து, நான் என்னுடைய கட்சி சார்பான உத்தியோகபூர்வ கருத்துகளைப் பதிவு செய்ய விரும்பு கின்றேன். அந்த அறிக்கையின் 17ஆம் பக்கத்தில் இவ்வாறு குறிப்பிடப்பட்டு இருக்கின்றது. அவர் அதனை வலியுறுத்திச் சொல்வதற்காக, எழுத்துகளை underlined and bold செய்திருக்கின்றார். I quote:

> **Nevertheless, the artefacts and associated contextual evidence suggest that the site exhibits greater similarities to contexts characterized by formal burial practices than to clandestine burial sites documented in other parts of the world.** The relatively high density of individual burials does not establish the circumstances under which the deceased were interred. If the concentration of burials resulted from an epidemic or another form of natural catastrophe, a limited assemblage of associated material culture would not necessarily be unexpected."

குறிப்பாகச் சொன்னால், தொற்றுநோய் அல்லது பேரழிவு காரணமாக கணிசமான நபர்கள் உயிரிழந்து அவர்கள் புதைக்கப்படுகின்ற இடத்துடன் செம்மணியில் கண்டறியப்பட்டிருக்கின்ற புதைகுழிகளின் விதம் ஒத்துப்போவதாகவும் அதை நிராகரிப்பதற்கு எந்தவிதமான ஆதாரமும் இல்லை என்ற கருத்தைத் தெரிவித்திருக்கின்றார். இந்தக் கருத்தைத் தெரிவித்திருக்கின்ற அதே பந்தியின் ஆரம்பத்தில் அவர் இவ்வாறு குறிப்பிடுகின்றார். I quote:

> "The assemblage of material evidence documented in this report is insufficient, in isolation, to support a definitive conclusion regarding the nature and character of the burials investigated."

அப்படியென்றால், இதுவரைக்கும் கண்டறியப்பட்டிருக் கின்ற எலும்புக்கூடுகள் தொடர்பாக, தங்களுடைய நிபுணத்துவக் குறைபாடு காரணமாகவும் இன்னும் ஆராய்ச்சிகள் மேற்கொள்ளப்பட இருக்கின்ற காரணத் தினாலும் திட்டவட்டமாக முடிவுகளை எடுக்க முடியாது என்ற கருத்தை ஆரம்பத்தில் குறிப்பிட்டுவிட்டு, பின்னர் தொற்றுநோயால் அல்லது இயற்கைப் பேரழிவால் அது நடைபெற்றிருப்பதுபோன்ற கருத்தைப் பதிவு செய்துள்ளார். பேராசிரியர் என்று சொல்லப்படுகின்ற ராஜ் சோமதேவ அவர்கள் எந்த அடிப்படையில் இந்தக் கருத்துகளைப் பதிவு செய்திருக்கின்றாரென்ற கேள்வியை நாங்கள் கேட்க விரும்புகின்றோம். அதன் சாரம்சத்தை 17ஆவது பக்கத்தில் அவர் தெரிவித்திருந்தாலும், அவ்வறிக்கையின் எந்தவோர் இடத்திலும் அதனை உறுதிப்படுத்தக்கூடிய வகையில் ஆதாரங்களைச் சமர்ப்பிக்காமல், 'இறுதி முடிவுக்கு வரமுடிய வில்லை' என்று சொல்லிவிட்டு, தனது கருத்தை அழுத்திச்

சொல்கின்ற வகையில் குறிப்பிட்டிருக்கின்றார் என்றால், அவருடைய நிகழ்ச்சிநிரல் சம்பந்தமாக நாங்கள் கேள்விக்குட் படுத்துகின்றோம் என்பதை நான் தெளிவாக இந்த இடத்தில் சொல்ல விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இது அவரின் 4ஆவது அறிக்கை. இதற்கு முன்பு அவர் 3 அறிக்கைகளை வெளியிட்டு இருக்கின்றார். 1ஆவது அறிக்கையில், "Observations" என்ற பெயரில் அவர் இவ்வாறு குறிப்பிடுகின்றார். I quote:

"2. The skeletons were found in a disorganized and scattered arrangement, lacking any consistent orientation, particularly with respect to the alignment of the crania. This absence of systematic positioning suggests a deviation from conventional burial practices.

3. Notably, there was a complete absence of clothing remnants or associated personal artifacts, such as buttons or pins. This observation raises the possibility that such items were deliberately removed prior to interment, potentially reflecting an attempt to conceal identity or obscure contextual information.

4. These observations collectively support the hypothesis that the trench constitutes a mass grave."

அதாவது. 'ஒரு பாரிய புதைகுழி' என்ற கருத்தைத் தெளிவாக முதலாவது அறிக்கையில் குறிப்பிட்டு இருக்கின்றார். 2ஆவது அறிக்கையில் அவர் இவ்வாறு குறிப்பிடுகின்றார். It states, I quote:

"Substantial evidence gathered over the 25-day excavation strongly suggests that the burials unearthed represent a mass grave. A key indicator supporting this interpretation is the manner in which the deceased were treated during interment."

"At the Chemmani site, the absence of consistent body orientation, lack of associated grave goods, and the apparent disregard for formal burial conventions collectively suggest that the interments were not intended to honor the deceased in a culturally meaningful way. Rather, the burial morphology supports the hypothesis that these individuals were disposed of hastily, and possibly under coercive or violent circumstances, aligning with known characteristics of mass graves associated with human rights violations."

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இது அவரின் சொந்த அறிக்கை. 3ஆவது அறிக்கையில் அவர் இவ்வாறு குறிப்பிட்டு இருக்கின்றார். It states, I quote:

"Mathematically, the putative norm for an individual burial pit is approximately 4 ft (1.21 m) in width, 6 ft (1.82 m) in length, and 6 ft (1.82 m) in depth. Using this standard, the horizontal space required for 141 formal burials would be:
4 ft × 6 ft × 141 = 3,384 sq ft, which is equivalent to approximately 310.5 square meters."

It further states, I quote:

"In the present case, however, the allocation ..... roughly half the expected area. From a cultural standpoint, this spatial... could suggest a reduced priority given to providing the deceased with the conventional... and space associated with formal interment. While the reasons for this restriction remain... it may relate to the social standing of the individuals at the death or the circumstances of death."

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அவர் மேலதிகமாக இவ்வகையிலே வலியுறுத்துகின்றார். It states, I quote:

"The absence of clothing in 96% of the human skeletons unearthed from trench 1 constitutes a significant and puzzling observation. Clothing is recorded only in association with skeletons that can be identified as formal disposals (Type I burials), while the vast majority of burials show no such evidence."

இன்னோர் இடத்திலே அவர் இவ்வகையில் குறிப்பிடுகின்றார்.

"The scientific understanding of textile preservation in burial contexts suggests that the absence of clothing associated with the majority of human remains in Trenches 1 and 2 cannot be attributed solely to natural decomposition processes. Rather, the lack of clothing is more plausibly linked to either the practice of interment without body clothing or the deliberate removal of garments prior to burial."

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இவை எல்லாமே அவருடைய சொந்த முடிவுகளாகவே இருக்கின்றன. தமிழீழ விடுதலைப் புலிகள் இயக்கம், தமிழ்த் தேசியவாத அரசியல் தரப்புகள் மற்றும் அரசாங்கத்தை விமர்சிக்கின்ற தரப்புகளுடைய கருத்துகளை ஒரு பக்கம் விட்டுவிட்டு, தமிழீழ விடுதலைப் புலிகளையும் தமிழ்த் தேசியவாதத்தையும் கடுமையாக விமர்சித்த தரப்புகளும்கூட செம்மணிப் புதைகுழி விவகாரம் தொடர்பாகக் கருத்துகள் தெரிவித்திருக்கின்றன. அதில் மிக முக்கியமான தரப்பாக, UTHR(J) என்ற ராஜன் ஹூல் என்ற பேராசிரியருடைய தலைமையில் இயங்கிய ஒரு குழு 1999ஆம் ஆண்டு செம்மணி தொடர்பாக வெளியிட்ட ஓர் அறிக்கையிலே இவ்வாறு குறிப்பிட்டிருக்கின்றது.

"According to the UTHR(J), 'What we reliably understand was the context in which Krishanthi's murder took place on 7th September, 1996. Pungankulam army camp was a main camp east of Jaffna City that controlled Chemmani point where the murder took place. Persons detained over a large area were first brought to Pungankulam camp, where a decision was taken what to do with them. Many were then sent to the Intelligence Camp in Ariyalai East, which is quite near Chemmani, the whole comprising a largely uninhabited area. Here the prisoners were tortured, and we are yet to hear of survivors. On regular occasions the men at Chemmani point would be alerted during the night. The naked corpses of detainees tortured and killed at the Intelligence Camp were then taken to Chemmani in a vehicle, for the men at the point to assist in burial.'

கண்டுபிடிக்கப்பட்ட உடல்களில் 96 சதவீதமானவை ஆடை இல்லாமல் புதைக்கப்பட்டிருப்பதாக ராஜ் சோமதேவவின் அறிக்கையில் உறுதிப்படுத்தப்பட்டு இருக்கின்றது. அது எப்படியென்றால், campக்குள் வைத்துத் திட்டமிட்டு ஆட்களைக் கொலைசெய்து, அங்கிருந்து ஆடை இல்லாமல் செம்மணிக்குக் கொண்டுபோய் புதைத்ததாக தமிழீழ விடுதலைப் புலிகளுக்கு எதிராகவும், தமிழ்த் தேசியவாதத்துக்கு எதிராகவும் கருத்துகளைப் பதிவுசெய்கின்ற தரப்புகள் 1999ஆம் ஆண்டிலேயே தெளிவாகச் சுட்டிக்காட்டி இருக்கின்றன. அதுமட்டுமல்ல, இந்த நாட்டினுடைய மனித உரிமைகள் ஆணைக்குழு அண்மைக் காலத்தில் சென்று பார்த்திருந்ததன் அடிப்படையில் இவ்வகையில் குறிப்பிட்டு இருக்கின்றது. It states, I quote:

Based on the preliminary feedback of the experts working at the site, the HRCSL learnt that over 90 per cent of the human remains found at the site had no form of clothing whatsoever. It was also observed that, given the positioning of the skeletal remains, including the fact that some remains were in extreme proximity to one another, and the shallow depth of the remains, there is a reasonable likelihood that the burials were unlawful and pursuant to extrajudicial killings."

இது இந்த நாட்டினுடைய மனித உரிமைகள் ஆணைக்குழுவின் அறிக்கை!

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ராஜ் சோமதேவ ஒரு நிகழ்ச்சிநிரலோடு இயங்குகின்றார் என்பதே தமிழ்த் தேசியப் பேரவையினுடைய நிலைப்பாடு! அவருடைய

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

කඩන්ත කාලච් චෙයර්පාඩුකළ් තොඩර්පාක නාංකළ් තෙළිවාකච් චුට්ටික්කාට්ටි ඉරුක්කින්රෝම්. කෝට්ටාපය රාජපක්ෂ කිළක්කු මාකාණත්තිලේ තොල්පොරුළ් ආය්වු තොඩර්පාන කුළුවොන්රෙ නියමිත්තපොළුතු, රාජ් සෝමදේවවෙයුම් අතිල් ඔර් උරුප්පිනරාක නියමිත්තිරුන්තාර්. අවර් ඔරු සුත්ත සිංකළ - පෞත්ත දේසියවාති! අන්ත වකෙයිල්, අවර් ඔරු නිකළ්ච්චිනිරලිලේ ඉයංකුකින්රාර් එන්පතු ඉන්රෙක්කු තෙරියවන්තු ඉරුක්කින්රතු.

චෙම්මණිප් පුතෙකුළි විවකාරම් තොඩර්පාක නඩක්කින්ර විසාරණෙකළෙ ඉන්ත නාට්ටුක්කුළ්ළේ චෙය්ය මුඩියාතු එන්පතෙ නාංකළ් තොඩර්ච්චියාකක් කුරිප්පිට්ටු වරුකින්රෝම්. නීංකළ් උණ්මෙයාකවුම් නේර්මෙයාකවුම් නඩන්තුකොළ්ළ විරුම්පුකින්රීර්කළ් එන්රාල්, අරසාංකම් සර්වතේස කුට්රවියල් විසාරණෙක්කු ඉණංක වේණ්ටුම්. ඒනෙන්රාල්, ඉන්තක් කුට්රත්තෙච් චෙය්තවර්කළ් තනිත්තුච් චෙය්යවිල්ලෙ. ඔරු මනෝනිලෙතාන් අතනෙච් චෙය්වතර්කාන එර්පාට්ටෙ එර්පඩුත්තික් කොටුත්තතු. ආකවේ, ඉතෙ විළංකික්කොළ්ළ වේණ්ටුම්. සර්වතේස කුට්රවියල් විසාරණෙ ඔන්රුක්කු නීංකළ් ඉණංකාමල්, ඉතන් උණ්මෙයෙක් කණ්ටරියවේ මුඩියාතු එන්පතෙ නාන් චුට්ටික්කාට්ටුකින්රේන්.

තයවුචෙය්තු, ඉන්රෙක්කාවතු උංකළුටෙය කණ්කළෙත් තිරවුංකළ්! කිට්ටත්තට්ට 600 උටල්කළ් ඉප්පොළුතු කණ්ටුපිටික්කප්පට්ටු ඉරුක්කින්රන එන්රුම් ඉන්නුම් 600 උටල්කළ් අංකේ ඉරුප්පතාකවුම් කුරිප්පිටප්පටුකින්රතු. නීංකළ් ඉනවාතිකළ් ඉල්ලෙ එන්රු නිරූපිප්පතාක ඉරුන්තාල්, ඉතර්කු මුතල් ආට්චි චෙය්තවර්කළිටම් ඉරුන්තු මාරුපට්ටවර්කළ් එන්පතෙ නීංකළ් නිරූපිප්පතාක ඉරුන්තාල්, චෙම්මණිප් පුතෙකුළි විවකාරත්තිල් ඔරු පාරතූරමාන කුට්රම් නටෙපෙට්රිරුක්කින්රතු එන්ර අටිප්පටෙයිල්, තමිල් මක්කළුක්කු මිකත් තේවෙප්පටුකින්ර විෂයත්තිලේ අක්කරෙ චොල්ලුත්ති, තයවුචෙය්තු නීංකළ් ඉන්ත විටයත්තිලාවතු සර්වතේස විසාරණෙයෙත් තටුක්කාතු අතර්කු ඉණංක වේණ්ටුම් එන්රු කේට්ටුක්කොළ්ළ විරුම්පුකින්රේන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දීප්ති වාසලගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.12]

ගරු දීප්ති වාසලගේ මහත්මිය
(மாண்புமிகு (திருமதி) தீப்தி வாசலகே)
(The Hon. (Mrs.) Deepthi Wasalage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත් පිළිබඳව විවාදයට ගන්නා මේ අවස්ථාවේදී ශ්‍රී ලංකාවේ කාන්තා පරපුර නියෝජනය කරන කෙනෙකු වශයෙන් මේ මන්ද්‍රව්‍ය ව්‍යසනය පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම සම්බන්ධයෙන් මා සතුටු වනවා. අපේ සමාජය ගත්තාම පාසල් දරුවන්, විශ්වවිද්‍යාල දරුවන් ඇතුළු තරුණ තරුණියන් අතරේ සහ මුළු සමාජය පුරාම දැඩි ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙන මන්ද්‍රව්‍ය උවදුරෙන් පීඩාවට පත් වෙලා තිබෙන කෙනා තමයි කාන්තාව. මොකද, අපේ රටේ අම්මාවරු තමන්ගේ දරුවෝ පිළිබඳව භයෙන් ඉන්නේ. කොයි මොහොතක හෝ තම දරුවන් මන්ද්‍රව්‍ය ව්‍යසනයට ගොදුරු වෙයිද කියන භයෙන් තමයි ඔවුන් ඉන්නේ. ඒ වාගේම තරුණ කාන්තාවන් තමන්ගේ ස්වාමි පුරුෂයින් මන්ද්‍රව්‍ය උවදුරට ගොදුරු වීම නිසා පවුල් ජීවිතය අවුල් වෙලා විශාල වශයෙන් දුකට පත් වෙලා තිබෙන අවස්ථා අපට හමු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී කථාවක් කියන්න කැමැතියි. මගේ දිස්ත්‍රික්කයේ මම හඳුනන යෙහෙළියක් ඉන්නවා. ඇයගේ දරුවා හොඳ පාසලකින් අධ්‍යාපනය ලබා, විශ්වවිද්‍යාල අධ්‍යාපනයත් ලැබුවා. දරුවා අයිස් මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වීම නිසා ගෙදර කලහකාරී තත්ත්වයක් ඇති වෙලා, ඒ අම්මා කොහොම හරි ඒ දරුවාව වෛද්‍යවරයෙක් ළඟට අරගෙන ගිහින් තිබෙනවා. එවිට එම වෛද්‍යවරයා ඒ දරුවාව පුනරුත්ථාපනය කරන්න ඕනෑය කියලා පුනරුත්ථාපන මධ්‍යස්ථානයකට යොමු කළාම එම දරුවා මානසික ආබාධක් තිබෙන බව රහ දක්වමින් පුනරුත්ථාපනය වීමේ ක්‍රියාවලියෙන් බැහැර වීමට උත්සාහ කර තිබෙනවා. ඒ අම්මා ඇත්තටම මගේ යෙහෙළියක්. ඒ අම්මා කථා කරලා මට කිව්වා, දරුවා කොහොම හරි පුනරුත්ථාපනය කරලා එවන්න, පුනරුත්ථාපනය කිරීමෙන් තොරව ගෙදර එවන්න එපා, ඒකට මට උදවු කරන්න කියලා. "මට පැය දෙකකට ගෙදර ගිහිල්ලා එන්න දෙන්න අම්මා මරලා එන්න, මොකද අම්මා තමයි මාව පුනරුත්ථානය කරන්න මෙතැනට අරගෙන ආවේ, අම්මාව මරලා එන්න මට පැය දෙකකට ගෙදර ගිහිල්ලා එන්න අවස්ථාවක් සලස්වලා දෙන්න" කියලා ඒ දරුවා කියා තිබෙන බව ඒ අම්මාට ආරංචි වෙලා තිබෙනවා. ඒ වාගේ ඉතා දුක්ඛිත කථා තමයි අපේ සමාජය තුළදී අපට අහන්නට ලැබෙන්නේ. ඒ අම්මා ඇඬුවා, මට කොහොම හරි දරුවාව පුනරුත්ථාපනය කරලා දෙන්න උදවු කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන දිනවලදී අපි දකිනවා, මත්ද්‍රව්‍ය උවදුර නිසා තමන්ගේ පවුල් ජීවිතය කඩා වැටුණු තරුණ අම්මලා අතින් කටින් කුඩා දරුවෝ එල්ලාගෙන ඇවිල්ලා කොයි තරම් අඩා වැටෙනවාද කියලා. ඇත්තෙන්ම මෙය කාලෝචිත මාතෘකාවක් පිළිබඳව කථා කරන අවස්ථාවක්. මත්ද්‍රව්‍ය ව්‍යසනය මේ තරම් දුරට අපේ සමාජය වසා ගත්තේ කොහොමද කියලා අපි හිතලා බැලුවොත්, එයට ඕනෑ තරම් උදාහරණ තිබෙනවා. අද විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් කථා කරන්නේ ජාතික ජන බලවේගය ආණ්ඩුවේ මේ අවුරුදු දෙක ඇතුළත මත්ද්‍රව්‍ය ව්‍යසනය ව්‍යාප්ත වුණු හැටියටයි. ඒක තමයි ඒගොල්ලන්ගේ අදහස. නමුත් අපි දන්නවා, පසුගිය දේශපාලන ඉතිහාසය තුළ පාතාලය, මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයින් සහ දේශපාලනය අතර එකිනෙකට බැඳුණු සම්බන්ධතාවක් තිබුණු බව; බල අධිකාරී තුනක් එකට ගියා. දේශපාලන රැකවරණය මත්ද්‍රව්‍ය ව්‍යාපාරයට ලැබිලා තිබුණු බවට අපට හොඳ උදාහරණ මේ සමාජය තුළ දකින්න ලැබී තිබෙනවා. හිටපු අධිකරණ ඇමතිවරුන්ගේ පුත්තු, ඒ වාගේම සමහර පක්ෂවල ආසන සංවිධායකවරු, හිටපු නාගරික මන්ත්‍රීවරු විශාල වශයෙන් මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයින් සමඟ ගනුදෙනු කිරීම නිසා නීතියේ රැහැනට කොටු වුණු අවස්ථා අපි දැක්කා.

අපේ ආණ්ඩුව පත් වෙලා අවුරුදු දෙකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම විපක්ෂයට කියනවා, අපේ ආණ්ඩුවේ මන්ත්‍රීවරු 159දෙනාගෙන් එක්කෙනෙක්වත් කිසිම මොහොතක මත්ද්‍රව්‍ය ව්‍යසනයට සම්බන්ධ වෙලා තිබෙනවාය කියලා කොතැනකදීවත් වාර්තා වුණාද කියලා හොඳට හිතා බලන්න සහ හොඳට කල්පනා කර බලන්න කියලා. අපට සැබෑ ඕනෑකමක් තිබෙනවා, මේ ශ්‍රී ලාංකික ජනතාවට ආරක්ෂිත සමාජයක් හදා දෙන්න. එම නිසා මේ මන්ත්‍රීවරු කිසි කෙනෙක් කිසිම දවසක

පොලීසිය ඇතුළු ආරක්ෂක අංශවලට කථා කරලා නැහැ, අත්අඩංගුවට පත් වුණු කෙනෙක් නිදහස් කරන්න සහ ආරක්ෂා කරන්න කියලා. හිටපු දේශපාලන අධිකාරිය තුළ දේශපාලකයින් විසින් තමයි මත්ද්‍රව්‍ය ව්‍යාපාරයට රැකවරණය දුන්නේ. පාසල් යන කුඩා දරුවන්ගේ පොත්පත් අස්සේ, පොත් බෑග්වල මත්ද්‍රව්‍ය හොයනකොට ඒ ව්‍යාපාරිකයින් දේශපාලකයින්ගේ තුරුල්ලේ සැඟවිලා හිටපු විධිය අපි කාලයක් දැක්කා. ඒ නිසා මම හිතනවා, මේ මත්ද්‍රව්‍ය ව්‍යාපාරය මේ රටින් තුරන් කිරීම සඳහා අපට විශාල කර්තව්‍යයක් පැවරී තිබෙනවාය කියලා. අද දින මේ පනත් කෙටුම්පත් සම්මත කරනු ලබන්නේද ඒ වෙනුවෙන් කියලා මම ඉතාම ඝතුවින් කියනවා.

අපේ රටේ කාන්තාවන්ට ආරක්ෂාකාරීව ජීවත් වීම සඳහා මේ ව්‍යසනය මේ රටෙන් තුරන් විය යුතුමයි. අපි ආණ්ඩුවක් වශයෙන් මත්ද්‍රව්‍ය ව්‍යසනය තුරන් කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. අපට කිසිසේත්ම ඕනෑකමක් නැහැ, මේ මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයින් ආරක්ෂා කර ගැනීමට. අපි කිසි දවසක දේශපාලන ඉතිහාසය තුළ දැකලා නැහැ, මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයින්ගේ දේපළ රාජසන්තක වෙනවා. මම නියෝජනය කරන ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයෙකුගේ රුපියල් කෝටි ගණනක දේපළ මෑතකදී රාජසන්තක කරනවා මම සියැසින් දැක්කා. මේවා ඉතාම සුබදායක ලකුණු අපේ රට හොඳ ගමනකට යනවා කියන එක පෙන්වන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ජනාධිපතිතුමා මම හිතන්නේ මත්ද්‍රව්‍ය මේ රටින් තුරන් කිරීම වෙනුවෙන් ප්‍රමුඛ කාර්යයක් ඉටු කරනවා. ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් අපේ මහජන ආරක්ෂක ඇමතිතුමා, ජනාධිපති ලේකම්තුමා, විවිධ අමාත්‍යාංශවල ලේකම්වරු, ආගමික නායකයින්, විවිධ ජන කොටස්වල නියෝජනය කරන සිවිල් සංවිධාන එකතු වෙලා ජාතික මෙහෙයුම් සභාවක් හදලා, අපේ රටින් මේ ව්‍යසනය නැති කිරීම සඳහා කටයුතු කරමින් සිටිනවා. මම දන්නවා, අපේ මහජන ආරක්ෂක ඇමතිතුමා, නියෝජ්‍ය ඇමතිතුමා ලංකාවේ දිස්ත්‍රික්ක පුරා ගිහිල්ලා, දිස්ත්‍රික් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු සකස් කරලා, ඒ පිළිබඳව සාකච්ඡා කළ බව. හැබැයි, මේවා කරන්න කලින් හිටපු දේශපාලන අධිකාරියට ඕනෑකමක් තිබුණා කියා අපි දැක්කේ නැහැ. ඒ වාගේම ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු අපි හදලා තිබෙනවා. මහජන ආරක්ෂක කමිටු හදලා තිබෙනවා. අපට ඕනෑකම තිබෙන්නේ මේ මත්ද්‍රව්‍ය ව්‍යසනය මේ රටින් තුරන් කිරීම සඳහා සැබෑවටම ක්‍රියා කරන්නයි.

ඒ වාගේම මේ අවස්ථාවේදී විශේෂයෙන් අපේ රටේ ජනාධිපතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා, එතුමාගේ මේ මහ පෙන්වීම අපේ රටේ දරුවන් වෙනුවෙන් කරන මහඟු ඵලදායී ක්‍රියාවලියක් නිසා. මහජන ආරක්ෂක ඇමතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා, මේ ව්‍යසනය සම්බන්ධයෙන් දේශපාලනික වශයෙන් සම්බන්ධ නොවී සැබෑ ඕනෑකමින් නීතියට ක්‍රියාත්මක වීමට නිදහස ලබා දීලා, නීතිය හරියට ක්‍රියාත්මක කරලා, නීතියේ විධානය හැම තැනම පතුරුවලා මේ මත්ද්‍රව්‍ය ව්‍යාපාරය මේ රටින් තුරන් කිරීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ගයට. ඒ සම්බන්ධයෙන් මේ රටේ සියලු ජනතාව ඒකමතිකව ඔබත් සමඟ සිටිනවා කියන කාරණයත් මම මේ අවස්ථාවේදී මතක් කර සිටිනවා.

අපි දන්නවා, අපට ඕනෑ පොහොසත් රටක් බව. පොහොසත් රට කියන්නේ, ආර්ථිකව පොහොසත් වුණු රටක් පමණක් නොවෙයි, ආකල්පවලින් පොහොසත් වුණු රටක්. එවැනි රටක් අපි හදන්න ඕනෑ. ආකල්පවලින් පොහොසත් වුණු රටක් හදන්න නම් මේ මත්ද්‍රව්‍ය ව්‍යසනය මේ රටෙන්, මේ සමාජයෙන් තුරන් කළ යුතුයි. ඒ වෙනුවෙන් කළ හැකි සියලු ක්‍රියාමාර්ග සඳහා ජාතික ජන බලවේගය ආණ්ඩුවේ ජනාධිපතිතුමා, අගමැතිතුමිය, කැබිනට් අමාත්‍යවරු, මන්ත්‍රීවරු යන මේ සියලු දෙනා එකට අත්වැල් බැඳගෙන කටයුතු කරනවා. ඒ වාගේම කිසිසේත්ම පසුබසින්නේ නැතුව මේ ව්‍යසනය මේ රටින් අතු ගා දැමීමට මේ සියලුදෙනා ක්‍රියා කරන බවත් කියමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කේ. සුජීත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

[අ.භා. 3.20]

ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විවාදයට ගැනෙන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් අදහසක් දක්වන්න ලැබීම ගැන මම ඝතුටු වෙනවා. විශේෂයෙන් මේ පනත් සංශෝධන අපි දකින්නේ ඉතාම කාලෝචිත සංශෝධන හැටියටයි. ඇත්තවශයෙන් මීට අවුරුදු දෙකකට විතර ඉස්සෙල්ලා හරි මේ පනත් කෙටුම්පත් ගෙනෙන්න පුළුවන්කම තිබුණා නම් අපට යම්කිසි ප්‍රගතියක් මේ සම්බන්ධව අත්කර ගන්න පුළුවන් වෙනවා.

අද කවුරුත් කථා කරන මාතෘකාව මත්ද්‍රව්‍ය බව අපි දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්ද්‍රව්‍ය අද ලංකාවේ සමාජයම මුළුමනින් වෙළාගෙන තිබෙනවා කිව්වොත් මම හිතන්නේ මා නිවැරදියි. පසුගිය දවස්වල අපි ගමට ගියාමත්, නගරයට ගියාමත්, විශේෂයෙන් වතුකරයට ගියාමත් ඒ හැම තැනකදීම අපේ රටේ ජනතාව කථා කළේ පාසල් දරුවනුත්, තරුණ තරුණියනුත් මේ මත්ද්‍රව්‍ය උවදුරෙන් මුදා ගන්න කටයුතු කරන්නේ නැද්ද කියන කාරණය පිළිබඳවයි. අපි දන්නවා, ඒ සම්බන්ධව විශාල සමාජ කතිකාවක් තිබෙනවාය කියන එක. අපි මේ අවස්ථාවේදී කියන්න

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

ඕනෑ, වර්තමාන රජය ඒ සම්බන්ධයෙන් යම් යම් ක්‍රියාමාර්ග ගනිමින් සිටිනවාය කියන එකත්. ඒ සම්බන්ධවත් අපි මේ අවස්ථාවේදී සතුටු වෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හුහක් අවස්ථාවල මැති ඇමතිවරු කථා කළේ පසුගිය කාල සීමාව තුළ එහෙම නැත්නම් පසුගිය ආණ්ඩුවල ක්‍රියාමාර්ග නිසා තමයි මේ ව්‍යසනය මේ තරම් දුරට ඔඩු දුවන්න කටයුතු සිදු වුණේ කියන එකයි.

මම මේ වෙලාවේ මේ කාරණය කියන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ආණ්ඩුව පත් වෙලා අවුරුදු 2ක් ගත වෙලා තිබුණත්, අපි දැක්කා, පසුගිය දවස්වලත් විශාල වශයෙන් මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් සිදු වුණා. ඒ වාගේම පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම් විශාල වශයෙන් සිදු වෙලා තිබෙනවා. ඒ හා සමානවම පසුගිය ආණ්ඩු කාලවලත් අත්අඩංගුවට ගත්තා. උදාහරණයක් හැටියට, 2024 වර්ෂයේ විතරක් ලක්ෂ දෙකකට ආසන්න සංඛ්‍යාවක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. 2025 වර්ෂයේදීත් ඒ වාගේම ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. ඇමතිතුමා ඒ ගැන ප්‍රකාශ කරනවා මම දැක්කා. ගිය අවුරුද්දේ දෙලක්ෂ හැටඑක්දහසක් අත්අඩංගුවට ගත්තා කියලා තමයි එතුමා ප්‍රකාශ කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් අපිට දැන් කල්පනා කරන්න වෙන්නේ ඒ පසුගිය අවුරුදුවලත් අත්අඩංගුවට ගැනීම් සංඛ්‍යාව අඩු වුණාද, එහෙම නැත්නම් වැඩි වෙලා තිබෙනවාද කියලායි.

මෙතැනදී අපිට තිබෙන ප්‍රශ්නය තමයි, මේ මත්ද්‍රව්‍ය උවදුර සම්බන්ධව මේ ආණ්ඩුව යම් යම් ක්‍රියාමාර්ග ගත්තාට, ඒ පිළිබඳ යම්කිසි ප්‍රගතියක්, එහෙම නැත්නම් ඒවායෙහි අඩුවීමක් අපිට දකින්න නැති වීමයි. මේක ඇත්ත වශයෙන්ම බරපතළ තත්ත්වයක්. ඒ නිසා අපි සියලු දෙනාම එකතු වෙලා මේකට විසඳුමක් හෙව්වේ නැත්නම් අපේ අනාගත පරපුරට දෙයියන්ගේ පිහිටයි! කියලා තමයි කියන්න තියෙන්නේ.

අනෙක් ප්‍රශ්නය තමයි, බන්ධනාගාරවල තිබෙන ගැටලුව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ ඇමතිතුමාත් ඉන්න මේ වෙලාවේ මම මතක් කරන්න කැමතියි, පෞද්ගලිකව මමත් ඒ වාගේම ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාත්, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමාත් අධිකරණ අමාත්‍යාංශයට ගිහිල්ලා, ගරු ඇමතිතුමාව හම්බ වුණු බව. එතුමාව හම්බ වෙලා බන්ධනාගාරවල තිබෙන ප්‍රශ්න, ඒ වාගේම බන්ධනාගාරවල තිබෙන පීඩනය ගැන අපි කිව්වා. ඒ වාගේම රිමාන්ඩ්ගත වෙලා ඉන්න සිරකරුවන් නිදහස් කිරීමට තිබෙන බාධා සම්බන්ධව, නීතිමය ගැටලු සම්බන්ධව අපි එතුමාත් එක්ක සාකච්ඡා කළා. ඒ සාකච්ඡා සිදු කරමින් ඉන්න අතරතුර තමයි බන්ධනාගාරවල කැරලි ගණනාවක් සිදු වුණේ. බන්ධනාගාර තුන හතරක ලොකු ප්‍රශ්නයක් ඇති වුණා. සිරකරුවෝ ඝාතනය වුණා, නිලධාරීන් ඝාතනය වුණා. මේකට මූලික වශයෙන් හේතු වෙලා තිබුණේ, ඒ බන්ධනාගාරවල තිබුණු අධික තදබදය; ඒ වාගේම ඒ සිරකරුවන් අතර තිබුණු පීඩනය. ඒ පීඩනය පිට කිරීමක් වශයෙන් තමයි, අවස්ථානුකූලව එදා ඒ කැරලි ඇති වුණේ. ඉතින්, ඒවා සම්බන්ධව විසඳුම් සොයන්න ඕනෑ නිසා තමයි, අපි ගරු ඇමතිතුමාට යම් යම් යෝජනා ඉදිරිපත් කළේ. ඒ වාගේම ගරු නෂීත් ඉන්දික මන්ත්‍රීතුමා සභාපතිත්වය දරන ඒ අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවටත් අපි මේ සම්බන්ධ යෝජනා ඉදිරිපත් කළා, මේ යෝජනා ක්‍රියාත්මක කර ගත්තොත් බන්ධනාගාරවල තිබෙන තදබදය අඩු කරන්න පුළුවන්කම ලැබෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සතුටු වෙනවා. ඒ සම්බන්ධව ගරු ඇමතිතුමාගේ මැදිහත්වීමෙන් යම්කිසි ප්‍රගතියක් අත්පත් කර ගන්න පුළුවන්කම ලැබී තිබීම පිළිබඳව.

විශාල ප්‍රශ්නයක් වශයෙන් අපි දැක්කේ, රස පරීක්ෂක වාර්තාවල ප්‍රමාදයයි. ඒ වාගේම නීතිපති දෙපාර්තමේන්තුවේ වාර්තා වෙලාවට එන්නේ නැති නිසා මේ නඩු ටික විසඳගන්න තිබෙන අපහසුතාව අපි දැක්කා. ඒ වාගේම රිමාන්ඩ් බන්ධනාගාරගත වෙලා ඉන්න අය නිදහස් කරන්න, එහෙම නැත්නම් ඒ සම්බන්ධ අධිකරණ ක්‍රියාමාර්ග ගන්න තිබෙන බාධාව විශාල ප්‍රශ්නයක් වෙලා තිබුණා. දැන් අවශ්‍ය තොරතුරු ලබාගෙන, මේ සම්බන්ධ නඩු ටික ඉක්මනින් අවසන් කර ගන්න, යම්කිසි සහනයක් ලබා ගන්න මේ ගෙනෙන පනත් ඉවහල් වනවා කියලාත් මා මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. ඒ වාගේම සිරකරුවෝ හතළිස්දහසක් විතර බන්ධනාගාර කිහිපයේම රඳවා ඉන්නවා. ඉන් යම්කිසි ප්‍රමාණයක් අපිට අඩු කරන්නත් මේ අනුව පුළුවන්කම ලැබෙනවා.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධව අපි කථා කළ යුතු තවත් කරුණු කිහිපයක් තිබෙනවා. ඒවා සම්බන්ධවත් ඔබතුමා අවධානය යොමු කළොත් තවත් සිරකරුවෝ ගණනාවක් නිදහස් කරලා බන්ධනාගාර තදබදයට යම්කිසි විසඳුමක් ලබා දෙන්න පුළුවන්කම ලැබෙනවා. අපි දන්නවා, යහපත් කල්ක්‍රියාවෙන් ඉන්න සිරකරුවෝ විශේෂ දිනවලදී, රජයේ විශේෂ නිවාඩු දිනවලදී නිදහස් කිරීමේ ක්‍රියාදාමයක් තිබුණා. පසුගිය අවුරුදු දෙකේදී, ඒ සම්බන්ධව ක්‍රියාත්මක වීමක් වුණේ නැහැ. අපි දන්නවා, ගරු ජනාධිපතිතුමා වෙත ලැයිස්තුවක් ආවාට පස්සේ තමයි සිරකරුවෝ නිදහස් කරන්නේ. ඒ ලැයිස්තුවේ යම් යම් ප්‍රශ්න කිහිපයක් ඇති වෙලා, වෙනත් සිරකරුවනුත් නිදහස් කරන්න කටයුතු කළා. ඊට පසුව ඒ ක්‍රියාමාර්ගය සම්පූර්ණයෙන් ඇනහිටලා තිබෙනවා. මම ගරු ඇමතිතුමාට යෝජනා කරන්න කැමතියි, අර ඉස්සර වාගේම විශේෂ දවස්වලදී, ජාතික සිරකරු දිනය වාගේ දිනවලදී දඩ ගෙවන්න බැරි වෙච්ච අය, සුළු සුළු වැරදිවලට සිරගත වෙලා ඉන්න අය නිදහස් කරන්න අපිට පුළුවන්කම තිබෙනවා කියා. විශේෂයෙන්ම අවුරුදු 70ට වැඩි වැඩිහිටි සිරකරුවෝ නිදහස් කළ හැකි ක්‍රමවේදයකුත් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අවුරුදු 70ට වැඩි සිරකරුවන් නිදහස් කිරීමේ ක්‍රමවේදයකුත් තිබෙනවා. ඒ සම්බන්ධවත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරලා ඒකත් ක්‍රියාත්මක කරන්න පුළුවන්කම තිබෙනවා නම්, අපිට තවත් සිරකරුවෝ ටිකක් නිදහස් කරන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, ඊට අමතරව තවත් කාරණාවක් කියන්න තිබෙනවා. අපි දන්නවා, අභියාචනා ඉදිරිපත් කරපු සිරකරුවන්ට විශාල අසාධාරණයක් වෙලා තිබෙනවා කියලා. පසුගිය කාල සීමාවේදීත් - 2025දීත් - අපි ඒක දැක්කා.

විජයදාස රාජපක්ෂ හිටපු අමාත්‍යවරයා පාර්ලිමේන්තුවට පනතක් ගෙනාවා. ඒ පනතෙන් කිව්වේ මොකක්ද? විශේෂයෙන් අභියාචනා ඉදිරිපත් කරපු අයගේ - සිරගත වෙලා ඉන්න අවස්ථාවේදී වෙන්න පුළුවන්- නඩු අහන්න අවුරුදු ගණනක් යනවා. ඒ අවුරුදු ගණන අඩු වෙන්නේ නැහැ. එම තීන්දුවම ආවොත් ඒ අවුරුදු ගණනත් ගත කරන්න තමයි සිද්ධ වෙන්නේ. ඉතින්, ඒක විශාල අසාධාරණයක් හැටියට දැක්කා. ඒ අනුව එතුමා පනතක් ගෙනැල්ලා පාර්ලිමේන්තුවේ සම්මත කළා. හැබැයි ඒ සම්මත කරපු පනතෙන් සහනයක් ලැබුණේ ඉදිරියේදී එන

සිරකරුවන්ට පමණයි. කලින් අභියාචනා ඉදිරිපත් කරපු, ඒ ක්‍රියාවලිය සඳහා ගත වුණු කාලය අඩු කර ගන්න බැරි වුණු, සිරගත වෙලා සිටි කාලය අඩු කරගන්න බැරිවෙච්ච සිරකරුවන් ඉන්නවා 1,000කට ආසන්න සංඛ්‍යාවක්. එතැනදී ඔවුන්ට විශාල අසාධාරණයක් වෙනවා, ගරු ඇමතිතුමනි. මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න. ඇත්තවශයෙන්ම මෙය ඉතා කනගාටුදායක තත්ත්වයක්. මොකද, ඒගොල්ලන් දඬුවම් දෙකක් විඳිනවා. අවුරුදු 3ක්, 4ක් දඬුවම් විඳලා ඔවුන්ට ඒ කාල සීමාව අඩු කරගන්න විධියක් නැහැ. ඒ නිසා ඔබතුමාත් එක්ක මේ ගැන පෞද්ගලිකව කථා කරපු කෙනෙකු හැටියට මා ඉල්ලා සිටිනවා, කරුණාකර ඒ අභියාචනා ඉදිරිපත් කරපු අයටත් - 2025ට ඉස්සෙල්ලා ඒ දඬුවම් විඳපු අයටත් - සම්පූර්ණ සහනය ලබා දෙන්න කටයුතු කරන්න කියලා.

මේ සම්බන්ධයෙන් ආංශික අධීක්ෂණ කාරක සභාවේදීත් අපි කථා කළා. එතැනදී අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමිය කිව්වේ මොකක්ද? "අපි ඒ සම්බන්ධයෙන් නීති කොමිෂන් සභාවට ඉදිරිපත් කර තිබෙනවා. එහි වාර්තාව එනතුරුයි ඉන්නේ" කියලා එතුමිය කිව්වා. මාස 6ක් විතර වෙනවා එය නීති කොමිෂන් සභාවට ඉදිරිපත් කරලා. තවම වාර්තාව ආවාද, නැද්ද කියන එක තමයි ප්‍රශ්නය. යම් යම් හේතූන් නිසා මෙය දිගින් දිගටම කල්ඇරීම තුළ බන්ධනාගාරගත වෙලා ඉන්න අයට ලොකු අසාධාරණයක් වෙනවා. ඒ නිසායි අපි මේක පුන පුනා කියන්නේ. ඒ නිසායි අපි මේ ගැන ආංශික අධීක්ෂණ කාරක සභාවේදී කිව්වේ; අමාත්‍යාංශයිය උපදේශක කාරක සභාවේදී කිව්වේ. ගරු ඇමතිතුමා සමඟ පෞද්ගලිකව මේ සම්බන්ධයෙන් කථා කළේත් ඒකයි. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න කියලා. මේ කරුණු ටික ක්‍රියාත්මක කර ගත්තොත්, බන්ධනාගාරය තුළ සිටින සිරකරුවන්ගේ ප්‍රශ්නයට සෑහෙන දුරට විසඳුමක් ලබා දෙන්න හැකියාව ලැබෙනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පද්මසිරි බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.28]

ගරු පද්මසිරි බණ්ඩාර මහතා
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ විවාදයට ලක්වන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ විවාදය තුළ උදේ ඉඳලා බොහෝ කරුණු කාරණා මේ සභාවට ඉදිරිපත් වුණා. ඒවායේ සාධනීය ලක්ෂණ බොහොමයක් දක්නට ලැබුණා. මම හිතන විධියට, හෘදය සාක්ෂියට එකඟව හිතන පතන අපි කාටත් මේ පනත් කෙටුම්පත්වලට විරුද්ධ වෙන්න බැහැ. විනාශකාරී සමාජයක් ඇතුළේ ජීවත් වෙනකොට හැමෝටම විශාල පීඩනයක් දැනෙනවා. ඒ සමාජය වෙනස් කරන්න, සමාජ ශෝධනයක් සිදුකරන්න ගෙන ආ ඉතාම වටිනා පනත් කෙටුම්පත් හැටියට මේවා හඳුන්වන්න පුළුවන්.

ආණ්ඩුවක් හැටියට අපි මේ රට භාරගත්ත වෙලාවේ රටේ තිබුණා, ප්‍රධාන අර්බුද තුනක්. එකක් තමයි, ආර්ථික අර්බුදය. අනෙක තමයි, දේශපාලන අර්බුදය. ඊළඟ එක තමයි, සමාජ අර්බුදය. හැබැයි, වසර එකහමාරක්, දෙකක් ගතවෙනකොට අපි ආණ්ඩුවක් හැටියට සමත් වෙලා තිබෙනවා, ලෝකයේ බංකොලොත් රටක් කියලා නම් කරලා තිබ්බ්ව අපේ රට ඒකෙන් අයින් කරගෙන, ඒකපුද්ගල ආදායම වැඩි කරගෙන, තිබ්බ්ව ආර්ථික අර්බුදය යම් තරමකට පියමං කරගන්න.

මේ රටේ තිබ්බ්ව ඊළඟ අර්බුදය තමයි, දේශපාලන අර්බුදය. ජනතාව ඡන්දය දීලා පාර්ලිමේන්තුවට එවන මන්ත්‍රීවරයා අය වැයේදි කාට ඡන්දය දෙයිද, කීයට විකිණෙයිද කියලා හිතෙන බොහොම අස්ථාවර බවක් ඒ තුළ තිබුණා. ප්‍රාදේශීය දේශපාලනය ඇතුළේ ද මේ අස්ථාවර බව ජනතාවට ඉතාම බරපතළ ලෙස පෙනෙන්න තිබුණා. නමුත් අපි එදා වේදිකාවලදී ජනතාවට පොරොන්දු වුණා, මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා, ඒ අස්ථාවර දේශපාලනය වෙනස් කරලා, මේ රටේ දේශපාලන අර්බුදය අවසන් කරනවා කියලා. මේ වෙනකොට අපි ඒ ජනතා පොරොන්දුව ඉටු කරලා අවසන් කියන එකයි මගේ හැඟීම.

අපට තිබ්බ්ව ඊළඟ අර්බුදය තමයි, අපේ නිරන්තර කථා බහට ලක් වෙච්ච සමාජ අර්බුදය කියන ප්‍රධාන අර්බුදකාරී තත්ත්වය. ඇත්තෙන්ම අපි දන්නවා, ඒක සරල නැහැ කියලා. ආර්ථික අර්බුදය යම් ප්‍රමාණයකින් පියමං කර ගන්න වසර එකහමාරක්, දෙකක් යනකොට අපට පුළුවන් වුණා. අපි දේශපාලන අර්බුදය අවුරුද්දක් යනකොට පියමං කරගෙන අවසන් කළා. හැබැයි, සමාජ අර්බුදය පියමං කර ගැනීම අවුරුද්දකින්, දෙකකින් කර ගන්න අපට බැහැ. මේකට ලොකු කාලයක් ඕනෑ. මොකද, මෙහිදී කථා කළ අපේ මන්ත්‍රීවරුන්ගේ, ඇමතිවරුන්ගේ අදහස් ඇතුළේ තිබුණා, අද සමාජය ඉතා විනාශකාරී, ව්‍යසනකාරී තත්ත්වයකට පරිවර්තනය වෙලා තිබෙන බව. කුඩා දරුවාගේ ඉඳලා වැඩිමහල්ලා දක්වාම විශාල ලෙස දූෂණයට ලක් වෙච්ච සමාජයක් ඇතුළේ තමයි අප ඉන්නේ. දැනට අවුරුදු 20කට, 25කට කලින් අප පාසල් ගුරුවරුන් හැටියට වැඩ කළ කාලයේ තිබුණු පාසල් පන්ති කාමරය හෝ පාසල නොවෙයි වර්තමානය වනකොට තිබෙන්නේ. වර්තමානයේ පාසලේ ඉන්න දරුවෝ, විශේෂයෙන් 9 ශ්‍රේණියෙන් ඉහළ පන්තිවල ඉන්න දරුවෝ මේ සමාජ ව්‍යසනයට ලක් වෙලා සිටිනවා. මේ හැමෝම කුමන හෝ සමාජ ව්‍යසනකාරී අර්බුදයකට මුහුණ දීලායි ඉන්නේ.

අපි දන්නවා, බොහෝ ළමයින් සමාජයේ අවතැන් වෙලා ඉන්න බව. තමන්ගේ අම්මා තාත්තා විසින් ගෙදරින් පිටමං කිරීම නිසා ළමා නිවාසවල ජීවත් වන දරුවෝ අතිවිශාල ප්‍රමාණයක් අපේ රටේ ඉන්නවා. ඒකේ අතීතය - ඉතිහාසය - සොයා බැලුවොත් අපට හඳුනා ගන්න තිබෙන ප්‍රධාන මූල බීජය තමයි ඒ පවුලේ අම්මා, එහෙම නැත්නම් තාත්තා, එහෙමත් නැත්නම් දෙදෙනාම බරපතළ ලෙස විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා සිටීම. එහෙම පවුල්වල දරුවන් තමයි එසේ අනාථභාවයට පත් වෙලා ඉන්නේ. සමාජයේ ඉමහත් විනාශකාරී තත්ත්වයක් නිර්මාණය වීම සඳහා විෂ මත්ද්‍රව්‍ය දැඩි ලෙස බලපා තිබෙනවා. හිර ගෙවල් පිරෙව්වා කියලා, එහෙම නැත්නම් හිර ගෙවල්වලින් නිදහස් කළා කියලා මේ ප්‍රශ්නය, මේ අර්බුදය විසඳා ගන්න අපට බැහැ. මොකද, මේකත් එක්ක බැඳුණු දීර්ඝ ඉතිහාසයක් තිබෙනවා.

අපි දන්නවා, පසුගිය කාලයේ රට පාලනය කළ පාලකයන් බොහෝ දෙනෙක් පාතාලයත් එක්ක ගනුදෙනු කළ බව. පාතාලයේ අය අත්අඩංගුවට ගත්තාම ඔවුන්ගෙන් ලබා ගත් කට උත්තර ඇතුළේ ඒ බව සඳහන්ව තිබෙනවා. ඒ පාලකයන් පාතාලයත් එක්ක, මත්ද්‍රව්‍ය විකුණපු මිනිසුන් එක්ක ගනුදෙනු කරලා තමන්ගේ දේශපාලන ව්‍යාපාරය, ඡන්ද ව්‍යාපාරය නඩත්තු කරපු බව අපට සාක්ෂි සහිතව ඔප්පු වෙලා තිබෙනවා. ඒ

[ගරු පද්මසිරි බණ්ඩාර මහතා]

තත්ත්වය තමයි අද මේ තරම් විශාල සමාජ පිළිකාවක් බවට පරිවර්තනය වෙන්න බලපා තිබෙන්නේ. නමුත් වර්තමාන ආණ්ඩුවේ අපි කිසිදු පාතාලයක් එක්ක ගනුදෙනු කරන්නේ නැතිව, කිසිදු දේශපාලන ක්‍රියාකාරකමකට ඔවුන් සම්බන්ධ කර ගන්නේ නැතිව කටයුතු කරනවා. අපේ ආණ්ඩුව, පාතාල ගනුදෙනු අත් හැරපු පිරිසිදු දේශපාලන ව්‍යාපාරයක් හැටියට ඔවුන්ට එරෙහිව සටනක් ආරම්භ කරපු ආණ්ඩුවක්. ඒ නිසා අපට බොහෝ අභියෝග තිබෙනවා. අපි ඒක හොඳටම දන්නවා.

විපක්ෂයේ හිටපු බොහෝ අය අද ඔය ශුද්ධවන්තයන් වාගේ කථා කළාට ඒ අයගේ ඉතිහාසය පිළිබඳව සොයා බැලුවොත්, පාතාලයත් එක්ක ගනුදෙනු කරපු අවස්ථා අපට වාර්තා වෙමින් තිබෙනවා. අපි මේ ගරු සභාව විශේෂ කාරණයකින් දැනුවත් කරන්න ඕනෑ. අපි අපේ දේශපාලන ව්‍යාපාරය ඇතුළේ ජාතික වැඩසටහනක් ආරම්භ කරලා තිබෙනවා, "ඉවත් වෙනු" කියලා. එය මේ රටේ කුඩා දරුවාගේ සිට වැඩිමහල් තැනැත්තා දක්වා මේ සමාජ බෙදවාචකයෙන් ගලවා ගැනීම සඳහා ආරම්භ කරපු වැඩසටහනක්. මෙය දේශපාලන සටන් පාඨයක් නොවෙයි. මේ සමාජයට, රටට ආදරය කරන දේශපාලන ව්‍යාපාරයක් හැටියට මේ ව්‍යසනයෙන්, මේ මහා අනර්ථකාරී සමාජ වටපිටාවෙන් දරුවන්, තරුණයන් ඇතුළු සියලු දෙනා බේරා ගැනීමේ අරමුණින් තමයි "වහා ඉවත් වෙනු" කියන සටන් පාඨයත් එක්ක අප ඒ වැඩසටහන ආරම්භ කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු පද්මසිරි බණ්ඩාර මහතා
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)
හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පාසල්වල වයස අවුරුදු 16 ඉක්ම වූ දරුවන්ගෙන් විශාල පිරිසක් මදන මෝදක වැනි මත්ද්‍රව්‍ය භාවිත කරනවා කියන ආරංචිය පසුගිය කාලයේ අපට අසන්නට ලැබුණා. අත්අඩංගුවට ගැනීම් ද කර තිබුණා. පාතාලයත් එක්ක ඒ දරුවන්ගේ කිසිම සම්බන්ධයක් නැහැ. හැබැයි, වැඩිහිටියන් තමයි ඒ සම්බන්ධතා ගොඩ නඟාගෙන දරුවන් ද එයට ඇදගෙන යමින් ඉන්නේ.

අපේ ගරු ඇමතිතුමා පසුගිය වසරේ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කළා. හෙරොයින් කිලෝ 2,486ක්, අයිස් කිලෝ 3,302ක්, කොකේන් කිලෝ 297ක්, ගංජා කිලෝ 101,146ක්, කුෂ් කිලෝ 1,726ක්, හෂීස් කිලෝ 416ක්, මදන මෝදක කිලෝ 1,277ක් වැනි විශාල ප්‍රමාණයක් අපි මේ වනකොට අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මේ අත්අඩංගුවට ගත්තු ප්‍රමාණය ඇතුළේ අපට දැනෙන දේ තමයි, මේවා අල්ලා ගන්න බැරි වුණා නම්, මත්කුඩු තේ කුඩු වාගේ පොළේ විකුණන්න තිබේවි කියන එක. මේවා අල්ලා ගත්තේ නැත්නම් ඒ තරමටම අපේ සමාජය ව්‍යසනයට යන්න පුළුවන්; අළෙවි සැල් ඕනෑ තරම් එළියේ තිබෙන්න පුළුවන්. ඒ නිසා අපි ආණ්ඩුව හැටියට, රජය හැටියට මේකට අවශ්‍ය කරන නීතිමය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා.

මා මුලින් සඳහන් කරපු පාතාලයේ තිබුණු අවි ගනුදෙනු පිළිබඳව සොයා බැලුවොත්, අපි 2025.01.01 දින සිට 2025.12.31 දක්වා T 56 අවි 74ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. පිස්තෝල අවි 90ක්, රිවෝල්වර 63ක්, වෙනත් අවි 2,177ක් ඇතුළුව මුළු එකතුව 2,404ක් වශයෙන් අවිආයුධ අත්අඩංගුවට අරගෙන තිබෙනවා. 2026 අවුරුද්දේ මේ මාසයේ 15වන දා දක්වා අවි 997ක් එක්ක මුළු අවි 3,391ක් අපි අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මේ පාතාලයයි, මත්ද්‍රව්‍යයි අතර තිබෙන සම්බන්ධය නිරූපණය වන අවස්ථාවක් තමයි, මම මේ දත්ත ඉදිරිපත් කරමින් කියන්න අදහස් කළේ. ඒ නිසා අපි මේ "ඉවත් වෙනු" කියන ජාතික වැඩ පිළිවෙළ තුළින් ක්‍රියාත්මක කරන්නේ ග්‍රාමීය සහ නාගරික සමාජයේ තරුණ පරම්පරාව, දරු පරම්පරාව බේරා ගැනීමේ මෙහෙයුමක් මිස, දේශපාලන මෙහෙයුමක් නොවේය කියා ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මට තවත් මිනිත්තු 7ක් එකතු වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 15ක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

[3.38 p.m.]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Thank you very much, Hon. Presiding Member. I also have to thank the Hon. Jeevan Thondaman for giving me those extra seven minutes.

I am also happy that the Hon. Minister of Justice and National Integration is here since I wish to make some important reference to a particular Clause. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පතේ 4 වන වගන්තියේ (2) (අ) යටතේ මෙසේ සඳහන්ව තිබෙනවා:

> "ඒ වරද සිදු කිරීමේ දී ජාවාරම් කරන ලද, ආනයනය කරන ලද, අපනයනය කරන ලද හෝ සන්තකයේ තබා ගන්නා ලද අන්තරායදායක ඖෂධයේ ශුද්ධ බර 77අ වන වගන්තිය යටතේ ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා විසින් නිකුත් කරන ලද වාර්තාව ප්‍රකාරව ග්‍රෑම් සියයක්...."

ගරු අධිකරණ ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, මේ සංශෝධනයේ ප්‍රධාන අරමුණ. ශුද්ධ බර ග්‍රෑම් සියයකට වඩා වැඩිපුර තබාගෙන සිටි මනුස්සයාට තමයි Court of Appeal යන්න වෙන්නේ. අනෙක් අයට පහළ උසාවියෙන් ඇප ගන්න පුළුවන්. This is the main objective of this Bill. But, ශුද්ධ බර ලබා ගැනීමේදී තිබෙන ප්‍රශ්නය මත, එකතු කරලා - ඒක practically, right - ඒකේ තවදුරටත් මෙසේ කියනවා:

> "...ආණ්ඩුවේ රසපරීක්ෂකවරයා විසින් නිකුත් කරන ලද වාර්තාව ප්‍රකාරව ග්‍රෑම් සියයක් හෝ ඊට වැඩි වන්නා වූ විට හෝ, ඒ වාර්තාව නොමැති අවස්ථාවක දී ජාවාරම් කරන ලද, ආනයනය කරන ලද, අපනයනය කරන ලද හෝ සන්තකයේ තබා ගන්නා ලද අන්තරායදායක ඖෂධයේ දළ බර..."

That is, the gross weight, not the pure weight. මම විශේෂ දෙයක් කියන්නයි මේ හදන්නේ. ආණ්ඩුවේ රස පරීක්ෂක වාර්තාව ලබා ගැනීමේ නොහැකියාව කියන කාරණයත් මෙහිදී සැලකිල්ලට ගෙන තිබෙනවා. මේක ඔබතුමන්ලාගේ ආණ්ඩුවට පටවන වරදක් නොවෙයි. ඒ කියන්නේ, the general inability on the part of the Government. ආණ්ඩුවේ රස පරීක්ෂක වාර්තාව ලබා ගැනීමට තිබෙන ආයතනමය ප්‍රශ්නය ඉස්සරත් තිබුණා නේ. දැන් අපේ ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ දූෂිත police officers and narcotic officersලාට පුළුවන්, gross weight එක ග්‍රෑම් 100ක් පෙන්වීමට පිටි ටිකක් එකතු කරන්න. ඒක නේ තිබෙන ප්‍රශ්නය. මම කියන්නේ ඔක්කෝම එහෙම කරනවා කියලා නොවෙයි. දැන් කොහොමද ඒ ප්‍රශ්නය නැති කරන්නේ? ඒ ප්‍රශ්නය නැති කරන්න තිබෙන එකම ක්‍රමය තමයි, ආණ්ඩුවේ රස පරීක්ෂක වාර්තා වහාම ලබා ගන්නා එක. ඒක easily said than done; වැඩේ ටිකක් අමාරුයි. මොකද, එච්චර ලොකු backlog එකක් තිබෙනවා. මම ගරු බිමල් රත්නායක ඇමතිතුමාගේ Ministerial Consultative Committee එකට ගිය වෙලාවේ, අර number plates ප්‍රශ්නය ගැනත් කථා වුණා. ලක්ෂ හතක්ව තිබුණු ප්‍රමාණය දැන් මිලියනයක් වෙලා ඒක කරගන්න බැරිව ඉන්නේ. මේකට පොඩි ක්‍රමවේදයක් තිබෙනවා. I just want the Hon. Minister to look into it. There are some strips available. මම දන්නේ නැහැ, ඒකේ availability එක කොහොමද කියලා. They are disposable strips. ඒ කියන්නේ, ලිටිමස් තීරු වාගේ තීරු වගයක් තිබෙනවා. අත්අඩංගුවට ගත් ද්‍රව්‍ය මත එම strip එක තබා ඒ තුළ කොපමණ ප්‍රතිශතයක් මත්ද්‍රව්‍ය තිබෙනවාද කියා roughly කියන්න පුළුවන් ක්‍රමවේදයක් තිබෙනවා. They call it hand-held electrochemical reader. ඒ කියන්නේ, අතේ තබා ගන්න පුළුවන් උපකරණයක්. එම microelectrode test strips පාවිච්චි කරලා අපට අල්ලා ගන්නා මත්ද්‍රව්‍යවල ප්‍රතිශතය බලාගන්න පුළුවන්. ඒගොල්ලන් ඒකට තව නමක් කියනවා. ලාහම ක්‍රමය තමයි, Immunoassay කියන්නේ**.** ඒක ඩොලරයක් විතර වටිනවා. සමහරුන් diabetes ආවාම ලේවල සීනි කොපමණ ප්‍රමාණයක් තිබෙනවාද කියලා තමන් විසින්ම බලාගන්නවා වාගේ, ඒ strip එකක් තබා මත්ද්‍රව්‍යවල ප්‍රතිශතය බලන ක්‍රමවේදයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒවා භාවිත කර ඒ වෙලාවේම බලාගන්න පුළුවන්, අත්අඩංගුවට ගත් භාණ්ඩවල සැක කරන ලද අන්තරායදායක ඖෂධය සියයට 100ක්ම - purely - තිබෙනවාද, නැත්නම් ඒ තුළ එකතු කරන ලද යම්කිසි ප්‍රතිශතයක්ද තිබෙන්නේ කියලා.

අපට මේ සඳහා යම් ක්‍රමවේදයක් ගෙනෙන්න පුළුවන් නම් හොඳයි. ඒකට නීතියක්ම එන්න ඕනෑ නැහැ, direction එකක් කරන්න පුළුවන්. එතකොට ඒ වෙලාවේම ඒ strip එක පාවිච්චි කරලා, අර අත්අඩංගුවට ගත් ද්‍රව්‍ය, doctored, එහෙම නැත්නම් සියයට සියයක්ම ශුද්ධ බර සහිත අන්තරායදායක ඖෂධයක් නොවෙයි කියලා බැලූ බැල්මට පෙනෙන අවස්ථාවක ඒ පිළිබඳව සටහනක් දැම්මාට පසුව ඒකට පොඩිඩක් ප්‍රමුඛතාවක් ලබා දීලා පරීක්ෂණ වාර්තාව ලබා ගන්න පුළුවන්. එතැනින් ඔබ්බට ගියොත්, ලෝකයේ භාවිත කරනවා, Thermo Scientific TruNarc Delta Handheld Narcotics Analyzer සහ Raman spectroscopy තාක්ෂණය සහිත උපකරණයක්. ඒක ටිකක් ගණන් වැඩියි. ඩොලර් 38,000ක් විතර වෙනවා. එච්චර ඕනෑ නැහැ. මම හිතන විධියට අනිවාර්යයෙන්ම, international organizations would be willing to help us. ඒවා law enforcement, customs and forensic fieldsවල පාවිච්චි කරනවා. ඒවායෙන් දෙක තුනක් තබා ගත්තා නම් අපට ඇති. Pure කියලා පෙන්වන ඒවාට ප්‍රමුඛත්වය දෙන්න ඕනෑ නැහැ; ඒ stripsවලින් කෙළින්ම පෙන්වනවා නම්, මේක සියයට සියයක්ම අන්තරායදායක ඖෂධයක් කියලා, එය ග්‍රෑම් 100ට වැඩි නම් ඒක පොඩිඩක් පරක්කු වුණාට කමක් නැහැ. නමුත් අන්තරායදායක ඖෂධ නොවන දේවල් යම්කිසි ප්‍රතිශතයකින් තිබෙනවා නම්, ඒවාට ප්‍රමුඛත්වය ලබා දීලා මේ machine එක පාවිච්චි කරලා හොයා ගන්න පුළුවන් නම්, අපට පුළුවන්, දවසකින් මේ backlog එක ඉවත් කරන්න.

මම මේ දේවල් ගැන දන්නේ නැහැ. ඇත්තටම මම මේ පිළිබඳව කළ research එකෙන් සොයා ගත් දෙයක් මීසක්, මේ පිළිබඳව මට පෞද්ගලික දැනුමක් නැහැ. නමුත් මට පෞද්ගලික දැනුමක් තිබෙනවා, සිරකරුවන් පිළිබඳව. මමත් එක කාලයක ඒ වාගේ කෙනෙක් වෙනුවෙන් defend කළා. අන්තිමට රස පරීක්ෂක වාර්තාවෙන් ආවේ පොඩි ප්‍රමාණයක්. ඒ වනකොට අවුරුදු ගණනක් ඒ මනුස්සයා රිමාන්ඩ් භාරයේ ඉඳලා ඉවරයි. තව එක දෙයක් ගැන කියලා තවත් පොඩි වැදගත් කාරණයකට මම එන්න කැමැතියි.

Hon. Minister, you are aware that අර passport ප්‍රශ්නයේදී, ඒ කියන්නේ කුඩා දරුවන් forged visaවලින් ගත්තාම ඒක non-bailable වුණා. මම හිතන්නේ අග්‍ර විනිශ්චයකාර සරත් එන්. සිල්වා හිටපු කාලයේ non-bailable කියන එකත් FR එක යටතේ bailable කළා. මොකද, remand prisonersලා කියන්නේ සැකකරුවන් පමණයි. චාමර සම්පත් මන්ත්‍රීතුමා කියන්නේ මොකක්ද? ඒගොල්ලන්ට අත්දැකීම් තිබෙනවා. මට බස්වල ගිහිල්ලා අත්දැකීම් තිබෙනවා, ඒ නිසා බස්වල යද්දි ඇතිවන ප්‍රශ්න ගැන මම කියනවා. ඒ වාගේම train එකේ ගිහිල්ලා මට අත්දැකීම් තිබෙනවා. හැබැයි, එක එක පක්ෂයේ මන්ත්‍රීවරුන් රිමාන්ඩ් බන්ධනාගාරයට ගිහින් එන එකත් හොඳයි. මොකද, එතකොට තම තමන්ටම තේරුම් යනවා, ඒකේ තිබෙන ප්‍රශ්න ගැන. එතුමා කියපු දේ ඇහුවාම, I got the shock of my life. ඒක තමන්ටම වෙන්න එපායැ, රිදෙන්න. එතුමා කියනවා, 30ක් ඉන්න පුළුවන් තැනකට 140දෙනෙක් දමනවා කියලා. It is a fundamental violation of human rights! කොටින්ම, ලොරියක ගෙන යා හැකි හරකුන් ප්‍රමාණය ඉක්මවා වැඩිපුර හරක් පැටෙව්වොත් cruelty to animals යටතේ ඒ මනුස්සයාට දඩ ගහනවා. ඉතින්, සිරකරුවන් මේ විධියට දමන්න පුළුවන්ද? දමන්න බැහැ. ඒක නිසා මේ පිළිබඳව පොඩිඩක් දැනුවත් වෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

இன்னுமொரு முக்கியமான விடயம் சம்பந்தமாகக் குறிப்பிட விரும்புகின்றேன். அது என்னவென்றால், Prof. Raj Somadeva பற்றி இங்கே தொடர்ச்சியாகப் பேசப்பட்டது. Chemmani mass graveஇலே காணப்படுகின்ற எச்சங்கள் அல்லது எலும்புக்கூடுகள் சம்பந்தமாக இதுகாலவரை சொல்லாத வித்தியாசமான விடயங்கள் அடங்கிய ஓர் அறிக்கையை Prof. Raj Somadeva அவர்கள் வெளியிட்டிருக் கின்றார். இயற்கையான மரணம் இல்லை என்று சொல்வதற்கு அங்கே ஆதாரம் இல்லையென்ற விடயத்தைச் சொல்லி அதுசம்பந்தமாக அதிருப்தியைத் தெரிவித்திருக்கின்றார்.

எங்களுக்கு முக்கியமான விடயம் என்னவென்றால், நூற்றுக்கணக்கான ஹஜ்ஜாஜிகளை அப்பொழுதிருந்த பயங்கரவாதிகள் கடத்திக்கொண்டுபோய் குரூரமாகக் கொலை செய்து குருக்கள்மடம் பகுதியில் புதைத்தார்கள். அது சம்பந்தமான சாட்சியங்கள் இருக்கவில்லை. அவர்கள் புதைக்கப்பட்ட இடத்தைக் கண்டுபிடிப்பதற்கு மிகவும் கஷ்டப் பட்டு, இப்பொழுது Prof. Raj Somadeva அவர்களுடைய உதவி நாடப்பட்டது. மனித எச்சங்கள் உள்ள இடங்களாக அடையாளப்படுத்தக்கூடிய இடங்கள் கண்டுபிடிக்கப்பட்டு, இப்பொழுது அவ்விடங்கள் தோண்டப்பட்டுக்கொண்டு இருக்கின்ற சூழ்நிலையில், இது சம்பந்தமாகக் கிடைக்கின்ற

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

තකවල් එංගලුන්ක්කු මුක්කියමාන විඩයමාකුම්. ඉප්පොළුදු Military Intelligence Corps - ඉරාණුවප් පුලනාය්වුත්තුරෙ ඉන්ත අරසාංකත්තෙයුම් කෛප්පත්තත් තොඩංකිවිට්ටදා? එන්ර සන්දේකම් එංගලුක්කු එළුකින්රදු.

ඒ ගැනත් මම පොඩ්ඩක් කථා කරන්න ඕනෑ. හමුදා බුද්ධි අංශයට මේ රජය දවසින් දවස යටත් වෙනවාද කියන ප්‍රශ්නය මතුවෙලා තිබෙනවා. මොකද ඇමතිතුමාත් දන්නවා, Additional Solicitor General දිලීප පීරිස් මහත්මයා ඊයේ පෙරේදා කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් වෙලා කියලා තිබෙනවා, දැනට සැකකරුවෙක් වශයෙන් under detention සිටින හිටපු බුද්ධි අංශ ප්‍රධානි සුරේෂ් සලේ මහතා සම්බන්ධ පරීක්ෂණයේදී, රාජ්‍ය බුද්ධි අංශය මඟින් සැකකරුවන්ට සල්ලි දෙනවා, ඔවුන්ගේ මිල මුදල් වියදම් කරලා ඔවුන් වෙනුවෙන් නීතිඥවරුන් ඉදිරිපත් කරනවා කියලා. ඊට අමතරව මතු කර තිබෙන ඉතා වැදගත් කාරණයක් තමයි, මේ සම්බන්ධයෙන් සාක්ෂි ලබා දෙන සාක්ෂිකරුවන්ට විරුද්ධව බුද්ධි අංශ නිලධාරීන් විසින් බලපෑම් කරනවා කියන එක. It is a very serious matter. එහෙම කියපු ගමන් මහෙස්ත්‍රාත්තුමා කියලා තිබෙනවා, එහෙම නම්, "It is a very serious matter. Then, they are entitled to protection under the Assistance to and Protection of Victims of Crime and Witnesses Act. Bring evidence" කියලා. එහෙම කියපු ගමන්, අවසානයට he has said, "ඒක තහවුරු කරන්න මට සාක්ෂි නැහැ" යනුවෙන්.

ඉදු මුක්කියමානදොරු විඩයම්. ඉප්පොළුදු කොඤ්සම් කොඤ්සමාක ඉරාණුවප් පුලනාය්වුප් පිරිවින් කට්ටුප්පාට්ටුක්කුළ් ඉන්ත අරසාංකම් වරුකින්රදා? එන්ර කේල්වි එළුකින්රදු. The Hon. Deputy Minister of Defence is also here. I hope he would take note of these facts. සනාධිපති අවර්කළ් ඔරු මුරෙ සොන්නාර්, "අරසාංකත්තුක්කු එදිරාක investigation" එන්රු. අදේමාදිරි ඉප්පොළුදු, Additional Solicitor General Dileepa Peiris අවර්කළ් නීදිමන්රත්දින් මුන්නිලෙයිල් සොල්ලියිරුක්කිරාර්, ඉන්ත විසාරණෙයෙච් සෙය්වදිල් ඉරාණුවප් පුලනාය්වුප් පිරිවිනරිඩමිරුන්දු සාට්සියාළර්කළුක්කු එදිර්පාරාද අළුත්තංකළ් වරුකින්රදු එන්රු. ඉදනෙයුම් Prof. Raj Somadeva අවර්කළුඩෙය එදිර්පාරාද අදික්කෙයෙයුම් ඔන්රාකච් චේර්ත්තුප් පාර්ක්කුම්පෝදු, පල්වේරු කේල්විකළ් එළුකින්රන. කුදිප්පාක, ඉන්ත අරසාංකමුම් මුන්නර් ඉරුන්ත අරසාංකත්තෙප්පෝල් ඉරාණුවප් පුලනාය්වුප් පිරිවිනරින් ආදික්කත්තුක්කු උට්පදුත්තප්පදුකින්රදා? එන්ර කේල්වි එළුකින්රදු. අප්පඩියෙන්රාල්, මුන්නර් ඉරුන්ත අරසාංකත්තාල් සෙය්යප්පට්ට මනිදප් පදුකොලෙකළ්, මනිත උරිමෙකළුක්කු එදිරාන නදවඩික්කෙකළුක්කු ඉරුන්තදෙප් පෝන්ර අළුත්තංකළුක්කු ඉන්ත අරසුම් අඩිපණිකින්රදා? එන්ර කේල්වි එළුකින්රදු.

That is a matter I want even the Hon. Deputy Minister to take serious note of. When it is in the public domain, when a senior official in the Attorney-General's Department is saying that there is pressure from military intelligence on the ongoing investigation and even on the witnesses, it is not a simple matter; it is a very serious matter. I was expecting some explanation on this matter. ඉදු නාංකළ් මිකවුම් කවනමාකප් පාර්ක්ක වේණ්ඩිය ඔරු විඩයමාකුම්.

උණ්මෙයිලේයේ ඉන්රු නදෙපෙරුකින්ර සෙයර්පාදු කළුක්කු අදිලුම් කුදිප්පාක, මීණ්ඩුම් දලෙතූක්කියුළ්ළ පෞත්ත ඉනවාද සෙයර්පාදුකළුක්කු ඉන්ත අරසාංකම් අඩිපණියාමල් ඉරුප්පදෙක්කණ්ඩු නාංකළ් සන්තෝෂප් පඩුකින්රෝම්. We are happy that you have not bowed down to this so-called racist nationalism of some Sinhala Buddhists. අදේනේරම්, එව්වළවු කාලත්තුක්කු ඉන්ත විඩයත්දිල් උංකළාල් නින්රුපිඩික්ක මුඩියුම්? එන්ර කේල්වියුම් එළුකින්රදු. මුක්කියමාක, ඉවර්කළුඩෙය ඉව්වාරාන අළුත් තංකළෙයුම් ආංකාංකේ කිදෙක්කින්ර අදික්කෙකළෙයුම් ඔන්රුසේර්ත්තුප් පාර්ක්කුම්පෝදු, එංකළුක්කුළ් කේල්විකළ් තාන් එළුකින්රන.

ඉප්පොළුදු Fort Magistrateඉල් නදක්කින්ර පුලනාය්වුප් පිරිවිනරුක්කු එදිරාන Easter Sunday attacks සම්පන්දමාන වළක්කු නීණ්ඩ කාලමාක එන්දවිදමාන මුඩිවුම් ඉල්ලාමල් - without any breakthrough - පෝය්ක්කොණ්ඩු ඉරුක්කින්රදු. එංකළුක්කුප් පයමාක ඉරුක්කින්රදු, නාළෙ මරුදිනම් කුදිත්ත එදිරාළිකළුක්කු එදිරාක එර්රුක්කොළ්ළක්කූඩිය එන්ර සාට්සියමුම් ඉල්ලාදදාල් අවර්කළෙ විටුවික්ක වේණ්ඩුම් එන්රු නීදිමන්රම් සොල්ලිවිටුමෝ එන්රු. අව්වාරු සොන්නාලුම් පුදිනප්පදුවදර්කු ඉල්ලෙ. It can come to a point where the Judiciary - what can the Judiciary do when they realize there is no evidence to charge them or proceed with? - might say, "Well, there is no evidence. Let them go." That should not happen. The entire trust has been put in this Government especially by those who are against racism and by those who want justice to be meted out to the persons who made use of the military intelligence for their political purposes and to be punished.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
I will conclude, Sir.

Therefore, I urge the Hon. Minister of Justice and National Integration and the Hon. Deputy Minister of Defence to look into this matter.

Thank you very much.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 3.53]

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இந்தச் சபையில் நடைபெறுகின்ற நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் எனக்கு உரையாற்று வதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இன்று நாடு முழுவதும் புரையோடிப்போய் இருக்கின்ற போதைப்பொருள் பிரச்சினையானது, எமது வட மாகாணத்தில் மிகவும் பாரதூரமான தாக்கத்தை ஏற்படுத்தியிருப்பதை நான் இந்தச் சபையில் கூற விரும்புகின்றேன். வடக்கு மாகாணத்தின் எதிர்காலத்தையே அச்சுறுத்திக்கொண்டு இருக்கும் மிகக் கொடூரமான இந்தப் பிரச்சினை குறித்து இந்த உயர் சபையின் கவனத்தை ஈர்க்க விழைகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது வட மாகாணத்தில் யாழ்ப்பாணம், கிளிநொச்சி, மன்னார், முல்லைத்தீவு, வவுனியா மாவட்டங்களில் அதிகரித்துவரும் குற்றச்செயல்கள், வன்முறைச் சம்பவங்கள், 'ஐஸ்' எனப் படுகின்ற methamphetamine உள்ளிட்ட அபாயகரமான செயற்கைப் போதைப்பொருட்களின் ஊடுருவல் காரணமாக எமது மக்களின் அமைதியும் பாதுகாப்பும் பெரிதளவில் பாதிக்கப்பட்டுள்ளன. எமது மக்களின் பாதுகாப்பையும் நல்வாழ்வையும் உறுதிப்படுத்தாமல் நாட்டின் பொருளாதார மீட்சி பற்றியோ, நல்லிணக்கம் பற்றியோ பேச முடியாது. மூன்று தசாப்தகால யுத்தத்தின் வடுக்களிலிருந்து மீண்டுவரும் வடக்கு மாகாண இளைஞர்கள் போதைப்பொருளுக்கு அடிமையாவதால் தங்களது எதிர்காலத்தை இழந்து நிற்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. எமது நாட்டில் நீண்ட காலமாக அரசியல்வாதிகளுக்கும் போதைப்பொருள் வியாபாரிகளுக்கும் பாதாள உலகக் குழுவினருக்கும் இடையிலிருந்த பரஸ்பர உறவின்மூலம் போதைப் பொருளானது இந்த நாட்டில் புற்றுநோய்போல எங்குமே பரவியிருக்கின்றது. அரசியல்வாதிகள் போதைப்பொருள் வியாபாரிகள்மூலம் நன்மை அடைந்ததுபோல போதைப் பொருள் வியாபாரிகளும் அரசியல்வாதிகள்மூலம் நன்மை அடைந்தார்கள். போதைப்பொருள் வியாபாரத்தையும் அதன் ஊடுருவலையும் தடுப்பதற்கு எமது அரசாங்கத்தால் எந்தளவு நடவடிக்கைகளை எடுக்க முடியுமோ அந்தளவுக்கு நடவடிக்கைகள் எடுக்கப்பட்டு வருகின்றன. அவற்றை இன்னும் தீவிரமாக்க வேண்டியது எமது கடமையாகும். அவற்றை நாங்கள் விரைவில் மேற்கொண்டு, போதைப் பொருளை நாட்டிலிருந்து அடியோடு ஒழிக்கப் பாடுபடுவோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தற்போதைய நிலைமையின் தீவிரத்தைப் பின்வரும் புள்ளிவிபரம்மூலம் நான் உங்களுக்குத் தெரிவிக்க விரும்பு கின்றேன். பொலிஸ் போதைப்பொருள் ஒழிப்புப் பிரிவின் தகவல்களின்படி, ஆண்டுதோறும் நாடு முழுவதும் போதைப் பொருள் குற்றங்கள் தொடர்பில் 150,000க்கும் அதிகமானோர் கைது செய்யப்படுகின்றனர். வடக்கு மாகாணத்தின் யாழ்ப்பாணம், கிளிநொச்சி, மன்னார், முல்லைத்தீவு, வவுனியா ஆகிய 5 மாவட்டங்களிலும் ஹெரோயின், கஞ்சா, 'ஐஸ்' தொடர்பான கைதுகளின் எண்ணிக்கை தொடர்ந்தும் அதிகரித்துக்கொண்டே செல்கின்றது. உதாரணத்துக்கு, 2023ஆம் ஆண்டின் புள்ளிவிபரத்தின்படி, யாழ்ப்பாண மாவட்டத்தில் மட்டும் 600க்கும் மேற்பட்ட கைதுகளும் வவுனியா, மன்னார் மாவட்டங்களில் முறையே 260,130க்கும் மேற்பட்ட கைதுகளும் பதிவாகியுள்ளன. கிளிநொச்சி மற்றும் முல்லைத்தீவு மாவட்டங்களில் கைது செய்யப்படுவோரில் 70 - 84 சதவீதமானவர்கள் கஞ்சா பயன்பாடு மற்றும் கடத்தலுடன் தொடர்புடைய குற்றங்களில் ஈடுபடுவோராக இருக்கின்றனர். இன்று 'ஐஸ்' பயன்பாடு அனைத்து மாவட்டங்களிலும் வேகமாக ஊடுருவி வருகின்றது. இன்று குற்றச்செயல்கள் அதிகரிப்பதற்குப் போதைப்பொருள் முக்கிய காரணமாக இருக்கின்றது. போதைப்பொருளுக்கு அடிமைப்பட்ட இளைஞர்கள், திருட்டு, வீதிகளில் கொள்ளையடித்தல், தகாத வன்முறைச் செயல்களில் ஈடுபடுவதோடு, குழுக்களாகச் சேர்ந்து மோதல்களிலும் ஈடுபடுகின்றனர். போதைப்பொருள் பாவனையானது குடும்ப வன்முறைகளுக்கு நேரடியாகவே வழிகோலுகின்றது.

அடுத்து, நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் கட்டளைச் சட்டம் சார்ந்த திருத்தங்கள் பற்றி சொல்ல விரும்புகிறேன். தற்போதைய சட்டக்கட்டமைப் பிலுள்ள நடைமுறை மற்றும் சட்டப் பிரச்சினைகளே நீதி வழங்குவதில் தாமதத்தை ஏற்படுத்துகின்றன. எனவே, இன்று இப்படியானதொரு திருத்தச் சட்டமூலத்தைக் கொண்டுவருவது காலத்தின் தேவையாகும். அந்த வகையில், நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் கட்டளைச் சட்டத்தின் 54அ(1), 54அஅ(1), 83 (2) ஆம் பிரிவுகள் மற்றும் அதன் மூன்றாவது அட்டவணைக்கு முன்மொழியப்பட்டுள்ள திருத்தங்கள் குறித்து நாம் இங்கு அவதானிக்க வேண்டும்.

இங்கு எனக்கு முதல் பேசிய எதிர்க்கட்சி உறுப்பினர்கள் பலரும் இந்தச் சட்டத் திருத்தத்தை வரவேற்றதோடு, அதற்காகத் தங்களாலான ஆலோசனைகளையும் வழங்கி இருந்தார்கள். அதற்காக நாங்கள் அவர்களுக்கு நன்றி கூறக் கடமைப்பட்டு இருக்கின்றோம். பிணை தொடர்காக உள்ள தாமதத்தையும் சிறைச்சாலை நெரிசலையும் இந்தச் சட்டத் திருத்தத்தின்மூலம் ஓரளவுக்குத் தீர்க்கலாம் என்றே நாங்கள் எண்ணுகிறோம். 10 கிராமுக்கு மேற்பட்ட போதைப்பொருளை வைத்திருப்போர் பிடிபடும்பொழுது, அவர்களை நாட்டின் பல பகுதிகளில் இருந்தும் கொழும்புக்கு அழைத்து வரவேண்டி இருக்கிறது. இங்கு இருக்கின்ற மேன்முறையீட்டு நீதிமன்றத்தில் அவர்களுக்குப் பிணை வழங்கப்படாவிட்டால், அவர்கள் சிறைச்சாலைகளில் அடைக்கப்படுவதால் சிறைச் சாலைகளில் பாரிய இட நெரிசல் ஏற்படுகின்றது. இதன்மூலம் அங்கு பல்வேறு தொற்று நோய்கள் ஏற்படுவதோடு, அவர்களுக்கு மன உளைச்சல் ஏற்படுவதையும் காணக் கூடியதாக இருக்கின்றது. எனவே, இந்தச் சட்டத் திருத்தத்தின் மூலம் சந்தேக நபர்களுக்குப் பல்வேறு நன்மைகளை வழங்கக்கூடியதாக இருக்கும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, போதைப்பொருளால் பல பலவிதமான பாதிப்புகள் ஏற்படு கின்றன. குறிப்பாக, சுகாதாரப் பாதிப்பு ஏற்படுகின்றது. வட மாகாணத்தில் புனர்வாழ்வு மையங்கள் பற்றாக்குறையாக இருக்கின்றன. போதைப்பொருளால் பாதிக்கப்பட்டவர்களுக் குப் புனர்வாழ்வு அளிப்பதற்கான புனர்வாழ்வு மைய மொன்றை நாங்கள் அங்கு விரைவில் நிறுவ இருக்கிறோம். அதன்மூலம் பாரியதொரு reliefஐ அவர்களது பெற்றோருக்குக் கொடுக்க முடியும். ஏனென்றால், அநேகமான பெற்றோர் மனநிலை பாதிப்புடன் வாழ்ந்துகொண்டு இருக்கிறார்கள். தங்களது பிள்ளையை எப்படியாவது போதைப்பொருள் பாவனை யிலிருந்து மீட்டுத் தரும்படி கேட்கிறார்கள். வங்கி அதிகாரிகள்கூட அப்படி கேட்டிருக்கிறார்கள். பாடசாலை மாணவர்கள், பல்கலைக்கழக மாணவர்கள் எனப் பலரையும் போதைப்பொருள் பாவனையிலிருந்து மீட்டுத் தரும்படி அவர்கள் எம்மிடம் கேட்கின்றார்கள். இப்படி யானதொரு சமூகத்தில்தான் நாங்கள் இன்று வாழ்ந்து கொண்டு இருக்கின்றோம். இன்று போதைப்பொருளானது பாடசாலைகள், பல்கலைக்கழகங்கள், தனியார் கல்வி நிலையங்கள் என அனைத்து இடங்களிலும் தலைவிரித்தாடு கின்றது. அதனைத் தடுத்து நிறுத்த வேண்டியது எமது கடமையாகும். அதற்காக இப்படியான சட்டத் திருத்தங்கள் மிகவும் முக்கியமானவை.

போதைப்பொருளால் பொருளாதார சிக்கல்களும் ஏற்படுகின்றன. போதைப்பொருள் பாவனையில் ஈடுபடுவோர் தங்களது பொருட்களை விற்பதுடன், உழைப்பின் பெரும் பகுதியை போதைப்பொருளுக்கும் பயன்படுத்துகிறார்கள்.

[ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා]

මේලුම්, තර්කොලෙ, කොලෙකළ්, විපත්තුකළ් ඉතනාල් ඉඩම්පෙරුවතාල් සමුතායත්තිල් නාංකළ් පල්වේරු සික්කල්කළෙයුම් එතිර්කොළ්ළවේණ්ඩි ඉරුක්කිරතු. ඉප්පඩි යාන සට්ටත් තිරුත්තත්තින්මූලම් පෝතෛප්පොරුළ් පාවනෙයෙය මුර්‍රාක ඔළිත්තු, මක්කළුක්කුත් තීර්වෛප් පෙර්‍රුක්කොටුක්ක එමතු අරසාංකම් එන්‍රුමේ තයංකාතු. 'සට්ටත්තින් මුන් අනෛවරුම් සමම්' එන්‍ර රීතියිල් පෝතෛප්පොරුළ් සාර්න්ත විටයංකළිල් ඊටුපටුවෝරුක්කුත් තකුන්ත තණ්ටනෛකළෛ වළංකි, සට්ටත්තින් ආට්සියෛ නාංකළ් නිලෛනිර්‍රුත්තුවෝම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උර්‍රුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි.

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) එස්. ශ්‍රී පවානන්දරාජා)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)
Please give me one more minute, Sir.

இන්‍රෛය තිනම් ඉච්සපෛයිල් සෙම්මණි පුතෛකුෆි තොටර්පාකවුම් ඉංකු පලර් පිරස්තාපිත්තු ඉරුන්තාර්කළ්. අතු තොටර්පාන කුලුවිල් ඉරුක්කින්‍ර කුර්‍රිත්ත අතිකාරියෛ එංකළුටෛය අරසාංකම් නියමික්කවිල්ලෛ. අවර් තනතු සොන්ත අර්‍රික්කෛයෛයේ නීතිමන්‍රත්තුක්කුක් කොටුත්තිරුක්කිරාර්. නාට්ටිල් සට්ටත්තුක්කු මේල් යාරුමේ ඉල්ලෛ. ඉතු තොටර්පිල් නීතිමන්‍රම් විරෛවිල් ඔරු මුටිවෛ එටුක්කුම්. අන්ත මුටිවුක්කු එල්ලෝරුම් කට්ටුප්පටුවෝම්. සන්තර්ප්පම් වළංකිය මෛක්කු නන්‍රි කූර්‍රි, විටෛ පෙර්‍රුකින්‍රේන්. වණක්කම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උර්‍රුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.03]

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු මේජර් ජෙනරල් (ඉවත්වුපෙට්ර) අරුණ ජයසේකර - පාතුකාප්පුප් පිරති අමෛච්චර්)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද විවාදය පැවැත්වෙන්නේ විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත් පිළිබඳවයි. අපි මේ ආඥාපනතට සංශෝධන ගෙන එන්නේ ඇයි කියන එක සබැඳිව තාක්ෂණික කරුණු නීතිමය පැත්තෙන් සාකච්ඡා වුණා. ඒ වාගේම සෑම පැත්තකින්ම ඒ සම්බන්ධයෙන් ගොඩක් කරුණු කාරණා, අදහස් ඉදිරිපත් කළා. ඒ කියන්නේ, අපි මතක් කර දිය යුතු විශේෂ කරුණු ගොඩක් ඒ සඳහා මූලික වෙනවා.

පසුගිය කාල වකවානු තුළදී මේ රටේ ඇති වෙච්ච සිද්ධි දිහා බලන්න. පසුගිය මැතිවරණ දෙකෙන් අපි බලයට පත් වුණා. ඒ මැතිවරණ දෙකෙන්ම අපේ රටේ මුළුමහත් ජනතාව විසින් පලවා හැරියේ මේ රටේ මෙතෙක් තිබූ දූෂිත දේශපාලන ක්‍රමයයි. ඒ කියන්නේ, ලෝකයේම තිබුණු මහා පරිමාණ දූෂණ සහ වංචා, ලෝකයවත් උහුලන්නේ නැති මහා පරිමාණ අපරාධ, දේශපාලන කුමන්ත්‍රණ, බලය ඩැහැ ගැනීම වෙනුවෙන් ජාතිවාදය, ආගම්වාදය මුල් කරගෙන සිදු කළ ක්‍රියාකාරකම් තමයි මේ රටේ ජනතාව පසුගිය මැතිවරණ දෙකේදී පරාජය කළේ. අපරාධ සිදු කිරීම මූලධර්මයක් කරගෙන තිබුණු අභිබිහිසුණු, ජඩ, මැර, පවුල් පාලනවලින් සමන්විත වෙච්ච චෞර පාලනය දරුණු ලෙස කරගෙන ගියේ මේ මත්ද්‍රව්‍ය මුල් කරගෙනයි. අපේ රටේ දේශපාලනය තුළ වසර ගණනාවක් තිස්සේ තිබුණේ එවැනි තත්ත්වයක්. අපි මේ පලවා හැරියේ ඒකේ එක කල්ලියක් නොවෙයි. මේ කල්ලි ජාලගත වෙලා තිබුණේ. සංවිධානාත්මක අපරාධ, මත්ද්‍රව්‍ය ජාවාරම්, දේශීය සහ විදේශීය මහා ජාවාරම්කරුවන් එකතු වෙලා දරුණු ගණයේ අපරාධ ලංකාව තුළ සිදු කරලා, අපේ රට පාර රාජ්‍යයක් කරපු දීර්ඝ ඉතිහාසයක් තමයි අපට තිබුණේ. ඒක තමයි අපි කඩලා, නැති කරලා තිබෙන්නේ. ඒ වෙනුවෙන් තමයි මේ රටේ මහජනතාව අපිට බලය ලබා දීලා තිබෙන්නේ. මේ රටේ කුලියට මිනී මරපු අය හිටියා. මිටි පිටින් තමයි කුඩු ගෙනාවේ. එවැනි මහා හොර තක්කඩි රැළක් තමයි දේශපාලනය කරමින් මේ රට පාලනය කළේ.

අපේ රට මේ තැනට පත් වෙන්න මූලික වෙච්ච කරුණු තමයි මත්ද්‍රව්‍ය සහ පාතාලය ඇතුළු සංවිධානාත්මක අපරාධ. ඒකේ නෑයෝ වෙච්ච අයියලා, මල්ලිලා, අප්පලා ඔක්කෝම එකතු වෙලා තමයි මේ රට මහා දරුණු අගාධයකට ඇද දැමුවේ. ඒක හිටපු දේශපාලනඥයින්ගේ එක qualification එකක්. ඔවුන්ට දේශපාලනය කරන්න එක සුදුසුකමක් තමයි, ඒක. අපේ රටේ දේශපාලනය ඒ තිබුණු පාතාලයට යටත් වෙලා, ඒ අපරාධකරුවන් හරහා යම් යම් උදව්ය බිය ගන්වලා, සුදු වැන් සංස්කෘතිය වැනි දේවල් අරගෙන ඒමට මූලික වුණේ මේ මත්ද්‍රව්‍යයි. මත්ද්‍රව්‍යවලින් සිදු වුණු ව්‍යසනයෙන් අපේ රට ගොඩ ගන්න අපට තවත් වසර ගණනක් ගත වනවා. ඒ තරම් දරුණු ලෙස කිඳා බැහැ ගත්ත මහා මුල් සහිත වෘක්ෂ තමයි පසුගිය කාල වකවානු තුළදී අපි දැක්කේ. ඒක නිසා තමයි අපි මේවායේ මුදුනටම අත තියලා තිබෙන්නේ. අපේ නීතිය මේ සියල්ලේ මුදුනටම අත තියලා තිබෙනවා. නීතිය කාටත් සාධාරණයි. මේ රටේ නායකයාද, අපිද, කවුද කියන එක අදාළ නැහැ, නීතිය තමයි උඩින්ම තිබෙන්නේ. නීතිය තමයි මුදුනටම ගහලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි පසුගිය අවුරුදු දෙකහමාරක කාලය තුළදී අපි නීතිය ක්‍රියාත්මක කරලා මහා පරිමාණයෙන් අපේ රටට මත්ද්‍රව්‍ය සපයපු ජාවාරම්කරුවන් 70කට වැඩි පිරිසක් රතු නිවේදන මඟින් අත්අඩංගුවට අරගෙන මේ රටට ගෙනැල්ලා තිබෙන්නේ. මේ උදව්ය සියයට සියයක්ම මේ මත්ද්‍රව්‍ය ජාලය හරහා, මත්ද්‍රව්‍ය ජාවාරම හරහා එතෙර, මෙතෙර, මහ මුහුදේ සිට ඒ ජාවාරම්වලට සම්බන්ධ අය. අපි බලයට ඇවිත් 2025-2026 කියන මේ අවුරුදු දෙක ඇතුළත හෙරොයින්, කොකේන්, ගංජා, කුෂ්, හෂීස්, මත් පෙති විතරක් නොවෙයි, අයිස් - methamphetamine - කියන වර්ගයත් අද සාකච්ඡා කරන මෙම සංශෝධිත පනත ඇතුළට අරගෙන තිබෙනවා. ඉහත කී වර්ග කිලෝ දහස් ගණනින් තමයි අපේ රටට ගෙනැල්ලා තිබෙන්නේ.

විශේෂයෙන්ම මේ කාරණයත් මේ අවස්ථාවේදී මම කියන්න ඕනෑ. අපේ මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඉන්න අතිදක්ෂ විමර්ශන කණ්ඩායම් එතෙර ගිහිල්ලා මේ මහා ජාවාරම්කරුවන් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ත්‍රිවිධ හමුදාව ඇතුළු පොලිසියත්, ශ්‍රී ලංකා පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයත්, වෙරළ ආරක්ෂක බලකායත්, විශේෂ කාර්ය බලකාය ඇතුළු බුද්ධි අංශත් එකතු වෙලා 2025 වසරේ විතරක් රුපියල් බිලියන 75කට අධික වටිනාකමකින් යුක්ත, මම කලින්

සඳහන් කළ මත්ද්‍රව්‍ය ප්‍රමාණය අත්අඩංගුවට ගෙන තිබෙනවා. 2026 වසරේ මේ දක්වා රුපියල් බිලියන 57කට අධික වටිනාකමකින් යුක්ත මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන තිබෙනවා.

අපි "රටම එකට" ජාතික මෙහෙයුම වැඩසටහන පසුගිය අවුරුද්දේ ඔක්තෝබර් 30වැනි දින නිල වශයෙන් ජනගත කළා. එදා පටන් මේ දක්වා රුපියල් බිලියන 97කට අධික වටිනාකමකින් යුක්ත මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. මේ ඔක්කෝම සල්ලි එකතු කළා නම් අපිට නැව් ගන්න තිබුණා, වරායන්, ගුවන් තොටුපළවල්, කර්මාන්තශාලා හදන්න තිබුණා. ඒ තරම් දරුණු අපරාධ. ඒ නිසා තමයි නීති සම්පාදනය කරලා, පනත් සංශෝධනය කරලා රට හදන්න කටයුතු කරන්නේ. ඉස්සෙල්ලාම මේ රටෙන් ව්‍යසන, විෂබීජ, දරුණු අපරාධ තුරන් කරන්න ඕනෑ, හොඳ සමාජයක් ගොඩ නඟන්න; හොඳ ක්‍රමවේදයක් ගොඩ නඟන්න; හොඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න. නමුත් මීට කලින් පවුල් ජාල විධියට ඔක්කෝම එකතුවෙලා රට හදන්නේ නැතිව රට විනාශ කරන්න තමයි කටයුතු කළේ. අපි ඒ තත්ත්වයෙන් රට බේරා ගන්න ඕනෑ. ඒ නිසා තමයි මේ පනත් සංශෝධන ගේන්නේ. මේවායෙන් රටේ අනාගතයට ඉතා හොඳ දේවල් සිද්ධ වෙනවා.

මීට කලින් ලංකාවේ, බංකොලොත් රටේ යහමින්, සැපෙන් හිටපු, බලයට ලොල් වෙලා හිටපු, බලය භුක්ති විඳපු අය තමයි මත්ද්‍රව්‍ය ජාවාරම්වලට මුල් වෙලා තිබෙන්නේ. ඔවුන් ඒවායෙන් හම්බ කරගත්තා. ඒ වාගේම ඔවුන්ගේ දරුවන්ටත්, දරුවන්ගේ දරුවන්ටත් හම්බ කර ගත්තා. ඒවා වෙනස් කරනකොට තමයි පාද යාත්‍රා, පා ගමන්, බලි තොවිල් කරන්නේ. ඒවා කරලා හරියන්නේ නැහැ. ඒවා නොවෙයි කරන්න ඕනෑ. ජාලයන් කඩනකොට ඒවායෙන් යැපුණු කට්ටිය භය වෙනවා. ඒවායින් යැපුණු කට්ටිය උද්ඝෝෂණ කරනවා. ඔවුන්ට දැන් ඉතුරුවෙලා තිබෙන්නේ, do-or-die game එකක් විතරයි, වෙන මුකුත් නැහැ. ඒ නිසා අහිංසක මිනිස්සු ටිකක් අල්ලාගෙන ඔවුන්ව නොමඟ යවලා මේ දේවල් කරන්න උත්සාහ ගන්නවා. නමුත් ඒවා හරියන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුඩ්ඩන්ට, හොරුන්ට, වනචාරින්ට රඟන්න දෙන්න නොවෙයි අපි බලය ගත්තේ. ගරු ජනාධිපතිතුමා ඇතුළු අප සියලු දෙනාට සමස්ත ජනතාව වරම ලබා දීලා අපෙන් ඉල්ලුවේ, මේ රට හදන්න, මේ රට මත්ද්‍රව්‍ය ජාවාරමෙන්, මත්ද්‍රව්‍ය ජාලයෙන්, සංවිධානාත්මක අපරාධවලින් බේරා දෙන්න, හොඳ සමාජයක් ගොඩ නඟලා දෙන්න කියලායි. ඒ දේවල් ඉවත් කරන්නේ නැතිව අපි කොහොමද ළමයෙකුට ආදර්ශයක් දෙන්නේ? බලන්න, පාර්ලිමේන්තුවේ මේ මහජන ගැලරියට ඇවිත් ඉන්නේ අපේ රටේ අනාගතය භාරගන්න ඉන්න දරුවෝ. ඔවුන්ට අපි හොඳ අනාගතයක් හදලා දෙන්න ඕනෑ. ඒ අපේ රත්තරන් දරුවෝ, ඉදිරියේදී රටට නායකත්වය දෙන්න ඉන්න අය.

දැන් භයවෙලා ඉන්නේ කවුද? මේවාට සම්බන්ධ වෙලා ඉන්න, ජාලගත වෙලා සිටින මහා සංවිධානාත්මක අපරාධ සිදුකරන අය. මේවාට සම්බන්ධ වෙලා තිබෙනවා රජයේ නිලධාරීන් කිහිප දෙනෙකුත්. ඒ වාගේම අනෙක් ආයතනවල අයත් ඉන්නවා. බැංකු පද්ධතියේ ගිණුම් කටයුතු කරන අය ඉන්නවා; audit firms තිබෙනවා. එවැනි යම්කිසි කොටසක් ඉන්නවා. ඒ වාගේම යම්කිසි ව්‍යාපාරිකයෝ කොටසකුත් ඉන්නවා. පාතාලය සහ සංවිධානාත්මක අපරාධ කරන අයත් ඉන්නවා. ඒ නිසා තමයි වෙඩික්කරුවෝ උදේ හවස ඇවිල්ලා, කුලියට මිනී මරලා, මිනිස්සුන්ව භය කරන්නේ. අපි භය නැහැ. අපි එඩිතරව තීන්දු තීරණ ගන්නවා. අපි ප්‍රතිපත්තිගරුක විධියට, නීතිගරුක විධියට, ප්‍රජාතන්ත්‍රවාදී ලෙස, ප්‍රජාතන්ත්‍ර ව්‍යුහය ඇතුළේ මේ රාජ්‍යකරණය ඉතාම හොඳින් කරගෙන යනවා. ඒ නිසා තමයි අපට ජාත්‍යන්තරයෙන් පවා ප්‍රසාදය ලැබිලා තිබෙන්නේ.

අපේ රටේ ආර්ථික තත්ත්වය ගොඩ නැඟීම තමයි අපේ මූලිකම අභියෝගය වුණේ. ආර්ථිකයක් නැතිව අපට ජාතික ආරක්ෂාවකුත් නැහැ, සංවර්ධනයකුත් නැහැ, පැවැත්මකුත් නැහැ. ඒ නිසා තමයි අර්ථිකය ගොඩ නැඟීම අපේ මූලික දෙය වුණේ. මේ විධියට ව්‍යසන සිදු වෙනකොට, මත්ද්‍රව්‍ය ජාවාරම් කරනකොට ආර්ථිකයක් හදන්න පුළුවන්ද? බැහැ. ඒ නිසා ඒවා රටින් තුරන් කරන්න ඕනෑ. ඒකට ඉතාම විනයගරුක, විනිවිදභාවයකින් යුතු රාජ්‍යකරණයක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම ආර්ථික වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. ඒ නිසා තමයි අපි මූලිකවම ආර්ථික ස්ථාවරත්වය ගොඩ නඟන්න කටයුතු කළේ. ආර්ථික ස්ථාවරත්වයක් ගොඩ නඟන්නේ නැතිව අපට කිසිදු ගමනක් නැහැ.

අපට පසුගිය වසර දෙක ඇතුළත ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් ඉතාම හොඳ, වටිනා, වැදගත් ප්‍රශංසා සහ comments ලැබුණා. ඔවුන් ඇවිල්ලා අපේ ජනාධිපතිතුමාව, මැති ඇමතිවරු, ගරු අගමැතිතුමිය හමුවෙලා ප්‍රශංසා කළා. අපි ඒ විධියට ලෝකය දිනාගෙන තිබෙනවා. අපි ලෝකයට විශ්වාසයක් ගොඩ නැඟුවා, දැන් රටේ නීතිය ඉතාම හොඳින් ක්‍රියාත්මක වෙන බවට. ඒක තමයි ජාත්‍යන්තර ආයෝජකයින්ට අවශ්‍ය වෙන්නේ. මොකද, ඔවුන් ඇවිල්ලා invest කරන්නේ ඔවුන්ගේ මුදල්. ඔවුන්ට මුදල් ආයෝජනය කරන්න නම් විශ්වාසයක් ඇති වෙන්න ඕනෑ. සංචාරක කර්මාන්තය දියුණු වෙන්න නම්, මත්ද්‍රව්‍ය ජාවාරම අයින් කරන්න ඕනෑ, පාතාලය නැති වෙන්න ඕනෑ, සංවිධානාත්මක අපරාධ නැති වෙන්න ඕනෑ. ඒ නිසා තමයි රටට ඔබින විධියට, රටට වැඩදායි විධියට මේ නීති ගෙනැල්ලා, පනත් සංශෝධන ගෙනැල්ලා ඉදිරි වැඩ කටයුතු සාර්ථක කරගන්න කටයුතු කරන්නේ. එතකොට තමයි ආර්ථික ස්ථාවරත්වයක් ගොඩ නඟාගෙන හොඳ සංවර්ධනයක් කරා යන්න පුළුවන් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෑතකදී බ්‍රිතාන්‍ය මහ කොමසාරිස්තුමා ඉතාම හොඳ comment එකක් දීලා තිබුණා, ඉදිරි වසර 30 ඇතුළත ආසියාවේ රටවල් අතරින් ඉතා හොඳින්ම දියුණු වෙන රට ලංකාව කියලා. එතුමා මේ රටේ අවුරුදු තුනකට වැඩි කාලයක් හිටියා. එතුමා දැක තිබෙනවා, මේ රටේ සියලු දේශපාලන අර්බුද, ආර්ථික අර්බුද, සමාජයීය අර්බුද. ඒ වාගේම පසුගිය කාල වකවානුවල ඇතිවෙච්ච දේවල් එතුමා හොඳට අධ්‍යයනය කර තිබෙනවා, ඒවා ප්‍රායෝගිකව දැකලාත් තිබෙනවා. ඒවා බලලා, මේ අවුරුදු දෙක ඇතුළත අපේ මේ වැඩ පිළිවෙළේ සාර්ථකත්වය දැකලා, ඒ අනුව තමයි එතුමා ඒ ප්‍රකාශය කරන්නේ.

අපේ මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ සිටින ඒ අතිවිශිෂ්ට, ඉතාම දක්ෂ විමර්ශන නිලධාරීන් පසුගිය අවුරුදු එකහමාරක කාලය තුළ කරන ලද විමර්ශනවලින් අත්අඩංගුවට අරගෙන තිබෙන අවි ප්‍රමාණය දිහා බැලුවාම පුදුම හිතෙනවා, මොන විධියේ රටක් ද මේ තිබුණේ කියලා. ඒ අවි ප්‍රමාණයන් ගත්තොත්, T-56 77ක්, පිස්තෝල 90ක්, රිවෝල්වර 63ක්, වෙනත් අවි දෙදහස් ගණනක් වශයෙන් මුළු එකතුව දෙදහස් හාරසිය ගණනක් වෙනවා. ඒ, එක අවුරුද්දක; 2025 අවුරුද්දේ විතරක් අත්අඩංගුවට ගත් ප්‍රමාණය. ඊට කලින් කොච්චරද? තවත් අවි ආයුධ නිදැල්ලේ තිබෙනවා. තවත් නිදැල්ලේ ඉන්නවා, මේ ජාවාරම් කරන ජාවාරම්කරුවන්, මහා දරුණු අපරාධකාරයින්. නිහාගන්න පුළුවන්ද, ඔවුන්ට තිබෙන දේපළ පිළිබඳව? පිට රටවල සුවිසල් මන්දිර, සුපර්මාර්කට්, යාන වාහන තිබෙනවා. ඒ අය සුඛෝපභෝගී ජීවිත ගත කරනවා. ඒවා කරන්නේ

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

කොහොමද? අපේ අහිංසක මිනිස්සුන්ගේ සල්ලි එකතු කරගෙන. මිනිස්සුන්ව මරවලා, විෂබීජ දීලා, මත්ද්‍රව්‍ය දීලා නැති කරලා උපයන සල්ලිවලින් තමයි ඔවුන් වැජඹෙන්නේ. රජයක් හැටියට ගරු ජනාධිපතිතුමා, කැබිනට් මණ්ඩලය ඇතුළු සියලු දෙනා මේ රටේ ජනතාවට පොරොන්දු වෙනවා, අපි අනිවාර්යයෙන් මේ මත්ද්‍රව්‍ය රකුසා, මේ පිළිලය මේ දේශයෙන් තුරන් කරනවා කියලා. එසේ තුරන් කරන්න අපට කාලයක් ඕනෑ, මේ විධියේ පනත් ඕනෑ, මේ විධියේ සංශෝධන පනත්වලට ගෙනෙන්න ඕනෑ. ඒවායින් තමයි ගරු අධිකරණය ශක්තිමත් වෙන්නේ. ගරු අධිකරණය විසින් මේ ගැන ඉතාම හොඳින් කටයුතු කරලා තමයි තීන්දු තීරණ දෙන්නේ. ඒ ගැන අපට මහා විශ්වාසයක් තිබෙනවා. රත්තරන් වාගේ වටින අපේ මේ අනාගත පරපුරට අපි හොඳ අනාගතයක් හදලා දෙන්න ඕනෑ, ඔවුන්ට හොඳ රටක් ගොඩනඟලා දෙන්න ඕනෑ. ඒක තමයි මේ පනත් කෙටුම්පත් ගෙන ඒමේ වැදගත්කම, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජී.ඩී. සූරියබණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.15]

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ වගන්ති කිහිපයකට සංශෝධන ගෙන එන අද දවසේ, එම විවාදයට එකතු වෙලා මගේ අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම අපි අද දිනයේ මේ සංශෝධන තුළින් බලාපොරොත්තු වන්නේ මොනවාද කියන එක ගැන සරලවම කිව්වොත්, ඇප ලබා දීමේ කාරණයට අදාළව ග්‍රෑම් 10ක් වශයෙන් ඇති අවම මත් කුඩු සීමාව ග්‍රෑම් 100ක් දක්වා ඉහළ දැමීමටත්, විමර්ශකයින් විසින් අත්අඩංගුවට ගනු ලබන මත් කුඩු සාම්පල රඳවා ගැනීමෙන් පසු නඩු විභාගය අවසන් වීමට පෙර එම මත් කුඩු විනාශ කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීමත්, ආණ්ඩුවේ රස පරීක්ෂක වාර්තා නිකුත් කිරීම කඩිනම් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීමටත්, methamphetamine නිෂ්පාදනය ඇතුළු 3වන උපලේඛනයේ සඳහන් අන්තරායදායක ඖෂධ නිෂ්පාදනය කිරීම වරදක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීමත්, මහ මුහුදේ දී methamphetamine නිෂ්පාදනය කිරීම වරදක් බවට විධිවිධාන සැලැස්වීමටත්, අභියාචනාධිකරණය විසින් ඇප ලබා දීමට අවශ්‍ය විධිවිධාන පැනවීමත් තමයි මේ සංශෝධන තුළින් බලාපොරොත්තු වෙන්නේ. ඒ වාගේම, *Cannabis sativa* L.වල ස්වාභාවික සංයෝග අඩංගු යම් සැකසුමක් අන්තරායදායක ඖෂධයක් ලෙස නිශ්චිතව දැක්වීමත් මේ සංශෝධනය තුළින් බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට පිහිටා තිබෙන්නේ ඉන්දියන් සාගරයේ භූගෝලීය වශයෙන් ඉතාම වැදගත් ස්ථානයක බව අපි දන්නවා. භූගෝලීය වශයෙන් අපේ රටට වටිනාකමක් ලැබුණත් මහ සයුරෙන් වටවෙලා තිබෙන අපේ රට විවිධ තර්ජනවලට, අභියෝගවලට මුහුණ දෙනවා. එහෙම නැත්නම්, අනාගතයේදී මුහුණ දෙන්නට සිදු වෙනවා. ඒවා අපි අවබෝධ කරගත යුතුයි. ඒ තර්ජනයන් මොනවාද කියන එකත්, දැනට මුහුණ දෙන තර්ජන සහ මුහුණදීමට නියමිත තර්ජන සඳහා රටක් වශයෙන් මොන වාගේ ක්‍රියාමාර්ග ගත යුතුද කියන එක සම්බන්ධයෙනුත් අපි හැමෝම අවධානය යොමු කළ යුතු වෙනවා, විශේෂයෙන්ම ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීමේදී. ප්‍රධාන වශයෙන්ම පසුගිය කාලයේත් අපේ රටට - මේ දිවයිනට - තර්ජන, එහෙම නැත්නම් අභියෝග රාශියක් පැමිණි ආකාරය අපි දැක්කා. පළමුවෙනි එක තමයි, මිනිස් ජාවාරම - human trafficking. අපේ මුහුදු සීමාවේ සහ ජාත්‍යන්තර මුහුදු සීමාවේ මිනිස් ජාවාරමට සම්බන්ධ පිරිස් පසුගිය කාල සීමාව තුළ බහුලව අත්අඩංගුවට පත් වෙනවා අපි දැක්කා. ඒ වාගේමයි, මත්ද්‍රව්‍ය ජාවාරම - drug trafficking. මත්ද්‍රව්‍ය ජාවාරම විශේෂයෙන්ම මුහුදු මාර්ගයෙන් ජාත්‍යන්තර මත් කුඩු ජාවාරම හා සම්බන්ධ වෙලා අපේ රට මත් කුඩු බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් බවට පත් වීමේ අවදානමක් තිබුණා. මුහුදු මාර්ග හරහා අපේ රටට මත් කුඩු පැමිණීමේ තර්ජනයක් තිබෙනවා. ඒ වාගේම තමයි, නීති විරෝධී සංක්‍රමණිකයන්. පසුගිය කාලයේ අපි දැක්කා, මියන්මාරයේ රෝහින්ග්‍යා සරණාගතයන් ලංකාව ආශ්‍රිත මුහුදු සීමාවට පැමිණීම නිසා සරණාගත ප්‍රශ්නයකුත් ඇති වුණු බව. අනාගතයේදීත් සරණාගතයන් මේ රටට ඇතුළු වීමේ අවදානමක් නැහැ කියන එක කිසි ලෙසකින්වත් අපට බැහැර කරන්න බැහැ. ඒ වාගේම අපේ රටට නීති විරෝධී ආකාරයෙන් විවිධාකාරයේ භාණ්ඩ ගෙන්වන්න පුළුවන්. විශේෂයෙන් බරපතළම කාරණය තමයි, රටට බාහිර තර්ජන, ඒ කියන්නේ ත්‍රස්තවාදී තර්ජන සිදු වීමේ සම්භාවිතාව. එයත් අපට බැහැර කරන්න බැහැ. අපි ඒ සඳහාත් අවශ්‍ය විධිවිධාන සලසා ගත යුතු වෙනවා. මේ කාර්යයේදී අපට multi-pronged approach එකක් අවශ්‍ය වෙයි කියා මම විශ්වාස කරනවා.

මේ සියලු කරුණු ගත්තාම පෙනෙනවා, අපේ රට වටා තිබෙන මුහුදු තීරය සුරක්ෂිත කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වන බව. ශ්‍රී ලංකා නාවික හමුදාවත්, ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවත් ශක්තිමත් කිරීම තුළින් අපේ රට වටා තිබෙන මුහුදු සීමාව සුරක්ෂිත කරන්න අපට පුළුවන්. එසේ සුරක්ෂිත කිරීම තුළින් මේ රටට සිදු විය හැකි අනතුරු අවම කර ගැනීමේ හෝ මර්දනය කර ගැනීමේ හැකියාව අපට ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ගරු ධීවර නියෝජ්‍ය ඇමතිතුමාත් එතුමාගේ කථාවේදී ප්‍රකාශ කළා, ධීවර බෝට්ටු, එහෙම නැත්නම් බහුදින යාත්‍රා මඟින්, අනෙකුත් ධීවර යාත්‍රා මඟින් අපේ රට තුළට මත් කුඩු පැමිණීමේ භයානක අනතුරක් තිබෙන බව. පසුගිය කාලයේ අපි දැක්කා, බහුදින ධීවර යාත්‍රාවලින් අපේ රටට මත් කුඩු ගෙනෙන පිරිස් අත්අඩංගුවට ගන්නා ආකාරය. ඒ වාගේම තමයි, රට වටේ තිබෙන ධීවර ගම්මාන ඍජු අධීක්ෂණයට යටත් කළ යුතු වනවා. හේතුව, බහුදින ධීවර යාත්‍රා වාගේම කුඩා පරිමාණයේ බෝට්ටු, යාත්‍රා දියත් කරන්නේ ඒ ධීවර ගම්මානවලින්. ධීවර යාත්‍රා මුහුදට දියත් කළාට පස්සේ නැවත පැමිණීමේදී රට තුළට නොයෙකුත් ආකාරයේ අනවශ්‍ය දේවල් - විශේෂයෙන් මත් කුඩු - පැමිණීමේ අවදානමක් තිබෙනවා.

දෙවනුව, තර්ජනවලට මුහුණ දීම සඳහා අවශ්‍ය යන්ත්‍රණ අපි අනිවාර්යයෙන්ම සකසන්න ඕනෑ. මත්කුඩු ජාවාරම සම්බන්ධයෙන් එහෙම නැත්නම්, මත් කුඩු සටනට එරෙහිව අපි යන්ත්‍රණයක් සකස් කර තිබෙනවා. ඒ, "රටම එකට" ජාතික වැඩසටහනයි. දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය මට්ටමින් ඒ යන්ත්‍රණය සකස් කරලා අපි ඒ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා.

තුන්වනුව, අවශ්‍ය නීති සම්පාදනය කරන්න වෙනවා. එහෙම නැත්නම්, පවතින නීති යාවත්කාලීන කිරීම, එහෙමත් නැත්නම් ඒවා සංශෝධනය කරලා යාවත්කාලීන කිරීම අවශ්‍ය වනවා. ඒ නිසා තමයි අද මේ විවාදයේදී විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ යම් යම් වගන්ති අපේ රටට, වර්තමානයට උචිත ආකාරයට සංශෝධනය කරන්නේ. ඒ තුළින් අපි බලාපොරොත්තු වෙනවා, විශේෂයෙන්ම කලින් කථා කළා වාගේ බන්ධනාගාරවල තදබදය නැති කිරීමට වාගේම රටේ ජනතාවට යුක්තිය පසිඳලීමේදී යුක්තියේ සාධාරණත්වය ඉටු කිරීමට අවශ්‍ය නීතිමය පරිසරය නිර්මාණය කර දීමට.

අද අප මේ සම්බන්ධව කථා කරනවා වාගේම අර කියපු කරුණු කාරණාවලට අදාළවත්, එනම් ත්‍රස්තවාදී කටයුතුවලට එරෙහිවත් පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමට නියමිතයි. ඒ තමයි, ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත. ඒ වාගේම, සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පතත් පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමට නියමිතයි. මේ කාරණා සම්බන්ධයෙන් අපි සැලකිලිමත් විය යුතුයි. විශේෂයෙන්ම මත් කුඩු ජාවාරම මැඩලීම සඳහා ශ්‍රී ලංකා පොලිසියේ විශේෂ කාර්ය බලකාය නොයෙකුත් අපහසුතා මධ්‍යයේ වුණත් ඉතාම සුවිශේෂ කාර්යභාරයක් කරනවා. අපි ඒ සඳහාත් අවධානය යොමු කරන්න අවශ්‍යයි. ඔවුන්ට අවශ්‍ය සියලු සම්පත්, පිරිස් බලය ලබා දීලා මේ කාර්යයට සහයෝගය ලබා දුන්නොත්, මත් කුඩු ජාවාරම රට තුළ ව්‍යාප්ත වන එක නවත්වා අපේ රට මත් කුඩුවලින් තොර රටක් බවට පත් කර ගැනීමේ හැකියාව තිබෙන බව ප්‍රකාශ කරමින්, කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රියාස් ෆාරූක් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.24]

ගරු රියාස් ෆාරූක් මහතා
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් විවාද කරන මේ අවස්ථාවේ මට කථා කරන්න කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්ලාම් ආගමේ ශුද්ධ වූ අල් කුරානයේ පැහැදිලිව සඳහන් වෙනවා, මිනිසාගේ බුද්ධිය නැති කරන, මිනිසාගේ ශරීරයට සහ සමාජයට හානි කරන සියලුම මත්ද්‍රව්‍ය හා මත්පැන් සම්පූර්ණයෙන්ම තහනම් කියලා; "හරාම්" කියලා. මත්ද්‍රව්‍ය භාවිතය යනු, යක්ෂයාගේ ක්‍රියාවක් වන අතර, එයින් වැළකී සිටීම සමාජයේ යහපතට හේතු වන බවත් එහි සඳහන් වෙනවා. මේ බව ඉස්ලාම් ආගමේ විතරක් නොවෙයි, බෞද්ධ, හින්දු සහ කතෝලික යන ආගම්වලත් සඳහන් කර තිබෙනවා. ඒ හින්දා තමයි අපේ ආණ්ඩුව "රටම එකට" කියලා ව්‍යාපෘතියක් ගෙනැල්ලා මේ ඔක්කෝමලා එකතු වෙලා වැඩ කරන්නේ. ඒ ඇයිද කිව්වොත්, මේ මත්ද්‍රව්‍ය නිසා අපේ තරුණ ළමයින්ට විශාල වශයෙන් හානි වෙනවා. ඒවා ඒගොල්ලන්ම හොයාගත්තු ඒවා නොවෙයි. මේ තරම් මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් ලංකාව ඇතුළට එන්නට දේශපාලකයෝ මුල් වෙලා තියෙනවා. හිටපු අධිකරණ ඇමතිතුමාගේ පුතාගේ ඉඳලා විපක්ෂයේ හිටපු ඇමතිවරුන්, මන්ත්‍රීවරුන්, ඒගොල්ලන්ගේ නෑදෑයන් කට්ටිය, පළාත් පාලන ආයතනවල නිලධාරීන් ඇතුළු සියලුදෙනා එකතු වෙලා තමයි මේ උවදුර වර්ධනය කර ගත්තේ. මෙය තුරන් කරන්න වැඩ කරමින් ඉන්න වෙලාවේ තමයි අප මේ පනත් සංශෝධනයත් කරන්නේ.

මට කලින් කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීවරු දෙන්නෙක් බන්ධනාගාරයේ ඉඳලා කෙළින්ම මෙතැනට ආවා. ඒගොල්ලෝ මෙතැනට ඇවිල්ලා අදහස් කිහිපයක් කිව්වා. අපේ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ experience එක නැති හින්දා ඒගොල්ලන්ගේ experience එක අපිත් එක්ක බෙදා ගත්තාට අපි ස්තුතිවන්ත වෙනවා. බන්ධනාගාරයේ ඉඩ මදි කියන ප්‍රශ්නය ගැනත් ඒගොල්ලෝ කිව්වා. ඒ වාගේම, මත්ද්‍රව්‍ය ලොකු ප්‍රමාණයක් මේ රටට ගෙන්වන අය ගැනත් කිව්වා. ඒ වාගේම, මත්ද්‍රව්‍ය ලොකු ප්‍රමාණයක් බිස්නස් කරන අය ගැනත් කිව්වා. මත්ද්‍රව්‍ය පොඩි ප්‍රමාණයක් පාවිච්චි කරන කට්ටිය ඇල්ලුවාට වැඩක් නැහැ, මත්ද්‍රව්‍ය ව්‍යාපාරය ලොකුවට කරන කට්ටිය තමයි දැන් අල්ලන්න ඕනෑ වාගේ ගොඩක් කරුණුත් මෙතැනදී ඉදිරිපත් කළා. ඇත්තටම එතුමන්ලාත් දන්නවා, අපි බලයට ආපු වෙලාවේ ඉඳලා අල්ලන්නේ ලොකු මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයන් බව; මත්ද්‍රව්‍ය ලොකු ප්‍රමාණවලින් ගෙනෙන කට්ටිය බව. පිටරට ඉඳන් මත්ද්‍රව්‍ය බිස්නස් කරන ශ්‍රී ලාංකිකයන් ද ඔක්කෝම වාගේ ලංකාවට ගෙනාවා. ඒ ඔක්කෝම ඔයගොල්ලන්ට සහයෝගය දුන්නු කට්ටිය තමයි. දැන් ඒ ඔක්කෝම එකට බන්ධනාගාරයේ ඉන්න එක ගැන අපි කනගාටුව පළ කරනවා.

ඊළඟට මම මේ කාරණයත් කියන්න ඕනෑ. දැන් දවස් දෙකකට ඉස්සෙල්ලා - පසුගිය 20වන දා - අකුරණ ප්‍රදේශයේ ඇති වුණු ගංවතුර ගැන රවුල් හකීම් මන්ත්‍රීතුමා යම් ප්‍රශ්න ටිකක් ඇහුවා. එදා මගේ කථාවේදී ඒවායෙන් ප්‍රශ්න කිහිපයකට මම උත්තර දුන්නා. තවත් ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. එදා එතුමා ඇහුවා, නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් මැරිලාද ඉන්නේ වාගේ ප්‍රශ්නයක්. ඒ ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් 90ක් විතර කරලා තිබෙනවා කියලාත් එතුමා කිව්වා. ඒ වාගේම, ඇළ සීමාව අඩි 40ක් පමණ තිබෙනවා, ඒක මදි, අඩි 40ක් තමයි ඇළ සීමාව සඳහා මේ ආණ්ඩුව තියාගෙන ඉන්නේ, ඒක මදි, ඒක අඩි 60ක්වත් කරන්න ඕනෑ වාගේ කථාවල් ගොඩක් එතුමා කිව්වා. මම කියන්න ඕනෑ, අපේ ආණ්ඩුව ආවාට පස්සේත්, ඊට කලිනුත් NPP එක හෝ JVP එක කවදාවත් අකුරණ ප්‍රාදේශීය සභාවේ බලය අරන් නැහැ කියන එක. දැනුත් බලය නැහැ. ඒ මොකද කිව්වොත්, රවුල් හකීම් මන්ත්‍රීතුමා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හලීම් මැතිතුමාත් එක්ක තරග කරනකොට ස්වාධීනව එක්කෙනෙක් තරග කළා, ඒගොල්ලන්ගේ ඡන්ද කඩන්න. එතකොට රවුල් හකීම් මන්ත්‍රීතුමා එල්ලිලා ආවා. හලීම් මන්ත්‍රීතුමා පැරදුණා. ඒගොල්ලන් පරද්දපු කෙනා තමයි දැන් අකුරණ ප්‍රාදේශීය සභාවේ සභාපති කරලා තිබෙන්නේ. මොකද කිව්වොත්, ඒ මේ ගංවතුර ප්‍රශ්නයට විසඳුම් හොයන්නේ නැතුව කකුලෙන් අදින්නයි. ඒ වෙනුවෙන් තමයි දැන් ඒගොල්ලන් කටයුතු කරමින් ඉන්නේ. ඇත්තටම රවුල් හකීම් මන්ත්‍රීතුමා නාගරික සංවර්ධන අධිකාරියට දොස් කියලා තමයි ගියේ. ඇත්තටම ඒගොල්ලන්ගේ කාලයේදී තමයි මේ අනවසර ඉදිකිරීම් ඔක්කෝම කරලා තිබෙන්නේ. 2024දී නාගරික සංවර්ධන අධිකාරිය survey කරලා තිබෙනවා, ඒ අනවසර ඉදිකිරීම් ගැන. ඒගොල්ලන් 221ක් survey කරලා තිබෙනවා. ඒවායින් 192ක්ම අනවසර ඉදිකිරීම්. ඒක කරලා තිබෙන්නේ කොහොමද දන්නවාද? නාගරික සංවර්ධන අධිකාරියේ තිබෙන බලය ප්‍රාදේශීය සභාවට පවරාගෙන තමයි ඒක කරලා තිබෙන්නේ. එහෙම බලය පවරාගෙන, දැන් නාගරික සංවර්ධන අධිකාරියටයි, අනෙක් අයටයි දොස් කියනවා. නඩු දමන්නේ නැහැ කියාත් කිව්වා. ඇත්තටම නඩු දමලාත් නැහැ. නඩු දමන්න බැහැ, ඒගොල්ලන් ඒකේ තියාගෙන බිස්නස් කරපු නිසා.

[ගරු රියාස් ෆාරූක් මහතා]

තවත් පොඩි දෙයක් විතරක් මම කියන්නම්, කාල වේලාවත් මදි නිසා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පසුගිය වතාවේ ගංවතුර ආපදා වෙලාවේත් ප්‍රාදේශීය සභාව අපට බාධා කළා. මේ සැරේත් ගංවතුර ආපදා වෙලාවේදී ප්‍රාදේශීය සභාවට මම කථා කරලා, town එක සුද්ද කරන්න JCB රථ ඉල්ලුවාම operatorsලා නැහැ කියලා ඒක මහහැරියා. ඊට පස්සේ මම බැකෝ යන්ත්‍ර දෙකකුයි, dumpers හතරකුයි දමලා සුද්ද කරලා, town එකේ තැනකට ගොඩ කරන්න යනකොට ප්‍රාදේශීය සභාවේ සමහර නිලධාරීන් ඒකට බාධා කරමින් ඒක කරන්න දුන්නේ නැහැ. ඊට පස්සේ ඒගොල්ලන් JCB එක අරගෙන, සභාපතිතුමා JCB එකේ එල්ලිලා ගිහිල්ලා දේශපාලනය එහෙම කළා. දැන් ඒ කුණු ටික ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉස්සරහයි, මගේ කඩේ ඉස්සරහයි දාලා තිබෙන්නේ. මගේ කඩේ ඉස්සරහ තිබෙන ඇළ අයිනේ තමයි කුණු ටික දාලා තිබෙන්නේ. එතකොට, ආයෙත් ලොකු වැස්සක් ආවොත් ඒවා ඇළට ගසාගෙන යනවා.

රවුල් හකීම් මන්ත්‍රීතුමා මට කිව්වා, රොන් මඩ ටික ඉවත් කරලා නැහැ කියලා. රොන් මඩ ටික ඒගොල්ලන්ම ඇළට දමලා අපට ඉවත් කරන්න කිව්වාට ඒක කරන්න බැහැ. ඒ සිද්ධිය ගැන බලන්න පළාත් පාලන කොමසාරිස්තුමියත් ඇවිල්ලා ගියාය කිව්වා. මම ඒ ගැන කියන්න දන්නේ නැහැ. මිනිස්සුන්ට කෝටි ගණනක් පාඩු වෙලා, ඔවුන් විපතට පත් වෙලා ඉන්න වෙලාවේදී වෙළෙඳ සංගමයෙන් මුදලක් අරගෙන ඒක සුද්ද කරනවාය කියලා මට ආරංචි වෙලා තිබෙනවා. මම කියනවා, අපේ ආණ්ඩුවේ කකුලෙන් අදින්න try කරන්න එපා කියලා. මොකද, 1990 ගණන්වල ඉඳලා ඔයගොල්ලන්ගේ සභාපතිවරු තමයි ඉඳලා තිබෙන්නේ. ඒ වංචා, දූෂණ ඔක්කෝම අපි ඉදිරියේදී විභාග කිරීම සඳහා ගෙනෙනවා. සමහර සභාපතිවරු පිට රට ගිහිල්ලාත් ඉන්නවා. ඕස්ට්‍රේලියාවට ගිහිල්ලා හැංගිලා ඉන්නේත් රවුල් හකීම් මන්ත්‍රීතුමාගේ සභාපති කෙනෙක් තමයි. ඒ වාගේ, දැන් ඉන්න සභාපතිවරුනුත්, දේශපාලනඥයිනුත් දේශපාලනය කළාට කමක් නැහැ. හැබැයි, රජයේ නිලධාරීන් පරිස්සමෙන් වැඩ කටයුතු ටික කරන්න ඕනෑ. ඒ මොකද කිව්වොත්, දැනට නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ට රවුල් හකීම් මන්ත්‍රීතුමා චෝදනා කරපු විධියටම, අනෙක් පැත්ත හැරෙද්දී ඔයගොල්ලනුත් ඒකට අහු වෙන්න එපා කියමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු සඤ්ජීව රණසිංහන අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, කුළුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [මාණ්පුමිකු (තිරුමති) හේමාලි වීරසේකර] තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA]took the Chair.

[பி.ப. 4.34]

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம் தொடர்பான இன்றைய விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு நான் மிக்க மகிழ்ச்சி அடைகின்றேன்.

எங்கேயாவது ஓர் ஊரில் யாராவது சாராயம் குடித்துவிட்டு, இரவு நேரத்தில் மயங்கி விழுந்து, அடுத்த நாள் காலையில் எழுந்து சமாளித்துவிடுவதை நாங்கள் கடந்த காலங்களில் கண்டிருக்கிறோம். ஆனால், இன்று இந்த நாட்டில் போதைப்பொருளால் முழுச் சமூகமும் அழிவை நோக்கிப் போய்க்கொண்டு இருப்பதை நாங்கள் காண்கின்றோம். இதனால் நாம் சமூகத்தில் பெரும் பாதிப்புகளை எதிர்கொண்டு இருக்கின்றோம். இங்கு பேசிய கௌரவ பிரதி அமைச்சர் அவர்கள் யதார்த்தமான சில விடயங்களைச் சொன்னார். இந்த நாட்டில் போதைப்பொருளை இல்லாமல் செய்வதற்காகக் கொண்டுவரப்பட்டுள்ள தேசிய வேலைத்திட்டங்களுக்கு தேசிய மற்றும் மாவட்ட மட்டத்தில் நாங்கள் உதவி செய்துகொண்டு இருக்கின்றோம். இந்த நாட்டைப் போதைப்பொருள் இல்லாத நாடாக மாற்றுகின்ற நல்ல திட்டங்களுக்கு நாங்கள் எல்லோரும் கட்சி பேதம், இனபோதம் இல்லாமல் ஒத்துழைக்க வேண்டும். மேலும், கொடூரமான இந்தப் பழக்கத்தை உருவாக்கியவர்களை இல்லாமல் செய்து, நாட்டை போதைவஸ்திலிருந்து மீட்க வேண்டிய கடமை நம் எல்லோருக்கும் இருக்கின்றது. எவ்வாறு இந்த நாட்டில் பயங்கரவாதம் இல்லாமல் செய்யப்பட்டதோ, அதேபோன்று போதைப்பொருளையும் இல்லாமல் செய்வதற்கான ஏற்பாட்டை நாங்கள் எல்லோரும் சேர்ந்து செய்ய வேண்டுமென அன்பாகக் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, நமது நாட்டின் வரலாற்றைப் பார்த்தோம் என்றால், முன்னாள் சனாதிபதி சந்திரிக்கா பண்டாரநாயக்க குமாரதுங்க அவர்களின் ஆட்சிக் காலத்திலிருந்து மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய ஆட்சிக் காலம் வரை தமிழ் பேசும் மக்கள் அதிக வாக்குகளை அவர்களது கட்சிக்கு அளித்து இருக்கிறார்கள் என்பதை அறிய முடியும். மஹிந்த ராஜபக்ஷ அவர்கள் இந்த நாட்டில் யுத்தத்தை இல்லாமல் செய்து, சமாதானத்தை ஏற்படுத்திய தலைவர். அந்த அடிப்படையில், அவருக்கு கௌரவம் கொடுக்கவேண்டிய கடமை எங்கள் எல்லோருக்கும் இருக்கின்றது. யுத்தம் இருந்திருந்தால் நாங்கள் இவ்வாறு பாராளுமன்றத்துக்கு வந்து பேச முடியாத சூழ்நிலை இருந்திருக்கும். யுத்தத்தை வென்ற மஹிந்த ராஜபக்ஷ அவர்கள், அன்று தமிழ், முஸ்லிம் மக்களுடைய தேசியப் பிரச்சினைகளுக்கு உடனடியாகத் தீர்வு கண்டிருந்தால், அதற்கு பௌத்த மக்களும் ஒத்துழைப்பு வழங்கி இருப்பார்கள். ஏனெனில், 30 வருட காலம் நடந்த கொடூரமான யுத்தத்தை இல்லாமல் செய்த சனாதிபதி ஒருவர் சொல்கின்றபொழுது, அதனை தமிழ் மக்களும் ஏற்றுக்கொள்வார்கள்; முஸ்லிம் மக்களும் ஏற்றுக்கொள்வார்கள்; சிங்கள மக்களும் ஏற்றுக்கொள்வார்கள்.

அப்படியான ஒரு காலம் இருந்தது. அவர் அப்படிச் செய்திருந்தால், சவூதி அரேபியா நாட்டில் இருக்கின்ற மன்னர் ஆட்சிபோல, இறக்கும் வரை அவரும் இந்த நாட்டில்

சனாதிபதியாக இருப்பதற்கு வாய்ப்பு இருந்தது. அதனை இல்லாமல் செய்தவர் அவரின் சகோதரரான முன்னாள் சனாதிபதி கோட்டபய ராஜபக்ஷ என்பதை நான் உங்களுக்குச் சொல்ல வேண்டும். அவர், பாதுகாப்பு அமைச்சின் செயலாளராக இருந்தார். அவர்தான் பொது பலசேனா அமைப்பின் முதலாவது காரியாலயத்தைத் திறந்து வைத்தார். நாட்டின் சனாதிபதியின் சகோதரர், இனவாதிகளை உருவாக்குகின்ற காரியாலயத்தைத் திறந்து வைத்ததை நாங்கள் கண்டோம். அன்றிலிருந்துதான் மஹிந்த ராஜபக்ஷவின் அரசியல் வாழ்க்கைக்கு இந்த நிலைமை ஏற்பட்டது என்பதை நான் உங்களுக்குச் சொல்லக் கடமைப்பட்டு இருக்கின்றேன்.

அண்மையில் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள், ஞானசார தேரர் அவர்களுடைய ஆடை விடயம் சம்பந்தமாக மகாநாயக்க தேரர்களோடு பேசும்பொழுது ஒரு விடயத்தைச் சொன்னார். அதாவது, "உயர் நீதிமன்றத்தின் தீர்ப்பில் நான் தலையிட மாட்டேன். சட்டம் ஒரு தீர்மானத்தை எடுத்திருக்கின்றது. எனவே, உயர் நீதிமன்றத்தின் நடவடிக்கைகளை நாம் எல்லோரும் ஏற்றுக்கொள்ள வேண்டும்" என்ற கருத்துப்பட கூறியிருந்தார். மேலும், அதில் யாரும் தலையிடக்கூடாதெனச் சொன்னார். உங்களுக்குத் தெரியும், இதே ஆட்கள்தான் 2018-2019ஆம் ஆண்டு காலப்பகுதியில் கண்டியிலிருந்து கொழும்பு நோக்கி இனவாத ரீதியில் பாதயாத்திரை மேற்கொண்டார்கள் என்பது. அதுபோன்றதொரு பாதயாத்திரையை அண்மையிலும் மேற்கொண்டார்கள். அந்தப் பாதயாத்திரை கண்டியிலிருந்து கொழும்புக்கு வருவதற்கு இடையில், குறித்த தேரர் பௌத்த மதகுருமாருக்குரிய சீருடையை அணியலாம் என்ற தீர்மானத்தை கௌரவ நீதி அமைச்சர் அவர்களும் கௌரவ புத்தசாசன அமைச்சர் அவர்களும் அறிவித்து இருக்கிறார்கள்.

எங்களுடைய முஸ்லிம் சமூகம் பொறுமையுள்ள ஒரு சமூகம்; நடுநிலையாகச் செயற்படுகின்ற ஒரு சமூகம். அதுமாத்திரமல்ல, இந்த நாட்டின் ஐக்கியத்துக்கும் தேசிய நல்லிணக்கத்துக்கும் பெரும் பங்களிப்புச் செய்த சமூகமும்கூட. நாங்கள் பல கஷ்டங்களை அனுபவித்து இருக்கிறோம். குறிப்பாக, யுத்த காலத்தில் கஷ்டங்களை அனுபவித்து இருக்கிறோம். நாங்கள் இனவாத ரீதியான பிரச்சினைகளை எதிர்கொண்டபோது, பொறுமையுடன் இருந்திருக்கிறோம். நாங்கள் யாரையும் வஞ்சிப்பதில்லை; பழிவாங்குவதில்லை. மாறாக, அவர்களை மன்னிப்போம். மன்னிக்கும் விடயத்தில் எங்களுடைய புனித இஸ்லாம் மார்க்கம் வழிகாட்டல்களைத் தந்திருக்கிறது. எனவே, நாங்கள் மன்னிப்போம். எங்களால் இயலாவிட்டால், அல்லாஹ்விடம் பிரார்த்தனை செய்வோம். எங்களுடைய மார்க்கத்தின்படி, மூன்று பேருடைய பிரார்த்தனை எந்தவித சந்தேகமும் இன்றி ஏற்றுக்கொள்ளப்படும். ஒன்று, பாதிக்கப்பட்ட ஒருவர் இறைவனிடம் கையேந்திக் கேட்டால், பாதிப்பை ஏற்படுத்தியவருக்கு உடனடியாகவே punishment கிடைக்கும். இன்னும் இரண்டு விடயங்கள் இருக்கின்றன. அவற்றை நான் உங்களுக்குப் பிறகு சொல்கின்றேன். இந்த நாட்டில் பாதிக்கப்பட்ட ஒரு சமூகமாகத்தான் முஸ்லிம் சமூகம் இருந்துகொண்டு இருக்கின்றது.

அண்மையில் நடந்த அனோஜனின் விடயத்தை நீங்கள் அறிவீர்கள். ஒரு மதத் தலைவருக்கு எதனைச் சொல்லக்கூடாதோ அதனை அவர் சொல்லியிருந்தார். இருப்பினும், ஆளுங்கட்சி உறுப்பினர்கள், எதிர்க்கட்சி உறுப்பினர்கள் என எல்லோரும் இணைந்து அவரை விடுதலை செய்யக் கோரி கையொப்பமிட்ட கடிதத்தை ஜனாதிபதியிடம் கொடுத்தோம். இதைவிட நாங்கள் என்ன செய்வது?

எங்களுடைய முஸ்லிம் சமூகம் சார்ந்த பல விடயங்கள் இந்த நாட்டில் இன்னும் தீர்க்கப்படாமல் இருக்கின்றன. முஸ்லிம்களில் பெரும்பான்மையானோர் தமது வாக்குகளை இந்த அரசாங்கத்துக்கு வழங்கியிருக்கிறார்கள் என்பது உங்களுக்குத் தெரியும்! கடந்த இரண்டரை வருடங்களாக - கோட்டாபய ராஜபக்ஷ அவர்களுடைய ஆட்சிக் காலத்திலிருந்து - 40,000 அல்-குர்ஆன் பிரதிகள் இலங்கை சுங்கத்தில் தடுத்துவைக்கப்பட்டு இருக்கின்றன. கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இவற்றை விடுவிக்குமாறு கோரி ஆளுங்கட்சி மற்றும் எதிர்க்கட்சியைச் சேர்ந்த 22 முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களும் கையொப்பமிட்டு கடிதம் வழங்கியிருக்கிறோம். அதுமாத்திரமல்ல, முஸ்லிம் சமூகத்தில் இருக்கின்ற பல புத்திஜீவிகள் மாண்புமிகு சனாதிபதி அவர்களையும் விடயத்துக்குப் பொறுப்பான அமைச்சர் அவர்களையும் சந்தித்து இருக்கிறார்கள். எனினும், அந்த அல்-குர்ஆன் பிரதிகள் இன்னும் விடுவிக்கப்படாமல் இருக்கின்றன.

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, உண்மையிலேயே இந்த நாட்டில் இனவாதம் இல்லை என்று சொன்னால், உடனடியாக நாளையே அந்த 40,000 அல்-குர்ஆன் பிரதிகளையும் விடுவிக்க வேண்டும். இவ்வாறு அல்-குர்ஆன் பிரதிகளைத் தடுத்து வைத்திருப்பதற்குரிய தண்டனை உங்களுக்குக் கிடைக்கும் என்பதையும் சொல்கிறேன். நீங்கள் இன்னும் அவற்றை விடுவிக்காமல் இருந்தால், அதற்குரிய தண்டனையை யார் யார் அனுபவிக்கப் போகிறார்கள் என்று எனக்குத் தெரியாது. கடந்த அரசாங்க காலத்தில் முஸ்லிம்களின் ஜனாஸாக்கள் எரிக்கப்பட்டபோது, இந்தப் பாராளுமன்றத்தில் ஓர் உறுப்பினர் - அவர் முன்னர் அமைச்சராக இருந்தவர் - சொன்னார், "முஸ்லிம்களின் சாபம் அரசாங்கத்துக்குக் கிடைக்கும்" என்று. அவர் அவ்வாறு சொல்லி இரண்டு மாதங்களில் அரசாங்கமும் இல்லாமல்போனது; ஆட்சியாளர்கள் ஓடினார்கள். எனவே, நாங்கள் பாதிக்கப்படாத வகையில், விரைவாக இந்தப் புனித அல்-குர்ஆன் பிரதிகளை விடுவிக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, எங்களுடைய புனித மார்க்கக் கல்வி கற்பிக்கப்படுகின்ற 82 அரபுக் கல்லூரிகளைத் தடைசெய்து இருக்கிறார்கள். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நான் இந்தப் பாராளுமன்றத்தில் மூன்று மாதங்களுக்கு முன்னர் இந்த விடயம் தொடர்பில் கேட்டபோது கௌரவ அமைச்சர் அவர்கள் சொன்னார், "நாங்கள் அவற்றின் மீதான தடையை நீக்குவதற்குரிய நடவடிக்கைகளை விரைவாக எடுப்போம்" என்று. ஆனால், 90 நாட்களாகியும் இன்றுவரை ஒன்றுமே நடைபெறவில்லை. இதனை நான் மனவருத்தத்துடன் சொல்கின்றேன்.

அடுத்து, முஸ்லிம் பெண் சுகாதார ஊழியர்களின் ஆடை தொடர்பான பிரச்சினை பற்றி சொல்ல வேண்டும். இன்றைக்கு நீங்கள், ஞானசார தேரருக்கு மதகுருமாருக்குரிய சீருடையை அணிந்து சிறைச்சாலையிலிருந்து நீதிமன்றத்துக்கு வரமுடியுமெனச் சொல்லி இருக்கிறீர்கள். அதனை நாங்கள் ஏற்றுக்கொள்கின்றோம்.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(මාණ්පුමිකු එම්.එස්. උදුමාලෙප්පෙ)
(The Hon. M.S. Uthumalebbe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එනක්කු ඔරු නිමිටම් තාරුංකළ්!

කල්මුනෙ වටක්කු ආතාර වෛත්තියසාලෙයිල් එංකළුටෙය 6 මුස්ලිම් පෙණ් සුකාතාර ඌළියර්කළ් තමතු කලාසාර ආටෙයෙ අණිංතු කටමෙපුරිය අනුමති මරුක්කප්පට්ට නිලෙයිල්, අවර්කළෙ සුකාතාර අමෙච්චර් අෂ්රප් ඥාපකාර්ත්ත වෛත්තියසාලෙක්කු ඉටමාර්රම් සෙය්විට්ටු, " සීලෛත් තුණ්ටුක්කාක නීංකළ් පිරච්සිනෛප්පටත් තේවෙයිල්ලෛ" එන්රු සොල්ලි ඉරුක්කිරාර්. ඉප්පෝතු මනිත උරිමෛකළ් ආණෛක්කුමු සුකාතාර අමෙච්සුක්කු සිල විටයංකළෛක් කූරියුළ්ළතු.

අතෙ මාත්තිරම් සොල්ලි එනතු උරෙයෙ මුටික්ක විරුම්පුකින්රේන්. කල්මුනෙ වටක්කු තළ මරුත්තුවමනෙයිල්ලි අනෛත්තු නිරුවාක ඌළියර්කළුක්කුම් පොරුන්තක්කූටිය පොතු නිරුවාකච් සුට්රරික්කෛකළ් කුරිත්ත එළුත්තුමූල විළක්කත්තෛ වළංකුතල්, නිර්ණයික්කප්පට්ට සීරුටෙයුටන් සේර්ත්තු තලෛක්කු මුක්කාටු, නීණ්ට කෛ ආටෙ මට්රුම් නීළ කාට්චට්ටෛ අණිය විරුම්පුම් එන්තවෝර් ඌළියරුම් අව්වාරු සෙය්වතර්කු අනුමතික්කප්පටුකිරාර්කළ් එන්පතෛත් තෙළිවුපටුත්තුතල් තොටර්පාන -

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුළුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරමු, ගරු මන්ත්‍රීතුමා.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(මාණ්පුමිකු එම්.එස්. උදුමාලෙප්පෙ)
(The Hon. M.S. Uthumalebbe)
මට තව තත්පර කිහිපයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

කල්මුනෙ වටක්කු තළ මරුත්තුවමනෙයින් එන්තවෝර් ඌළියරාලුම් මුරෙයීට්ටාළර්කළ් තුන්පුරුත්තප්පට්ටතාකක් කූරප්පටුම් අනෛත්තුක් කුට්රච්චාට්ටුකළ් කුරිත්තුම් මුළුමෙයාන මට්රුම් පක්කච්චාර්පට්ර විසාරණෛ ඔන්රෙ නටත්තුතල්, මුරෙයීට්ටාළර්කළ් මරුත්තුවමනෛක්කුත් තිරුම්ප විරුම්පිනාල් කල්මුනෙ වටක්කු තළ මරුත්තුවමනෙයිල් මීණ්ටුම් පණියෛත් තොටර්වතර්කාන විරුප්පත්තෛ අවර්කළුක්කු එළුත්තුමූලම් වළංකුතල්, මුරෙයීට්ටාළර්කළිල් යාරාවතු මරුත්තුවමනෛක්කු පණික්කුත් තිරුම්ප තේර්වුසෙය්තාල්, මේලේ කුරිප්පිටප්පට්ට එළුත්තුමූල විළක්කම් නටෛමුරෙප්පුපටුත්තප්පටුවතෛ උරුතිසෙය්තු, නිර්ණයික්කප්පට්ට සීරුටෙයුටන් කූටුතලාක තලෛක්කු මුක්කාටු, නීණ්ට කෛ ආටෙ මට්රුම් නීළ කාට්චට්ටෛ අණිය අවර්කළ් අනුමතික්කප්පටුවතෛ උරුතිසෙය්තල් වේණ්ටුමෙන ඉලංකෛ මනිත උරිමෛකළ් ආණෛක්කුමු සොල්ලියිරුක්කිරතු.

එනවේ, නීංකළ් උංකළුටෙය මතම්සාර්න්ත උටෛ විටයත්තිල් එව්වාරු කවනම් සෙලුත්තුකිරීර්කළෝ, අතේපෝන්රු එංකළුටෙය මුස්ලිම් පෙණ් සුකාතාර උත්තියෝකත්තර්කළුම් තංකළුටෙය කලාසාර ආටෙයෙ අණිවතර්කුරිය ඒර්පාටුකළෛච් සෙය්ය වේණ්ටුමෙනක් කේට්ටු, විටෛපෙරුකින්රේන්. නන්රි!

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුළුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.44]

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා
(මාණ්පුමිකු ස්ටෙපනි පර්නාන්තු)
(The Hon. Stepni Fernando)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මේ සංශෝධන පනත් කෙටුම්පත් ගෙන එන්න මූලික හේතුව වුණේ, රටක් හැටියට කාලීන අවශ්‍යතාව අනුව මේ නීති වෙනස් කළ යුතු වීමයි. මේ නීති එහෙම වෙනස් කළේ නැත්නම් අපට කාලයේ හැටියට රටේ පාලනය ගෙන යෑමේ ප්‍රශ්නයක් ඇති වනවා.

ඔබතුමන්ලා දන්නවා, අපි රට භාර ගන්නකොට මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් වාගේම පාතාලයත් රටේ මුල් බැසගෙන සිටි බව. ඒ නිසා අපට ඒ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවක් තිබුණා. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ, පාතාලයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ, ඒ වාගේම ජාවාරම්කරුවන් සමඟ සම්බන්ධ වෙලා හිටපු දේශපාලනඥයින්ට එරෙහිවත් නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒක තමයි මේ රට හරි පාරට දා ගන්නවා කියන්නේ.

ඔබතුමන්ලා දන්නවා, අපි මීට වසරකට වාගේ පෙර "රටම එකට" වැඩසටහන පටන් ගත්තා කියලා. ඉන් පසුව "ඉවත් වෙනු" කියන වැඩසටහනත් අපි පටන් ගත්තා, මත්ද්‍රව්‍ය ජාවාරම්වලින්, මත්ද්‍රව්‍ය වෙළෙඳාමෙන් සහ මත්ද්‍රව්‍ය පාවිච්චි කරන අයට මත්ද්‍රව්‍යවලින් ඉවත් වෙන්න කියලා. අපි ජාතික මට්ටමින් වාගේම දිස්ත්‍රික් මට්ටමින් "ඉවත් වෙනු" වැඩසටහන පටන් අරගෙන ඉන් අනතුරුව ප්‍රාදේශීය මට්ටමින් ග්‍රාම නිලධාරි වසම දක්වාම එය ක්‍රියාත්මක කරමින් යනවා. දැන් නීතිය හරියට ක්‍රියාත්මක කරන්න ඕනෑ නිසා තමයි අපි මේ පනත් සංශෝධනය කරන්නේ. ඒ අනුව ත්‍රිවිධ හමුදාව, පොලිසිය, ආගමික නායකයින්, ගමේ සිටින විද්වතුන් සහ ව්‍යාපාරිකයින් වාගේ හැම කෙනෙකුම සම්බන්ධ කරගෙන ඒ ජාලය මැඩපැවැත්වීමේ ක්‍රියාවලිය නිසියාකාරව අපි සිදු කරගෙන යනවා. ඒ ක්‍රියාවලිය සිදු කරගෙන යද්දි අනිවාර්යෙන්ම මේ නීති වෙනස් කරන්න ඕනෑ, ව්‍යවස්ථා සංශෝධන ගේන්න ඕනෑ. එහෙම කළොත් තමයි අපට මේ වැඩසටහන් හරියටම ක්‍රියාත්මක කර ගැනීමේ හැකියාව ලැබෙන්නේ.

මේ පනත් සංශෝධන ගෙනැල්ලා ඒවා ක්‍රියාත්මක කිරීමෙන් අපි බලාපොරොත්තු වන්නේ බන්ධනාගාරගත වෙලා ඉන්න රැඳවියන් ඉක්මනින් මුදා ගැනීමයි. සමහර රැඳවියන් ඉන්නවා, ඔවුන් වැරදිකරුවන්ද කියලා දන්නේත් නැහැ, මොනවාටද බන්ධනාගාරයේ ඉන්නේ කියලා දන්නේත් නැහැ. එහෙම රැඳවියන් අවුරුදු ගණන් බන්ධනාගාරවල ඉන්නවා. ඒ අය සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරලා ඔවුන්ව ඉක්මනින් මුදා ගැනීමේ ක්‍රියාවලියට අපි එන්න ඕනෑ. අපි මේ පනත් සංශෝධනය සිදු කරන්නේ ඉක්මනින් ඒ කටයුත්ත කිරීම සඳහායි.

වත්මන් සමාජය තුළ මත්ද්‍රව්‍යවලින් මිදීමට කැමැති අය ඉන්නවා. මත්ද්‍රව්‍ය පාවිච්චි කරන සමහර අය තමන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙනවා කියලා දන්නේ නැහැ. සමහර දරුවන් කුඩා කාලයේදී, එහෙම නැත්නම් පාසල් අවධියේදී නොදැනුවත්වම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වනවා. එලෙස මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් බේරා ගැනීම සඳහා අපි විශේෂ වැඩසටහන්

ක්‍රියාත්මක කරනවා. ඒ අනුව අපි ජාතික මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින් සහ පාසල් මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කරලා දැනුවත්වීම් කරනවා, දරුවන් මේ මත්ද්‍රව්‍ය උවදුරෙන් මුදා ගැනීමට. ඒ වාගේම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් පුනරුත්ථාපන කඳවුරු පටන් ගැනීමටත් අපි තීරණය කරලා තිබෙනවා. දැන් හැම දිස්ත්‍රික්කයේම පුනරුත්ථාපන කඳවුරක් විවෘත කරලා ඒ හරහා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා ඉන්න අය මුදා ගැනීමේ වැඩසටහනක් අපි ක්‍රියාත්මක කර තිබෙනවා. මේ හැම එකක්ම කරන්නේ අපට ඉතාම හොඳ රටක අවශ්‍යතාවක් තිබෙන හින්දායි. රටක් වශයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට අනිවාර්යයෙන් නීති සංශෝධනය කිරීම අවශ්‍යයි. ඇත්තටම නීති සංශෝධනය කරන්න ඕනෑ ඇයි කියන කාරණාව ගැන බලමු. නීතියක් සංශෝධනය කරන්න පටන් ගන්න නම් ඇත්තටම රටක් ආර්ථික වශයෙන් ශක්තිමත් වෙන්න ඕනෑ. ආර්ථික වශයෙන් රටක් ශක්තිමත් වුණොත් තමයි පාර්ලිමේන්තුවට, එහෙම නැත්නම් ජනතාවට නීති වෙනස් කරන්න ඕනෑ කියලා අවශ්‍යතාවක් ඇති වෙන්නේ.

ඔබතුමන්ලා දන්නවා, අපි භාර ගත්තේ බංකොලොත් රටක් බව. බංකොලොත් රටක නීති වෙනස් කිරීමේ අවශ්‍යතාවක් නැහැ. දේශපාලනඥයින්ට අවශ්‍ය විධියට ඒ නීතිය ක්‍රියාත්මක කර ගන්නවා. මේගොල්ලන් දේශපාලනඥයින්ට අවශ්‍ය කරන පහසුකම් ටික සැලසීම සඳහා තමයි මේ පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පත් ගෙනැල්ලා ඒවා වෙනස් කර ගන්න හැදුවේ. හැබැයි, රටේ නීතිය ක්‍රියාත්මක කරන එක ගැන, රට නිසි ක්‍රමවේදයකට ගමන් කරන එක ගැන කවුරුවත් හිතුවේ නැහැ. තමුන්ගේ බලය වෙනුවෙන්, තමුන්ගේ ආරක්ෂාව - දේශපාලනඥයින්ගේ ආරක්ෂාව - වෙනුවෙන් තමයි මෙච්චර කල් නීති වෙනස් කළේ. හැබැයි, අපි ඒක දැන් වෙනස් කරලා තිබෙනවා. එහෙම නීති වෙනස් කරන්න හේතුව තමයි, අපි මේ රට නිවැරදි ස්ථානයකට අරගෙන යන්න ඕනෑ වීම. ඒ සඳහා තමයි අපි මේ හැම එකක්ම කරන්නේ.

ඒ වාගේම තමයි, සංවිධානාත්මක අපරාධකරුවන් විශාල ප්‍රමාණයක් හිටියා. ඒ එක සංවිධානාත්මක අපරාධකරුවෙක්වත් මේ රටේ නොවෙයි විදේශගතවයි හිටියේ. අපි මේ සංවිධානාත්මක අපරාධකරුවන් අපේ රටට ගෙනෙන්න වැඩකටයුතු සලස්වලා, ඒ අය විශාල පිරිසකුත් දැන් අරගෙන ඇවිල්ලා තිබෙනවා. තවත් කිහිප දෙනෙක් අපේ රටට ගෙනෙන්න තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, මේ සංවිධානාත්මක අපරාධකරුවන් සමඟ දේශපාලනඥයින් සම්බන්ධ වෙලා ඉන්න බව. ඉස්සරහට ඒවා එළියට එනවා. ඒවා එළියට එද්දී මේ පනත් අනිවාර්යයෙන්ම වෙනස් කරන්න ඕනෑ. මේ පනත් වෙනස් කරන්නේ නැතිව මේ නීතිය ක්‍රියාත්මක කිරීමේදී අපහසුතාවන් එනවා. අපි හැදුවේ ජනතාවාදී ආණ්ඩුවක්. අපි ජනතාවාදී ආණ්ඩුවක් හැදුවාට පස්සේ ජනතාවට අවශ්‍ය කරන අණපනත් තමයි පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කරන්නේ. එහෙම නැතිව ජනතා විරෝධී අණපනත් කිසිවක් මේ පාර්ලිමේන්තුව තුළ අපි මෙතෙක් සම්මත කරලා නැහැ. අපි හැම වෙලාවේදීම ජනතාවට සුබවාදී, රටට සුබවාදී, මේ රට ඉස්සරහට අරගෙන යන අණපනත් තමයි ක්‍රියාත්මක කරන්නේ. අපේ අධිකරණ ඇමතිතුමා විසින් මෙම ආඥාපනත සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත් ඉතාම හොඳ ඒවා.

බන්ධනාගාර තුළ ඉන්න රැඳවියන් ඉක්මනින් එළියට ගැනීම සඳහා රස පරීක්ෂක වාර්තා ඉක්මනින්ම ලබා ගන්න ඕනෑ. රස පරීක්ෂක වාර්තා මාස දෙකක් ඇතුළත ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, මෙතෙක් කල් රස පරීක්ෂක වාර්තා ලබා දීම මාස ගණන් පරක්කු වූ බව. ඒවා නිකුත් කරන්න ගොඩක් පරක්කු වුණා. එතකොට ඒ රැඳවියන්ගෙන් නිවැරදිකරුවන් එළියට ගැනීමේ අපහසුතාවක් තිබෙනවා. ඒ වාගේම මේ හැම කෙනෙක්ම මත්ද්‍රව්‍ය ජාවාරම කරන අය වාගේම මත්ද්‍රව්‍ය පාවිච්චි කරන අය. මේ අය අපේ රටේ ජනතාව. මේ ජනතාව නිදහස් කර ගැනීම හා ඔවුන් නිසි තැනට අරගෙන ඒම රජයේ මූලික අභිප්‍රායයි. ඒක රජයේ මූලික අභිප්‍රාය වෙද්දි අපි ඒ සඳහා පුනරුත්ථාපන කඳවුරු ඇති කරනවා, ජනතාව මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම නතර කරනවා.

ඒ වාගේම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච දරුවෝ ඉන්න දෙමව්පියන් විඳින දුක ගැනත් අපි දන්නවා. ඒ හින්දා මේ හැම කටයුත්තක්ම කර ගැනීමට, මේ නීති ක්‍රියාත්මක කිරීමට මේ පනත් අනිවාර්යයෙන්ම වෙනස් කරන්න ඕනෑ. ඒ නිසා තමයි අපි මේ පනත් වෙනස් කර තිබෙන්නේ. අපි අනිවාර්යයෙන්ම ඒ වෙනස කරනවා. මේ රට ඉතාම හොඳ තැනකට අරගෙන යාම තමයි අපේ මූලික අභිප්‍රාය.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ගීතා හේරත් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.52]

ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා ගෙනෙන පනත් කෙටුම්පත් දෙකක් සම්බන්ධයෙන් තමයි අද දවසේදී මේ විවාදය පැවැත්වෙන්නේ. මේ වෙනකොට ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා විශාල පිරිසක් මේ සම්බන්ධයෙන් කරුණු දැක්වීම් කර තිබෙනවා.

මම විශේෂයෙන් මේ කාරණය කියන්න ඕනෑ. මා නියෝජනය කරන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කය. එය කොළඹින් දුර බැහැර පිහිටි ප්‍රදේශයක්. ඇත්තටම මේ සංශෝධන පනත් කෙටුම්පත් එක්ක අභියාචනාධිකරණයට කොළඹට එන්න ඕනෑ අයට කුරුණෑගල ඉඳලා තමන්ගේ නඩු කටයුතුවලට සම්බන්ධ වෙන්න පුළුවන් විධියට අවස්ථාව සැලසෙනවා. ඒ කොහොමද? අභියාචනාධිකරණයක් තිබෙන්නේ ලංකාවටම එකයි. ඒ, කොළඹ ප්‍රදේශයේ. නමුත් දිස්ත්‍රික් මට්ටමින් මහාධිකරණ තිබෙනවා. කුරුණෑගල දිස්ත්‍රික්කය ගත්තාම, කුරුණෑගල සහ කුලියාපිටියේ මහාධිකරණ දෙකක් තිබෙනවා.

විශේෂයෙන්ම මේ දවස්වල බොහෝ දෙනාගේ කථා බහට ලක් වන කාරණයක් සහ සමාජයේ තිබෙන මැසිවිල්ලක් තමයි, අධිකරණවල නඩු ප්‍රමාදය සහ බන්ධනාගාරවල තිබෙන තදබදය. මේ සංශෝධන පනත් කෙටුම්පත්වලින් අන්න ඒ කාරණා දෙකටත් විසඳුමක් සැලසෙනවා. ඒ කොහොමද? ලංකාවේ මේ වනකොට ලක්ෂ 11ක විතර නඩු ගොඩගැහිලා තිබෙනවා. නඩුවල ප්‍රමාදයක් තිබෙනවා.

මහෙස්ත්‍රාත් අධිකරණයක අද දවසේ විභාග වන නඩුවකට දින ලැබෙන්නේ සමහර වෙලාවට ලබන අවුරුද්දේ මැයි, ජූනි විතර. සෑහෙන කාලයක් ඒ වෙනුවෙන් බලා ගෙන ඉන්න වෙනවා. මේ

[ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය]

සංශෝධනයත් එක්ක ශුද්ධ බර කියන එක දළ බර විධියට වෙනස් වෙනවා. අනික් පැත්තෙන් ග්‍රෑම් 10 කියන ප්‍රමාණය ග්‍රෑම් 100 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ තත්ත්වයත් එක්ක, කොළඹ අභියාචනාධිකරණයට එන්න ඕනෑ අයට තමන්ගේ ප්‍රදේශවල ඉඳලා මහාධිකරණයෙන් ඇප ඉල්ලීම් කරන්න අවස්ථාව සැලසෙනවා. ඒකෙන් පොදු ජනතාවට පහසුවක් සැලසිලා තිබෙන්නේ. ඒකම තමයි අපි විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙනුත් කළේ. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙනුත් අභියාචනාධිකරණවලට තිබෙන බලතල එක්ක ප්‍රාදේශීය මට්ටමින් ජංගම අභියාචනාධිකරණ හරහා ඒ නඩු අහන්න අවස්ථාව සලසා දුන්නා. ඒ කාරණාත් එක්ක මේ සංශෝධනවලට කිසිම කෙනෙකුට විරුද්ධ වෙන්න හේතුවක් නැහැ. අභියාචනාධිකරණයට ඇවිල්ලා ඇප ගන්න තිබෙන අයට මහාධිකරණයෙන් ඇප ගන්න මේ තුළින් අවස්ථාව සැලසෙනවා.

අනික් කාරණය මෙයයි. රස පරීක්ෂක වාර්තා ප්‍රමාද වීම නිසා බොහෝ කාලයක් ඇප ඉල්ලීම් කරලා ඒ වෙනුවෙන් බලාගෙන ඉන්න සිදු වෙනවා. දැන් මේ සංශෝධනයෙන් ශුද්ධ බර, දළ බර කියන එක සලකා රස පරීක්ෂක වාර්තාවක් එනකල් ඉන්නේ නැතුව තමන්ට ඇප ඉල්ලීම කරන්න ඒ සැකකරුවන්ට අවස්ථාව තිබෙනවා. ඒකෙන් ජනතාවට පහසුවක් තමයි සැලසිලා තිබෙන්නේ.

පොදු සමාජය තුළ යම් කථා බහකට ලක් වෙලා තිබුණා, අත්අඩංගුවට ගන්නා මත්ද්‍රව්‍ය ගබඩා කරලා තිබෙන ආකාරය සම්බන්ධව. මොකද, රස පරීක්ෂක වාර්තා එනකල් නඩු විභාගයට ගන්න සෑහෙන කාලයක් ගත වෙනවා. එතකොට මේ නඩු භාණ්ඩ විනාශ නොකිරීම නිසා මේවා ගබඩා කරලා තියා ගන්න ඕනෑ. එවැනි අවස්ථාවක අත්අඩංගුවට ගත්ත දේවල් නැවත පොදු සමාජයට යනවා කියන කාරණය යම් යම් සංවාදයට ලක් වුණු කාරණයක්. එවැනි අවස්ථාත් අපි පසුගිය කාලවලදී අත්දැක්කා. අපට එහෙම අත්දැකීම් තිබෙනවා. දැන් මේ අනුව, මුල් අවස්ථාවේදීම මහෙස්ත්‍රාත්වරයාගේ නියෝගයත් එක්ක රස පරීක්ෂකවරයාට සාම්පල් ලබාගෙන, ඡායාරූප ලබාගෙන, අවශ්‍ය නම් වීඩියෝත් කරගෙන ඒවාට යටත්ව ඒ නඩු භාණ්ඩ විනාශ කිරීමට හැකියාවක් තිබෙනවා. ඒකත් මේ සංශෝධන පනත් කෙටුම්පත්වල දකින්න පුළුවන් හොඳ කාරණයක්.

විශේෂයෙන්ම මම මේ කාරණයත් කියන්න ඕනෑ. ආණ්ඩුව මේ හැම වැඩ පිළිවෙළක්ම ගෙනැල්ලා තිබෙන්නේ එක පැත්තකින් අධිකරණයේ නඩු වේගවත් කරගන්නයි. අනික් අතට, ජනතාවට සුබවාදීව තමන්ගේ අධිකරණ කටයුතු පහසුවෙන් කරගන්න ප්‍රවේශයක් ලබා දෙන්නයි. ඒ නිසා, මේ සංශෝධන බොහොම හොඳ සංශෝධන කියලා මම කියන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බන්ධනාගාරවල සිටින රැඳවියන්ගේ අයිතිවාසිකම් ගැන, ඒවායේ පවතින අඩුපාඩු ගැන විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා බොහොම උනන්දුවෙන් කථා කරනවා. පසුගිය දවස්වල මම දැක්කා, සමහර මන්ත්‍රීතුමන්ලා බන්ධනාගාරවල ඒ අත්දැකීම් ප්‍රායෝගිකව අත්විඳලා මේ සභාවට ඇවිල්ලා කථා කරනවා. මේ වනකොට බන්ධනාගාර බස් රථය හැමදාම පාර්ලිමේන්තුවට එන තත්ත්වයක් තමයි තිබෙන්නේ

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසානයි.

ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)
අවසාන වශයෙන් මම කියන්නේ මෙච්චරයි. අපි හදලා තිබෙන්නේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට දේශපාලන රැවරණය ලබා නොදෙන ආණ්ඩුවක්. හැබැයි, මීට පෙර ආණ්ඩු මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට, පාතාලයට දේශපාලන රැකවරණය ලබා දුන්නු ආණ්ඩු. ඒ තත්ත්වය දැන් වෙනස් වෙලා තිබෙනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අද දින විවාදයේ වැඩ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.58]

ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින විවාදයේදී මත්ද්‍රව්‍ය පිළිබඳව තමයි කථා කරන්නේ. අනිවාර්යයෙන්ම මත්ද්‍රව්‍ය මේ රටෙන් තුරන් කරන්න ඕනෑ. මොකද, මත්ද්‍රව්‍ය නිසා රටට විශාල හානියක් සිදු වනවා. ආර්ථිකය පැත්තෙන්, අධ්‍යාපනය පැත්තෙන් ගත්තාම ඇත්තටම ලොකු විනාශයක් වෙනවා. ඇත්තටම මේ සම්බන්ධව අලුත් නීති රීති ගෙනැල්ලා මත්ද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම තුරන් කිරීමට කටයුතු කිරීම ගැන මගේ සතුට ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සමහර ප්‍රශ්නවලදී ඇත්තටම මම දැකපු දේවල් තිබෙනවා. එක තරහකාරයෙක් පොලීසියට කිව්වා, අසවල් තැන අසවල් කෙනා කුඩු වළලා තිබෙනවා කියලා. අන්තිමට පොලීසියෙන් ගිහිල්ලා වළලපු ඒවා එතැනින් එළියට ගත්තා. ඊට පස්සේ පොලීසියට තීරණය කරන්න බැහැ ඒ කුඩුද, මොනවාද කියලා. ඇත්තටම ඔහු අහිංසක කෙනෙක්. අපේ ආගමේ හැටියට මදුසා පාසල් යන කෙනෙක්. ඒ ළමයා ඒකට මාට්ටු වුණා; වෙනත් කෙනෙකු හොරෙන් තිබ්බ එකකට මාට්ටු වුණා. ඊට පස්සේ ඒ ළමයා වාරියපොළ බන්ධනාගාරයේ මාස ගණනක් හිටියා. අන්තිමට පරීක්ෂණ කරලා බලනකොට කිසිම මත්ද්‍රව්‍යයක් තිබී නැහැ. ඒ වාගේ සිද්ධිත් වෙනවා. අහිංසක මිනිස්සුත් මේවාට මාට්ටු වෙනවා.

මේ මත්ද්‍රව්‍ය පිළිබඳ කාරණයේදී ලෙහෙසියෙන් tablets දෙනවා. ඒ tablet එක ගැන කවුරුවත් දන්නේ නැහැ. ඒකෙන් විශාල හානියක් වෙනවා. ඒ සම්බන්ධව ලොකු වැඩ පිළිවෙළක් කරන්න ඕනෑ. මොකද, ඉස්කෝලේ යන හුහාක් ළමයි මේකට

ඇබ්බැහි වෙලා තිබෙනවා. මේ සම්බන්ධව ආණ්ඩුව මීට වඩා වැඩියෙන් ඉදිරියේදී කටයුතු කරන්න ඕනෑ. මොකද, මේ සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයකට දැන් රට මුහුණ දෙනවා.

අද බලන්න, කුලියට වැඩ කරන පුද්ගලයෙක් රුපියල් දෙතුන් දාහක් අරගෙන ඒ මුදල්වලින් මත්ද්‍රව්‍ය ගන්නවා. ගෙදර දරුවන් ඉන්නවා, පවුලේ අය ඉන්නවා. නමුත්, ඔහු ඒ මුදල්වලින් මත්ද්‍රව්‍ය ගන්නවා. පසුව ඔහු නීතියට හසු වෙනවා. අන්තිමට ඒ පුද්ගලයා විතරක් නොවෙයි, ඒ දරු පවුලම අනාථ වෙනවා. දරුවන් ඒ මනුස්සයා ගැන හොයා බලන්න එනවා; මීගමුවටද, වාරියපොළටද, ඒ හැම තැනකටම එනවා. ඒ දරුවෝ කොච්චර අසරණ වෙනවාද? එදිනෙදා කුලී වැඩ කරන මනුස්සයා මේ වාගේ දෙයකට අහු වෙලා දරු පවුල සම්පූර්ණයෙන්ම විනාශ කර ගන්නවා. කොච්චර ප්‍රශ්න එනවාද? තමන්ගේ ස්වාමිපුරුෂයා, තමන්ගේ දරුවෝ, තමන්ගේ තාත්තා ඉන්නවා කියා බලන්න යනවා. එහෙම බලන්න යනකොට කොච්චර වියදම් කරනවාද? බස්වල යන්න ඕනෑ. කෑම අරගෙන යන්න ඕනෑ. ඇඳුම් අරගෙන යන්න ඕනෑ. ඒ සම්බන්ධව නීතිය පැත්තෙන් යම් සීමා කිරීමක් කරනවා නම් එය ඉතාම හොඳයි කියලා කියන්න ඕනෑ.

ඒ වාගේම මම තව කාරණයක් කියන්න ඕනෑ. ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා මෙතැන හිටියා. මම කල්පිටිය ප්‍රදේශයයි නියෝජනය කරන්නේ. කල්පිටිය කියන්නේ සංචාරක කටයුතු, ධීවර කටයුතු සහ කෘෂිකාර්මික කටයුතු කරන ප්‍රදේශයක්. මම කලිනුත් ගරු ඇමතිතුමාට පැහැදිලි කළා, මේ ප්‍රදේශය සංචාරකයන් එන තැනක් කියලා. Air Force Camp එකක් තිබෙනවා. ඒ Air Force Camp එකේ training කටයුතු කරන වෙලාවේදී touristsලා, ධීවර ජනතාව අසරණ වෙනවා. දැනට අක්කර 1,000ක ප්‍රමාණයකට එය සීමා කරලා තිබෙනවා. ඊට වැඩියෙන් ගත්තොත් ඒ ප්‍රදේශයේ එදිනෙදා කුලී වැඩ කරන කට්ටිය, ගොවිතැන් කරන කට්ටියට අපහසු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමනි, තවත් එක දෙයක් මම කියන්න ඕනෑ. විශේෂයෙන්ම මේ ආණ්ඩුව බලයට පත් වෙලා අවුරුදු දෙකයි. ඒක අපි පිළිගන්නවා. මීට කලින් ආණ්ඩු ඉඳලා තිබෙනවා. ඒවායේ අඩුපාඩු තිබුණා. ඒවා නිවැරදි කරන එක වර්තමාන ආණ්ඩුවේ වගකීමක්. මම උදාහරණයක් කියන්නම්. පුත්තලම නගරය පැරණි නගරයක්. ඒ නගරයේ සියලු දේවල් තිබෙනවා. ඉස්පිරිතාල තිබෙනවා, උසාවි තිබෙනවා, කච්චේරිය තිබෙනවා, විවිධ පාසල් තිබෙනවා. ඒ පාසල් අවුරුදු 76කට කලින් පටන් ගත්තේ. ඒවා දවසෙන් දවස දියුණු කරන්න ඕනෑ. ඒවා දියුණු කරන එක වර්තමානයේ ආණ්ඩු කරන අයගේ වගකීමක්.

ඊයේ මට පොඩි සිදුවීමක් වුණා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. දැනට පුත්තලම ආසනයේ පළාත් සභාවට අයත් මූලික රෝහල මධ්‍යම රජයට අරගෙන තිබෙනවා. ඒක අපි අගය කරනවා. නමුත්, ඒ ප්‍රශ්නයේදී ආණ්ඩු පක්ෂය විතරක් මේක කියන්න ඕනෑ කියලා මතයක් නැහැ. එහෙම නම් විපක්ෂයක් අවශ්‍ය නැහැ නේ. අපේ මතය අපි මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී කියන්න ඕනෑ.

ඇත්තටම මට ප්‍රශ්නයක් මතු වුණා; ඒ ඉන්න specialist doctor කෙනෙකු කථා කරලා කිව්වා, මේ ඉන්න MS මහත්වරු හොඳට වැඩ කරගෙන යනවා, ඒ මහත්මයකුට ස්ථාන මාරුවීමක් ලබාදී තිබෙනවා කියලා. ඒ ගැන කෙළින්ම විෂය භාර ඇමතිතුමා නේ, කටයුතු කරන්න ඕනෑ. ගරු විෂයභාර ඇමතිතුමාට ඒ සම්බන්ධයෙන් කථා කරන්න ඕනෑ. මම ගරු රිසාඩ් බදියුදීන් හිටපු අමාත්‍යතුමාට කථා කරලා කිව්වා, පුත්තලම නගරයේ hospital එකේ මේ ප්‍රශ්නය පිළිබඳව. ඇත්තටම ජනතාවත් එක්ක, රෝහල් කමිටුවත් එක්ක සුහදව වැඩ කරන MS මහත්මයෙක් ඉන්නවා. ඔහුව ස්ථාන මාරු කර තිබෙන බව කිව්වා. මේ සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍ය ගරු නලින්ද ජයතිස්ස මැතිතුමාට කථා කරලා එය නවත්වන්න අවශ්‍ය කටයුතු කර දෙන්න කියාත් කිව්වා. එතුමා ගරු නලින්ද ඇමතිතුමාට කථා කළා. ඒ වැඩේ වුණා. ඒක කවුරු කළත් ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා අපි බොරු කියන්නවත්, කවුරුවත් විවේචනය කරන්නවත් මෙතැනට එන්නේ නැහැ.

පුත්තලම නියෝජනය කළ ඉතා පැරණි දේශපාලනඥයන් ගැන අපි දන්නවා. එම්.එච්.එම්. නයිනා මරික්කාර් මැතිතුමා පුත්තලමේ. කථානායකවරයකු වශයෙන් කටයුතු කළ එච්.එච්.එස්. ඉස්මයිල් මහතා පුත්තලමේ. ඒ අය පුත්තලම නගරය දියුණු කරලා තිබෙනවා. ඒ වාගේ, පුත්තලම නගරය දියුණු කරන එක සියලුදෙනාගේ වගකීම. පක්ෂයක්, පාටක් අවශ්‍ය වෙන්නේ නැහැ, ඒක සියලු දෙනාගේ වගකීමක්. අඩුපාඩු පෙන්වා දීම විපක්ෂයේ වගකීම. ඒ වගකීම ඉෂ්ට කරනවා නම් ඒකට කවුරුත් තරහා ගන්න දෙයක් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.04]

ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මෙම විවාදය අවසන් කරන අවස්ථාවටයි අපි පැමිණ තිබෙන්නේ. විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධන ගෙනෙන මේ වෙලාවේ මා මුලින්ම කාරණයක් කියන්න ඕනෑ. මේ ගෙනෙන සංශෝධනයට සහයෝගය පළ කරලා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප පොළක් අදහස් දැක්වුවා. රටේ අවශ්‍යතාව දිහා බලලා ඒ දක්වපු සහයෝගය සම්බන්ධයෙන් මම එතුමන්ලාට ඉතාම ස්තූතිවන්ත වනවා. විශේෂයෙන්ම ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා, ගරු සුජීත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා සහ ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විපක්ෂයේ සිටියත් මෙම පනත් කෙටුම්පත්වලට සහයෝගය පළ කරමින් කථා කළා. හැබැයි, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා විවේචනාත්මකව කථා කළා. ඊට අදාළ පැහැදිලි කිරීම මා පසුව කරන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත්වල හරයාත්මක කාරණාව අපේ ගරු ගීතා හේරත් මන්ත්‍රීතුමියත් පැහැදිලි කළා. ඒවායේ තිබෙන හරයාත්මක කාරණා මොනවාද? පසුගිය වකවානුවේ මුළු රටක්ම ඉල්ලා සිටියා මෙම සංශෝධන ගෙනෙන්න කියලා. ඇයි, එහෙම කිව්වේ? මුළු රටක්ම යුක්තිය ඉෂ්ට කර ගැනීම සඳහා අභියාචනාධිකරණයට ආ යුතුව තිබුණා. සරලව කියනවා නම්, මත්ද්‍රව්‍යවල ශුද්ධ බර ග්‍රෑම් 10ට අඩු නම් මහාධිකරණයටත්, ඊට වැඩි ඒවා සම්බන්ධයෙන් අභියාචනාධිකරණයටත් තමයි ඇප ලබා දීමේ බලය තිබුණේ. ඒක තමයි නීතිය. නමුත්, එම නීතිය සංශෝධනය කරන්න ඉල්ලා සිටියේ ඇයි? මොකද, මොනරාගලින් එන එක්කෙනා,

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

යාපනයෙන් එන එක්කෙනා, දෙවුන්දරින් එන එක්කෙනා ඇතුළු යුක්තියක් ඉෂ්ට කර ගැනීමට එන මනුස්සයෝ කොළඹට ඇවිල්ලා ගරු අභියාචනාධිකරණයට එන්න ඕනෑ. එම නිසා ඒගොල්ලෝ කිව්වේ, "අපි ඉන්න ප්‍රදේශවල මහාධිකරණය තිබෙනවා. ඇයි ඒ අධිකරණ බලය දෙන්නේ නැත්තේ?" කියලායි. දැන් ඒ අවස්ථාව උදා වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ අනුව, ඔවුන්ට යුක්තිය ඉෂ්ට කරවා ගැනීම සඳහා කොළඹට එන්න අවශ්‍ය නැහැ.

ඒ වාගේම අපි දැන් ඒ අදාළ ප්‍රමාණයත් වැඩි කර තිබෙනවා. මත්ද්‍රව්‍යවල ශුද්ධ බර ග්‍රෑම් 100 දක්වා දැන් වැඩි කරලා තිබෙනවා. ඒ කියන්නේ, තවත් සරල කර තිබෙනවා. ඒ තුළ රස පරීක්ෂක වාර්තාවක් එන කල් ඉන්න ඕනෑ නැහැ. දළ බරට අනුව කටයුතු කරන්න පුළුවන්. එහිදී තමන් කැමැති forum එකකට ගිහිල්ලා යුක්තිය ඉෂ්ට කර ගන්න පුළුවන්. ඒ සඳහා තමන්ගේ දිස්ත්‍රික්කය ඇතුළේ තිබෙන මහාධිකරණයට යන්න පුළුවන්. එය සමාජයෙන් ආපු දැවැන්ත ඉල්ලීමක්. නීතිඥ ප්‍රජාවගෙනුත් ඒ ඉල්ලීම ආවා. ඒ ඉල්ලීමට අදාළ කාරණය තමයි අද දවසේ ගරු පාර්ලිමේන්තුව අනුමත කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊළඟට, ඒ අල්ලා ගන්නා ලද විෂ මත්ද්‍රව්‍ය යළි සමාජගත වෙනවා ද කියන සැකය නිසා සමාජයෙන් ආවා තව ඉල්ලීමක්. ඒ සැකය දුරු කරන්න ජනාධිපතිවරයා සහ අධිකරණ අමාත්‍යවරයා සම්බන්ධ වුණු සාකච්ඡා වට ගණනාවක් ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවතියා. ඒ සඳහා දැන් සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සංශෝධනය තිබෙන්නේ, "සාම්පලයක් පමණක් පරීක්ෂණය සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඉතිරි ප්‍රමාණය මහෙස්ත්‍රාත්වරයාගේ ආඥාවකට අනුව වහාම විනාශ කරනු ලැබිය යුතුය" කියලා. හරි නේ. එහෙම නම් සමාජයේ ඉල්ලීම ඔන්න අපි ඉෂ්ට කළා. විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥා පනතට ගෙනා සංශෝධන දෙකම සමාජයෙන් කළ ඉල්ලීම්. සමාජයේ ඉල්ලීම සහ අපේ අවශ්‍යතාව ඒ ඉටු කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි මේ දේවල් මේ විධියට කරගෙන යන්නේ ඇයි? බලයට එන්න කලින් අපි ප්‍රතිඥාවක් දුන්නා, අපව බලයට පත් කර ගත්තොත් මේ සමාජයේ තිබෙන විෂ මත්ද්‍රව්‍ය, පාතාලය සහ අවි ගනුදෙනුව නතර කරනවාය කියලා. ඒකට අදාළ සාධාරණය තමයි මේ කරන්නේ. මොකක්ද? අපට අලුතෙන් අණපනත් හදා ගන්න අවශ්‍ය නම් ඒ කාර්යය තමයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි මේ දැන් කරමින් සිටින්නේ.

ඒ වාගේම අපි සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පතත් පළමුවන වර කියවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඒ ගැන මේ ගරු සභාවේදීත් විවේචන සහිතව කරුණු කිහිපයක් කිව්වා. ප්‍රශ්නයක් නැහැ, තව අවස්ථාව තිබෙනවා. එම පනත් කෙටුම්පතේ මොනවා හරි ගැටලු තිබෙනවා නම් අපට ඒවා සාකච්ඡා කර ගන්න පුළුවන්.

හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ සමාජයට සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනතක් අවශ්‍යයි. ඇයි ඒ? Library එකෙන් මට research note එකක් එවලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ research note එකේ සඳහන් වනවා මත්ද්‍රව්‍යවලට අදාළවම නොවෙයි, සංවිධානාත්මක අපරාධ ගණයට වැටෙන ක්‍රියාවලට අදාළ පුද්ගලයන් 41දෙනෙකු විදේශයේ සිට මෙරටට රැගෙන ඇවිත් තිබෙනවා කියලා. කවුද ඒ අය? මම කිහිපදෙනෙකු ගැන විතරක් කියන්නම්. එක් කෙනෙක්, ලොකු පැටී; ප්‍රධාන පෙළේ සංවිධානාත්මක අපරාධකරුවෙකු සහ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙක්. ඉෂාරා සෙව්වන්දි; ගනේමුල්ල සංජීව ඝාතන සිද්ධියට ආධාර, අනුබල දීමට සම්බන්ධයි. පොඩි ලැසී, සංවිධානාත්මක අපරාධ ගණනාවකට සම්බන්ධයි. මීදිගම චූටි, වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති ඝාතනය ඇතුළු දකුණු පළාතේ සහ දිවයිනේ මනුෂ්‍ය ඝාතන කිහිපයකට සම්බන්ධයි. බටුවත්තේ චාමර, ගනේමුල්ල සංජීවගේ ඝාතනය හා සම්බන්ධයි. බස් ලලිත්, මනුෂ්‍ය ඝාතන, අපරාධ හා කප්පම් ගැනීම්වලට සම්බන්ධයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පසුගිය කාලයේ මේ කියන කප්පම් සිද්ධිය සැලකිය යුතු ජනප්‍රියත්වයක් ලැබුවා. ඊයේ පැවැති සාකච්ඡාවකදීත් මේ කරුණ මතු වුණා. එහෙම නම්, කප්පම් සිද්ධිවලට අදාළව ගත්තත් සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත අත්‍යවශ්‍යයි. මොකද, ඔවුන් සංවිධානාත්මකව තමයි මේ අපරාධ සිදු කරන්නේ. ඒ වාගේම කොණ්ඩ රංජී, කඳාන, මීගමුව, වත්තල ඇතුළු ප්‍රදේශවල අපරාධ ගණනාවකට සම්බන්ධයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අන්න ඒ අවශ්‍යතාව පදනම් කරගෙන තමයි අප සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත ගෙනැවිත් තිබෙන්නේ. නමුත්, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා විවේචන කීපයක් ගෙනාවා. තවම ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලාත් නැහැ. ඉදිරි අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් අපට සාකච්ඡා කරන්න පුළුවන්.

මෙච්චර සුබවාදී පනත් කෙටුම්පතක් පවා මේ සභාවේ විවේචනයට ලක් කළා. නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයාගේ කථාව කුහක, පුදුම තරහකින් කරපු කථාවක්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මොකද, සමගි ජන බලවේගයේ බහුතරයක් මන්ත්‍රීවරු, මේ පනත් කෙටුම්පත් අනුමත කරමින් මේක සමාජ අවශ්‍යතාවක් කියලා සුබවාදීව කථා කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙය පිළිතුරු කථාව නිසා තවත් විනාඩි කිහිපයක් මට අවශ්‍යයි.

එතුමා මතු කරපු තර්කය මොකක්ද? එතුමා මතු කරපු තර්කය තමයි, දැන් ග්‍රෑම් 100, ග්‍රෑම් 101ක් කරලා දමයි කියන එක. ඒක මොන තරම් කුහක අදහසක්ද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි?

එතුමාගේ කථාවේදී බන්ධනාගාර නිලධාරීන් ගැන හරියට කිඹුල් කඳුළු හෙළුවා. මොකද, බන්ධනාගාර නිලධාරීන්ගේ සුබසාධනය, ඔවුන්ගේ පවුල් ජීවිත ආදි දේවල් ගැන තමයි මෙතැනදී කථා කළේ. ඒක තනිකරම කිඹුල් කඳුළු හෙළීමක්, බොරුවට කරපු ප්‍රකාශයක්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මොකද, දැන් ඔහු ඉන්නේ එතැන නේ; හිරේ නේ. එතැන තිබෙන පහසුකම් හදා ගන්න තමයි මෙතැනට ඇවිල්ලා කිඹුල් කඳුළු හෙළුවේ. හැබැයි, එතුමා අපූරු යෝජනාවක් කළා. බන්ධනාගාර නිලධාරීන්ට අවදානම් දීමනාවක් - risk allowance එකක් - දෙන්න ඕනෑ කියලා. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ කථාව නම් ඇත්ත.

මොකද, නාමල් රාජපක්ෂ හිරේ ඉන්න කොට අනිවාර්යයෙන් ඔය risk allowance එක දෙන්න ඕනෑ. ඒක නිසා වෙන්න ඕනෑ, ඔය ඉල්ලීම කරන්න ඇත්තේ. බොහොම හොඳයි, ඒ ඉල්ලීම කළාට. ඒ වාගේම නාමල් රාජපක්ෂ කියනවා, "සික්" එක හැදිලා තරුණයෝ පාරේ වැටිලා නැහැ කියලා; මත්ද්‍රව්‍ය සමාජයේ අඩු නම් "සික්" එක හැදිලා තරුණයෝ පාරේ ඉන්න ඕනෑලු.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටට මේ විනාශය අත් කර දීපු පියවරුන් නේ, මේ. එතුමාගේ කට්ටිය තවම වැඩ නේ. එතුමා පාර්ලිමේන්තුවේ කරපු ඒ කථාවෙන් ධෛර්යය දෙනවා, "සමාජයේ තවම කුඩු තියෙනවා, wholesale තිබෙනවා, ඔන්න ගනිල්ලා" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මොනවාද මේ කථා. තමන්ගේ තාත්තා වත්තල පැත්තට ගිහිල්ලා කරපු විත්නැතිය අපට මතකයි නේ. ඕනෑම පවුලක දඩබ්බරයෙක් ඉන්නවා නේ. සමහර පවුල්වල ටිකක් දඩබ්බරයෝ ඉන්නවා. එහෙම දඩබ්බර වෙලා ඉන්නේ මල්ලි නම්, අයියා කියනවා "ඔය වැඩ කරන්න එපා" කියලා. එහෙම නැත්නම් ගෙදර පියා නොමඟ යනකොට අම්මා එහෙම කියනවා. දැන් ඒ පවුලේ කවුද කියන්න කෝ, අවවාදයක් දෙන්න ඉතුරු වෙලා ඉන්න කෙනා? මහින්ද රාජපක්ෂ ගිහිල්ලා වත්තල පැත්තේ අර කුඩු වෙළෙන්දා බදා ගත්තා. ඊට පස්සේ සිරිලිය නැන්දා ගිහිල්ලා,- එයාගේ අම්මා කවුද? සිරිලිය නැන්දා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? එතැන වංචාවක් කරලා අහු වෙලා. පවුලේ අනික් දරුවෝ තුන්දෙනාම එක එක දේවල් කරලා. නාමල්ට දැන් අධිචෝදනා පත්‍රභාර දීලා. ඊළඟට, මේ අයගේ රියැදුරුලා, පෞද්ගලික ලේකම්ලා ඇතුළු සියලු දෙනා ඒවාට හවුල් කරගෙන තිබෙනවා. සමස්ත පවුලක් මේ රට නැති කරලා තිබියදී, රට නැති කරපු මිනිහා_මෙතැනට ඇවිල්ලා කියනවා, "හා තවම සමාජයේ කුඩු තියෙනවා; මාර ප්‍රශ්නයක් නේ" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම කථාව අවසන් කරන්නම්, තවත් පොඩි කාරණයක් කියලා. දැන් නාමල් කියනවා නම්, තවම සමාජයේ බඩු තියෙනවා කියලා, අපි එතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. 2025.10.30 ඉඳලා 2025.10.19 දක්වා "රටම එකට" ජාතික වැඩ පිළිවෙළ පටන් ගත්තාට පසුව වසරයි ගත වෙලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි එම වැඩ පිළිවෙළට අවුරුද්දක් සම්පූර්ණ කරනවා, එළඹෙන 30වන දාට. මේ කාල වකවානුවේ විතරක්, අත්අඩංගුවට ගෙන තිබෙනවා හෙරොයින් කිලෝග්‍රෑම් 2,486ක්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පිටි මුට්ටවලින් නම්, මුට්ට 40ක්. ගරු නාමල් රාජපක්ෂ මැතිතුමනි, පිටි මුට්ට 40ක් වාගේ කුඩු ප්‍රමාණයක් සමාජගත වුණා නම් මොකද වෙන්නේ? අපේ දරුවෝ සහ අපේ වැඩිහිටියෝ ඒවා පරිහරණය කරන්නේ. අයිස් කිලෝග්‍රෑම් 3,302යි. පිටි මුට්ටවලින් නම්, 66යි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රජය යටතේ "රටම එකට" ජාතික මෙහෙයුමේ ජනාධිපතිවරයා උඩින් ඉඳලා දිස්ත්‍රික් සභා 25ක් හදලා සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම ප්‍රාදේශීය කමිටු හදලා කටයුතු කරගෙන යනවා. ගම් දහහතර දහස් ගණනයි තිබෙන්නේ. ඒ ගම් දහහතර දහස් ගණනටම මහජන ආරක්ෂක කමිටු හදලායි තිබෙන්නේ. ඒක හින්දා ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, යන්ත්‍රණයක් හදලා තිබෙනවා. ඒ යන්ත්‍රණය ඇතුළේ තමයි මේ කටයුතු කරන්නේ.

ජාතික ජන බලවේගය මැතිවරණයට කලින් කවදාක හරි පොරොන්දුවක් දුන්නා නම්, අපි මේ රටේ මහජනතාවට කියනවා, ඔන්න ඔබගේ බලාපොරොත්තුව ඉෂ්ට කරමින් ඒ විධියටම මේ ක්‍රියාවලිය ඉස්සරහට යනවා කියන එක. මා ඒ ප්‍රතිඥාව මේ වෙලාවේ ලබා දෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

විනා විවුක්කප්පට්ටු, ඏට්‍රුක්කොළ්ළප්පට්ටදු.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු හර්ෂණ නානායක්කාර මහතා]

තීරමානික්කප්පට්ටදු:
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Harshana Nanayakkara]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES in the Chair.]

1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 1 ordered to stand part of the Bill.

2 වන වගන්තිය.- (218 වන අධිකාරයේ 77අ වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 2.- (218ஆம் அத்தியாயத்தின் 77அ என்னும் பிரிவைத் திருத்துதல்)

CLAUSE 2.- *(Amendment of section 77A of Chapter 218)*

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "2 වන පිටුවේ, 15 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(අ) 54අ වන හෝ 54අඅ වන වගන්තිය යටතේ වන වරදක්' "

(2) "3 වන පිටුවේ, 20 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ආ) 54අ වන හෝ 54අඅ වන වගන්තිය යටතේ වන වරදක්' "

(3) "5 වන පිටුවේ, 5 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

'(අ) සැකකරු අධිකරණයේ පෙනී සිටින අවස්ථාවක දී,

සැකකරුට හෝ ඔහුගේ නීතිඥවරයාට ඒ' "

(4) "5 වන පිටුවේ, 10 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අතර, ඒ දිනය, (අ) ඡේදය ප්‍රකාර සැකකරුට හෝ ඔහුගේ නීතිඥවරයාට ඒ වාර්තාව භාර දෙන ලද දින' ".

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තංකල් විටුක්කප්පට්ටු ඒත්රුක්කොළ්ළප්පට්ටතු.
Amendments put, and agreed to.

2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

2ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clause 2, as amended, ordered to stand part of the Bill.

3 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

3ආම් වාසකම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clause 3 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

චට්ටමාකු වාසකමුම් තලෛප්පුම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
චට්ටමූලම් තිරුත්තංකළුටන් අරික්කෛ චෙය්යප්පට්ටතු.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මම යෝජනා කරමි.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.

වීනා විටුක්කප්පට්ටු, ඒත්රුක්කොළ්ළප්පට්ටතු.
අතන්පටි, චට්ටමූලම් තිරුත්තප්පට්ටවාරු මූන්රාම් මුරෛ මතිප්පිටප්පට්ටු නිරෛවේට්රප්පට්ටතු.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත - එල්.ඩී.ඕ 11/2026 - දෙවනවර කියවීම.

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත
நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம்
POISONS, OPIUM AND DANGEROUS DRUGS (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

වීනා විටුක්කප්පට්ටු, ඒත්රුක්කොළ්ළප්පට්ටතු.
අතන්පටි, චට්ටමූලම් ඉරණ්ටාම් මුරෛ මතිප්පිටප්පට්ටතු.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:

''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු හර්ෂණ නානායක්කාර මහතා]

තීර්මානික්කප්පට්ටතු:
"චට්ටමූලම් මුළුප් පාරාළුමන්රක් කුළුවුක්කුච් චාට්ටප්පටුමාක." - [மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Harshana Nanayakkara]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනාරූඪ විය.]

කුළුවිල් ආරාය්ප්පට්ටතු.
[மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES in the Chair.]

1 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1ආම් වාසකත්තිලිරුන්තු 4ආම් වාසකම් වරෛ චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clauses 1 to 4 ordered to stand part of the Bill.

5 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම)
வாசகம் 5.- (முதன்மைச் சட்டவாக்கத்திற்கான மூன்றாம் அட்டவணையைத் திருத்துதல்)
CLAUSE 5.- (*Amendment to Third Schedule to the principal enactment*)

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "3 වන පිටුවේ, 29 වන පේළියේ සිට 31 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(1) ඒ උපලේඛනයේ 1 වන කොටසේ "ආ" විනාාසයේ 1 වන කොටසේ -

(අ) 26 වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"26 කැනබිස්	කැනබිස් ශාකයේ මල් හෝ ඵල දරන මුදුන් කොටස් (නිස්සාරණය නොකරන ලද රෙසින)"

(ආ) 26 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතම ඇතුළත් කිරීමෙන්:-

"26අ කැනබිස්	කැනබිස් සැටිවා ඵල්.
	26ආ කැනබිස් කැනබිස් සැටිවා ඵල්. හි යම් ගැලෙනිකල් (galenical) පිළියෙල කිරීමක්;" සහ

(ඇ) 27 වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"27 කැනබිස් රෙසින, නිස්සාරණ සහ ද්‍රාවණ	කැනබිස් ශාකයෙන් ලබා ගන්නා ලද (ශුද්ධ නොකරන ලද හෝ ශුද්ධ කරන ලද) වෙන් කරන ලද රෙසින" ' "; සහ

(2) "4 වන පිටුවේ, 1 වන පේළියේ සිට 3 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න"

(3) "4 වන පිටුවේ, 11 වන සහ 12 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

' "සැටිවා ඵල්./කැනබිස් සැටිවා ඵල්. හි යම් ගැලෙනිකල් (galenical) පිළියෙල කිරීමක්" යන අනුශීර්ෂය' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තංකල් විඩුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.
Amendments put, and agreed to.

5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

5ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.
Clause 5, as amended, ordered to stand part of the Bill.

6 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

6ආම් වාසකම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.
Clause 6 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

චට්ටමාකු වාසකමුම් තලෛප්පුම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.
චට්ටමූලම් තිරුත්තංකළුඩන් අරික්කෛ සෙය්යප්පට්ටදු.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරමි.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
න්‍යාය පත්‍රයේ විෂය අංක 3 සිට 11 දක්වා අනුමත කිරීම.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය: වාර්ෂික වාර්තාව (2022)
தேசிய தொழில் கற்கைகள் நிறுவகம்: வருடாந்த அறிக்கை (2022)
NATIONAL INSTITUTE OF LABOUR STUDIES: ANNUAL REPORT (2022)

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කම්කරු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත යටතේ 2024.02.20 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.22 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
වினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය: වාර්ෂික වාර්තාව (2022)
தேசிய தொழில்சார் பாதுகாப்பு மற்றும் சுகாதார நிறுவகம்: வருடாந்த அறிக்கை (2022)
NATIONAL INSTITUTE OF OCCUPATIONAL SAFETY AND HEALTH: ANNUAL REPORT (2022)

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කම්කරු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

"2009 අංක 38 දරන ජාතික වෘත්තිය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනතේ 18 වගන්තිය යටතේ 2024.06.04 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.22 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය: වාර්ෂික වාර්තාව (2015)
மக்கள் தோட்ட அபிவிருத்திச் சபை: வருடாந்த அறிக்கை (2015)
JANATHA ESTATES DEVELOPMENT BOARD: ANNUAL REPORT (2015)

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.08.23 දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to

ජනතා වතු සංවර්ධන මණ්ඩලය: වාර්ෂික වාර්තාව (2016)
மக்கள் தோட்ட அபிவிருத்திச் சபை: வருடாந்த அறிக்கை (2016)
JANATHA ESTATES DEVELOPMENT BOARD: ANNUAL REPORT (2016)

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2024.03.06 දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.24 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය: වාර්ෂික වාර්තාව (2017)
மக்கள் தோட்ட அபிவிருத்திச் சபை: வருடாந்த அறிக்கை (2017)
JANATHA ESTATES DEVELOPMENT BOARD: ANNUAL REPORT (2017)

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2024.03.06 දින ඉදිරිපත් කරන ලද, 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.24 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය: වාර්ෂික වාර්තාව (2018)
மக்கள் தோட்ட அபிவிருத்திச் சபை: வருடாந்த அறிக்கை (2018)
JANATHA ESTATES DEVELOPMENT BOARD: ANNUAL REPORT (2018)

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2024.03.06 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.24 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රණවිරු සේවා අධිකාරිය: වාර්ෂික වාර්තාව (2023)
ரணவிரு சேவா அதிகாரசபை: வருடாந்த அறிக்கை (2023)
RANAVIRU SEVA AUTHORITY: ANNUAL REPORT (2023)

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷண நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරිය පනතේ 15 වගන්තිය යටතේ 2025.07.11 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රණවිරු සේවා අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.11 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.11.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය: වාර්ෂික වාර්තාව (2022)
ஜெனரல் சேர் ஜோன் கொத்தலாவல பாதுகாப்புப் பல்கலைக்கழகம்: வருடாந்த அறிக்கை (2022)
GENERAL SIR JOHN KOTELAWALA DEFENCE UNIVERSITY: ANNUAL REPORT (2022)

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷண நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1981 අංක 68 දරන කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතන පනත යටතේ 2024.03.05 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.11 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.11.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය: වාර්ෂික වාර්තාව (2023)
ஜெனரல் சேர் ஜோன் கொத்தலாவல பாதுகாப்புப் பல்கலைக்கழகம்: வருடாந்த அறிக்கை (2023)
GENERAL SIR JOHN KOTELAWALA DEFENCE UNIVERSITY: ANNUAL REPORT (2023)

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷண நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1981 අංක 68 දරන කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතන පනත යටතේ 2025.10.21 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.11 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.11.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷண நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

තායිලන්ත නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරියගේ සංචාරයේදී නිසි රාජ්‍ය තාන්ත්‍රික පිළිගැනීම ලබා නොදීම
தாய்லாந்து பிரதிப் பிரதமரின் விஜயத்தின்போது முறையான இராஜதந்திர வரவேற்பு வழங்கப்படாமை
FAILURE TO ACCORD DUE PROTOCOL DURING THE VISIT OF DEPUTY PRIME MINISTER OF THAILAND

[අ.භා. 5.27]

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර ථේරවාද බුදු දහම මත පදනම්ව ඓතිහාසික සමීප සබඳතාවක් පැවතිණි. ලක්දිව උපසම්පදාව යළි පිහිටුවීම සඳහා සියම් දේශයෙන් භික්ෂූන් වහන්සේ වැඩම කරවීම එම ඓතිහාසික සම්බන්ධයට කදිම සාක්ෂියකි. එවැනි පසුබිමක මිහින්තලය රජමහා විහාරයේ පැවැති මිහිඳු මහසෑයේ කොත් වහන්සේ සහ චූඩාමාණික්‍යය නිරාවරණය කිරීමේ ආගමික උත්සවයේ ප්‍රධාන අමුත්තෙකු ලෙස තායිලන්තයේ නියෝජ්‍ය අගමැතිනිය ලෙස සුපජී සුතුම්පුන් මැතිනිය පැමිණීමේදී ඇයට හිමි නිසි රාජ්‍ය තාන්ත්‍රික පිළිගැනීම සහ ආරක්ෂාව ලබා දීම පවතින රජයේ යුතුකමකි.

නමුත්, එවැනි නිසි ඇගයීමක් ඇයට ලැබුණේද යන්න ගැටලු සහගතය. එවැනි පසුබිමක දෙරට අතර මිත්‍රත්වයටත්, ආගමික සහජීවනයටත් බාධා පැමිණුනු බව අපගේ හැඟීමයි. එබැවින් එවැනි අඩු පාඩු මහ හරහා රාජ්‍ය තාන්ත්‍රික කටයුතුවලදී නිසි ක්‍රමවේදයන්ට අනුකූලව කටයුතු කිරීම රජයක යුතුකම සහ වගකීම බව මෙම ගරු සභාවට යෝජනා කරමි."

Hon. Deputy Chairperson of Committees, the Motion before this House goes far beyond a single breach of protocol. It highlights a profound, systemic decline. When we handle our international relations with utter carelessness, we dismantle the efforts of generations and alienate our oldest, most-trusted allies. There is an old, enduring truth that a little knowledge is a dangerous thing. And, a little knowledge coupled with a stupid arrogance is catastrophic. In diplomacy, a shallow understanding is a liability, but refusal to learn is a fatal flaw. Today, we witness a tragedy. An amateur approach has replaced genuine statecraft and a painful mediocrity has become our daily norm on the world stage.

Madam Chair, we historically rejected this mediocrity. We survived because our leaders possessed a rare, profound grasp of international affairs. We built our alliances not on transactional favours, but on mutual trust, intellectual depth and absolute credibility. This strength was never an accident; it was forged through a proud tradition of diplomatic excellence, where we engaged global powers as absolute equals, drawing benefits from everyone without ever becoming a pawn to anyone. When you abandon that depth, you invite a dangerous emptiness.

Look at us now. Those high standards have completely collapsed. Renowned political analysts warn that Sri Lanka's international standing is rapidly deteriorating due to domestic ideological blunders. Our neighbours look at us today and see a nation that has lost its strategic clarity. Madam Chair, in the past, the global community looked up to Sri Lanka. We articulated our positions with elegance and deep intellect. Today, that elegance is gone. Look at how this Government treated the visiting Deputy Prime Minister of Thailand. The Ministry of Foreign Affairs hides behind cold, bureaucratic excuses claiming she arrived in a "private capacity" and received only "what was requested for". That is a pathetic evasion of duty. A sitting Deputy Prime Minister of a vital regional ally is never just a private citizen.

She brought a sacred Crest-Gem to our soil as a cultural ambassador. To deny her standard State protocol and secure dignity is a direct insult to the Thai State. It carelessly damages centuries of sacred Theravada Buddhist ties.

This broken, amateur approach has become the norm under a Ministry once celebrated for its elite standards. We saw that failure at the Raisina Dialogue where the Ministry failed to properly brief its own Minister on maritime security. We saw it when they sent an envoy to the BRICS Summit, leaving Sri Lanka humiliated and sidelined while 13 other nations moved forward.

Madam Chair, I can understand an inability to articulate. But, I cannot forgive an inability to understand; I cannot forgive lack of foresight; I cannot excuse an absence of strategic depth and I cannot tolerate this complete abdication of statecraft. Madam, we cannot stay silent when an institution built by giants is dismantled by these mediocre actions.

Thank you.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
යෝජනාව ස්ථිර කිරීම, ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.33]

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සභාව කල් තබන අවස්ථාවේදී ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව මම ස්ථිර කරනවා. ඇත්තටම තායිලන්ත නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරිය ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේදී ආණ්ඩුවේ ක්‍රියා කලාපය දකිද්දි අපට පැහැදිලිව පෙනෙන්න තිබෙන දේ තමයි, විදේශීය රාජ්‍ය නායකයෙකු අපේ රටට ඇතුළු වෙද්දි ඒ කෙනාට අවශ්‍ය අභිමානය ලබා දීම අතින් රජයේ විදේශ ප්‍රතිපත්තිය කොයි

තරම් අසමත්භාවයක් පෙන්වනවාද කියන එක. අපි අසමත් රාජ්‍යයක් බව දිගින් දිගටම පෙන්වන්න දරන උත්සාහයක්ද කියන එක පිළිබඳ සැකයක් මේ සිදුවීම තුළින් මට මතුවනවා.

මේක කොහොමද සිද්ධ වෙලා තිබෙන්නේ කියලා මම සොයා බැලුවා. ජනාධිපති ලේකම් කාර්යාලය වෙත මිහින්තලේ නායක හාමුදුරුවෝ මුලින්ම මේ පිළිබඳ පණිවුඩය යවන්නේ 07වැනි මාසයේ 28වැනි දා. ඊට පස්සේ තායිලන්තයේ තානාපති කාර්යාලයෙන් මේ පණිවුඩය විදේශ කටයුතු අමාත්‍යාංශයට එවනවා, සැප්තැම්බර් මාසයේ 01වැනි දා. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාට සැප්තැම්බර් මාසයේ 02වැනි දා ලිපියක් එවනවා. ඊට පස්සේ 09වැනි මාසයේ 28වැනි දා මේ පිළිබඳව කටයුතු කරන්න කියලා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයට දන්වා සිටිනවා. ඒ කියන්නේ documents පැත්තෙන් සියලු දේවල් නිසියාකාරව සිද්ධ වෙලා තිබෙනවා.

මම හිතන්නේ මේ අවුරුද්දටම රටක නියෝජ්‍ය අග්‍රාමාත්‍ය ධුරය හොබවන කෙනෙක් ලංකාවට ආ පළමුවැනි අවස්ථාව මෙය. ඒ වෙලාවේ අවශ්‍ය රාජ්‍ය තාන්ත්‍රික ගෞරවය ලබා නොදීම පිළිබඳව ආණ්ඩුවේ කරුණු පැහැදිලි කිරීමේදී කියන්නේ මොකක්ද? ඒ කරුණු පැහැදිලි කිරීමේදී සඳහන් වනවා, "විශේෂයෙන්ම විදේශීය රාජ්‍ය නියෝජිතයන් සම්බන්ධ කරුණුවලදී, කරුණු සම්පූර්ණයෙන් විමසා නොබලා රජයට එරෙහි දේශපාලන ප්‍රචාරයක් ගෙන යාමෙන් හානි විය හැක්කේ එක් පාර්ශ්වයකට පමණක් නොව, රටේ ජාත්‍යන්තර ප්‍රතිරූපයට ද වේ" යනුවෙන්. අපිත් කියන්නේ ඒකම තමයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ අවස්ථාවේදී මා මෙම සිද්ධියට අදාළ ලේඛන සියල්ල **සභාගත*** කරනවා.

මේ ආණ්ඩුවේ පොඩි වැඩ හින්දා, මේ ආණ්ඩුවේ කුඩා වැඩ හින්දා, ලංකාවත් එක්ක අවුරුදු දහස් ගණනක් තිස්සේ, - *[බාධා කිරීමක්]* හරි, හරි, ඔයගොල්ලන් සද්ද නැතුව ඉන්න කෝ. ඉස්සෙල්ලා කථාව අහගෙන ඉන්න කෝ. පණ්ඩිතයා වෙන්න එනවා මෙතන. කරන්න පුළුවන් හැම අපරාධයක්ම රටට කරලා, පොඩි, පොඩි මිනිස්සු ටිකක්. බුද්ධාගමට කරන්න පුළුවන් හැම කෙනහිලිකමක්ම කරලා, පණ්ඩිතයෙක් වාගේ මෙතැන කියවන්න එනවා. *[බාධා කිරීමක්]* හරි, හරි, කට පියාගෙන ඉන්න. ඔය මන්ත්‍රීතුමාට මේකේ කිසිම අදාළත්වයක් නැහැ නේ. ඔයා කවුද? මගේ කථාවට මැද්දෙන් පැනලා, - *[බාධා කිරීමක්]* බුද්ධාගමට කරන්න පුළුවන් හැම හානියක්ම කරලා, මිහින්තලේ හාමුදුරුවොත් එක්ක තිබෙන වෛරය තායිලන්තයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරිය ඉදිරියේ ප්‍රදර්ශනය කරලා, මේ මිනිස්සු එනවා අපට කියලා දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, මාතෘකාවට අදාළව කථා කරන්න.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ඉස්සෙල්ලා බුද්ධාගමට තිබෙන ගෞරවයවත් ආරක්ෂා කරන්න මතක තියාගන්න. *[බාධා කිරීමක්]* මොනවද එහෙම කථා කරන්න කියන්නේ. මගේ අදහස් දැක්වීමේදී භාවිත කරපු වැරදි වචනය මොකක්ද? *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයට කථා කරන්න.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
පොඩි මිනිස්සු, පොඩි මිනිස්සු මිසක් ආයෙත් ලොකු වෙනවායැ? නැත්තම් නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරිය ලංකාවට ආපු වෙලාවේ බුද්ධාගමට කරන්න පුළුවන් බරපතළම හානිය කරලා, - *[බාධා කිරීම්]* චූඩා මාණික්‍යය තියන්නේ ඒ අයගේ සල්ලිවලින්. නමුත් කිසිදු රාජ්‍ය නිලධාරියෙක් යැව්වේ නැහැ, රජයේ නියෝජිතයෙක් ගියේ නැහැ, එතුමිය පිළිගැනීමට. අඩුම තරමින් airport එකේ ඉඳන් මිහින්තලයට යනකම් කිසි ගෞරවයක් ලබා දුන්නේ නැහැ. ඒ ගැන කිසිදු දෙයක් නොකරපු ආණ්ඩුව ගැන ස්වාමීන් වහන්සේලා පැත්තේ ඉඳලා අපි විවේචනය කළාම, අපට කියලා දෙන්න එනවා. බුද්ධාගමේ ආරක්ෂාව මුළුමනින්ම විනාශ කරනවා කියලා හාමුදුරුවෝ දිගින් දිගටම කියන එක දැන් ඔප්පු වෙනවා. මම මේ රටේ ස්වාමීන් වහන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා, මේ අවුරුදු දෙක, තුන යනකම් මුසාවාදා ගැන කියන පන්සිල් පදය කියන කොට තුන්පාරක් කියන්න කියලා. හේතුව, මේ ආණ්ඩුව ඒ තරමට බොරු කියනවා. ඒ තරමට නොමඟ යවනවා. ඒ අතරවාරයේ අපි ඇවිල්ලා මේවා කියනකොට, ඒ ගැන අදහස් දක්වන්න ඉඩ දෙන්නේත් නැහැ. කාලයකට සැරයක් තමයි මේ වාගේ උත්සවයක් එන්නේ. ඒ වාගේ වෙලාවක තමයි පිට රටක නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරියක් ලංකාවට ආවේ.

ඊට අමතරව විදේශ කටයුතු ඇමතිවරයා දිගටම කියනවා, තායිලන්තයේ සංචාරක වීසා පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා කියලා. මේ වාගේ බරපතළ විදේශ තාන්ත්‍රික හේතු තිබෙන වෙලාවක තායිලන්තයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරිය ලංකාවට ආවාම එතුමියට නිසි ගෞරවය නොදුන්නේ ඇයි කියලා ඇහුවාම මෙතැන අපට වෙන වෙන දේවල් කියලා දෙන්න එනවා. ඕවා තමයි පොඩි වැඩ, ඕවා තමයි පොඩි වැඩ. ලක්ෂ්මන් කදිර්ගාමර් වාගේ විදේශ කටයුතු ඇමතිවරුන්, සිරිමාවෝ බණ්ඩාරනායක වාගේ අග්‍රාමාත්‍යවරියන් මේ රට ලෝකය තුළ ඉස්සරහට ගෙනිච්චේ කොහොමද කියලා බලාගන්න. මේ රට කුඩා රටක් වුණාට ලෝකය ඇතුළේ ප්‍රබල රටක් විධියට ඉස්සර හිටපු මිනිස්සු මේ රට ඉස්සරහට ගෙනිච්චා. අපි මේ පිළිබඳව අදහස් දක්වන කොට මෙතැන අපට වෙන වෙන දේවල් කියලා දෙන්න එනවා. තමන්ගේ රාජකාරිය හරියට ඉෂ්ට කරන්න කියලා මම කියනවා. *[බාධා කිරීමක්]* පණ්ඩිත කථා කියවන්නේ නැතුව ඉන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
කරන්න පුළුවන් හැම දෙයක්ම බුද්ධාගමේ විනාශය වෙනුවෙන් කරන ගමන්, බෞද්ධ ජනතාව කුපිත කරවමින් බරපතළ ප්‍රශ්නයකට රට ගෙනියන්න හදන ගමන්, අර පැත්තෙන් විහාර මහාදේවී උද්‍යානයේ ඉන්න ස්වාමීන් වහන්සේලාට අගෞරව කරනවා. *[බාධා කිරීමක්]*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[පි.ප. 5.38]

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(මාණ්පුමිකු තුරෛරාසා රවිකරන්)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இராஜதந்திர நடைமுறைகளையும் சமய நல்லிணக்கத்தையும் வலியுறுத்தி இந்த ஒத்திவைப்புப் பிரேரணையை முன்வைத்த கௌரவ திலித் ஜயவீர அவர்களின் முயற்சியை வரவேற்கின்றேன்.

இலங்கைக்கும் தாய்லாந்துக்கும் இடையிலான வரலாற்று உறவுகளை நாம் மதிக்கின்றோம். வெளிநாட்டு உயர்மட்ட விருந்தினர் ஒருவர் சமய நிகழ்வுக்காக வருகை தந்தாலும், அவரது பதவிக்கும் வருகையின் தன்மைக்கும் உரிய இராஜதந்திர மரியாதையும் பாதுகாப்பும் வழங்கப்பட வேண்டும். இவ்விடயத்தில் மேற்கொள்ளப்பட்ட ஏற்பாடுகள் என்ன? எங்கு குறைகள் ஏற்பட்டன என்பவை தொடர்பில் அரசாங்கம் இச்சபைக்குத் தெளிவுபடுத்த வேண்டும். அதே வேளை, வெளிநாட்டு விருந்தினர்களுக்கான சமய மரியாதையை வலியுறுத்தும் இச்சபையில், உள்நாட்டில் எமது மக்களின் சமய மரியாதைக்கு ஏற்பட்ட அவமதிப்புகளையும் நினைவுபடுத்த விரும்புகின்றேன்.

2019ஆம் ஆண்டில் முல்லைத்தீவு, செம்மலை நீராவியடிப் பிள்ளையார் ஆலயத்தில் நீதிமன்ற உத்தரவையும் மீறி, நூற்றுக்கணக்கான தமிழர்களின் எதிர்ப்பையும் மீறி, பொலிஸார், படையினர் உள்ளிட்ட அரச இயந்திரங்கள் குவிந்து பாதுகாப்பு வழங்க, சைவ மக்களின் புனித தீர்த்தக்கேணியோரம் பௌத்த பிக்குவின் உடலம் தகனம் செய்யப்பட்டது. அப்போது எமது மக்களின் சமய உணர்வுகளுக்கு வழங்கப்பட்ட மரியாதைதான் என்ன? படையினர் சூழ்ந்திருக்க குருந்தூர்மலை ஆதிசிவன் ஆலயத்தில் எமது மக்கள் வழிபட்டுவந்த சூலம் காணாமலாக்கப்பட்டது. வெடுக்குநாறி மலையில் எமது சமய அடையாளங்கள் சேதப்படுத்தப்பட்டு அகற்றப்பட்டன. இவற்றுக்கான பொறுப்புக் கூறல் எங்கே?

இறுதிப் போரின்போது காணாமலாக்கப்பட்ட அருட்தந்தை பிரான்சிஸ் ஜோசப் அடிகளாரின் கதியையும் இச்சபையில் நினைவுபடுத்துகின்றேன். அவருக்கு என்ன நேர்ந்தது என்ற உண்மை வெளிக்கொண்டுவரப்படவில்லை; நீதியும் நிலை நாட்டப்படவில்லை. சிங்கள பௌத்தர்கள் வாழாத முல்லைத்தீவின் கொக்கிளாய் பகுதியில் தனியார் காணியை ஆக்கிரமித்து விகாரை வலிந்து நிர்மாணிக்கப்பட்டது. சைவ மக்கள் நிறைந்த வெட்டுவாய்க்கால் பகுதியிலும் வலிந்து விகாரை அமைக்கப்பட்டது. ஆக, இங்கு அமைக்கப்படும் விகாரைகள் வழிபடும் நோக்கத்துக்காக அன்றி, நில ஆக்கிரமிப்பு அடையாளங்களாகவே அமைக்கப்படுகின்றன. நாட்டையும் அரண்மனை வாழ்வையும் துறந்து ஞானம் கண்ட புத்தபெருமானை, நில ஆக்கிரமிப்பின் அடையாளமாக எமது மக்கள் உணரும் நிலைக்குக் கொண்டுவந்த கடந்த கால அரசியல் அணுகுமுறைகள் எவ்வளவு துயரமானவை!

இந்தத் தீவின் வருங்காலம் பல்வகைமையை மதித்துக் கொண்டாடுவதாக அமைய வேண்டும். இன, மத, நல்லிணக்கம் நடைமுறையிலும் வெளிப்பட வேண்டும். வெளிநாட்டு விருந்தினர்களுக்குரிய இராஜதந்திர மரியாதையை வலியுறுத்துகின்ற அதே உறுதியுடன், உள்நாட்டிலும் அனைத்து மக்களுக்கும் உரிய சமய மரியாதையையும் அரசாங்கம் உறுதிப்படுத்த வேண்டுமென வலியுறுத்தி, நிறைவு செய்கின்றேன். நன்றி. வணக்கம்!

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.41]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම විශ්වාස කරනවා, ඔබතුමිය බුද්ධාගමේ කියලා. හැබැයි, මම නම් හින්දු ආගමේ, බුද්ධාගමේ නොවෙයි. හැබැයි, මට ලජ්ජයි, 159ක් හැමදාම ගෝත්‍රික වැඩ කරනවාය කියන එක ගැන. මට ඒ ගැන ලජ්ජයි. ඇත්තටම ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දෙමළ, හින්දු වෙලාත් මම කවදාවත් බුද්ධාගමට අත දික් කරන්නේ නැහැ. අපේ මිනිස්සු ඇවිල්ලා අත දික් කරලා බෝම්බ පුපුරන කොටත් වැරදියි කියලා කියපු කෙනෙක් මම. හැබැයි, නවරාත්‍රී පූජාව celebrate කළා නේද? ඔය වාගේ ගොන් වැඩ, චූන් දෙන වැඩවලට අපි එන්නේ නැහැ.

හැබැයි, ඔබතුමන්ලා ඉන්දියාවෙන් එක්කන් ආවා, කෛලාශානන්ද් කියන හින්දු පොරක්ව. ඔහු flight එකෙන් මෙහාට එනකම්,- මම ඇමතිතුමාගේ නම දන්නේත් නැහැ නේ හරියට. Hon. (Prof.) Ruwan Ranasinghe, Deputy Minister සහ තව අපේ international අයියාත් ගිහිල්ලා බැලුවා, මම හිතන්නේ - "ඉන්ටර්නැෂනල් ලෝ රිපාට්ටේ"- ඒ අයියාත් ගිහිල්ලා බැලුවා මම හිතන විධියට. ලජ්ජයි. මේ රටේ අවුරුදු 40ක් යුද්ධය පැවැති කාලයේදීවත් කරන්න බැරි වෙච්ච දෙයක් තමයි ඔබතුමුන්නාන්සේලා කළේ. භික්ෂූන් වහන්සේලාගේ සිවුරු ගැලෙව්වා. එහෙම කරන ගමන් මෙහේ නවරාත්‍රී celebrate කරනවා. තමුන්නාන්සේලා බුද්ධාගමේ කියලා පිළිගන්න ඔක්කෝටම කලින්. අපි පාඩම් කරනකොට කියනවා, මේක සිංහල, බෞද්ධ රට කියලා. හැබැයි, අපේ දෙමළ මිනිස්සු ඒක එහෙම නොවෙයි, අපිත් ඉන්න ඕනෑ කියලා අවුරුදු 40ක් රණ්ඩු වුණා. හැබැයි, ඒක කරගන්න බැරි වුණා. අපි එකම එක දෙයයි කළේ. ඩයස් පෝරාවට කියලා මේගොල්ලන්ට සල්ලි ටිකක් දුන්නා. දැන් බුද්ධාගම නැති කරලාම දැම්මා, රටටම. දැන් පිළිම වන්දනාව ගෝත්‍රික වැඩක් කියනවා. ඔය ආණ්ඩු පක්ෂය පැත්තේ ඉස්සරහ පේළියේ ඉන්න සමහර ලොක්කන්ට; ඔළුවේ කොණ්ඩය නැති ඇමතිලාට දැන් ඒක ගෝත්‍රික වැඩක් වෙලා තිබෙන්නේ.

හැබැයි, මම නම් ඕකට ඉඩ දෙන්නේ නැහැ. ඇත්තටම බුද්ධාගම කියන්නේ මේ රටේ අවුරුදු 2,500කට වඩා කාලයක් තිස්සේ තිබෙන ආගම. දෙමළ වුණත් මම පොඩි කාලයේ ඉඳන්ම පන්සලට යනවා, මේකට යනවා. අරකට යනවා. හැබැයි, බලන්න කෝ අර,-

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හොඳයි. පිට රටක Deputy Prime Minister and Minister of Commerce, Cabinet Minister කෙනෙක් ලංකාවට එනකොට ඔබතමුන්නාන්සේලා කවුරුවත් ගියේ නැහැ. ඇත්තටම මම ඒ ගැන කනගාටු වෙනවා. ලක්ෂ්මන් කදිර්ගාමර් වාගේ දෙමළ පොරවල් හිටපු රටක් මේක. ඒක මතක තියා ගන්න. ඒ වාගේ මිනිස්සු ජීවත් වුණු රටක් මේක; ඒ වාගේ මිනිස්සු බේරා ගත් රටක් මේක. "ඉන්ටර්නැෂනල්" කියන එක කියන්න තේරෙන්නේ නැතිව, "ඉන්ටෙෂනල්", "ඉන්ටෙෂනල්" කියලා, මිනිස්සු දැන් හිනා වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. දැන් මේ රටේ අය විතරක් නොවෙයි, ලෝකයේම අය හිනා වෙනවා, අපේ දිහා බලා. ඉස්සරහ පැත්තෙන් බලා හිනා වුණාට කමක් නැහැ. පිටිපස්සෙනුත් බලා හිනා වෙනවා. ඒකයි case එක. ඒ නිසා සිවුරු ගලවා, අපේ මිනිස්සු චූන් කරන වැඩ නවත්වන්න. එහෙම කළාට අපි ඡන්දය දෙන්නේ නැහැ. ලොකු පුටුවල වාඩි වෙනකොට ඒ විධියටම හැසිරෙන්නත් දැන ගන්න ඕනෑ. නමුත් එහෙම හැසිරෙන්න බැහැ. කොහොමත් අර

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඒ නිසා ඒගොල්ලන්ට එහෙම හැසිරෙන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසන්.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම කථාව ඉවර කරනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඒ විධියට. හැබැයි, එහෙම හිල දාපු underwear දාගෙන ආවේ නැහැ අපි පාර්ලිමේන්තුවට. හැබැයි, ඔබතමුන්නාන්සේලා මතක තියා ගන්න, ලොකු පුටුවල වාඩි වෙනකොට ඒකට ගරුත්වයක් තිබෙනවා. කදිර්ගාමර්ගේ ඉඳලා ඔක්කෝම අය වාඩි වෙලා හිටපු පුටුවල වාඩි වෙලා ඉදිමින් ඔයගොල්ලන් කරන්නේ කැත වැඩ. පිට රටක Deputy Prime Minister කෙනෙක් ආවාම කිසිම ආරක්ෂාවක් දෙන්නේ නැතිව කැත වැඩක් කළා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විජිත හේරත් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.45]

ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර දිගු කාලීන ආර්ථික, සංස්කෘතික සහ ආගමික මිත්‍රත්වයක් තිබෙනවා. එම මිත්‍රත්වය ඉතා ශක්තිමත්ව අපි ඉදිරියට අරගෙන යනවා.

ඒ වාගේම එදා ලංකාවට උපසම්පදාව ගෙන ඒමේදීත් තායිලන්ත රජයෙන් විශාල වැඩ කොටසක් ඉටු කළ බවත් අපි පිළිගන්නවා. ඒ වාගේම අපේ රටේ බුදු දහම ආරක්ෂා කරන්න, පෝෂණය කරන්න රජයක් විධියට අපි වගකීම් සහගතව බැඳී ඉන්නවා. ඒ සියලු කටයුතු සිදු වන අතර තායිලන්තයත් එක්ක අපේ තිබෙන රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාව ඉතා කිට්ටුවෙන්, මිත්‍රශීලීව පවත්වා ගෙන යනවා. මෑතකදී තායිලන්ත රජයේ ආරාධනාවකට මම තායිලන්තයට ගියා. තායිලන්තයේ නියෝජ්‍ය විදේශ ඇමතිතුමා සහ ඒ බලධාරීන් මම මුණ ගැහුණා; අපි දෙරට අතර තිබෙන සම්බන්ධතා තවත් ශක්තිමත් කරගත්තා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විවිධ අවස්ථාවලදී විවිධ රටවල අමාත්‍යවරුන්, රාජ්‍ය නායකයින් රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් ලංකාවට පැමිණෙනවා. ඒ වාගේම තමයි ඒ රටවල ඇමතිවරුන් පෞද්ගලික සංචාර සඳහාත් ලංකාවට පැමිණෙනවා. වරද්දා ගෙන තිබෙන්නේ මෙන්න මේ කාරණා දෙකයි.

ඇත්තටම තායිලන්තයේ වාණිජ්‍ය ඇමතිතුමිය ලංකාවට ආපු පළමුවැනි අවස්ථාව මෙය නොවෙයි. මුසාවාදා කියන්න එපා කියලා අපට කිව්වාට, ඔයගොල්ලන් කිව්වේම මුසාවාදයක්. දන්නේ නැහැ නේ. නොදන්නා ඒවා කියන්න ගිහින්, පණ්ඩිතකම පෙන්වන්න ගිහින් වරද්දා ගත්තා. *[බාධා කිරීමක්]* ඒ නිසා දන්නා දේවල් විතරක් කථා කරන්න. පසුගිය දෙසැම්බර් මාසයේදීත් එතුමිය ලංකාවට ඇවිල්ලා හිටියේ. "දිවිවා" සුළි කුණාටුව එන්න කලින් එතුමිය ලංකාවට ඇවිල්ලා, මහනුවරට ගිහින් මහනුවර ඉඳලා අනුරාධපුරයට යන්න හිටියේ. නමුත් "දිවිවා" සුළි කුණාටුව නිසා යන්න බැරි වුණා. ඒ නිසා නොදන්නා බහුබූත කථා කරන්න එපා. *[බාධා කිරීමක්]* තමන්ගේ තකතීරු මෝඩකම පෙන්වන්න යන්න එපා. *[බාධා කිරීමක්]* මේක එතුමිය මෙරටට පැමිණි පළමුවැනි චතාව නොවෙයි.

අනික් එක තමයි, තායිලන්තයේ නියෝජ්‍ය අගමැතිවරිය ලංකාවට පැමිණීම. තායිලන්තයේ දේශපාලන ව්‍යුහය අනුව ඒ රටේ නියෝජ්‍ය අගමැතිවරු හත්දෙනෙක් ඉන්නවා. මේ හත්දෙනාගෙන් එක්කෙනෙක් තමයි මෙතුමිය. *[බාධා කිරීමක්]* තායිලන්තයේ නියෝජ්‍ය අගමැතිවරිය ලංකාවට ආවා, ආවා කියලා මේ කථා කරන්නේ හරියට ඒ රටේ ඉන්නේ එක නියෝජ්‍ය අගමැති කෙනෙක් විතරයි කියලා හිතා ගෙනයි. එහෙම නැහැ. සාමාන්‍යයෙන් ඒ රටවල අමාත්‍ය මණ්ඩලයේ ඇමතිවරු අතරේ නියෝජ්‍ය අගමැතිකම් බෙදා තිබෙනවා. මෙතුමිය, ඒ හත්දෙනාගෙන් එක්කෙනෙක්. ඇත්තටම ගත්තොත්, මෙතුමිය ඒ රටේ වාණිජ්‍ය ඇමතිතුමියයි. එතුමිය බෞද්ධාගමට ඉතාම ලැදියි, බෞද්ධාගම සම්බන්ධයෙන් ඉතාම කිට්ටුවෙන් වැඩ කරනවා. එම නිසා තායිලන්තයේ ඉන්න බෞද්ධ සැදැහැවතුන්ගේ උදවු උපකාර ලබාගෙන, එතුමිය අපේ රටේ විවිධ විහාරස්ථානවලට උදවු උපකාර කරනවා සහ ආගමික කටයුතුවලට සම්බන්ධ වෙනවා.

[ගරු විජිත හේරත් මහතා]

එතුමිය මේ ගමන ආවේ ප්‍රධාන වශයෙන් අනුරාධපුර, මිහින්තලේ රජමහා විහාරයේ ධාතු තැන්පත් කිරීමේ උත්සවයට. ඒ වාගේම එතුමිය දඹුල්ල රජමහා විහාරයටත් ගියා. ඒ විතරක් නොවෙයි, මාතලේ අලුවිහාරයටත් ගියා. නමුත් ඒවා ගැන කථා කරන්නේ නැහැ, මිහින්තලේ ගැන විතරයි කියන්නේ. 16වැනි දා ඉඳලා 20වැනි දා දක්වා එතුමිය ලංකාවේ සංචාරය කරන බව අපට දැනුම් දුන්නා. ඒ අනුව, එතුමිය මාතලේ අලුවිහාරයටත් ගියා, දඹුල්ල රජමහා විහාරයටත් ගියා.

මේ සංචාරය, පෞද්ගලික සංචාරයක් බව තායිලන්ත තානාපති කාර්යාලය ඉතා පැහැදිලිව අපේ විදේශ කටයුතු අමාත්‍යාංශයට දැනුම් දුන්නා. ඒ පෞද්ගලික සංචාරයට අවශ්‍ය කරන දේවල් අතුරින් ඇත්තටම අපෙන් ඉල්ලුවේ ගුවන් තොටුපළේ VIP Lounge එක විතරයි. වෙන කිසිවක් ඉල්ලුවේ නැහැ. නමුත් වැඩිමනත් විධියට විදේශ කටයුතු අමාත්‍යාංශය මැදිහත් වෙලා එතුමියට අවශ්‍ය කරන ගුවන් තොටුපළ VIP Lounge එක ලබා දුන්නා වාගේම අපේ protocol officersලාත් යැව්වා. ඊළඟට, අවශ්‍ය කරන ආරක්ෂාව සැපයුවා. නමුත් ඒවා ඉල්ලුවේ නැහැ, එපා කිව්වා. ඒවා ඕනෑ නැහැ, මේක පෞද්ගලික සංචාරයක්, සියලුම ගමන් බිමන් සඳහා අවශ්‍ය වාහන ඒ පැත්තෙන් සපයා ගන්නවාය කිව්වා. නමුත් අපි එතුමියගේ අනුරාධපුර ගමනට, දඹුල්ලේ ගමනට, මාතලේ අලුවිහාරයේ ගමනට අවශ්‍ය කරන, රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් ලබා දිය යුතු සියලු දේවල් ලබා දීලා තිබෙනවා. මොනවාද ලබා නොදුන්නේ? කවුරුවත් කිව්වේ නැහැ, දුන්නේ නැත්තේ මොනවාද කියලා. Diplomatic relationsවලට අනුව දෙන්න ඕනෑ ඔක්කොම පහසුකම් අපි ලබා දී තිබෙනවා. නොදීපු එක දෙයක් කියන්න. පුළුවන් නම් නොදීපු එක දෙයක් කියන්න. කියන්න දෙයක් නැහැ. දුන්නේ නැහැ, දුන්නේ නැහැ කියනවා. මොනවාද දුන්නේ නැත්තේ?

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ඇමතිතුමනි, මම කියන්නද?

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
පෞද්ගලික සංචාරයකදී අවශ්‍ය කරන VIP Lounge එක දුන්නා, protocol officersලා යැව්වා, ආරක්ෂාව දුන්නා. ඒ විධියට අවශ්‍ය කරන සියලු පහසුකම් ලබා දුන්නා. අද හවසත් තායිලන්ත තානාපතිවරයා අපේ විදේශ කටයුතු අමාත්‍යාංශයට ඇවිල්ලා, වැඩිමනත් වශයෙන් විශේෂ ස්තුතියක් කළා, ඔවුන් ඉල්ලුවාටත් වඩා වැඩි සැලකීම් තායිලන්ත වාණිජ්‍ය ඇමතිතුමියට අපේ පැත්තෙන් කළා කියලා. එම නිසා ඉතා පැහැදිලියි, ඒ ගනුදෙනුව ඉතා ශක්තිමත්ව යනවාය කියන එක.

ඒ විතරක් නොවෙයි, ලබන නොවැම්බර් මාසයේ 21වැනි දා සහ 22වැනි දා අස්ගිරි මහා විහාරයේ පැවැත්වෙන කඨින පින්කමටත් ඔවුන්ගේ විදේශ කටයුතු ඇමතිතුමා එනවා. 23වැනි දා මාවත්, ගරු අගමැතිතුමිය සහ ජනාධිපතිතුමාවත් මුණ ගැහෙන්නත් අවස්ථාව ඉල්ලා තිබෙනවා. මේවා තමයි, රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා. ඔබතුමන්ලා කෑ ගැහුවාට, ඔබතුමන්ලා ළිං මැඩියෝ වාගේ දැහලුවාට වැඩක් නැහැ. ඔබතුමන්ලා මෙතැනදී ආගම්වාදය අවුස්සලා, ඒ ආගම්වාදය හරහා තායිලන්තය සහ ලංකාව අතර තිබෙන සම්බන්ධතාව බිඳින්න හදනවා, නැති ප්‍රශ්නයක් ඇති කරන්න හදනවා. නමුත්, මෙතැන එහෙම කිසිවක් නැහැ. අපි ඉතා ශක්තිමත්ව ඒ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා පවත්වාගෙන යනවා. ඒ නිසා තමයි තායිලන්ත විදේශ කටයුතු ඇමතිතුමා වැඩිමනත් වශයෙන් ලබන මාසයේ 21 සහ 22 දිනවල ලංකාවට එන්නේ. ලංකාවේදී මොකක් හරි අඩුවක් හෝ නොසලකා හැරීමක් හෝ තිබුණා නම් එතුමා එන්නේ නැහැ.

ඒ නිසා ඔබතුමන්ලා කෑ ගැහුවාට වැඩක් නැහැ. ඔබතුමන්ලා ඉතාම පහත්, නින්දිත උත්සාහයකයි මේ නිරත වෙන්නේ. ඒ, මොකක්ද? මිහින්තලේ විහාරය ඉලක්ක කරගෙන දැන් අපේ රටේ ආගම් විරෝධයක් හදන්න හදනවා, නැති ප්‍රශ්නයක් ඇති කරන්න හදනවා.

දැන් කවුද මන්ත්‍රීවරයෙක් කිව්වා, කෛලාශානන්ද් ගිරි ජී සාමිට අපි පහසුකම් දුන්නා කියලා. කෛලාශානන්ද් ගිරි ජී සාමි ලංකාවට ආවේ පෙබරවාරි මාසයේ. ඇත්තටම ගත්තොත්, ඒක සංචාරක ව්‍යාපාරයේ වැඩක්. මොකද, ඒ රටේ පවත්වන කුම්භ මේලා උත්සවය කියන්නේ මිනිස්සු ලක්ෂ 50ක් විතර සම්බන්ධ වෙන උත්සවයක්. ඒ ගිරි ජී සාමිට ඒ වාගේ භක්තිකයන් ප්‍රමාණයක් ඉන්නවා. අපි ඉන්දියාවත් එක්ක spiritual and religious tourism වර්ධනය කරද්දී, එවැනි ගමනක් ඉතාම වැදගත් වෙන්නේ සංචාරක කර්මාන්තයටයි. ඒ සඳහා අපේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යම් වියදමක් දැරුවා. පෞද්ගලික අංශයේත් සහයෝගය ලැබුණා. ඒක ඇවිල්ලා වෙනම සංචාරක කටයුත්තක්. වරද්දා ගන්න එපා. පොට වරද්දා ගන්න එපා; වලිගය පාගා ගන්න එපා. අපිට එහෙම ආගම් භේදයක් නැහැ; ජාති භේදයක් නැහැ. අපි ශ්‍රී ලංකාවේ සියලු ආගම්වලට, සියලු ජාතිකත්වයන්ට එක හා සමානව සලකමින් ශ්‍රී ලංකා වාසීන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරන අර්ථයෙන් තමයි මැදිහත් වෙන්නේ.

ඔය කෑ ගහන අයට වඩා අපි හොඳ බෞද්ධයෝ. අනුරාධපුරය අභයගිරියේ සහ ජේතවනාරාමයේ එකම දවසේ ධාතූන් වහන්සේලා තැන්පත් කළේ මම. ඉතිහාසයේ පළමුවැනි වතාවටයි එවැනි දෙයක් කර තිබෙන්නේ. අපි ඔය කෑගහන අයට වඩා බෞද්ධ ආගම වෙනුවෙන්, ධාතූන් වහන්සේලා තැන්පත් කිරීම් වෙනුවෙන් උපරිමයෙන් මැදිහත් වෙන අය. ඒ නිසා බොරු ශෝභන දාන්න යන්න එපා. නැති ප්‍රශ්න ඇති කරන්න යන්න එපා. තායිලන්තය සහ ලංකාව අතර තිබෙන ඉතාම කිට්ටු මිත්‍රත්වය බිඳින්න සිදු කරන ඔය වාගේ පහත්, නිහීන උත්සාහයන් අපි දැඩි ලෙස හෙළා දකිනවා; තරයේ හෙළා දකිනවා. මොකද, මේ වාගේ පහත් උත්සාහයන්වලින් තමයි නැති ප්‍රශ්න ඇති කරන්නේ. නමුත්, මේ රටේ ජනතාව මේවා හොඳට තේරුම් අරගෙන තිබෙනවා. ඒ නිසා අපි ඉතා පැහැදිලිව මේ රටේ ජනතාවට කියනවා, තායිලන්ත වාණිජ ඇමතිතුමිය ලංකාවට ආපු අවස්ථාවේදී රටක් විධියට, ආණ්ඩුවක් විධියට එතුමියට ලබා දිය යුතු සියලුම පහසුකම්, ආරක්ෂාව සහ අනෙකුත් සියලුම පහසුකම් ඉල්ලුවාටත් වඩා, රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් අපි ලබා දීලා තිබෙන බව. ඒ පිළිබඳව තායිලන්ත රජයේ ස්තුතිය අපිට දැනටමත් ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ වාගේම, ඒ ආපු ගමනේදී එතුමිය මිහින්තලාවත්, දඹුල්ල රජමහා විහාරයත්, මාතලේ අලුවිහාරයත් වැඳ පුදා ගන්න ගියා. ඒ ස්ථානවලට යනකොටත් එතුමියට අවශ්‍ය කරන සියලු පහසුකම් අපි සපයා දුන්නා. ඉතාම මිත්‍රශීලීව අපි ඒ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාව පවත්වාගෙන යනවා. ඒ නිසා ඔබතුමන්ලා මුසාවාද කියන්න එපා.

ඔබතුමන්ලා මල්වතු පාර්ශ්වයේ මහනායක ස්වාමීන් වහන්සේ බැහැදකින්න ගිහිල්ලා, මුසාවාද කියලා මොකද වුණේ? ඔබතුමන්ලාට රෙදි ගලෝගෙන, රෙදි නැතුවයි එන්න වුණේ. මල්වතු පාර්ශ්වයේ අපේ මහනායක ස්වාමීන් වහන්සේ බැහැදකින්න ගිහිල්ලා පට්ටපල් බොරුවක් දෙසා බැවා. මල්වතු පාර්ශ්වයේ අපේ මහනායක ස්වාමීන් වහන්සේ ඔබතුමන්ලාට ඉතාම පැහැදිලිව එදා වෙච්ච සිදුවීම පිළිබඳව මැනවින් කරුණු පැහැදිලි කරලා දුන්නා. අනේ මම දන්නේ නැහැ, ඔබතුමන්ලා

ඒකෙන්වත් පාඩමක් ඉගෙන ගත්තා ද කියලා. ලොක්කන්ට ඒ පාඩම ඉගෙන ගන්න බැරි වුණාම, මේ සොක්කෝ ඇවිල්ලා බොරුවට නිකම් කට මැත දොඩවනවා. ඉතින් වැඩක් නැහැ. හිතන්න එපා මේක මීරිගම ටියුෂන් එක කියලා. මීරිගම ටියුෂන් එකේ අර කොල්ලෝ කෙල්ලෝ ටික අල්ලාගෙන පණ්ඩිතකම් දෙඩුවාට, මේ පාර්ලිමේන්තුවේ පණ්ඩිතකම් දොඩවන්න බැහැ. මේක පාර්ලිමේන්තුව. මේක උත්තරීතර පාර්ලිමේන්තුව. ඒ වාගේ ගොන් කථා හොඳයි ඒ වාගේ තැන්වලට ගිහිල්ලා කියන්න. මේ රටේ ජනතාව ඒවා පිළිගන්නේ නැහැ. ඒ නිසා ඉතා පැහැදිලිව වගකීමෙන් මම කියනවා, ඒ අවශ්‍ය කරන රාජ්‍ය තාන්ත්‍රික සියලු පහසුකම් අපි ලබා දුන්නා කියන එක. තායිලන්තය සහ ශ්‍රී ලංකාව අතර විතරක් නොවෙයි, ලෝකයේ සෑම රටක් එක්කම පවත්වා ගත යුතු රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා අපි ඉතාම ශක්තිමත්ව පවත්වාගෙන යනවා. මේ වාගේ නිහීන උත්සාහයන්වලින් ඒවා බිඳින්න බැහැ. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ස්තුතියි. අදහස් ප්‍රකාශ කරන්න නැවත විනාඩියක කාලයක් ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමාට ලැබෙනවා.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න. මොකද, ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න කාරණා කිහිපයක්ම තිබෙනවා.

Hon. Minister, I want to bring this to your notice. මේ Royal Thai Embassy එකෙන් නිකුත් කරන ලද 5001/310 කියන ලිපිය දැනටමත් අපේ අමිල ප්‍රසාද් මන්ත්‍රීවරයා සභාගත කරලා තිබෙනවා. එහිදී තායිලන්ත තානාපති කාර්යාලයෙන් - Royal Thai Embassy එකෙන් - formal දැනුම්දීමක් කරලා තිබෙනවා, එතුමිය ලංකාවට එනවා කියලා. ඔබතුමා අසා සිටියා, ඔබතුමන්ලා මොනවාද නොකළේ කියලා. මම ඒ ගැන කියන්නම්. ඔබතුමන්ලා අර කෛලාශානන්ද් මැතිතුමාව පිළිගත්තා. නමුත්, තායිලන්ත වාණිජ ඇමතිතුමිය පිළිගන්න අඩුම ගාණේ අපේ කිසිම නියෝජ්‍ය ඇමතිවරයෙක්වත් ගියේ නැහැ. එතුමිය පිළිගන්න මන්ත්‍රීවරයෙක්වත් ගියේ නැහැ. ගරු ඇමතිතුමනි, මම කිසිම ආගම්වාදයක් අවුස්සන්න හදනවා නොවෙයි. I am just trying to point out that there was a major diplomatic blunder because I myself was a witness to that.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ලබා දුන් කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ඇමතිතුමා, listen to me.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ඒ සභාගත කරපු ලියුම ඉතා පැහැදිලිව කියවලා බලන්න. තානාපති කාර්යාලයෙන් ඉල්ලලා තිබෙන්නේ VIP Lounge එක විතරයි. නමුත් අපි ඊට වඩා දේවල් දුන්නා. නොදීපු කිසි දෙයක් නැහැ. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලබා දුන් විනාඩිය අවසානයි.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
මම නැවත කියනවා, ගිරි ජී සාමි ලංකාවට ආවේ සංචාරක ව්‍යාපාරයේ උන්නතිය පිළිබඳ කටයුත්තක් වෙනුවෙන් කියන එක. නමුත් මේක පෞද්ගලිකව ආගමික කටයුත්තක් සඳහා සම්බන්ධ වීමක්. ඒ දෙක වෙනස්. ඒක තේරුම් ගන්න. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමනි, ඔබතුමා තව තත්පර 30ක් ලබා ගන්න. පාර්ලිමේන්තුවේ කටයුතු අවසන් කරන්න තිබෙනවා.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු ඇමතිතුමනි, මම කියන්න හැදුවේ එතැන කිසිදු රාජ්‍ය නිලධාරියෙක් හිටියේ නැහැ කියලායි. අඩු ගණනේ එතැන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලිපිකරුවෙක්වත් හිටියේ නැහැ. මොකද, මම පෞද්ගලිකවම එතැන හිටියා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් අවසන් කරන්න.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු ඇමතිතුමනි, මම පෞද්ගලිකවම ඒ උත්සව අවස්ථාවේ හිටියා. එතකොට ඔබතුමන්ලාට යුතුකමක් තිබුණේ නැද්ද, එතැනට කවුරු හෝ නිලධාරියෙක් එවන්න? ඔබතුමන්ලාට ඒ හාමුදුරුවෝ එක්ක ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒක වෙනම ප්‍රශ්නයක්.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
රාජ්‍ය නිලධාරීන් පන්සලට යනවාද, නැද්ද කියලා තීරණය කරන්නේ පන්සලේ හාමුදුරුවන්ගේ පිළිවෙත අනුව. ඒක, ඒ අයට තිබෙන නිදහස. ඒක අපට තීරණය කරන්න බැහැ.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය විසින් ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.58ට, 2026 ඔක්තෝබර් 23වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 5.58க்கு, பாராளுமன்றம் 2026 ஒக்ரோபர் 23, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 5.30 p.m., THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEEES adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 5.58 p.m. until 9.30 a.m. on Friday, 23rd October, 2026.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
WRITTEN ANSWERS TO QUESTIONS

ආයුර්වේද රෝහල්: 2025 වසරේ ප්‍රතිකාර ලැබූ රෝගීන්
ஆயுர்வேத வைத்தியசாலைகள்: 2025ஆம் ஆண்டில் சிகிச்சை பெற்றோர்
AYURVEDIC HOSPITALS: PATIENTS TREATED IN 2025

2335/2026

1. ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ආයුර්වේද රෝහල්වල නේවාසික රෝගීන් සඳහා වෙන් කර ඇති ඇඳන් සංඛ්‍යාව;

(ii) 2025 වර්ෂය තුළ එම රෝහල්වලින් ප්‍රතිකාර ලබා ගත් බාහිර සහ නේවාසික රෝගීන් සංඛ්‍යාව;

(iii) එම වර්ෂය තුළ රාජගිරිය ආයුර්වේද රෝහලෙන් ප්‍රතිකාර ලබාගත් මුළු රෝගීන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) රජයේ විශ්වවිද්‍යාලයකින් ආයුර්වේද වෛද්‍ය උපාධිය ලබා ගන්නා උපාධිධාරියෙකුට රජයේ රැකියාවක් ලබා දීමට රජය බැඳී සිටින්නේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

(iii) මේ වන විට රැකියා විරහිත ආයුර්වේද උපාධිධාරී වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

සුකාදාරම් මට්රුම් වෙකුසන ඌටක අමෛච්චරෛක් කේට්ට විනා:

(அ) (i) இலங்கையிலுள்ள ஆயுர்வேத வைத்தியசாலைகளில் உள்ளக நோயாளர்களுக்காக ஒதுக்கப்பட்டுள்ள கட்டில்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) 2025ஆம் ஆண்டில் மேற்படி வைத்தியசாலைகளில் சிகிச்சை பெற்ற வெளிநோயாளர்கள் மற்றும் உள்ளக நோயாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அவ்வாண்டில் இராஜகிரிய ஆயுர்வேத வைத்தியசாலையில் சிகிச்சை பெற்ற மொத்த நோயாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா;

(ஆ) (i) அரச பல்கலைக்கழகமொன்றில் ஆயுர்வேத மருத்துவப் பட்டத்தைப் பெறும் பட்டதாரி ஒருவருக்கு அரசாங்கத் தொழிலொன்றை வழங்குவதற்கு அரசாங்கம் பிணைந்துள்ளதா என்பதையும்;

(ii) இன்றேல், ஏன் என்பதையும்;

(iii) இன்றளவில் உள்ள வேலையற்ற ஆயுர்வேத மருத்துவப் பட்டதாரிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -
  (i) number of beds allocated for in-patients in Ayurvedic hospitals in Sri Lanka;
  (ii) number of out-patients and in-patients who received treatment from Ayurvedic hospitals in Sri Lanka during the year 2025; and
  (iii) total number of patients who received treatment from the Ayurveda Hospital in Rajagiriya during the same year?

(b) Will he also inform this House -
  (i) whether the Government is bound to provide Government employment to a graduate who obtains a degree in Ayurveda medicine from a State university;
  (ii) if not, why; and
  (iii) the number of medical practitioners who hold a degree in Ayurvedic Medicine and are currently unemployed?

(c) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

(අ) (i) 5,428කි.

(ii) බාහිර රෝගීන් සංඛ්‍යාව - 3,832,637
නේවාසික රෝගීන් සංඛ්‍යාව - 47,056

(iii) 276,960කි.

(ආ) (i) නැත.

(ii) රජයේ විශ්වවිද්‍යාල තුළින් බිහි වන උපාධිධාරීන් සියලු දෙනා රාජ්‍ය සේවයට බඳවා ගැනීමට අනුමැතියක් නොමැති අතර, රෝහල්වල පහසුකම් හා අවශ්‍යතාව අනුව එම බඳවා ගැනීම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය පරිදි සිදු කරනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආයුර්වේද/සිද්ධ/යුනානි උපාධිය ලත් උපාධිධාරීන් අදාළ වර්ෂවල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන කුසලතා ලේඛනයේ අනුපිළිවෙළ පදනම් කරගෙන බඳවා ගනු ලැබේ.

තවද, උපාධිය අවසන් කළ පුහුණු ආයුර්වේද වෛද්‍යවරුන්ගේ පෞද්ගලික අංශය වෙත එනම් ආයුර්වේද පෞද්ගලික රෝහල්, පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන, ආයුර්වේද සුවතා

මධ්‍යස්ථාන, ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන, පෞද්ගලික ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර, සංචාරක කර්මාන්තය හා බැඳී හෝටල් හා ඒ ආශ්‍රිත ආයුර්වේද ප්‍රතිකාර ලබා දීමේ මධ්‍යස්ථාන වැනි අංශවලටත් යොමු වීමට අවස්ථාව පවතී.

ඒ අනුව, විශ්වවිද්‍යාල තුළින් බිහි වන උපාධිධාරීන් ප්‍රමාණය රෝහල් පද්ධතිය තුළ පවතින සුරප්පාඩු ප්‍රමාණයට සමානුපාතික නොවන අතර, රාජ්‍ය සේවයට අවශ්‍ය ආයුර්වේද වෛද්‍යවරුන් ප්‍රමාණය පමණක් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

(iii) 1,987කි.

(ඇ) පැන නොනඟී.

(අ) (i) 5,428

(ii) වෙලිනෝයාළර්කළින් එණ්ණික්කෙ - 3,832,637

වතිවිට නෝයාළර්කළින් එණ්ණික්කෙ - 47,056

(iii) 276,960

(ආ) (i) ඉල්ලෙ.

(ii) අරසාංග පල්කලෙක්කළකංකළිලිරුන්දු වෙලියේරුම් අනෙත්තු පට්ටතාරිකළෙයුම් වේලෙක්කු අමර්ත්තුවතර්කු අනුමති ඉල්ලෙ එන්පතුටන්, අරසාංකත්තුක්කු ආයුර්වේත මරුත්තුවර්කළෙ වේලෙක්කු අමර්ත්තුවතර්කාන මුකාමෙත්තුව සේවෙකළ් තිණෙක්කළත්තින් ඔප්පුතල් මර්රුම් මරුත්තුවමනෙකළින් වසතිකළ් මර්රුම් තේවෙකළුක්කු ඒර්ප අන්ත ආට්චේර්ප්පු මේර්කොළ්ළප්පටුකිරතු. පල්කලෙක්කළක මානියංකළ් ආණෙක්කුළුවාල් අංකීකරික්කප් පට්ට පල්කලෙක්කළකමොන්රිලිරුන්දු ආයුර්වේත / සිත්ත පට්ටම් පෙර්ර පට්ටතාරිකළ්, සම්පන්තප්පට්ට ආණ්ටුකළුක්කාක පල්කලෙක්කළක මානියංකළ් ආණෙක්කුළුවාල් වෙලියිටප් පටුම් තකෙමෙප් පට්ටියලින් වරිසෙක් කිරමත්තින් අටිප්පටෙයිල් චේර්ත්තුක්කොළ්ළප් පටුකින්රනර්.

මේලුම්, පට්ටප්පටිප්පෙ මුටිත්ත පයිර්චි පෙර්ර ආයුර්වේත මරුත්තුවර්කළ් තනියාර්තුරෙක්කු, අතාවතු ආයුර්වේත තනියාර් මරුත්තුවමනෙ කළ්, තනියාර් මරුත්තුව නිලෙයංකළ්, ආයුර්වේත නලන්පුරි නිලෙයංකළ්, ආයුර්වේත පඤ්චකර්ම නිලෙයංකළ්, තනියාර් ආයුර්වේත මරුන්තු තයාරිප්පු නිලෙයංකළ්, සුර්රුලාත්තුරෙ චාර්න්ත විටුතිකළ් මර්රුම් අතු තොටර්පාන ආයුර්වේත චිකිච්චෙ වළංකුම් නිලෙයංකළ් පෝන්ර තුරෙකළුක්කුම් චෙල්වතර්කාන වාය්ප්පුකළ් කාණප්පටුකින්රන.

ඉතර්කමෙය, පල්කලෙක්කළකංකළිලිරුන්දු වෙලිවරුම් පට්ටතාරිකළින් අළවු මරුත්තුවමනෙ මුරෙමෙක්කුළ් කාණප්පටුම් වෙර්රිටංකළින් අළවුක්කු විකිතාචාරමාන තල්ල එන්පතුටන්, අරස චේවෙක්කුත් තේවෙයාන ආයුර්වේත මරුත්තුවර්කළින් අළවු මාත්තිරම් ආට්චේර්ප්පුච් චෙය්යප්පටුකින්රතු.

(iii) 1987

(ඉ) එළවිල්ලෙ.

(a) (i) 5,428.

(ii) The number of out-patients - 3,832,637

The number of in-patients - 47,056

(iii) 276,960.

(b) (i) No.

(ii) There is no approval to recruit all graduates from State universities. The recruitment of Ayurveda Medical Officers by the Government is carried out with the approval of the Department of Management Services and based on the facilities and requirement of hospitals. Graduates who have obtained degrees in Ayurveda, Siddha, Unani from universities recognized by the University Grants Commission are recruited based on their merit order in the merit list issued by the University Grants Commission for the relevant years.

Furthermore, trained Ayurvedic Medical Officers who have completed their degrees have opportunities to enter the private sector, including private Ayurveda hospitals, private medical centres, Ayurvedic wellness centres, Ayurvedic Panchakarma centres, private Ayurvedic pharmaceutical manufacturing firms, hotels and related centres associated with the tourism industry which provide Ayurvedic treatments.

Accordingly, the number of graduates from universities is not proportionate to the number of vacancies available within the hospital system. Therefore, only the number of Ayurveda Medical Officers required by the Public Service is recruited.

(iii) 1,987.

(c) Does not arise.

ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව: ව්‍යවස්ථාපිත වගකීම සහ කාර්ය සාධනය

இலங்கை சட்ட ஆணைக்குழு: நியதிச்சட்டப் பொறுப்பும் செயற்றிறனும்

LAW COMMISSION OF SRI LANKA: STATUTORY RESPONSIBILITY AND PERFORMANCE

2336/2026

2. ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාවේ සාමාජිකයන් කවුරුන්ද;

(ii) එහි ව්‍යවස්ථාපිත වගකීම කවරේද;

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

(iii) කොමිෂන් සභාවේ කටයුතු සඳහා 2025/2026 මුදල් වර්ෂය සඳහා රජය විසින් වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2026 වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් ඉටු කර ඇති කාර්යයන් කවරේද;

(ii) පසුගිය වර්ෂ 2ක කාලය තුළ කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

නීති මට්‍රුම් දේසිය ඔරුමෙප්පාට්ටු අමෙච්චරෛක් කේට්ට විනා:

(අ) (i) *ඉලංකෛ චට්ට ආණෛක්කුළුවින් උරුප්පිනර්කළ් යාවර් එන්පතෛයුම්;*

(ii) *අතන් නියතිච්චට්ට මුරෛයාන පොරුප්පුක්කළ් යාවෛ එන්පතෛයුම්;*

(iii) *ආණෛක්කුළුවින් නටවටික්කෛකළුක්කාක 2025/2026 නිතියාණ්ටුක්කාක අරචාංකත්තාල් ඔතුක්කප්පට්ටුළ්ළ නිතිත්තොකෛ යාතු එන්පතෛයුම්;*

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ආ) (i) *2026ආම් ආණ්ටිල් ආණෛක්කුළුවාල් මේර්කොළ්ළප්පට්ටුළ්ළ පණිකළ් යාවෛ එන්පතෛයුම්;*

(ii) *කටන්ත 2 වරුට කාලප්පකුතියිල් ආණෛක්කුළු වින් චෙයර්පාටුකළෛ මේම්පටුත්තුවතර්කාක අරචාංකත්තාල් මේර්කොළ්ළප්පට්ටුළ්ළ නටවටික්කෛකළ් යාවෛ එන්පතෛයුම්;*

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ඉ) *ඉන්රෙල්, ඒන්?*

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) the members of the Law Commission of Sri Lanka;

(ii) its statutory responsibility; and

(iii) the amount of money allocated by the Government for the activities of the Commission for the financial year 2025/2026?

(b) Will he also inform this House the -

(i) functions performed by the Commission during the year 2026; and

(ii) steps taken by the Government during the past two years to promote the functioning of the Commission?

(c) If not, why?

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷண நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

(අ) (i)
- විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගාමිණී අමරසේකර මහතා
- විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු රුවන් ප්‍රනාන්දු මහතා
- මහාචාර්ය වසන්තා සෙනෙවිරත්න මහත්මිය, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- විශ්‍රාමික සොලිසිටර් ජනරාල් ඉන්දිකා දේමුනි ද සිල්වා මහත්මිය
- විශ්‍රාමික අතිරේක සොලිසිටර් ජනරාල් ෆර්සානා ජමීල් මහත්මිය
- ජනාධිපති නීතිඥ නීල් ඩී.බී. උනම්බුවේ මහතා
- විශ්‍රාමික නීති කෙටුම්පත් සම්පාදක ජනාධිපති නීතිඥ අරුණ ශාන්ත ද සිල්වා මහතා
- ආචාර්ය සුනිල් ඩී.බී. අබේරත්න මහතා
- ජනාධිපති නීතිඥ හර්ෂ ප්‍රනාන්දු මහතා (2026.06.01 දින ඉල්ලා අස්විය.)
- ජනාධිපති නීතිඥ ඉන්දිරා සමරසිංහ මහත්මිය
- ජනාධිපති නීතිඥ විරාන් කොරයා මහතා
- නීතිඥ රියාද් අමීන් මහතා

නිල බලයෙන් පත්වන ලද සාමාජිකයන්

- ගරු නීතිපති පාරින්ද රණසිංහ මහතා
- ශෙහාරා වීරකෝන් මහත්මිය, නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක
- පියුමන්ති පීරිස් මහත්මිය, අතිරේක ලේකම් (නීති), අධිකරණ අමාත්‍යාංශය

විස්තරාත්මක ලිපිය **ඇමුණුම 01*** මඟින් ද දක්වා ඇත.

(ii) නීති කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත වගකීම පිළිබඳව 1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනතෙහි 4වන වගන්තියෙහි දක්වා ඇත. විස්තර **ඇමුණුම 02*** මඟින් දක්වා ඇත.

(iii) 2025 - අනුමත ප්‍රතිපාදන (ඇමුණුම 03 (a))

පුනරාවර්තන වියදම්	-	රු. 26,000,000
ප්‍රාග්ධන වියදම්	-	රු. 2,000,000
මුළු ප්‍රතිපාදන	-	රු. 28,000,000

2026 - අනුමත ප්‍රතිපාදන (ඇමුණුම 03 (b))

පුනරාවර්තන වියදම්	-	රු. 30,800,000
ප්‍රාග්ධන වියදම්	-	රු. 3,700,000
මුළු ප්‍රතිපාදන	-	රු. 34,500,000

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

වැඩි විස්තර **ඇමුණුම 3 (a)*, 3 (b)*** මඟින් දක්වා ඇත. (ඉංග්‍රීසි භාෂාවෙන් ඇති ඇමුණුම 3 (a), 3 (b) බලන්න.)

(ආ) (i) 2025 - **ඇමුණුම 4 (a)* හා (b)*** මඟින් ඉදිරිපත් කර ඇත. (ඇමුණුම 4 (b) ඉංග්‍රීසි භාෂාවෙන් දක්වා ඇත.)

2026 - **ඇමුණුම 5 (a)*, (b)* හා (c)*** මඟින් ඉදිරිපත් කර ඇත. (ඇමුණුම 5 (b) හා (c) ඉංග්‍රීසි භාෂාවෙන් දක්වා ඇත.)

(ii) නීති කොමිෂන් සභා පනත ප්‍රකාරව නීති කොමිෂන් සභාව සඳහා පරිපාලන හා නීති පර්යේෂණ සඳහා අවශ්‍ය සහය ලබා දීම සඳහා අධිකරණ අමාත්‍යාංශය යටතේ නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. **ඇමුණුම 06*** මඟින් විස්තර දක්වා ඇත.

ඒ අනුව, අදාළ මුදල් වර්ෂ තුළ නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය කටයුතු සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දී ඇත.

(ඇ) පැන නොනඟී.

(අ) (i)
- ඉය්වුපෙට්‍ර උයර් නීතිමන්‍ර නීතිපති තිරු. කාමිනී අමරසේකර
- ඉය්වුපෙට්‍ර මේන්මුරෛයීට්ටු නීතිපති තිරු. රුවන් පර්නාන්තු
- පේරාසිරියර් තිරුමති වසන්තා සෙනවිරත්න, සට්ට පීඩම්, කොළුම්පුප් පල්කලෛක්කළකම්
- ඉය්වුපෙට්‍ර සොලිසිට්ටර් ජෙනරල් තිරුමති ඉන්දිකා තේමුනිත සිල්වා
- ඉය්වුපෙට්‍ර මේලතික සොලිසිට්ටර් ජෙනරල් තිරුමති පර්සානා ජෙමීල්
- සනාතිපති සට්ටත්තරණි තිරු. නීල් ටි.පි. උනම්පුවේ
- ඉය්වුපෙට්‍ර සට්ටවරෛඥර් සනාතිපති සට්ටත්තරණි තිරු. අරුණ සාන්ත ත සිල්වා
- කලානිති තිරු. අනිල් ඩෙ.පි. අපේරත්න
- සනාතිපති සට්ටත්තරණි තිරු. හර්ෂ පර්නාන්තු (2026.06.01 අන්‍රු ඉරාජිනාමා සෙය්තාර්)
- සනාතිපති සට්ටත්තරණි තිරුමති ඉන්දිරා සමරසිංඝ
- සනාතිපති සට්ටත්තරණි විරාන් කොරයා
- සට්ටත්තරණි තිරු. ෆියාත් අමීන්

උත්තියෝකපූර්ව අධිකාරත්තාල් නියමික්කප්පට්ට උරුප්පිනර්කළ්
- කෙළරව සට්ටමා අතිපර් තිරු. පාරින්ත රණසිංඝ
- තිරුමති ෂෙහාරා වීරක්කෝන්, පිරති සට්ටවරෛඥර්
- තිරුමති පියුමන්ති පීරිස්, මේලතික සෙයලාළර් (සට්ටම්), නීති අමෛච්සු.

මේලතික විපරම් ***ඉණෛප්පු 01**ඉල් තරප්පට්ටුළ්ළතු. (සිංහල මොළියියිලුළ්ළ ඉණෛප්පු 01ඉප් පාර්ක්කවුම්.)

(ii) සට්ට ආණෛක්කුමුවින් නියතිච්සට්ටප් පොරුප්පුකළ් පර්රි 1969ආම් ආණ්ටින් 3ආම් ඉලක්ක, සට්ට ආණෛක්කුමුච් සට්ටත්තින් 4ආම් පිරිවිල් කොටුක්කප්පට්ටුළ්ළතු.

***ඉණෛප්පු 02ඉල්** තරප්පට්ටුළ්ළතු. (සිංහල මොළියියිලුළ්ළ ඉණෛප්පු 02ඉප් පාර්ක්කවුම්.)

(iii) 2025 - අංගීකරික්කප්පට්ට ඒර්පාටුකළ් (ඉණෛප්පු 03(a))

මීණ්ටෙළුම් සෙලවු	-	රූපා	26,000,000
මූලතනච් සෙලවු	-	රූපා	2,000,000
මොත්ත ඒර්පාටුකළ්	-	රූපා	28,000,000

2026 - අංගීකරික්කප්පට්ට ඒර්පාටුකළ් (ඉණෛප්පු 03(b))

මීණ්ටෙළුම් සෙලවු	-	රූපා	30,800,000
මූලතනච් සෙලවු	-	රූපා	3,700,000
මොත්ත ඒර්පාටුකළ්	-	රූපා	34,500,000

මේලතික විපරම් ***ඉණෛප්පු 03(a), 03(b)ඉල්** තරප්පට්ටුළ්ළතු. (ආංකිල මොළියියිලුළ්ළ ඉණෛප්පු 03(a), 03(b)ඉප් පාර්ක්කවුම්.)

(ආ) (i) 2025 - ***ඉණෛප්පු 04 (a)** මර්රුම් **(b)ඉල්** තරප්පට්ටුළ්ළතු.

(සිංහල මොළියියිලුළ්ළ ඉණෛප්පු 04 (a) මර්රුම් ආංකිල මොළියියිලුළ්ළ ඉණෛප්පු 04 (b)ඉප් පාර්ක්කවුම්.)

2026 - ***ඉණෛප්පු 05 (a), (b) මර්රුම් (c)ඉල්** තරප්පට්ටුළ්ළතු.

(සිංහල මොළියියිලුළ්ළ ඉණෛප්පු 05 (a) මර්රුම් ආංකිල මොළියියිලුළ්ළ ඉණෛප්පු (b) මර්රුම් (c)ඉප් පාර්ක්කවුම්.)

(ii) සට්ට ආණෛක්කුමුච් සට්ටත්තින් පිරකාරම් ආණෛක්කුමුවුක්කාක නිරුවාක මර්රුම් සට්ට ආරාය්ච්සික්කුත් තේවෛයාන උතවිකළෛ වළංකුවතර්කාක තිණෛක්කළම් අමෛක්කප්පට්ටුළ්ළතු.

***ඉණෛප්පු 06ඉල්** තරප්පට්ටුළ්ළතු. (සිංහල මොළියියිලුළ්ළ ඉණෛප්පු 06ඉප් පාර්ක්කවුම්.)

අතන්පටි, කුරිත්ත නිති ආණ්ටිල් සට්ට ආණෛක්කුමු තිණෛක්කළත්තුක්කුත් තේවෛයාන නටවටික්කෛකළුක්කාන ඒර්පාටුකළ් වළංකප්පට්ටුළ්ළන.

(ඉ) එළාතු.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

(a) (i)
- Mr. Gamini Amarasekera, Retired Supreme Court Judge
- Mr. Ruwan Fernando, Retired Court of Appeal Judge
- Prof. Vasantha Seneviratne, Faculty of Law, University of Colombo
- Mrs. Indhika Demuni de Silva, Retired Solicitor General
- Mrs. Farzana Jameel, Retired Additional Solicitor General
- Mr. Neel D.B. Unambuwe, President's Counsel
- Mr. Aruna Shantha de Silva, President's Counsel and Retired Legal Draftsman
- Dr. Sunil D.B. Abeyrathna
- Mr. Harsha Fernando, President's Counsel (Resigned on 01.06.2026)
- Mrs. Indira Samarasinghe, President's Counsel
- Mr. Viran Corea, President's Counsel
- Mr. Riyad Ameen, Attorney-at-Law

Ex-Officio Members:
- Mr. Parinda Ranasinghe, Hon. Attorney-General
- Mrs. Shehara Weerakoon, Deputy Legal Draftsman
- Mrs. Piyumanthi Peiris, Additional Secretary (Legal), Ministry of Justice

Further information is provided in Annex 01*. (Please refer to the Annex 01 in Sinhala)

(ii) The statutory responsibility of the Law Commission is set out in Section 4 of the Law Commission Actල No. 3 of 1969. The relevant information is provided in Annex 02*. (Please refer to Annex 02 in Sinhala.)

(iii) 2025 - Approved Provisions

Recurrent Expenditure	-	Rs. 26,000,000
Capital Expenditure	-	Rs. 2,000,000
Total Allocation	-	Rs. 28,000,000

Further information is provided in Annexe 03 (a)*.

2026 - Approved Provisions

Recurrent Expenditure	-	Rs. 30,800,000
Capital Expenditure	-	Rs. 3,700,000
Total Allocation	-	Rs. 34,500,000

Further information is provided in Annex 03 (b)*.

(b) (i) The information pertaining to the year 2025 is provided in Annexes 04(a)* and 04(b)*. (Please refer to Annex 04 (a) in Sinhala.)

The information pertaining to the year 2026 is provided in Annexes 05 (a)*, (b)* and (c) *. (Please refer to the Annex 05 (a) in Sinhala.)

(ii) In accordance with the Law Commission Act, the Law Commission Department has been established under the Ministry of Justice to provide the necessary administrative and legal research support for the Law Commission. The relevant information is provided in Annex 06*. (Please refer to the Annex 06 in Sinhala.)

Accordingly, sufficient provisions have been allocated to the Law Commission Department for its operations during the relevant financial years.

(c) Does not arise.

රජයේ ආයුර්වේද රෝහල්: ලබා ගත හැකි වෛද්‍ය පහසුකම්

அரசாங்க ஆயுர்வேத வைத்தியசாலைகள்: கிடைக்கக்கூடிய மருத்துவ வசதிகள்

GOVERNMENT AYURVEDIC HOSPITALS: MEDICAL FACILITIES AVAILABLE

2337/2026

3. ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ආයුර්වේද ශල්‍යවේදී උපාධිය හිමි වෛද්‍යවරුන් සිටියද, රජයේ ආයුර්වේද රෝහල්වල පිළිගත් ශල්‍යකර්ම සිදු නොකරන බව දන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) රාජගිරිය ආයුර්වේද රෝහලේ මේ වන විට දරු උපත් සිදු කරනු ලබන්නේද;

(ii) නො එසේ නම්, එම රෝහලේ අවසන් වරට දරු උපතක් සිදු කර ඇති දිනය කවරේද;

(iii) එම රෝහලේ නොමේරූ ළදරු ප්‍රතිකාර ඒකකයක් තිබේද;

(iv) මේ වන විට දරු උපත් සිදු නොකරන්නේ නම්, එම ඒකකය පවත්වාගෙන යෑමේ අවශ්‍යතාව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ආයුර්වේද රෝහල්වල හෘදය රෝග, අධිරුධිර පීඩනය, පිළිස්සුම්, උණ්ඩුකපුච්ඡ ප්‍රදාහය, පිළිකා, සර්ප විෂ හා වස විස වර්ග ශරීරගතවීම් සහ වෙනත්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

හදිසි රෝගී තත්ත්වයන් සඳහා භාවිත කළ හැකි හදිසි ඖෂධ ප්‍රතිකාර තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

සුකාදාරම් මත්රුම් වෙකුසන ඌටක අමෛච්සරෛක් කේට්ට විනා:

(අ) (i) ආයුර්වේද සත්තිරසිකිච්සෛ පට්ටම් පෙට්ර මරුත්තුවර්කළ් උළ්ළපෝතිලුම්, අරසාංක ආයුර්වේද වෛත්තියසාලෛකළිල් අංගීකරික්කප්පට්ට සත්තිරසිකිච්සෛකළ් මේර්කොළ්ළප්පටුවතිල්ලෛ එන්පතෛ අරිවාරා එන්පතෛයුම්;

(ii) ආමෙනිල්, අතර්කාන කාරණංකළ් යාවෛ එන්පතෛයුම්;

අවර් ඉච්සපෛක්කු අරිවිප්පාරා?

(ආ) (i) ඉරාජකිරිය ආයුර්වේද වෛත්තියසාලෛයිල් තර්පෝතු මකප්පේර්රු නටවටික්කෛකළ් ඉටම්පෙරුකින්රනවා එන්පතෛයුම්;

(ii) ඉන්රෛල්, අව්වෛත්තියසාලෛයිල් ඉරුතියාක මකප්පේර්රු නටවටික්කෛ ඉටම්පෙර්ර තිකති යාතු එන්පතෛයුම්;

(iii) මේර්පටි වෛත්තියසාලෛයිල් මුතිර්වුරා සිසු පරාමරිප්පුප් පිරිවොන්රු කාණප්පටුකින්රතා එන්පතෛයුම්;

(iv) තර්පෝතු මකප්පේරු ඉටම්පෙරාවිට්ටාල්, අප්පිරිවෛත් තොටර්න්තු නටත්තිච් සෙල්වතර්කාන තේවෛප්පාටු යාතු එන්පතෛයුම්;

අවර් ඉච්සපෛක්කු අරිවිප්පාරා?

(இ) (i) ආයුර්වේද වෛත්තියසාලෛකළිල් ඉරුතය නෝය්කළ්, උයර් කුරුති අළුත්තම්, තීක්කායංකළ්, කුටල්වළරි අළර්සි, පුර්රුනෝය්, පාම්පුක්කටි විසම්, ඒනෛය නච්සුප්පොරුට්කළ් උටලිල් සේරුතල් මර්රුම් ඒනෛය අවසර නෝය් නිලෛමෛකළුක්කු පයන්පටුත්තක්කූටිය අවසර මරුත්තුව සිකිච්සෛකළ් කාණප්පටුකින්රනවා එන්පතෛයුම්;

(ii) ඉන්රෛල්, අතර්කාන කාරණංකළ් යාවෛ එන්පතෛයුම්;

අවර් මේලුම් ඉච්සපෛක්කු අරිවිප්පාරා?

(ஈ) ඉන්රෛල්, ඒන්?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether he is aware that, although there are medical officers who possess a Degree in Ayurveda Surgery, recognized surgeries are not performed in government Ayurveda hospitals; and

(ii) if so, the reasons therefor?

(b) Will he also inform this House -

(i) whether child deliveries are currently performed at the Rajagiriya Ayurveda Hospital;

(ii) if not, the date on which the last child delivery was performed at the said hospital;

(iii) whether there is a Premature Infant Care Unit at the said hospital; and

(iv) if child deliveries are not currently performed, the necessity of maintaining the said unit?

(c) Will he further inform this House -

(i) whether there are emergency medical treatments available in the Ayurveda hospitals for heart diseases, high blood pressure, burns, appendicitis, cancer, snake bites and poisoning and other emergency medical conditions; and

(ii) if not, the reasons therefor?

(d) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

(අ) (i) ශල්‍යකර්ම සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ ආයුර්වේද රෝහල් විවිධ මට්ටම්වලින් සමන්විත වන අතර, ඒවායේ පවතින යටිතල පහසුකම්, උපකරණ සහ වෛද්‍ය මානව සම්පත් අනුව ශල්‍ය තන්ත්‍රයට අදාළ ප්‍රතිකාර සේවාවන් දැනටමත් ක්‍රියාත්මක කරනු ලබයි.

බටහිර වෛද්‍ය ක්‍රමය ලෙස නොව ආයුර්වේද ශල්‍ය තන්ත්‍රය යටතට යන්ත්‍ර කර්ම - surgeries carried out using blunt instruments; ශස්ත්‍ර කර්ම - surgeries carried out using sharp instruments; ක්ෂාර කර්ම - treatments performed using Herbo-mineral caustics; අග්නි කර්ම - therapeutic cauterization; රක්තමෝක්ෂණ ප්‍රතිකාර ක්‍රම - bloodletting; ව්‍රණ සඳහා ප්‍රතිකාර සැලකෙන අතර මෙම ප්‍රතිකාර රෝගයට සහ රෝගියාට අදාළව යොදා ගැනීම සිදු කෙරේ. මෙම කර්ම සියල්ල ආයුර්වේදයේ පිළිගත් ශල්‍ය කර්ම ලෙස සැලකේ.

ඉහත සඳහන් ප්‍රතිකාර සිදු කිරීම සඳහා බටහිර වෛද්‍ය ක්‍රමයේ මෙන්ම ශල්‍යාගාර - operating theatres; ව්‍රණිතාගාර - recovery room/dressing rooms, අතුරාගාර - wards - සහ ඒ සඳහා අවශ්‍ය ඖෂධ උපස්ථායක සේවය පිළිබඳ ආයුර්වේද ශල්‍ය තන්ත්‍රයේ සඳහන්ය.

වැඩිදුර තොරතුරු **ඇමුණුම*** මගින් දක්වා ඇත.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(ii) පැන නොනඟී.

(ආ) (i) නැත.

(ii) 2000 වසරේදී.

(iii) නැත.

(iv) දැනට නොමේරූ ළදරු ප්‍රතිකාර ඒකකයක් පවත්වාගෙන යනු නොලැබේ.

(ඇ) (i) ප්‍රතිකාර පවතී.

නමුත් එය රෝගියාගේ පවතින රෝගී තත්ත්වයේ තීව්‍රතාව මත තීරණය වේ.

තවද, අගද තන්ත්‍ර හෙවත් ආයුර්වේද විෂ වෛද්‍ය විද්‍යාවට අදාළ විශේෂඥ වෛද්‍ය සේවා සහ විශේෂිත අගද තන්ත්‍ර සායන මඟින් සර්ප දෂ්ටන ඇතුළු සත්ව දෂ්ටන, විෂ ද්‍රව්‍ය මුඛයෙන් ශරීරගත වීම සහ ස්පර්ශයෙන් ඇති වන විෂ බලපෑම් සඳහා රෝගී තත්ත්වයන්ට හා ආයතනයේ පහසුකම්වලට අනුකූලව ආයුර්වේද ප්‍රතිකාර සේවා සපයනු ලැබේ. මෙම සේවාවන් සඳහා භාවිත කරන අගද ඖෂධ විශේෂිත අගද තන්ත්‍ර සායනවල පවතී. කෙසේ වෙතත්, ප්‍රතිකාර ලබා දීම රෝගියාගේ තත්ත්වය, වෛද්‍ය නිපුණතාව සහ ආයතනයේ පවතින පහසුකම් මත රඳා පවතී. බරපතළ විෂ ශරීරගතවීම්වලදී කඩිනම් නවීන හදිසි වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය වන බැවින්, රෝගියා සුදුසු රෝහලකට කඩිනමින් යොමු කළ යුතු ය.

(ii) පැන නොනඟී.

(ඈ) පැන නොනඟී.

(අ) (i) අනුවෛද්‍ය ප්‍රතිකාර ලබා දෙනු ලබන ආයතන ඇත.

ශ්‍රී ලංකාවේ ආයුර්වේද රෝහල් විවිධ මට්ටම්වල වර්ගීකරණය කර ඇති අතර, ඒවායේ යටිතල පහසුකම්, උපකරණ සහ වෛද්‍ය කාර්ය මණ්ඩලය අනුව ශල්‍ය තන්ත්‍ර සම්බන්ධ සේවා සපයනු ලැබේ. ශල්‍ය තන්ත්‍ර සම්බන්ධ සියලුම ප්‍රතිකාර ක්‍රියා පටිපාටි සිදු කරනු ලබන්නේ මෙහෙයුම් රඟහල - operating theatres, පුණ් ප්‍රතිකාර කාමර/ මීට්ෂි කාමර - recovery rooms/dressing rooms, රෝගී වාට්ටු - wards - සහ ඒ සඳහා අවශ්‍ය වන ආයුර්වේද ඖෂධ සැපයුම් ඇති ආයුර්වේද රෝහල්වලදී ය.

(ඉ) (i) ප්‍රතිකාර ලබා දෙනු ලැබේ.

නමුත් එය රෝගියාගේ පවතින රෝගී තත්ත්වයේ තීව්‍රතාව මත තීරණය වේ.

තවද, අගද තන්ත්‍ර හෙවත් ආයුර්වේද විෂ වෛද්‍ය විද්‍යාවට අදාළ විශේෂඥ වෛද්‍ය සේවා සහ විශේෂිත අගද තන්ත්‍ර සායන මඟින් සර්ප දෂ්ටන ඇතුළු සත්ව දෂ්ටන, විෂ ද්‍රව්‍ය මුඛයෙන් ශරීරගත වීම සහ ස්පර්ශයෙන් ඇති වන විෂ බලපෑම් සඳහා රෝගී තත්ත්වයන්ට හා ආයතනයේ පහසුකම්වලට අනුකූලව ආයුර්වේද ප්‍රතිකාර සේවා සපයනු ලැබේ. මෙම සේවාවන් සඳහා භාවිත කරන අගද ඖෂධ විශේෂිත අගද තන්ත්‍ර සායනවල පවතී. කෙසේ වෙතත්, ප්‍රතිකාර ලබා දීම රෝගියාගේ තත්ත්වය, වෛද්‍ය නිපුණතාව සහ ආයතනයේ පවතින පහසුකම් මත රඳා පවතී. බරපතළ විෂ ශරීරගතවීම්වලදී කඩිනම් නවීන හදිසි වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය වන බැවින්, රෝගියා සුදුසු රෝහලකට කඩිනමින් යොමු කළ යුතු ය.

(ii) ඔව්.

(ඊ) ඔව්.

(a) (i) Surgeries are performed.

Ayurvedic hospitals in Sri Lanka are classified into various levels, and treatment services related to Shalya Tantra are already provided depending on the infrastructure, equipment and medical personnel available at each hospital.

Surgeries related to Shalya Tantra are carried out by specialized Ayurvedic medical officers and supporting staff in Ayurvedic hospitals that have the necessary infrastructure, equipment and medical personnel. All procedures related to Shalya Tantra are carried out in operating theatres, recovery rooms/dressing rooms, wards and where Ayurvedic medicines are available.

(i) Treatments are provided.

However, it depends on the current condition of the patient and the severity of the condition.

Moreover, Agada Tantra or Ayurvedic toxicology is the specialized medical science that deals with snakebites and other animal bites, poisoning through oral ingestion and toxic effects through skin contact. Treatments related to Agada Tantra and specialized Agada Tantra clinics are provided in accordance with the current condition of the patient and the facilities available in the hospital. However, the provision of treatments depends on the condition of the patient, the expertise of the physician and the facilities available in the hospital. Since urgent modern emergency medical treatments are required in cases of severe poisoning, patients should be referred to a hospital without delay.

(ii) Yes.

(ඌ) No.

(a) (i) Ayurvedic treatments are provided in hospitals.

Ayurvedic hospitals in Sri Lanka are classified into various levels, and treatment services related to Shalya Tantra are provided depending on the infrastructure, equipment and medical personnel available at each hospital. All procedures related to Shalya Tantra are carried out in operating theatres, recovery rooms/dressing rooms, wards and where Ayurvedic medicines are available.

(i) Treatments are provided.

However, it depends on the current condition of the patient and the severity of the condition.

Moreover, Agada Tantra or Ayurvedic toxicology is the specialized medical science that deals with snakebites and other animal bites, poisoning through oral ingestion and toxic effects through skin contact. Treatments related to Agada Tantra and specialized Agada Tantra clinics are provided in accordance with the current condition of the patient and the facilities available in the hospital. However, the provision of treatments depends on the condition of the patient, the expertise of the physician and the facilities available in the hospital. Since urgent modern emergency medical treatments are required in cases of severe poisoning, patients should be referred to a hospital without delay.

(ii) Yes.

(b) No.

---

* පුස්තකාලයේ තබා ඇත.

* நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.

* Placed in the Library.

Unlike in the western medical treatment system, various Shalya Tantra procedures are used in Ayurveda, such as surgeries carried out using blunt instruments, surgeries carried out using sharp instruments, treatments performed using Herbo-mineral caustics, therapeutic cauterization, bloodletting and treatment methods for wounds. All these treatment procedures are applied in accordance with the specific disease and the patient. These procedures are considered accepted and recognized surgeries in Ayurveda.

For carrying out the aforementioned treatments, facilities such as an operating theatres, a recovery rooms/dressing rooms, wards and the necessary services of attendants are specified in Ayurveda Shalya Tantra.

Further information is provided in Annex*. (Please refer to Annex in Sinhala.)

(ii) Does not arise.

(b) (i) No.

(ii) In the year 2000.

(iii) No.

(iv) Currently, a premature baby care unit is not maintained.

(c) (i) Treatments are available.

However, it depends on severity of illness of the patients. Further, Specialist Medical Officers' Service in respect of Agadatantra or Ayurvedic Science of Toxicology is provided for animal bites including snakebites, oral ingestion of poison and toxic effects through skin contact and such Ayurvedic treatments are provided depending on the facilities available in respective hospital. Agada medicine used or these treatments are available in special Agadatantra clinics. However, provisions of treatment depends on the condition of the patient, skill of doctor and facilities available at the hospital. However, in severe ingestion of poison, the patient should be referred to an appropriate hospital immediately as expeditious medical treatments are necessary in such cases.

(ii) Does not arise.

(d) Does not arise.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.